331 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 331 - இல. 02
Volume 331 - No. 02

2026 නොවැම්බර් 13වන සිකුරාදා
2026 நவம்பர் 13, வெள்ளிக்கிழமை
Friday, 13th November, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 451]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු]තීරු 454-480]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

2026 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ ප්‍රාග්ධන වියදම් භාවිතය අඩු වීම [තීරුව 480]

විසර්ජන පනත් කෙටුම්පත, 2027 - [පළමුවන වෙන් කළ දිනය]:

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 482-612]

කල්තැබීමේ යෝජනාව:

තද වැසි කාලවලදී කොළඹ නගරය ජලයෙන් යටවීම සඳහා ස්ථිර විසඳුමක් [තීරු 612-623]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තීරු 623-632]

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 451]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 454-480]

தனி அறிவித்தல் மூல வினா:

2026 சனவரி முதல் யூன் வரையான காலப்பகுதியில் மூலதனச் செலவின் குறைந்த பயன்பாடு [ப: 480]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2027 - [ஒதுக்கப்பட்ட முதலாம் நாள்]:

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 482-612]

ஒத்திவைப்புப் பிரேரணை:

கனமழை பெய்யும்போது கொழும்பு நகரில் ஏற்படும் வெள்ளப்பெருக்குக்கான நிரந்தரத் தீர்வு [ப: 612-623]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 623-632]

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT [Col. 451]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 454-480]

QUESTION BY PRIVATE NOTICE:

Low Utilization of Capital Expenditure from January to June, 2026 [Col. 480]

APPROPRIATION BILL, 2027- [First Allotted Day]:
Second Reading- Debate Adjourned [Cols. 482-612]

ADJOURNMENT MOTION:
Permanent Solution for Inundation of Colombo City During Heavy Rainfall [Cols. 612-623]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 623-632]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 නොවැම්බර් 13වන සිකුරාදා
2026 நவம்பர் 13, வெள்ளிக்கிழமை
Friday, 13th November, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXXIII කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XVIII, XIX, XX, XXI හා XXII කොටස්, සිව්වැනි කාණ්ඩයේ XII, XIII, XIV හා XV කොටස් සහ හයවැනි කාණ්ඩයේ VIII, IX, X , XI, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX, XX, XXI, XXII, XXIII, XXIV හා XXV කොටස්

මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

II

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXXIV කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXII, XXV, XXVI හා XXVII කොටස්, තෙවැනි කාණ්ඩයේ XIV හා XVI කොටස් සහ නවවැනි කාණ්ඩයේ XVII, XX හා XXI කොටස්

මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ තෘතීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Ministry of Education, Higher Education and Vocational Education in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, 2026 අංක 09 දරන පරිපූරක ඇස්තමේන්තුව මම ඉදිරිපත් කරමි.

මෙම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වගන්තිය යටතේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ඔක්තෝබර් 12 දිනැති අංක 2510/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.- [විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බදුල්ල, ගහබඩ පටුමග, අංක 14/9 යන ලිපිනයෙහි පදිංචි පද්මලතා ශ්‍රියාකාන්ති දිසානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හාලිඇල, බදුල්ල පාර, පළමු පටුමග, මධ්‍යම පාන්තික නිවාස, අංක 26 යන ලිපිනයෙහි පදිංචි ටී.එම්. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) සෙවනගල, කොවුල්ආර, අංක 176 යන ලිපිනයෙහි පදිංචි ඒ.ඒ. වසන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කොලොන්න, කැල්ලගම, කරගහයාය, අලුත් ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්.එල්.සී. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කාරියමඩිත්ත, දඹරැල්ල, අංක 186/04 යන ලිපිනයෙහි පදිංචි ආර්.පී. තුවන් චින්තක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මනම්පිටිය, නාමල්පොකුණ, මලියදේවපුර, අංක 20 යන ලිපිනයෙහි පදිංචි කේ.පී.ජී. රමිත් ශිවන්ත ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පොළොන්නරුව, 04 ඇළ, අංක 68/7 යන ලිපිනයෙහි පදිංචි පී.සී.කේ. පියසේන මහතා සහ වෙනත් 14දෙනෙකුගෙන් ලැබුණු පෙත්සම;

(3) පොළොන්නරුව, පලුගස්දමන, අංක 253 යන ලිපිනයෙහි පදිංචි පී.ජී. අමිල ප්‍රභාත් බැද්දේගම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) බකමූණ, ජී.පී.එස්. පාර යන ලිපිනයෙහි පදිංචි පී.කේ. ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත අපද්‍රව්‍ය බැහැර කරන පළාත් පාලන ආයතන: විස්තර
கரதியான திண்மக்கழிவு முகாமைத்துவ நிலையத்தில் கழிவுகளை அகற்றும் உள்ளூராட்சி நிறுவனங்கள்: விபரம்
LOCAL AUTHORITIES DISPOSING WASTE AT KARADIYANA SOLID WASTE MANAGEMENT CENTRE: DETAILS

1002/2025

1. ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට අපද්‍රව්‍ය බැහැර කෙරෙන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(iii) දිනකට එම ස්ථානය වෙත බැහැර කෙරෙන කසළ ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වය හේතුවෙන් කරදියාන ප්‍රදේශය අවට ජීවත් වන පවුල් විශාල සංඛ්‍යාවක් දැඩි දුෂ්කරතාවලට මුහුණදී සිටින බව දන්නේද;

(v) කැළි කසළ කරදියාන සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට යැවීම වෙනුවට ඒ සඳහා විධිමත් වැඩසටහනක් සකස් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිරුවාහ, මාකාණ සපෙකළ් මත්රුම් උළ්ලූරාට්සි අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) තත්පොළුතු කරතියාන තිණ්මක්කළිවු මුකාමෙත්තුව නිලෙයත්තිල් කළිවුකළෙ අකත්රුම් උළ්ලූරාට්සි නිරුවනංකළින් එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්;

(ii) මේත්පටි උළ්ලූරාට්සි නිරුවනංකළින් පෙයර්කළ් යාවෙ එන්පතෙයුම්;

(iii) නාළොන්රුක්කු මේත්පටි කිටංකිල් අකත්රප්පටුම් කළිවුකළින් අළවු එව්වළවු එන්පතෙයුම්;

(iv) මේත්පටි නිලෙමෙ කාරණමාක කරතියාන පිරතේසත්තෙච් සූළ වසික්කුම් පෙරුමළවු එණ්ණික්කෙයිලාන කුටුම්පංකළ් පෙරුම් අසෙකරියංකළුක්කු මුකංකොටුත්තු වරුවතෙ අරිවාරා එන්පතෙයුම්;

(v) කරතියාන තිණ්මක්කළිවු මුකාමෙත්තුව නිලෙයත්තුක්කු කළිවුකළෙ අනුප්පුවතර්කුප් පතිලාක, අතර්කාන මුරෙයානතොරු වේලෙත්තිට්ටත්තෙ තයාරිප්පතර්කු මේර්කොළ්ළප්පටුම් නටවටික්කෙකළ් යාවෙ එන්පතෙයුම්;

අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of local authorities currently disposing of waste at the Karadiyana Solid Waste Management Centre;

(ii) the names of the aforesaid local authorities;

(iii) the quantity of waste disposed of at the said site per day;

(iv) whether he is aware that a large number of families residing in the vicinity of the Karadiyana area face severe hardships due to this situation; and

(v) the measures taken to formulate a proper programme for waste management instead of sending garbage to the Karadiyana Solid Waste Management Centre?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 07යි.

(ii) මොරටුව මහ නගර සභාව

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

කෝට්ටෙ මහ නගර සභාව

බොරලැස්ගමුව මහ නගර සභාව

කැස්බෑව නගර සභාව

මහරගම නගර සභාව

හෝමාගම ප්‍රාදේශීය සභාව

(iii) මෙට්‍රික් ටොන් 500ක් පමණ.

(iv) ඔව්.

හැකිතාක් මහජන පීඩාව අවම වන පරිදි දෛනික මෙහෙයුම් සිදු කරනු ලැබේ.

(v) පළාත් පාලන ආයතන මට්ටමින් අපද්‍රව්‍ය හැකිතාක් දුරට ප්‍රභවයේදීම වෙන් කිරීම, ප්‍රතිසාධනය කළ හැකි අපද්‍රව්‍ය උපරිමයෙන් ප්‍රතිසාධනය කිරීම සහ එලෙස කළමනාකරණය කළ නොහැකි ඉතිරි අපද්‍රව්‍ය කරදියාන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කිරීම ප්‍රධාන අරමුණ වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා "Clean Up 75%" (2020), "Clean Up 100% (2025)" යන විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, එහි අඛණ්ඩ ඉදිරි පියවරක් ලෙස මේ වන විට "Clean Up 100+" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

එම වැඩසටහන් යටතේ

- **දිරන අපද්‍රව්‍ය කළමනාකරණය:**

  කරදියාන කසළ අංගනයේ මෙන්ම පළාත් පාලන ආයතන මට්ටමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සහ සත්ත්ව ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, 2026 වර්ෂයේදී ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් 1,000ක් බෙදා දීම සඳහා රුපියල් මිලියන 10ක ප්‍රතිපාදන වෙන් කිරීමටත්, 2027 වර්ෂයේදී කළු සොල්දාදු මැස්සා - Black Soldier Fly, BSF - ආශ්‍රිත පෙළ අපද්‍රව්‍ය සැකසීමේ හා සත්ත්ව ආහාර නිෂ්පාදනයේ ක්‍රමවේදය හඳුන්වා දීමටත් සැලසුම් කර ඇත.

- **ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය:**

  පළාත් පාලන ආයතන සඳහා තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබා දෙමින් ප්‍රතිචක්‍රීකරණය දිරිමත් කිරීමත්, කරදියාන ව්‍යාපෘති භූමිය තුළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය ප්‍රතිසාධනය කිරීම සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථාන - MRF - ව්‍යාපෘති 2ක් ආරම්භ කිරීමත් Clean Sri Lanka වැඩසටහන යටතේ සහ UNDP ආධාර යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

- **ප්‍රතිචක්‍රීකරණයෙන් අනතුරුව ඉතිරි වන නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය:**

  වෙන් කිරීමෙන් අනතුරුව ඉතිරි වන දහනය කළ හැකි අපද්‍රව්‍ය කෙරවලපිටිය Western Power බලාගාරය වෙත යොමු කිරීමත්, ප්‍රතිචක්‍රීකරණයෙන් පසු ඉතිරි වන දහනය කළ හැකි අපද්‍රව්‍ය INSEE සිමෙන්ති සමාගම වෙත යොමු කිරීමටත් කටයුතු කරනු ලබයි.

- **දැනට ගොඩ ගැසී ඇති දිරාපත් වී ඇති අපද්‍රව්‍ය බැහැර කිරීම:**

  දැනට ගොඩ ගැසී ඇති දිරාපත් වී ඇති අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා හඳුනාගත් ගල්වළවල් යොදා ගැනීමටත්, ඒවා පාරිසරික හා මහජන සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යාත්මකව බැහැර කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර අරුවක්කාරු සනීපාරක්ෂක බිම් පිරවුම සඳහා බැහැර කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් විස්තර කරපු ආකාරයට පළාත් පාලන ආයතන පහක වාගේ අපද්‍රව්‍ය මෙම ස්ථානයට එනවා; විශාල ප්‍රමාණයක් එනවා. ඒ පළාත් පාලන ආයතන පහම කොළඹ අවට තිබෙන, විශාල ජන ඝනත්වයක් තිබෙන පළාත් පාලන ආයතනයි. ගරු ඇමතිතුමනි, ඒ ඉවත් කරන කුණු කසළවලින් අතුරු නිෂ්පාදන බොහොමයක් කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනට එවැනි අතුරු නිෂ්පාදන බොහොමයක් සිදු වන බවක් වාර්තා වෙන්නේ නැහැ. විශේෂයෙන්ම විදුලිය නිෂ්පාදනය කිරීම ආදිය අනෙකුත් ස්ථානවල දැනටමත් සිදු කරගෙන යනවා. නමුත්, කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට බැහැර කරන කුණු කසළවලින් අතුරු නිෂ්පාදන කිරීමේ කටයුත්ත තවම ඉෂ්ට වෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා, ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද, ඒ සම්බන්ධව ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරපු කාරණයට අදාළව ගත්තොත්, waste-to-energy වැඩසටහන්, ඒ කියන්නේ බලශක්තිය උත්පාදනය කිරීමේ වැඩසටහන් රාශියක් මේ වන විට අමාත්‍යාංශය මඟින් සකස් කරමින් තිබෙනවා. ඒ වාගේම තමයි, අපද්‍රව්‍යවලින් පොහොර නිෂ්පාදනය කිරීම - waste-to-fertilizer - සඳහාත් අවශ්‍ය වැඩසටහන් මේ වනකොට සැලසුම් කර තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී අපට මේ ගැටලුව නිරාකරණය කර ගන්න පුළුවන් වේවි. අපි පිළිගන්නවා, දීර්ඝ කාලයක් තිස්සේ පැවැති තත්ත්වයන් එක්ක කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය ගැටලුවක් බවට පත් වෙලා තිබෙන බව. නමුත් කසළ අපට විපතක් බවට පත් කර ගන්නේ නැතුව ඒවා වඩාත් ඵලදායී ලෙස යොදා ගන්නේ කොහොමද කියන මෙහෙයුමක අපි ඉන්නවා. ඒක ඉක්මනින් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් පළාත් පාලන විෂය හා සම්බන්ධ ප්‍රශ්නයක් තමයි. ගරු ඇමතිතුමනි, පසුගිය දා ඇති වෙච්ච විශාල වර්ෂාපතනයත් එක්ක කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයක් වැසි ජලයෙන් යට වීමක් සිද්ධ වෙලා තිබුණා. එහිදී අප දැකපු ප්‍රධානම දේ මේකයි. විශේෂයෙන්ම කොළඹ නගරයේ තිබෙන කානු පද්ධතිය, කානු පද්ධතියත් එක්ක සම්බන්ධ වන ඇළවල්, ඒ වාගේම ගලි සුද්ධ කිරීමේදී අදාළ රාජ්‍ය ආයතනත් එක්ක යම් සම්බන්ධීකරණයක් පසු ගිය කාලයේම දකින්න තිබුණා. විශේෂයෙන්ම පහත් බිම් සංවර්ධන මණ්ඩලය, ඒ වාගේම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව - CSD - එකතු වෙලා තමයි සුද්ධ පවිත්‍ර කිරීම් දිගටම කරගෙන ගියේ. ඒ වාගේම, වරාය ඇතුළේ තිබෙනවා, වතුර ගලාගෙන යන තව outlets කිහිපයක්. පසුගිය කාලය පුරාම ඒවා සුද්ධ පවිත්‍ර නොකරපු හේතුව හින්දාම තමයි වැසි ජලය බැස යන්න සෑහෙන්න වෙලාවක් ගියේ.

ඊළඟ කාරණය මේකයි. ලෝක බැංකුවත් එක්ක පටන් ගත්තු ප්‍රධාන ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ, මරදානේ Norris Canal එක බේරේ වැවට සම්බන්ධ කිරීමේ project එක. ඒ ලෝක බැංකු ව්‍යාපෘතිය 2019, 2020 කාලයේ ඉඳන්ම ඇනහිට තිබෙනවා. එය තවම පටන් අරගෙන නැහැ. ඒ වාගේම, ආමර් වීදිය හන්දියේ පිරෙන වතුර ඉහුරු කඩේ ප්‍රදේශයෙන් බැස යාමට ව්‍යාපෘතියක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. එවැනි ව්‍යාපෘති කිහිපයක්ම පසුගිය කාලය පුරා අකර්මණ්‍ය වීම නිසා තමයි මේ වැසි ජලය බැස යාමට විශාල කාල වේලාවක් ගියේ. ඒ නිසා තමයි නැවත යථා තත්ත්වයට පත් වෙන්න විශාල කාලයක් ගියේ. එම නිසා මම ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. එය ඔබතුමාගේ විෂය යටතට ගැනෙන නිසා අමාත්‍යවරයා හැටියට ඔබතුමා මේ සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් කරලා, එම අකාර්යක්ෂමතා නැති කර ගන්න නගර සභාවත් එක්ක ඒකාබද්ධ වෙලා යම් වැඩසටහනක් කරන්න යෝජනාවක් තිබෙනවාද?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා මතු කරපු ප්‍රශ්නය ඉතාම වැදගත්. එතුමා නිවැරදිව සඳහන් කළා, පසුගිය කාලය මුළුල්ලේම ඒ ජලය බැහැර කිරීමේ කානු පද්ධති සහ ඒ අදාළ ක්‍රියාවලිය විධිමත්ව සිද්ධ වුණේ නැහැ කියලා. කොළඹ නගරය යටවීමට ඇත්තටම ඒක තමයි හේතුව. ඒ වාගේම, අවුරුදු 30ක, 40ක වාගේ ඉඳලා වෙගවත්ව සිද්ධ වුණු අනවසර ඉදිකිරීම් සම්බන්ධ ප්‍රශ්නයකුත් තිබෙනවා. ඊට කලිනුත් මේ ප්‍රශ්නය තිබෙන්න ඇති. නමුත්, පසුගිය අවුරුදු 30ක, 40ක වාගේ කාලය තුළ අනවසර ඉදිකිරීම් විශාල වශයෙන් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම කොළඹ නගරයේ වැසි ජලය විතරක් නොවෙයි, වෙනත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු සඳහාත් දීර්ඝ කාලයක් තිස්සේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. හැබැයි, ඒ බොහෝ වැඩසටහන් අවසන් වෙලා නැහැ. මේ වන විට අපි ඒ වැඩසටහන් අවසන් කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු කරනවා. සමහර විදේශීය ආයතන හරහා ලබා දුන්නු ප්‍රතිපාදන ඇත්තටම නතර වෙලා තිබුණා. අපි ඒ වැඩසටහන් රජයේ ප්‍රතිපාදන යටතේ ආරම්භ කරලා, නැවත ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, මම හිතන විධියට මේ ප්‍රශ්නය පිළිබඳව අද සවස සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාවකුත් ඉදිරිපත් කරන්න නියමිතව තිබෙනවා. මීට අදාළ සවිස්තරාත්මක තොරතුරු ඒ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

අධ්‍යාපන විද්‍යාපීඨවල සේවය කරන ගුරු අධ්‍යාපනඥයින්: ස්ථාන මාරු

கல்வியியற் கல்லூரிகளில் சேவையாற்றும் ஆசிரியக் கல்வியாளர்கள்: இடமாற்றம்

TEACHER EDUCATORS SERVING IN COLLEGES OF EDUCATION: TRANSFERS

1224/2025

2. ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අධ්‍යාපන විද්‍යාපීඨවල දැනට සේවය කරනු ලබන ගුරු අධ්‍යාපනඥයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු අධ්‍යාපනඥයින් සැලකිය යුතු සංඛ්‍යාවක් ස්ථාන මාරුවීම් නොලබා එකම ආයතනයේ දීර්ඝ කාලයක් සේවය කරන බව දන්නේද;

(iv) එම ආයතනවල සේවය කරන ගුරු අධ්‍යාපනඥයින් සඳහා ක්‍රමානුකූල ස්ථාන මාරු ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක වන්නේද;

(v) නොඑසේ නම්, ගුරු අධ්‍යාපනඥයින් වෙනුවෙන් සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සඳහා රජය ක්‍රියාත්මක කිරීමට අදහස් කරන පියවර හෝ සැලසුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது இயங்கிவரும் கல்வியியற் கல்லூரிகளின் எண்ணிக்கையையும்;

(ii) இந்த கல்வியியற் கல்லூரிகளில் தற்போது சேவையாற்றிவரும் ஆசிரியக் கல்வியாளர்களின் எண்ணிக்கையையும்;

(iii) கணிசமான எண்ணிக்கையிலான ஆசிரியக் கல்வியாளர்கள் இடமாற்றமின்றி ஒரே நிறுவனத்தில் நீண்ட காலமாக சேவையாற்றி வருகின்றனர் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iv) அந்த நிறுவனங்களில் சேவையாற்றும் ஆசிரியக் கல்வியாளர்களுக்காக முறைமை ரீதியான இடமாற்றத் திட்டமொன்று தற்போது நடைமுறையில் உள்ளதா என்பதையும்;

(v) அவ்வாறில்லையெனின், இவ்வாறான ஆசிரியக் கல்வியாளர்களுக்காக நியாயமானதும் வெளிப்படைத் தன்மையானதுமான இடமாற்றக் கொள்கையைத் தாபிப்பதற்காக அரசாங்கம் அமுல்படுத்த எண்ணியுள்ள நடவடிக்கைகள் அல்லது திட்டங்கள் எவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of Colleges of Education currently functioning in Sri Lanka;

(ii) the number of teacher educators currently serving in those Colleges of Education;

(iii) whether she is aware that a considerable number of teacher educators have been serving in the same institution for extended periods without being transferred;

(iv) whether a systematic transfer scheme is currently in operation for teacher educators serving in those institutions; and

(v) if not, the measures or plans that the Government intends to implement to establish a fair and transparent transfer policy for such teacher educators?

(b) If not, why?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වන විට ක්‍රියාත්මක රජයේ අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව 20කි.

(ii) එම අධ්‍යාපන විද්‍යාපීඨවල දැනට සේවය කරනු ලබන ගුරු අධ්‍යාපනඥයින් සංඛ්‍යාව 914කි.

(iii) ඔව්.

(iv) ඔව්.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ස්ථානමාරු පටිපාටියක් 2019 වර්ෂයේ සිට අනුමත කර ඇත. නමුත්, 2019 සිට 2025 වර්ෂය දක්වා ඉතා සීමිත පිරිසක් ගුරු අධ්‍යාපනඥ සේවයේ යෙදී සිටි හෙයින් ස්ථානමාරු සිදු කිරීමට හැකියාව නොතිබුණි. නමුත්, 2025 වර්ෂයේදී සීමිත පදනම මත 603ක ප්‍රමාණයක් ගුරු අධ්‍යාපනඥ සේවයට පත්වීම මත ස්ථානමාරු මණ්ඩල පැවැත්වීම සිදු කළ හැකි විය. ඒ අනුව, 2026 වර්ෂයේ සිට වසර 08කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථානමාරු කිරීම සිදු කරනු ලබයි. නමුත්, යම් යම් විද්‍යාපීඨ සුවිශේෂී විෂයයන් සඳහා පිහිටුවා ඇති බැවින් එම විද්‍යාපීඨවල පවතින පාඨමාලාවලට අදාළ විෂයන් සඳහා බඳවාගත් නිලධාරීන් වෙනත් විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථානවලට ස්ථානමාරු සිදු කිරීමේ හැකියාවක් නොමැත.

2027 වර්ෂයට ද වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර ස්ථානමාරු මණ්ඩල 2026 ඔක්තෝබර් 20, 23 දිනවලදී පවත්වනු ලබන අතර, එහිදී ද වසර 08කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථානමාරු කිරීමට ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරනු ලැබේ.

(v) 2019 සිට වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

(ආ) පැන නොනඟී.

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Hon. Speaker, through my first Supplementary Question, I wish to raise several concerns regarding the management and the deployment of Teacher Educators in National Colleges of Education and Teacher Development Centres. There are reports of serious shortcomings in staff deployment, institutional management, infrastructure and career progression. In particular, the Vavuniya National College of Education reportedly has three Art Teacher Educators despite it not offering Art as a subject. Similarly, a Drama and Theatre Teacher Educator is serving in another institution where the subject is not offered.

More than 60 Tamil Second Language Teacher Educators are reportedly serving in Tamil-speaking areas, while hundreds of Sinhala Second Language Teacher Educators are serving in the South. They should instead be deployed according to the actual language requirements, particularly in Tamil-speaking areas in the North and East and Sinahala-speaking areas in the South.

Several centres reportedly operate without clear annual programmes and measurable targets of effective performance monitoring. Also, some institutions with an approved cadre of four reportedly have more than ten staff members, creating unnecessary expenditure of public funds. Residential facilities have not been upgraded for decades. So, Teacher Educators are compelled to stay in deteriorating quarters, while eight to ten student teachers sometimes share a single room.

Millions of rupees allocated to these institutions are reportedly returned to the Treasury annually without being utilized. Then, there are concerns about the absence of a transparent and consistent transfer policy. Also, the Teacher Educators reportedly have to wait approximately for 18 years to reach Grade I.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, you have to shorten your Question.

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Therefore, Sir, I would like to ask the Hon. Minister whether the Government intends to undertake a comprehensive review and restructuring of all National Colleges of Education and Teacher Development Centres, too.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, it is correct that the National Colleges of Education are not at an acceptable level. For many years, those Colleges of Education have been neglected. Staff have not been recruited; the cadre has not been filled and infrastructure development has not taken place. And, we are gradually addressing all of those issues.

The main issue was the large number of vacancies that have been existing since 2019, which we started filling this year. In addition to the 600 odd staff recruited on a limited basis, a further 200-plus were recently recruited on an open basis as well. So, gradually, the staff requirement is being met.

In parallel, infrastructure development is taking place in the Colleges of Education. Money has been allocated. As far as I know, the infrastructure development that we have planned for 2025/2026 is taking place. From 2027 onwards, the allocation for the development of National Colleges of Education will also increase because, from 2027, we are prioritizing the development of National Colleges of Education.

In addition, for the first time, they are also being connected to the Internet, and digital education teaching facilities are being provided. We have already started a digital education hub at the Maharagama National College of Education, which is connected with five other National Colleges of Education. So, all these are currently being implemented.

In parallel, we have also started revising the curriculum, which has not happened for over 17 years. So, we have started the curriculum review and reforms. And, the minor revisions to the curriculum had already taken place. But, we are working towards offering a Bachelor of Education Degree from the National Colleges of Education.

In addition, we have also appointed a committee to look into the 20 National Colleges of Education as a whole, to look into their institutional practices, management practices and all other aspects and to give us recommendations for reforms. Since these National Colleges of Education have been neglected over a long period of time, there are many issues that need to be fixed, and we are addressing them gradually.

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Sir, now, I will ask my second Supplementary Question. There are serious issues with regard to the water facilities in the National College of Education at Dharga Town , Kalutara. Therefore, teachers and the College community are facing serious skin problems and other health problems as well. So, I hope that the Ministry will take these issues into consideration.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Certainly. If there are any complaints regarding those facilities made to us, we will attend to them immediately. In fact, the Vavuniya National College of Education has serious issues with regard to accommodation, some of which we have addressed, but many are still to be addressed. And, we will attend to any complaints that are received.

කළපු සංරක්ෂණ සහ කළමනාකරණ වැඩසටහන: අරමුණු

களப்புகளைப் பேணுதல் மற்றும் முகாமைத்துவ வேலைத்திட்டம்: குறிக்கோள்கள்

LAGOON CONSERVATION AND MANAGEMENT PROGRAMME: OBJECTIVES

1340/2025

3. ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කළපු සංරක්ෂණ සහ කළමනාකරණ වැඩසටහනේ අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ සිට මේ දක්වා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා තෝරා ගෙන ඇති කළපු කවරේද;

(iv) ධීවර කර්මාන්තය සඳහා කළපු සංරක්ෂණය සහ සංවර්ධනය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சின்கீழ் நடைமுறைப்படுத்தப்படுகின்ற களப்புகளைப் பேணுதல் மற்றும் முகாமைத்துவ வேலைத்திட்டத்தின் குறிக்கோள்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்துக்காக 2024ஆம் ஆண்டு முதல் இதுவரையான காலப்பகுதியில் செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி வேலைத்திட்டத்துக்காக தெரிவு செய்யப்பட்டுள்ள களப்புகள் யாவை என்பதையும்;

(iv) கடற்றொழிலுக்காக களப்புகளைப் பேணுதல் மற்றும் அபிவிருத்தி சம்பந்தமாக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House the -

(i) objectives of the Lagoon Conservation and Management Programme implemented under the Ministry;

(ii) amount of money spent on the said project from the year 2024 to date;

(iii) names of the lagoons that have been selected for the said programme; and

(iv) measures that will be taken regarding the conservation and development of lagoons for the fishing industry?

(b) If not, why?

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) Δ **කළපු පාරිසරික පද්ධතිය තිරසාර ලෙස සංරක්ෂණය කිරීම සහ භාවිතයට ගැනීම.**

ශ්‍රී ලංකාව වැනි දුපත් රාජ්‍යයක වෙරළබඩ කලාපීය ජීවනෝපායයන් සහ පරිසර සමතුලිතතාව රැක ගැනීම සඳහා කළපු තිරසාර ලෙස සංරක්ෂණය කිරීම සහ භාවිතයට ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා වැදගත් කරුණු කිහිපයක් පහත පරිදි විස්තර කළ හැකිය;

කළපු පාරිසරික පද්ධතියේ වැදගත්කම

- ජීව විවිධත්වය - biodiversity: මසුන්, කබොලන් - ඉස්සන්, කකුළුවන් - කඩොලාන ශාක, සංක්‍රමණික පක්ෂීන් සහ වෙනත් වෙරළබඩ ජීවීන්ට ආරක්ෂිත නිවහනක් හා බෝවන ස්ථානයක් ලෙස ක්‍රියා කරයි.
- ස්වාභාවික ආරක්ෂාව: සුළං, රළ පහරවල් සහ වෙරළ බාදනයෙන් ගොඩබිම ආරක්ෂා කරන ස්වාභාවික බාධකයක් ලෙස ක්‍රියා කරයි.

තිරසාර භාවිතය සඳහා ගනු ලබන පියවර

කළපුවලින් උපරිම ඵල ප්‍රයෝජන ලබන අතරම ඒවායේ පැවැත්ම තහවුරු කිරීමට පහත ක්‍රියාමාර්ග ගත හැකිය:

- නීති විරෝධී ධීවර ක්‍රම තහනම් කිරීම: කුඩා සිදුරු සහිත දැල් - Thangus nets - භාවිතය සහ විෂ ද්‍රව්‍ය/පුපුරණ ද්‍රව්‍ය යොදා ගැනීම සම්පූර්ණයෙන් තහනම් කිරීම.
- **මසුන් බෝවන කාලයන්හි ආරක්ෂාව;** මසුන් සහ ඉස්සන් බෝවන සමයන්හිදී - breeding seasonsවලදී - අස්වැන්න නෙළීම පාලනය කිරීම.

<u>පාරිසරික සංරක්ෂණ උපක්‍රම</u>

කළපුව වටා ඇති කඩොලාන ශාක විනාශය වැළැක්වීම සහ හායනය වූ ප්‍රදේශවල නැවත කඩොලාන වගා කිරීම මඟින් කඩොලාන පද්ධතියෙහි සුරක්ෂිතභාවය තහවුරු කිරීම, ජලය පිරිසිදු කිරීම සහ ජෛව විවිධත්වය ආරක්ෂා වීම සිදු වේ.

Δ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මඟින් කළපුවල සහ ඒ අවට බහුවිධ ආර්ථික කර්තව්‍යයන්/කාර්යයන් සංවර්ධනය කිරීම.

කළපු, ධීවර කාර්මිකයන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන අතර, සංචාරක කර්මාන්තයටද සෘජුවම දායක වේ. මෙහිදී

[ගරු රත්න ගමගේ මහතා]

පාරිසරික සංචාරක ව්‍යාපාරය - ecotourism - දියුණු කිරීම සඳහා කළපුවේ පරිසරයට හානි නොවන පරිදි ඔරු පැදීම, කඩොලාන නැරඹීම, කුරුල්ලන් නැරඹීම - bird watching - වැනි පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම, මෝටර් බෝට්ටු මඟින් සිදු වන තෙල් කාන්දුවීම් සහ ශබ්ද දූෂණය පාලනය කිරීම ක්‍රියාත්මක කළ හැක.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ සිට 2026.09.30 දක්වා වැය කර ඇති මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 126.30කි.

කළපු සංරක්ෂණය සහ කළමනාකරණය වෙනුවෙන් 2024 වර්ෂය වෙනුවෙන් පහත කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

- කළපු ගැඹුරු කර පිරිසිදු කිරීම
- කළපු නිෂ්පාදන වැඩිදියුණු කිරීම
- කළපු සීමා නිර්ණය සඳහා
- කළපු ප්‍රජා කළමනාකරණය
- ලැමසූරිය ඇළ මාර්ගය පිරිසිදු කිරීම
- මීගමුව කළපු සංවර්ධනය
- ව්‍යාපෘති අධීක්ෂණය
- ධීවර විශ්‍රාම වැටුප්

2024 වර්ෂයේ ඉහත කළපු සංරක්ෂණය සහ කළමනාකරණ කාර්යයන් සඳහා රුපියල් මිලියන 27.09ක මුදලක් වියදම් කර ඇත.

කළපු සංරක්ෂණය සහ කළමනාකරණය වෙනුවෙන් 2025 වර්ෂය සඳහා පහත කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

- කළපු ගැඹුරු කර පිරිසිදු කිරීම
- කළපු නිෂ්පාදන වැඩිදියුණු කිරීම
- කළපු සීමා නිර්ණය සඳහා
- කළපු ප්‍රජා කළමනාකරණය
- මීගමුව කළපු සංවර්ධනය
- ධීවර විශ්‍රාම වැටුප්

2025 වර්ෂයේ ඉහත කළපු සංරක්ෂණය සහ කළමනාකරණ කාර්යයන් සඳහා රුපියල් මිලියන 64.80ක මුදලක් වියදම් කර ඇත.

කළපු සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා 2026 වර්ෂය වෙනුවෙන් පහත කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

- කළපු නිෂ්පාදන වැඩිදියුණු කිරීම
- කළපු සීමා නිර්ණය සඳහා
- මීගමුව කළපු සංවර්ධනය
- ධීවර විශ්‍රාම වැටුප්

2026.09.30 දක්වා ඉහත කළපු සංරක්ෂණය සහ කළමනාකරණ කාර්යයන් සඳහා රුපියල් මිලියන 34.41ක මුදලක් වියදම් කර ඇත.

(iii)
- මීගමුව කළපුව
- නයාරු කළපුව
- නන්දිකඩාල් කළපුව
- පුත්තලම කළපුව
- මුන්දලම කළපුව
- හලාවත කළපුව
- මාවැල්ල කළපුව

(iv) Δ **කළපු ගැඹුරු කිරීම් සහ පිරිසිදු කිරීම් සිදු කිරීම**

කළපු ගැඹුරු කිරීම - dredging - සහ පිරිසිදු කිරීම - cleaning - යනු කළපු පාරිසරික පද්ධතියක තිරසාර පැවැත්ම, ජල සංසරණය සහ ජෛව විවිධත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සිදු කරනු ලබන ඉතා වැදගත් භෞතික කළමනාකරණ ක්‍රියාමාර්ග දෙකකි. මිනිස් ක්‍රියාකාරකම් සහ ස්වාභාවික හේතූන් නිසා කළපු පතුලේ රොන්මඩ පිරීමෙන් - sedimentation නිසා - ජල ධාරිතාව අඩු වීම, ජල සංසරණය ඇහිරීම සහ අපද්‍රව්‍ය එකතු වීම සිදු වේ. මෙමඟින් කළපුවේ පතුලේ තැන්පත් වී ඇති රොන්මඩ, වැලි සහ මැටි ඉවත් කරමින් එහි ජල ගැඹුර නැවත වැඩි කිරීම මෙන්ම ජල සංසරණය - water circulation - වැඩිදියුණු වීම, ඔක්සිජන් මට්ටම ඉහළ යාම, ගංවතුර පාලනය, ධීවර නාවික කටයුතු පහසු වීම ඇති කෙරේ.

Δ පිරිසිදු කිරීම - කළපුවට එකතු වී ඇති නොදිරන අපද්‍රව්‍ය සහ අනවශ්‍ය ආක්‍රමණශීලි ශාක/පාසි ඉවත් කිරීම.

- **ඝන අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් ඉවත් කිරීම:** කළපුවට ගොඩගැසී ඇති ප්ලාස්ටික්, පොලිතීන්, වීදුරු සහ ගෘහස්ථ අපද්‍රව්‍ය යන්ත්‍රසූත්‍ර හෝ ප්‍රජා සහභාගිත්වය - clean-up campaigns - මඟින් ඉවත් කිරීම.
- **ආක්‍රමණශීලි ජලජ ශාක පාලනය:** ජල මතුපිට වසා ගන්නා ජපන් ජබර, දිය පරඬැල් වැනි ශාක හා අනවශ්‍ය පාසි වර්ග ඉවත් කිරීම. එමඟින් සූර්යාලෝකය ජලය අභ්‍යන්තරයට ගමන් කිරීම තහවුරු වේ.
- **කාර්මික සහ නගර සභා අපජල පිරිසිදු කිරීම්:** කළපුවට ගලා එන අපජල නාළිකා සඳහා අපජල පිරිපහදු පද්ධති - wastewater treatment plants - සවි කිරීම.

Δ ධීවර තොටුපොළ සහ වරාය පහසුකම්

ආරක්ෂිත බෝට්ටු අංගන: කුණාටු සහ තද සුළං පවතින කාලවලදී බෝට්ටුවලට හානි නොවී ආරක්ෂිතව නැඹීමට කළපුවල හෝ වරායවල ආරක්ෂිත කලාප වෙන් කිරීම.

උදාහරණ වශයෙන් මීගමුව කළපු සංවර්ධන වැඩසටහන යටතේ මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය පිටුපස ජැටිය ඉදිකිරීම.

Δ මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කිරීම හරහා ආදායම ඉහළ නැංවීම

මේ යටතේ කළපු ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඉස්සන් පසුකිටයන් තැන්පත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. එමඟින් නව රැකියා අවස්ථා

නිර්මාණය කිරීම මඟින් ධීවර ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත සංවර්ධනය කිරීම සිදු කරන අතර, කළපු ජලජ වගාව ප්‍රවර්ධනය කිරීම මඟින් මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ආයෝජකයින් (දේශීය/විදේශීය) ආකර්ෂණය කර ගැනීම සිදු කෙරේ.

(ආ) අදාළ නොවේ.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමාට මම මේ කාරණය කිව්වාම තරහ යයිද දන්නේ නැහැ. මම දන්නේ නැහැ, සුපුරුදු ලෙස, එහෙම නැත්නම් ප්‍රතිපත්තියක් හැටියට එතුමා බොරු කියනවාද කියලා. මම එහෙම කියන්න හේතුව මෙයයි. ඔබතුමා ඔය කියපු කථා ටික මහ පොළොවේ සිදු වෙලා නැහැ. ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ධීවර අමාත්‍යාංශයේ 2026 ප්‍රගතිය සමාලෝචනය කරලා ගත්ත වාර්තාව අනුව සහ ඇස් දෙකෙන් හැම දාම දකින දර්ශනය අනුව නම් එහෙම වෙන්නේ නැහැ.

ඇත්තටම පුත්තලම සහ හලාවත කළපු දෙක ස්වාභාවික සම්පත් දෙකක්. මේවා ආරක්ෂා කර ගැනීම සඳහා 2024-2029 දක්වා වන වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මක් තිබුණා. ඒ සැලැස්මේ කාරණා ගොඩාක් අඩංගු වෙලා තිබුණා. එකක් තමයි, ගෘහස්ථ අපද්‍රව්‍ය, ප්ලාස්ටික් හා පොලිතීන්, කර්මාන්තශාලාවල අපද්‍රව්‍ය, ඉස්සන් වගාවේදී තිබෙන අපද්‍රව්‍ය පිළිබඳ කාරණය. ඊළඟට, ජලයේ ගුණාත්මකභාවය මැනීම පිළිබඳ කාරණය. ලුණු කර්මාන්තය කිරීමේදී සමහර වෙලාවට ජලය පිට කරනවා; සමහර වෙලාවට රස්නය තිබෙන ජලයත් එක්ක විශේෂයෙන්ම ඒ අපද්‍රව්‍ය ප්‍රමාණයක් පිටවනවා මේ සම්බන්ධව අරගෙන තිබෙන තීන්දු ගැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මෙන්න මේක ගැනයි මම ප්‍රශ්න කරන්නේ. ලස්සන වචන ටිකක් ඔබතුමාට ලියලා දෙන්න ඇති. ඒකේ සඳහන් වෙච්ච කරුණු කාරණාවලට ජනතාව රැවටෙනවා. හැබැයි, ජනතාව රැවටුණාට, කළපුවෙන් පිටත මිනිස්සු රැවටුණාට, කළපුව ආශ්‍රිත මේ රැකියාව කරන කණ්ඩායම රවටන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ කළපුව අපේ ස්වාභාවික සම්පතක්. ඒ සම්පත විශේෂයෙන්ම අපේ කෘෂිකර්මයට ගන්න පුළුවන්, ධීවර කර්මාන්තයට ගන්න පුළුවන්, සංචාරක ව්‍යාපාරයට ගන්න පුළුවන්, ජෛව විවිධත්වය ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් කරන්න පුළුවන්. හැබැයි, මේකට කාලයක් තිස්සේම නිවැරදි, සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමා ගිහිල්ලා කළපුව බලන්න. ඔය කියපු බොරු ටික පොඩ්ඩක් පැත්තකින් තියන්න. ඔබතුමාගෙත් හෘදය සාක්ෂිය තිබෙනවා. ඔබතුමා ධීවරයින් එක්ක ජීවත් වෙන කෙනෙක්. 2027 වසරේදී හරි කමක් නැහැ, කළපුව සම්බන්ධව ගන්නා නිවැරදි පියවර පිළිබඳව පැහැදිලි පිළිතුරක් දෙන්න, බොරුවක් නොකියා.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු කථානායකතුමනි, වාක්‍ය රචනාවක් හා සමාන දීර්ඝ ප්‍රශ්නයක් තමයි එතුමා යොමු කර තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂය වෙනුවෙන් කළපු සංවර්ධන වැඩසටහන සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කළා. ඒ වාගේම 2026ට රුපියල් මිලියන 100ක් වෙන් කළා. තමුන්නාන්සේලාගේ පාලන කාලයේ තමයි කළපු ටික ආක්‍රමණය කළේ. ඒවා මතක නැහැ. ගරු කථානායකතුමනි, මෙතුමන්ලාගේ පාලන කාලයේ තමයි කළපු ආක්‍රමණය කළේ. දේශපාලනඥයෝ තමයි මේ කළපු ටික ආක්‍රමණය කරලා තිබුණේ. ගරු කථානායකතුමනි, අපට ඒ එකින් එක පිළිබඳවම කටයුතු කරන්න සිද්ධ වුණා. *[බාධා කිරීමක්]* ඔබතුමා පොඩ්ඩක් ඉන්න. ඔබතුමාගේ ප්‍රශ්නයට මම උත්තර දෙන්න එපායැ. ඊළඟට ඕනෑ නම්, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු කථානායකතුමනි, රුපියල් මිලියන 100ක මුදලක් වෙන් කරලා පළමු කොටස කරන්න, අපේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවයි, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි, මීපා ආයතනයයි, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන එක්ක ඒකාබද්ධ යන්ත්‍රණයක් අපි ගොඩනගා ගත්තා. ඒ යන්ත්‍රණය ගොඩනගාගෙන පළමුවෙන්ම අපට කරන්න සිද්ධ වුණා, මේ සීමා මායිම් ලකුණු කර ගන්න එක. කළපු සීමා ඉක්මවලා, ඉන් ඔබ්බට ගිහිල්ලා නිවාස ඉදි කරලා තිබුණා. ඒ කාලයේ පළාත් පාලන ආයතන උඩ බලාගෙන තමයි ඉඳලා තිබුණේ. මොකුත් කරලා තිබුණේ නැහැ, ඒ කාලය තුළ. ඒ නිසා මේ එකින් එක නීත්‍යානුකූල කටයුතු තමයි අපට කරන්න සිද්ධ වෙලා තිබුණේ, කළපු ටික ඇල්ලුවාට පස්සේ. ඒ කාලයේ ඉබාගාතේ ගිහිල්ලා තිබුණා, ඒ වැඩකටයුතු.

ගරු කථානායකතුමනි, මීගමු කළපුවේ අඩි 4, 5ක ප්ලාස්ටික් පොලිතීන් තට්ටුවක් තිබෙනවා. හලාවතත් එහෙමයි. ආනවිලුන්දාවත් එහෙමයි, තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේ. ඒ වාගේම නයාරු කළපුවත් එහෙමයි. නන්දිකඩාලුත් එහෙමයි. කොග්ගලත් එහෙමයි. අපට මේ එකින් එක සුද්ද කරගෙන යන්න සිද්ධ වුණා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, එක්කෝ එතුමාට මේ ප්‍රශ්නයට මම දීපු උත්තරය තේරෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* මට හිතෙන්නේ තේරෙන්නේ නැතුව ඇති.

2026ට අදාළව රුපියල් මිලියන 100ක මුදලක් වෙන් කළා. ඒකෙන් අපි අදාළ කළපු සංවර්ධන කටයුතුත් කළා. සීමා මායිම් මැනලාත් ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, උද්ධච්චකමින්, උඩඟුකමින් ප්‍රශ්නවලට උත්තර දෙන්න එපා කියන්න. *[බාධා කිරීමක්]* මම ප්‍රශ්නය අහන්නම්. නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ කටවහගෙන ඉන්න. මමයි ප්‍රශ්නය අහන්නේ. මේ මගේ වාරය. තමුන්නාන්සේ මොනවාද කියන්නේ? තමුන්නාන්සේ කරුණාකරලා සද්ද නැතිව ඉන්න. තමුන්නාන්සේ මතක තියාගන්න, තමුන්නාන්සේ විතරක් නොවෙයි උගතා. තමුන්නාන්සේ විතරක් නොවෙයි දන්නේ. අනෙක් අයත් දන්නවා. ඒක මතක තියාගන්න. අනෙක් අය පහත් කරලා කථා කරන්න සූදානම් වෙන්න එපා. එහෙම පහත් කළාම තමුන්නාන්සේව නැවත පහත් වෙනවා, මතක තියාගන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විවාදයකට යාමේ අවශ්‍යතාවක් නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔළුව පොඩ්ඩක් පාවිච්චි කරන්න. ඇහ තිබුණාට වැඩක් නැහැ. මොළෙත් පාවිච්චි කරන්න.

ගරු කථානායකතුමනි, කරුණාකරලා මේ අයව හදන්න. මේ අයට කියලා දෙන්න, ප්‍රශ්නවලට උත්තර දෙන විධිය. අපි අහන්නේ ජනතාවගේ ප්‍රශ්න. වෙන මොනවත් නොවෙයි. මම මුලින්ම කිව්වා තරහා ගන්නේ නැතිව කියන්න කියලා. තරහ ගත්තාම බොරු ගොඩක් කියනවා. ඒකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - Sorry, නියෝජ්‍ය වුණා ඔබතුමාව. ගරු කථානායකතුමනි, මම එහෙම ඔබතුමාව පහළට දමන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මීගමුව කළපුවේ මීලියන 98යි දශම ගණනක වැඩ කළා කියලා. හැබැයි, කිසිම දෙයක් කරලා නැහැ, ඇත්තටම, අවංකවම. මම කියන්නේ දෙවියනේ! ගිහිල්ලා කළපු බලන්න. මම මේ ඔබතුමන්ලාට වැරැද්දක් කියනවා නොවෙයි. ඔබතුමන්ලා ආණ්ඩුව වෙන්න පුළුවන්, ඔබතුමන්ලා දන්නේ නැති වෙන්න පුළුවන්, පළමුවෙනි වතාව වෙන්න පුළුවන්, ඒක වෙන ප්‍රශ්නයක්. අපි මේ කියන්නේ ඒක නොවෙයි. අපි සියලු දෙනා ගිහින් බලමු. ඔබතුමාත් එන්න. ධීවර කර්මාන්තය කරන දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාවත් එක්කගෙන ගිහින් අපි බලමු. බලලා කථා කරමු.

ගරු කථානායකතුමනි, මේ රටේ ඉතාම ස්වාභාවික සම්පතක් හැටියට තිබෙන, ප්‍රධානම දෙයක් තමයි කළපු කියන්නේ. ඉතින්, අපි එකතු වෙලා මේ කළපු හදමු. මම ඇහුවේ, ඒ වැඩ පිළිවෙළ. දැන්වත් තරහා ගන්නේ නැතිව හරියට පොඩ්ඩක් මොළේ පාවිච්චි කරලා මට උත්තරයක් දෙන්න. කළපු ටික හදනවාද, නැද්ද කියලා කියන්න.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු කථානායකතුමනි, මීගමුව කළපුවට අදාළව ගත්තොත්, රුපියල් මිලියන 350ක වියදමින් කළපුවේ ජැටියේ වැඩ ආරම්භ කරලායි තිබෙන්නේ. මේ වෙනකොට ගරු කථානායකතුමනි, එතැන ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයක් තිබෙනවා. ඒකට හේතුව තමයි, මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පිටුපස,- *[බාධා කිරීම්]* නැහැ. මම කිව්වේ ඒකයි. ගරු කථානායකතුමනි, මේ අහන්නේ මීගමුව කළපුව ගැන නොවෙයි. සමස්ත වශයෙන් මෙතුමාගේ ප්‍රශ්නයේ තිබෙන්නේ කළපු සංරක්ෂණය ගැන. කළපු සංරක්ෂණය කිව්වාම මීගමුව කළපුව පමණක් නොවෙයි, සමස්ත කළපු සංරක්ෂණයම අයත් වෙනවා. සමස්ත කළපු සංරක්ෂණය ගැනයි අහන්නේ. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, සමස්ත කළපු වෙනුවෙන් 2025 වසරේ මීලියන 100ක් වෙන් කළා. 2026 වසරේදී මීලියන 100ක් වෙන් කළා. ඔබතුමා කියන එකේත් ඇත්තක් තිබෙනවා. මොකක්ද දන්නවාද? මේ සියල්ල ආක්‍රමණය කරලායි තිබෙන්නේ. ඒකට තමයි අපි වෙනම යන්ත්‍රණයක් ගොඩ නහා ගත්තේ, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවයි, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවයි, MEPA එකයි, පළාත් පාලන ආයතනයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයි ඒකාබද්ධ කරගෙන. ඒකෙන් තමයි සීමාව අල්ලා ගෙන යන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුත්ත කරන්න අපහසුතාවක් තිබෙනවා. ඒ කියන්නේ අත්පත් කරගත් කට්ටිය නැවත දෙන්නේ නැහැ. ඒ නිසා අපිට නීත්‍යානුකූල කටයුතුවලටත් යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේවාට සීමා මායිම් දමනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා ආරාධනා කළා. මමත් ආරාධනා කරනවා, මේ කටයුත්ත කරන්න යමු කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, පිළිතුර කෙටි කරන්න.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු මන්ත්‍රීතුමනි, මිලියන 350ක වියදමින් ජැටියක් හදන්න අපි කටයුතු කරනවා. නමුත් එම කටයුතු ප්‍රමාද වෙන්න හේතුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පිටුපස එම ඉදිකිරීම් කරන නිසායි. ඉතින් දහවල් කාලයේදී ඉදිකිරීම් කරන්න දෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මොකද, ඒ ප්‍රදේශය silent place එකක් නේ. ඒ නිසා එම කටයුතු රාත්‍රී කාලයේ කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, එම කටයුතු සිදු කරන්නේ මීගමුවේ පමණයි. අනෙක් කළපුවල සීමා නිර්ණය කරන එකයි කරන්නේ.

මම කලින් කියපු පරිදි ඇත්තටම දැවැන්ත ඉටි කොළ තට්ටුවක් තිබෙනවා; විශාල ස්තරයක් උඩින් තිබෙනවා. ඒ ස්තරය තිබෙන නිසා සූර්යාලෝකය ලැබෙන්නේ නැහැ. ඔබතුමා දන්නවා, එතකොට ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය සිදු වෙන්නේ නැහැ කියලා. එතකොට ඔක්සිජන් අඩු වෙනවා. ඒ නිසා මත්ස්‍ය ගහනය අඩු වෙලා තිබෙනවා. ඒක ඇත්ත. ඒක තමයි නිවැරදි කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දීපු හොඳ ප්‍රවේශය මම අගය කොට සලකනවා. ඒ නිසා උගත් මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමාත් ඇවිල්ලා අපිත් එක්ක මේ කටයුත්තට සම්බන්ධ වෙන්න.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1379/2025- (2), ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1534/2025- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, අපේ ගරු නියෝජ්‍ය ධීවර ඇමතිතුමා කියපු කාරණයට මමත් යමක් එකතු කරමින් මම මීගමුව ආසනයේ - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න පුළුවන්. වෙන දේවල් අහන්න බැහැ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම කිව්වේ එතුමාගේ ආරාධනාව පිළිගන්නවා කියලායි. ආරාධනාව පිළිගන්නවා කියමින් මම ප්‍රශ්නය අහන්නම්.

පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරින්: 2015 සිට නිකුත් කරන ලද බලපත්‍ර

மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபைகள்: 2015 முதல் வழங்கப்பட்டுள்ள அனுமதிப் பத்திரங்கள்

PROVINCIAL ROAD PASSENGER TRANSPORT AUTHORITIES: PERMITS ISSUED FROM 2015

1534/2025

5. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා පළාත් 09 තුළ ක්‍රියාත්මක වන මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි මඟින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලපත්‍ර නිකුත් කිරීම මඟින් එක් එක් අධිකාරිය විසින් වාර්ෂිකව උපයා ඇති ආදායම පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී වංචා සිදුවී ඇති බවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் தற்போதுவரை 9 மாகாணங்களிலும் இயங்கிவரும் வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபைகளால் வழங்கப்பட்டுள்ள அனுமதிப் பத்திரங்களின் எண்ணிக்கை, மாகாண ரீதியாக யாது என்பதையும்;

(ii) மேற்படி அனுமதிப் பத்திரங்களை வழங்குவதன் மூலம் ஒவ்வோர் அதிகாரசபையும் வருடாந்தம் ஈட்டிய வருமானம், மாகாண ரீதியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அனுமதிப் பத்திரங்களை வழங்கும்போது மோசடி இடம்பெற்றுள்ளதாகக் குறிப்பிட்டு கிடைக்கப் பெற்றுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) போக்குவரத்து அனுமதிப் பத்திரங்களை வழங்கும் செயன்முறையை ஒழுங்குபடுத்து வதற்காக அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) separately, the number of permits issued by the Road Passenger Transport Authorities operating in the nine provinces, disaggregated by province since 2015 up to now;

(ii) the annual revenue collected by each authority from issuing the aforesaid permits, listed separately by province;

(iii) the number of complaints received regarding alleged fraudulent practices in the issuance of these permits; and

(iv) the measures that will be taken by the Ministry to streamline the process of issuing transport permits?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එතුමා අසා තිබෙන්නේ පළාත් නවය තුළ ක්‍රියාත්මක වන මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි මඟින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳවයි. ඇත්තටම මෙය පළාත් සභාව සතුව පවතින විෂයයක්. ගරු මන්ත්‍රීතුමනි, මෙම විස්තරය අවුරුදු වශයෙන් කියන්න ගියොත් විශාල කාලයක් ගත වන නිසා, 2015 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා පළාත් නවය තුළ නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව ගැන මා සඳහන් කරන්නම්.

බස්නාහිර පළාත තුළ 2015 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා බලපත්‍ර 616ක් නිකුත් කර තිබෙනවා. 2026 වර්ෂයේ බලපත්‍ර නිකුත් කර නැහැ.

නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව සඳහන් කර තිබෙන්නේ මෙන්න වේ විධියටයි.

බස්නාහිර පළාත - 2015 වසරේ සිට 2026 දක්වා බලපත්‍ර 616ක් නිකුත් කර තිබෙනවා. 2026 වසරේ නිකුත් කරලා නැහැ. 2015 සිට 2026 දක්වා අවුරුදු 11ට මධ්‍යම පළාත - 213යි; දකුණු පළාත - 80යි; උතුරු පළාත - 1,014 යි; නැඟෙනහිර පළාත - 143යි; වයඹ පළාත - 15,901යි; උතුරු මැද පළාත - 181යි; ඌව පළාත - 238යි; සබරගමුව පළාත - 216යි.

විස්තර ඇමුණුම 01 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

(ii) එම බලපත්‍රවලින් ලබාගත් මුදල්වල එකතුව මම කියන්නම්.

2015 සිට 2026 දක්වා කාලය තුළ බස්නාහිර පළාත - රුපියල් මිලියන 1,417යි; මධ්‍යම පළාත - රුපියල් මිලියන 2.1යි; දකුණු පළාත - රුපියල් මිලියන 161යි; උතුරු පළාත - රුපියල් මිලියන 175යි; නැඟෙනහිර පළාත - රුපියල් මිලියන 18යි; වයඹ පළාත - රුපියල් මිලියන 82යි; උතුරු මැද පළාත - රුපියල් මිලියන 9.3යි; ඌව පළාත - රුපියල් මිලියන 54යි. සබරගමුව පළාතට අදාළව එකතුව හරියාකාරව ගණනය කරලා නැහැ. ඔබතුමාට අවශ්‍ය නම් වර්ෂ අනුව කියන්න පුළුවන්.

විස්තර ඇමුණුම 02 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) ගරු කථානායකතුමනි, බලපත්‍ර නිකුත් කිරීමේදී අතීතයේදී වංචා සෑහෙන්න ප්‍රමාණයක් සිදු වෙලා තිබෙන බව මම කියන්න ඕනෑ. ඒවා සම්බන්ධ පැමිණිලි ගැන කිව්වොත්, පොලීසියට කරපු පැමිණිලි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කරපු පැමිණිලි, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවලට කරපු පැමිණිලි, ආණ්ඩුකාරතුමන්ලාට කරපු පැමිණිලි, ඒ වාගේම අපට ඉදිරිපත් කරපු පැමිණිලි ආදි වශයෙන් බැලුවාම පැමිණිලි විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම නිසා බලපත්‍ර ලබා දීමේදී සිදු වෙලා තිබෙන වංචා ගැන සම්පූර්ණ අදහසක් මෙම පිළිතුර මඟින් කොහෙත්ම එන්නේ නැහැ. නමුත්, ප්‍රශ්නයට පිළිතුරක් විධියට විතරක් මේ සඳහන් කර තිබෙන කාරණා කියන්න පුළුවන්. අප ඒ සියලු විස්තර සොයලා කියන්න ගියොත් විශාල කාලයක් ගත වෙනවා. දැනට සඳහන් කර තිබෙන ආකාරය මම කියන්නම්.

බස්නාහිර පළාත	-	01
මධ්‍යම පළාත	-	නැත
දකුණු පළාත	-	නැත
උතුරු පළාත	-	නැත
නැඟෙනහිර පළාත	-	02
වයඹ පළාත	-	නැත
උතුරු මැද පළාත	-	නැත
ඌව පළාත	-	නැත
සබරගමුව පළාත	-	නැත

මම හිතනවා, මේක ඇත්ත නොවෙයි කියලා. ඒගොල්ලන් දෙන ඒවා නේ මම ඔබතුමාට ඉදිරිපත් කරන්නේ.

(iv) ඇමුණුම 03 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මා කෙටියෙන් සඳහන් කරන්නම්. ගරු කථානායකතුමනි, දැනට මාස ගණනාවකට කලින් අන්තර් පළාත් අධිවේගී මාර්ග සහ අන්තර් පළාත් සාමාන්‍ය මාර්ග ලෙස වර්ගීකරණය කර සම්පූර්ණයෙන් බලපත්‍ර ලබා දීමට තරගකාරී, විද්‍යානුකූල ක්‍රමවේදයක් සකස් කරලා, ඒක කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරලා තිබෙනවා. ඒ නිසා දැන් ටෙන්ඩර් කටයුතු සිදු කෙරෙන්නේ ඒ ආකාරයටයි. අපි බලාපොරොත්තු වෙනවා, පළමුවෙන්ම ජාතික ගමනාගමන කොමිසම මඟින් නොවැම්බර් මාසය අගදී routes 75කට පමණ අදාළව ටෙන්ඩර් publish කරන්න. අපි පළාත් සභාවලිනුත් ඉල්ලා තිබෙනවා, කැබිනට් මණ්ඩලය අනුමත කරපු ක්‍රමවේදයම පළාත් ඇතුළේ ටෙන්ඩර් ලබා දීමේදීත් අනුගමනය කරන්න කියලා. මීට මාස කිහිපයකට කලින් අපි ලිඛිතවම එසේ ඉල්ලා තිබෙනවා. සාකච්ඡාවලදීත් මම ඒ ඉල්ලීම කර තිබෙනවා.

ඒ නිසා විනිවිදභාවයෙන් යුතුව සහ තරගකාරීත්වය ඇති වන විධියටත්, දැනට බස් කර්මාන්තයේ යෙදී සිටින බස් කර්මාන්තකරුවන්ට වැඩි අවස්ථාවක් ලැබෙන විධියටත්, ඒ වාගේම අලුතින් බස් කර්මාන්තයට එන අයට අවස්ථාව ලැබෙන විධියටත් ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. අවශ්‍ය නම් ඒ සම්බන්ධව තවත් විස්තර ඉදිරිපත් කරන්න මට පුළුවන්. නමුත්, මම හිතනවා මෙය ප්‍රමාණවත් කියලා.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තොත්, අපට පෙනෙනවා යම් යම් අවස්ථාවලදී බස් රථ සඳහා බලපත්‍ර නිකුත් කර තිබෙන බව. හැබැයි, ඔබතුමන්ලාගේ රජය ආවාට පසුව සොයා බලා තිබෙනවාද, බස් රථ කොපමණ ප්‍රමාණයක් ලංකාවට අවශ්‍යද කියලා? ඒ පිළිබඳ තොරතුරු තිබෙනවාද? ඒ කියන්නේ, ලංගමට මෙච්චර බස් ප්‍රමාණයක් අවශ්‍යයි, පෞද්ගලික බස් සේවා සඳහා මෙච්චර බස් ප්‍රමාණයක් අවශ්‍යයි, දුරගමන් සේවා සඳහා මෙච්චර බස් ප්‍රමාණයක් අවශ්‍යයි, නගරාන්තර බස් සේවා සඳහා මෙච්චර බස් ප්‍රමාණයක් අවශ්‍යයි ආදි වශයෙන්; අපේ fleet එක මෙච්චරක් තිබෙන්න ඕනෑ, එකක් කැඩුණොත් ඒකට replace කරන්න තව එකක් තිබෙන්න ඕනෑ ආදි වශයෙන්. මොකද, ලොකු තදබදයක් තිබෙනවා. ඒ පිළිබඳ යම්කිසි සංගණනයක් සිදු කර තිබෙනවාද? ඒ සංගණනයත් එක්ක රජයට අවශ්‍ය කරන fleet එක, එහෙම නැත්නම් අවශ්‍ය බස් රථ ප්‍රමාණය ලබා ගැනීමටත්, පෞද්ගලික අංශයේ බස් රථ අයිතිකරුවන්ට බස් රථ මිල දී ගැනීමටත් හැකි නිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඒ කියන්නේ, ඔවුන්ට ණයක් එහෙම ලබා දෙන්න පුළුවන්. එහෙම නැත්නම්, ලීසිං ලබා ගැනීමේදී යම් පහසුවක් ලබා දෙන්න පුළුවන්. එවැනි වැඩ පිළිවළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා ඉතාම කෙටියෙන් කියන්නම්. බස් කර්මාන්තය dynamic එකක්. ඒක මිනිසුන්ගේ හැසිරීම් ආදි විවිධ කරුණු මත නිතර වෙනස් වන එකක්. ඒ නිසා master plan එකක් ලෙස හදා ගන්නවා මිස ඒක ආසන්න බස් එකට දෙකට වටයන්න බැහැ. නමුත්, ගරු මන්ත්‍රීතුමනි, මූලික වශයෙන් අපි demand surveys කරලා තමයි routes 450ක් විතර හඳුනා ගෙන තිබෙන්නේ. එසේ demand surveys කරලා හඳුනා ගත් routes 450ට අනුව තමයි අපි බස් අවශ්‍යතාව හඳුනාගෙන තිබෙන්නේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සරලව ගත්තොත්, ලංගම කාලසටහන දුවන්න ලංගමට බස් 7,000ක් අවශ්‍යයි. කලින් ධාවනය කරපු පෞද්ගලික බස් රථ ආසන්න වශයෙන් 5,000-6,000 අතර ප්‍රමාණයක් කොවිඩ් අර්බුදයෙන් සහ ඊට පසුව ඇති වුණු ආර්ථික අර්බුදයෙන් පසුව තවම ධාවනය කරන්නේ නැහැ කියලා අපි හිතනවා. ඒකට එකම හේතුව ඒක නොවෙයි. මොකද, 2012න් පස්සේ පොදු ප්‍රවාහනය දුර්වල වීම නිසා ජනතාව පෞද්ගලික වාහන - බයිසිකල් සහ කාර් - භාවිතයට යොමු වුණා. පොදු ප්‍රවාහනය පිළිවෙළක් කරන්නේ නැතිව ජනතාව ඒවායින් නැවත පොදු ප්‍රවාහනයට ගන්න එක ලෙහෙසි නැහැ.

මම ලොකු වෙලාවක් ගන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවා නේ, බස් කර්මාන්තකරුවන්ට මොන විධියේ උදව්ද කරන්නේ කියලා. උදවු කළ යුත්තේ, ඒගොල්ලන්ට බිස්නස් එක සාර්ථකව කරගෙන යන්න පුළුවන් වෙන්න නේ. පොදු ප්‍රවාහන සේවය කරගෙන යන විධිය අනුව තමයි මිනිසුන් පොදු ප්‍රවාහනයට එන්නේ. අපි සල්ලි දුන්නාටම එන්නේ නැහැ. දැනට අපි බස් කර්මාන්තකරුවන්ට ඩීසල්වල පිඩනය නොලැබෙන විධියට අවස්ථාව හදලා දීලා තිබෙනවා. ඒ formula එකේ, දුර ගමන් බස් සේවාවලට අදාළව ඩීසල් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. අපි දැන් formula එක හරියට හදලා දීලා තිබෙනවා. අපි එවැනි ක්‍රමවේදත් එක්ක කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, අපි Cabinet එකෙන් අනුමත කරලා තිබෙනවා, ඉදිරියේදී ගෙනෙන්න පුළුවන් බස් මොනවාද කියලා. ආනන්ද විජේපාල ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් සහ කර්මාන්ත ඇමතිතුමා ඇතුළු අදාළ ඇමතිවරුන් ඔක්කෝම සම්බන්ධ වන කැබිනට් අනුකමිටුව මඟින් bus specifications අනුමත කර තිබෙනවා. ඒ නිසා ඉදිරියට ගෙනෙන්න පුළුවන්කම තිබෙන්නේ මිනිසුන්ට යන්න හිතෙන බස් විතරයි. මේක ටිකක් එහෙම ක්‍රමානුකූලව, dynamic විධියට බල බලා කරගෙන යන එකක් විධියට තමයි තිබෙන්නේ. ඕක තමයි මට කියන්න තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නයත් අහන්න. මම ඒකටත් උත්තර දෙන්නම්.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, මිනිසුන්ට යන්න හිතෙන බස් රටට ගෙනෙන එක ඉතාම වැදගත්. නමුත්, තිබෙන ප්‍රශ්නය මෙයයි. අපි සමාජයට ගියාම බොහෝදෙනා කියන දේ තමයි, මේ අය වැයෙන් යම්කිසි සහනයක් ලැබෙයි, බස් ගාස්තුව - bus fare එක - අඩුවෙයි කියන බලාපොරොත්තුව ඒ අයට තිබුණා කියන එක. ඒ, එක පැත්තකින් මගීන් බලාපොරොත්තු වුණු දේ. අනෙක් පැත්තෙන් පෞද්ගලික බස් හිමියන් බලාපොරොත්තු වුණු දේකුත් තිබුණා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා කියපු ආකාරයට, ඉන්ධන මිල පිළිබඳව ගැටලුවක් තිබෙනවා. Engine oil පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම spare partsවල ගැටලුවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, බස් maintain කරන්න ගියාම, විශේෂයෙන්ම ටයර් ඇතුළු සියල්ලක්ම ගත්තාම, ලොකු wastage එකක් තිබෙනවා. ඔබතුමා කියපු ආකාරයට ඒකට සාපේක්ෂව තමයි පෞද්ගලික අංශයේ බස් රථ 5,000ක් විතර ලංකාවේ ධාවනය වන්නේ නැත්තේ. එයට ඒකත් එක හේතුවක්. කොවිඩ් වසංගතය නිසා ඇති වුණු ආර්ථික අර්බුදයට අමතරව මේකත් හේතුවක්. මොකද, බස් එකක් නඩත්තු කර ගන්න අමාරුයි. බස් එකක් ගත්තොත්, කොන්දොස්තර මහත්මයාට ගෙවන්න ඕනෑ, ඩ්‍රයිවර් මහත්මයාට ගෙවන්න ඕනෑ. ඒ වාගේම, මේ wastage එකත් තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් මගීන්ට යම්කිසි සහනයක් ලබා දෙනවා වාගේම, බස් හිමියන්ටත් සහනයක් ලබා දෙනවාද කියන එක තමයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි ආර්ථික අර්බුදයකින් ගොඩ එමින් තිබෙන රටක් නිසා හැමකෙනාටම යම් යම් ගැටලු තිබෙනවා කියන එක ගැන විවාදයක් නැහැ. නමුත් මම හිතනවා, ඊයේ හවස ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට පොදු අය වැයක් ඉදිරිපත් කරන අතරේ, ප්‍රවාහනය වෙනුවෙන් කරන්න තිබෙන උපරිම දායකත්වය එහි හැම ක්ෂේත්‍රයටම ලබා දුන්නා කියලා. පාර හැදෙනකොට, පිළිවෙළ වෙනකොට, එලෙස ප්‍රවාහන පද්ධතිය දියුණු කරනකොට සහ digitalization වෙනකොට ඒකෙන් බස් හිමියන්ට විශාල සහනයක් එනවා. ගරු කථානායකතුමනි, නමුත් අපි තේරුම් ගන්න ඕනෑ දේ තමයි, කාටවත් අමුතු ඒකාධිකාරයක් එන්නේ නැහැ කියන එක. මුලින් ශ්‍රීලංගම බස් විතරයි තිබුණේ. ශ්‍රීලංගමය හිතාගෙන හිටියා, බස් ටික ඕනෑ විධියට ධාවනය වුණාම මිනිස්සු බස්වලට නගීවි කියලා. ඒක වුණේ නැහැ. ඊට පස්සේ ප්‍රයිවට් බස් ආවා. දැන් ප්‍රයිවට් බස් රථ හිමියන් හිතුවොත්, තමන්ගේ බස් ටික ඕනෑ ඕනෑ විධියට එහේ මෙහේ ගියාම මිනිස්සු බස්වලට නගීවි කියලා, ආණ්ඩුව බස් එක කරේ තියාගෙන ගියත් මිනිස්සු බස් එකට නගින්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවසරය ඇතුව එක විනාඩියකින් මේ කාරණය කියන්නම්. ළඟදි මැදවච්චියේ accident එකක් වුණා. මැදවච්චිය accident එකේදි 70දෙනෙක් injured. 4දෙනෙක් මිය ගියා. පරීක්ෂණ අනුව අද වෙනකොට ඔප්පු වෙලා තිබෙනවා, කැබිතිගොල්ලෑව ඩිපෝවට අයත් ලංගම බස් එකේ ඩ්‍රයිවර් මහත්මයා ගංජා සහ මත්පැන් පානය කර සිටි බව, positive බව. මම හිතනවා, තමන්ගේ බස් එකේ ඩ්‍රයිවර් කොයි විධියේ පුද්ගලයෙකුද කියන එක බස් එක අයිති ව්‍යාපාරික මහත්මයා දන්නවා කියලා. එහෙම බස් ධාවනය කර කර ආණ්ඩුවට දොස් කිව්වාට වැඩක් නැහැ. මොකද, අපි කඩයක් ඇරලා ජරා කෑම දිදී, "ආ, ඇවිල්ලා කන්න" කියලා කිව්වාට මිනිස්සු එන්නේ නැහැ. මොකද, තව කඩ තිබෙනවා නේ. ඒ නිසා මම කියන්නේ මෙයයි. අපි උපරිම වශයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයට උදවු කරනවා. අපි ඒක ඔප්පු කරලාත් තිබෙනවා. මම හිතනවා, කර්මාන්තයක් විධියට මේක හදාගන්න ව්‍යාපාරික මහත්වරුන් කටයුතු කරනවා කියලා. ඒ වාගේම සිදු වන වංචා, දූෂණ අපි අවම කර තිබෙනවා. අපි උපරිම උත්සාහ කරමින් ඉන්නවා, ඒ අයට උදවු කරන්න. Formula එක හදලා තිබෙනවා, සාධාරණව ටිකට් එකට ලැබෙන්න.

ගරු කථානායකතුමනි, මැදවච්චියේ අනතුර වුණු ස්ථානයේ තිබෙන්නේ ද්විත්ව වංගුවක්. "නෙළුම් කොළය" කියලා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයකුත් එතැන තිබෙනවා. එහි හිමිකරුවා නැති වුණේත් එතැනදීම accident එකක් වෙලා. ඒ නිසා එතැන ආරක්ෂිත පාරක් කරන්න පුළුවන් ද කියලාත් අපි බලනවා. අපි දැන් RDA එකටත් එය කියලා තිබෙනවා.

මට අවසාන වශයෙන් ගරු මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ මෙයයි. අපි පෞද්ගලික බස් කර්මාන්තයත්, ශ්‍රී ලංගමයත් කියන මේ දෙකම දිහා එක විධියටයි බලන්නේ. අපි මේ දෙකම දියුණු කරනවා. හැබැයි, මේවා කරන ව්‍යාපාරික මහත්වරුත් මේ system එකට එන්න ඕනෑ. ගංජා ගහලා, කුඩු ගහලා බස් එළවන්න ඩ්‍රයිවර්ලා දැම්මාට පස්සේ මිනිස්සු එන්නේ නැහැ. නිකම් ගෙනිච්චත් එන්නේ නැහැ. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය, ගෘහ ආර්ථික විද්‍යාව සහ සෞන්දර්ය විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු: උතුරු, නැඟෙනහිර පළාත්

ஆங்கிலம், தகவல் தொழில்நுட்பவியல், மனைப்பொருளியல் மற்றும் அழகியல் பாடங்களுக்கான ஆசிரியர் வெற்றிடங்கள்: வடக்கு, கிழக்கு மாகாணங்கள்

TEACHER VACANCIES FOR ENGLISH, IT, HOME ECONOMICS AND AESTHETIC SUBJECTS: NORTH AND EAST PROVINCES

1379/2025

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය වෙනුවට)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මේ වන විට දිවයින පුරා පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු-නැඟෙනහිර පළාත්වල තොරතුරු තාක්ෂණ, ගෘහ ආර්ථික විද්‍යාව සහ සෞන්දර්ය විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට තීරණය කර තිබේද;

(iv) එසේ නම්,මේ වන විට ගුරු සේවයට බඳවා ගෙන ඇති ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ගුරු සේවයට බඳවා ගැනීමේදී රජය විසින් පිළිගනු ලබන ඩිප්ලෝමාවන් ප්‍රදානය කරන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது நாடு முழுவதிலும் நிலவும் ஆங்கில மொழி ஆசிரியர் பதவி வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) வடக்கு, கிழக்கு மாகாணங்களில் தகவல் தொழில்நுட்பவியல், மனைப்பொருளியல் மற்றும் அழகியல் பாடங்களுக்கு நிலவும் ஆசிரியர் பதவி வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி பதவி வெற்றிடங்களை நிரப்புவதற்காக டிப்ளோமாதாரிகளை ஆசிரியர் சேவைக்கு ஆட்சேர்ப்பு செய்வதற்குத் தீர்மானம் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், தற்போது ஆசிரியர் சேவைக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள டிப்ளோமாதாரிகளின் எண்ணிக்கை, பாட வாரியாக யாது என்பதையும்;

(v) ஆசிரியர் சேவைக்கு ஆட்சேர்ப்புச் செய்யும்போது அரசாங்க அங்கீகாரம் பெற்ற டிப்ளோமாக்களை வழங்கும் நிறுவனங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of vacancies for English teachers existing Island-wide at present;

(ii) the number of vacancies for teachers of Information Technology (IT), Home Economics, and aesthetic subjects in the Northern and Eastern Provinces, separately for each subject;

(iii) whether a decision has been taken to recruit diploma holders to the teaching service to fill those vacancies;

(iv) if so, the number of diploma holders recruited to the Teaching Service so far, separately for each subject; and

(v) the institutions which award government-recognized diplomas for recruitment into the Teaching Service?

(b) If not, why?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය

(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)

(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) දත්ත කළමනාකරණ ශාඛාව මඟින් ලබා දෙන ලද තොරතුරු අනුව ජාතික හා පළාත් පාසල්හි දිවයින පුරා පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු ප්‍රමාණය එක් එක් විෂය අනුව පහත පරිදි වේ.

විෂය	ජාතික පාසල්	දිවයින පුරා පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු									මුළු පුරප්පාඩු සංඛ්‍යාව
		පළාත් පාසල්									
		බස්නාහිර	දකුණ	මධ්‍යම	වයඹ	ඌව	උතුරු මැද	නැඟෙනහිර	සබරගමුව	උතුර	
ප්‍රාථමික ඉංග්‍රීසි	41	489	199	609	140	173	298	291	125	627	2992
සාහිත්‍ය හා රසාස්වාදය	80										80
අ.පෙ.ස. (උසස් පෙළ)	265			1			167		1	4	438
සාමාන්‍ය ඉංග්‍රීසි				300	145					237	682
ඉංග්‍රීසි (සා/පෙළ)		219	25	135	112	8		28	142		669
මුළු පුරප්පාඩු සංඛ්‍යාව	386	708	224	1045	397	181	465	319	268	868	4861

(ii) උතුරු - නැඟෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මඟින් ලබා දී ඇති තොරතුරු අනුව විමසා ඇති එක් එක් විෂය සඳහා පුරප්පාඩු පහත දක්වා ඇත.

උතුරු - නැඟෙනහිර පළාත්හි විමසා ඇති විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු

විෂය	උතුරු පළාත		නැඟෙනහිර පළාත			එකතුව
	දෙමළ මාධ්‍ය	එකතුව	මාධ්‍ය			
			සිංහල	දෙමළ	ඉංග්‍රීසි	
තොරතුරු තාක්ෂණය			70	87	5	162
ගෘහ ආර්ථික විද්‍යාව	12	12				
ගෘහ ආර්ථික විද්‍යාව (උසස් පෙළ)	1	1				
සංගීතය			42	8		50
චිත්‍ර			75	220		295
නැටුම්						
එකතුව		13				507

(iii) දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා අනෙකුත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලද අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් 6-11 ශ්‍රේණි ගුරු පුරප්පාඩු සඳහා මෙම වර්ෂය තුළ උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

එමෙන්ම, 2022-2024 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් එම ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම මත ජාතික හා පළාත් පාසල්හි 6-11 ශ්‍රේණි සඳහා වන පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3- I(ආ) ශ්‍රේණියට 2027 වර්ෂයේ මුල් කාර්තුව තුළ බඳවා ගැනීමට නියමිතව ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව, ඉදිරි ගුරු අවශ්‍යතාව ද නැවත සලකා බැලිය යුතු බැවින්, එකී කාරණය මත උක්ත බඳවා ගැනීම්වලින් අනතුරුව තවවුරටත් මෙම විෂයයන්හි පුරප්පාඩු පවතින්නේද යන්න ගණනය කිරීමකින් තොරව ඉදිරි බඳවා ගැනීම් සම්බන්ධව නිශ්චිත තීරණයකට එළැඹිය නොහැකිව ඇත.

(iv) 2021.03.15 දිනැතිව දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා පළ කරන ලද පුවත්පත් නිවේදනයට අනුව, 2021.12.12 දින පවත්වන ලද තරග විභාගයේ ප්‍රතිඵල මත හා අමප/23/1568/607/121 හා 2023.10.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි විෂය ගුරු පුරප්පාඩු සඳහා එකී විභාගය සමත් ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීමට කටයුතු කරන ලද අතර, එහිදී සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතුරින් සම ලකුණු ලබා තිබූ අයදුම්කරුවන් සිටීම ද සලකා ඉංග්‍රීසි විෂය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට ඉංග්‍රීසි උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් (HNDE) 501 ක් බඳවා ගැනීමට කටයුතු කර ඇත. එම ඩිප්ලෝමාධාරීන්ට අමතරව ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ආ) ශ්‍රේණියට බඳවා ගැනීම සිදු කරනු ලබයි. ඒ අනුව, 2020 වර්ෂයේ සිට මේ දක්වා උක්ත සඳහන් ඩිප්ලෝමාධාරීන් වර්ග දෙක යටතේ බඳවා ගන්නා ලද සංඛ්‍යාවන් පහත පරිදි වේ.

අනු අංකය	විෂය	පත්වීම් ලබා ගත් සංඛ්‍යාව	
01	ඉංග්‍රීසි උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් (HNDE)	501	
02	ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් (උක්ත සඳහන් විෂයයන් ද ඇතුළුව බඳවා ගන්නා ලද සමස්ත සංඛ්‍යාව)	වර්ෂය	සංඛ්‍යාව
		2019	4302
		2020	155
		2021	3728
		2022	4645
		2023	7391
		2024	320
		2025	3987
		2026	91

(v) තෘතියික අධ්‍යාපන ආයතනයට අනුව ඉංග්‍රීසි උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් (HNDE) 501 සඳහා සලකා බලන ලද ආයතන පහත දක්වා ඇත.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලය

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

2026 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ ප්‍රාග්ධන වියදම් භාවිතය අඩු වීම
2026 சனவரி முதல் யூன் வரையான காலப்பகுதியில் மூலதனச் செலவின் குறைந்த பயன்பாடு
LOW UTILIZATION OF CAPITAL EXPENDITURE FROM JANUARY TO JUNE, 2026

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, the Mid-Year Fiscal Position Report - 2026 released by the Ministry of Finance, Planning and Economic Development on 31st October, 2026 under Section 50 of the Public Financial Management Act, No. 44 of 2024 reports a primary surplus of Rs. 1,244.1 billion from January to June, 2026 against the IMF end-June target of Rs. 72 billion. The Report states that this was "mainly supported by higher revenue collection and lower execution of capital expenditure."

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

According to the Report, capital expenditure and net lending amounted to Rs. 277 billion or 16.1 per cent of the annual estimate of Rs. 1,719 billion.

Aswesuma is the Government's main cash-transfer programme for low-income families. Of the Rs. 231 billion allocated in 2026 for Aswesuma and other household cash grants, Rs, 89.6 billion or 38.8 per cent was spent in the first six months.

Accordingly, as a matter of urgent public importance, I request the Hon. Minister to clarify the following:

Hon. Speaker, this is a very important Question because we are going to debate the Budget Proposals for 2027 without knowing the actual expenditure and the revenue figures of 2026. විපක්ෂ නායකතුමාත් මීට කලින් මේ ගැන අහලා තිබුණා. නමුත්, තවම මේකට උත්තරයක් ලැබිලා නැහැ.

1. Which five Ministries recorded the lowest utilization of their 2026 capital allocations as at 30th June, 2026?

   At the Committee Stage, we are going to have Discussions on how much has been allocated to each Ministry. But, we are going to have the Discussions without knowing last year's expenditure, how much the Ministries have spent and so on.

2. What were the main reasons reported by Ministries for the low utilization of capital allocations between January-June, 2026?

   We are not asking for figures up until October, 2026 because we understand that that quarter had just ended. So, what we are asking is to, at least, go by the basis of the first six months.

3. What was the value of bills for completed works received by the Ministry of Finance from other Ministries, but not yet paid as at 30th June, 2026?

4. Will any unspent 2026 capital allocation be reallocated by the Ministry of Finance to other purposes before 31st December, 2026, and if so, to which purposes?

   We saw the Hon. President yesterday boasting about a Budget surplus. Sir, I understand keeping some money as a contingency fund. But, if we have excessive money, will we be spending it before the end of the year?

5. Will the Government use the unspent balance of the Rs. 231 billion cash-grant allocation to increase Aswesuma coverage or benefit amounts before the end of 2026?

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාත් මීට පෙර අවස්ථා කිහිපයකදීම මේ ප්‍රශ්නය අහලා තිබුණා. නමුත්, අද වෙනතුරු අපට පිළිතුරු ලැබිලා නැහැ. අපි අද මේ අය වැය විවාදයට යන්නේ පසුගිය අවුරුද්දේ වියදම් පිළිබඳව දන්නේ නැතුව. ඉතින්, මේ විවාදයට අපි යන්නේ කොහොමද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙන නිසා තමයි, මේ ප්‍රශ්නය හදිසියේම ඉදිරිපත් කළේ. මොකද, අස්වැසුම reallocate කළාම ඒක යම් පිරිසකට අහිමි වෙලා, තවත් පිරිසකට ලැබෙනවා. එතකොට ඉතුරු කරගත් මුදල්වලින් ඒ අයට ගෙවන්න තිබුණා නේ. මේ ප්‍රශ්නවලට පිළිතුරක් ලැබුණොත් තමයි අපට මේ විවාදයට යන්න පුළුවන් වෙන්නේ. ඒ පිළිතුරු නැතිව, තොරතුරු නැතිව කොහොමද විවාදයට යන්නේ? ජනාධිපතිතුමා කියනවා, දත්ත වැදගත් කියලා. නමුත්, මේ විවාදයට දත්ත නැතිව යන්න වෙන තත්ත්වයක් තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට ලබන සතිය තුළ පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2027, දෙවන වර කියවීමේ විවාදය. පළමුවැනි වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2027
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2027
APPROPRIATION BILL, 2027

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [නොවැම්බර් 12]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රශ්නය යළින් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 12]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [12th November]

"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]

Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, the Hon. Sajith Premadasa. You have 40 minutes.

[පූ.භා. 10.28]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, අපි ඊයේ දවසේ දුටුවා, බුදුරජාණන් වහන්සේගේ උතුම් ධර්මය උපුටාගෙන ජනාධිපතිතුමා මුදල් අමාත්‍යාවරයා හැටියට අය වැය කථාව ඉදිරිපත් කරනවා. මම ගරු ජනාධිපතිතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. රාජ්‍ය පාලනය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව සඳහන් වෙන වැදගත්ම සූත්‍රය තමයි, චක්‍රවර්ති සිංහනාද සූත්‍රය. එහි සඳහන් වෙනවා, කොහොමද රට පාලනය කරන්නේ, කොහොමද බදු අය කරන්නේ, කොහොමද සංවර්ධනය කරන්නේ, කොහොමද සුබසාධනය ක්‍රියාත්මක කරන්නේ කියලා. චක්‍රවර්ති සිංහනාද සූත්‍රය උපුටාගෙන ජනාධිපතිවරයා ඉදිරිපත් කරපු අය වැය කථාව අපි ඒ සූත්‍රයත් එක්ක සංසන්දනය කළොත්, අකටයුතුකම්, අසාධාරණකම්, අයුක්තිය, පීඩනය, අසහනය, සංකෝචනය, තෙරපීම යනාදී වශයෙන් හැම පීඩනකාරී තත්ත්වයක්ම ජනතාවට නිර්මාණය කරන අය වැයක් හැටියට තමයි අපට මේ අය වැය හඳුන්වන්න වෙන්නේ.

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම අපි නිරීක්ෂණය කළා, ජනාධිපතිතුමා කථා කළේ දෙලොවක් අතර අතරමං වෙලා වාගේයි. මොකද, එතුමා දේශපාලන ජන්මයෙන්ම මාක්ස්වාදීයි. හැබැයි ඒ ප්‍රතිපත්ති අමතක කරලා, දැන් නව ලිබරල්වාදී ප්‍රතිපත්තියේ කප්පිත්තෙක් බවට පත්වෙලා තිබෙනවා. ඉතින්, ඇත්තවශයෙන්ම එතුමා දෙලොවක් අතර තනි වෙලා - හුදෙකලා වෙලා -, අසරණභාවයට පත්වෙලා සිටින මොහොතක කළ අය වැය කථාවේදී එතුමා කියනවා අපි දැක්කා, සොහොන් පිටිවල නූල් ගැන, වස් කවි ගැන. මම හිතන විධියට, ඕවා ගැන කලබල විය යුතු නැහැ. ඔය හූනියම්, සොහොන් පිටිවල කරන දේවල්, ඕවා හැමෝටම කරන දේවල්; අපටත් කරනවා ඇති. ඒවා සුපුරුදු දේවල්. වැදගත්ම දේ මොකක්ද? "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" - චේතනාව පිරිසිදු වෙන්නට ඕනෑ. කුසලය අකුසලය අවබෝධ කරගෙන, පිරිසිදු චේතනාවෙන් ක්‍රියාත්මක වනකොට ඔය සොහොන් පිටිවල නූල්වලටයි, හූනියම්වලටයි, වස් කවිවලටයි බය වෙන්න දෙයක් නැහැ. අපට දැන් හූනියම් කළත් එකයි, නැතත් එකයි. අපි හැමෝටම දයාව, අනුකම්පාව, කරුණාව, පළි නොගැනීම, මෛත්‍රිය කියන හැමදේම ක්‍රියාත්මක කරනවා.

නමුත් මේ අය වැය ගැන බලනකොට නම් මම හිතන්නේ නැහැ, ඒක පිරිසිදු චේතනාවෙන්, අවංක අරමුණෙන් නිර්මාණය වුණු අය වැයක්ය කියලා. පැය පහක අය වැය කථාවක් අපි අසා සිටියා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේක ජනතා විමුක්ති පෙරමුණේ පළමුවැනි අය වැය නොවෙයි කියලා. ඔබතුමන්ලාට මතක ඇති, පළමුවැනි අය වැය. නලින්ද ජයතිස්ස ඇමතිතුමාට අමතකද දන්නේ නැහැ. මම හිතන විධියට, ඒ වෙලාවේ ඔබතුමා හිටියේ නැහැ, පාර්ලිමේන්තුවේ. බිමල් රත්නායක ඇමතිතුමා ඉන්න ඇති. ඒ තමයි, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් හවුල් කරගෙන හදපු අය වැය. මතකයි නේ. සරත් අමුණුගම මැතිතුමා ඉදිරිපත් කළේ. ඒකට කිව්වේ, "සරදියෙල්ගේ අය වැය" කියලා. මතකද? එතකොට ඒ සරදියෙල්ගේ අය වැයෙන් මොකක්ද වුණු පොරොන්දුව? පොහොසතුන්ගෙන් අරගෙන දුප්පතුන්ට දෙනවාය කියන කාරණාව. ඉතින් මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි, UPFA එකත් එක්ක ඉදිරිපත් කරපු ඒ original ජේවීපී අය වැයෙන් මොනවාද කිව්වේ කියලා. ලෝක බැංකුවට ගහලා තිබෙන plug එක ගලවනවාය කිව්වා නේද? කිව්වා නේද? IMF එකේ ප්‍රධාන මූලස්ථාන ඉවත් කරනවාය කිව්වා නේද? සූර සරදියෙල් අය වැයක් ලබා දෙනවාය කිව්වා නේද? ඒ නිසා මම මේ අවස්ථාවේදී වර්තමාන රජයට මතක් කර දෙන්නට ඕනෑ, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා - ජේවීපී එක - ජනාධිපතිකමත් අරගෙන, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකත් අරගෙන, පළාත් පාලන ආයතන බහුතරයකත් බලය අරගෙන දැන් ඉදිරිපත් කරලා තිබෙනවා, හොඳ බොක්සිං අය වැයක්; මොහොමඩ් අලී අය වැයක්; බඩට ගහන අය වැයක්; පොඩි මිනිහාගේ බඩට ගහලා, දුප්පතුන් කොන් කරලා, පොහොසතුන්ට තැන ලබා දෙන අය වැයක්. මම ඒ තර්කය කරුණු කාරණා, සාක්ෂි සහිතව ඔප්පු කරන්න සූදානම්. බිමල් රත්නායක මැතිතුමාට මම කියන්න කැමැතියි, මේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයයි, මේ 2027 අය වැයයි පොඩ්ඩක් සංසන්දනය කරන්න කියලා. පොඩ්ඩක් සංසන්දනය කරන්න. අන්න ඒ කාරණාව මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

දැන් ඔබතුමන්ලා බලයට පත් වන්නට මොකක්ද, කරපු රහපෑම? පහුගිය දවසකත් නියෝජ්‍ය ඇමතිවරයෙක් බොහොම ලස්සන රහපෑමක් කළා. ඒක නිකම් හත්වෙනි මණ්ඩලයේ නොවෙයි, සුපිරිම රහපෑමක්. ඔබතුමන්ලා බලය ගන්න මොකක්ද කිව්වේ? මොකක්ද ගහපු චිත්‍රපටය? "දුප්පතාගේ හිතවතා." දුප්පතාගේ හිතවතා කියලා රහපාලා, නැටුම්, ගැයුම්, වැයුම් කරලා, ගොයම් කාලා හැමදේම කරලා ජනාධිපතිකම ගත්තා; පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලය ගත්තා; පළාත් පාලන ආයතනවල බලය ගත්තා. හැබැයි බලය ගත්තාට පස්සේ, දැන් චිත්‍රපටය වෙනස්. දැන් චිත්‍රපටය "කඩවුණු පොරොන්දුව." කඩවුණු පොරොන්දුවේ අධ්‍යක්ෂණය, නිෂ්පාදනය, තිර රචනය, කැමරාකරණය කියන ඔක්කෝම අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ප්‍රමුඛ, - අපේ අගමැතිතුමිය පොඩ්ඩක් අහක බලාගෙන ඉන්නවා - අගමැතිතුමිය ප්‍රමුඛ වර්තමාන තුනෙන් දෙකේ ආණ්ඩුව.

ඔබතුමන්ලා බලයට ආවේ 76 වසරක ශාපය ඉවත් කරන්න; system එක සහමුලින්ම change කරන්න. ලොව්තුරා බුදු රජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා, "ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට" කියලා. ඒ වාගේම "අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ - අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතො" කියලා දේශනා කර තිබෙනවා. අනුන්ට බණ දේශනා කරන්න පෙර තමන් සුදුසු ගුණයෙහි පිහිටා සිට කටයුතු කරන්න ඕනෑ. මොකක්ද වෙලා තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවට? ඉස්සෙල්ලාම ගෙනාවා, Vote on Account එකක් - අතුරු අය වැයක්. ඊට පස්සේ ගෙනාවා, 2025 අය වැය. ඒ අය වැය ගෙනැල්ලා මොකක්ද කිව්වේ? අපොයි! ඉපදුණු හැටියේම ඇවිදින්න බැහැයි කිව්වා. පොඩ්ඩක් කල් ඕනෑය කිව්වා. ඊට පස්සේ 2026 අය වැය? ඉපදිලා බඩගානවා විතරයි. තවම පුරුදු වෙනවාය කියලා එතකොට කිව්වා. කවුද මේ කියන්නේ? ජේවීපී දරුවා. එතකොට මේ තුන්වැනි අය වැය. 2027 අය වැය. මේකේ කර්තෘත්වයයි, පිතෘත්වයයි භාර ගෙන ඔබ මාක්ස්වාදයෙන් පිට පැනලා නව ලිබරල්වාදයේ - neoliberalism - කප්පිත්තෝ - captainsලා - බවට පත් වෙලා තිබෙනවා; සුපිරි captainsලා බවට පත් වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම කථා කළොත් බිමල් රත්නායක ඇමතිතුමනි, මේ ආණ්ඩුව යන්නේත් ගිය ආණ්ඩුව ගිය අඩිපාරේමයි. ඒක තමයි සත්‍යය; ඒක තමයි යථාර්ථය.

කෝ, ඔබ පොරොන්දු වුණු විදේශ ආයෝජන? ඇත්තවශයෙන්ම 2025දී විදේශ ආයෝජන වශයෙන් අපේ රටට ඇවිල්ලා තිබෙන්නේ, ඇමෙරිකානු ඩොලර් බිලියනයයි. හැබැයි, පිටට යෑම තරගෙට සිද්ධ වෙනවා. ඒ සඳහා උදාහරණ මම ඔබතුමන්ලාට කියන්නම්. විශේෂයෙන්ම මම ඔබතුමන්ලාට

[ගරු සජිත් ප්‍රේමදාස මහත]

කියන්න කැමැතියි, China Merchants Port Holdings - Colombo Port Logistics Hub - එළියට ගියා; Amber Adventures එළියට ගියා; United Petroleum එළියට ගියා; Petronet LNG - Kerawalapitiya Project එක - එළියට ගියා; China Harbour Engineering Company - Floating LNG Terminal එක - එළියට ගියා. Incoming මොනවත් නැහැ නේ. ඔක්කෝම outgoing නේ; ඔක්කෝම පිටට යන එක නේ තිබෙන්නේ. එදා ඇඟලුම් කම්හල් 200 වැඩසටහනේ මූලිකයෝ වුණු MAS Holdings, Brandix, Hirdaramani, factories කීයක් අද වන විට අපේ රටේ වහලාද? අපේ රටේ තිබෙන factory එක වහලා පිටරට ගිහිල්ලා පටන් ගන්නවා, කර්මාන්ත පුරවරයක්. මෙහේ එකක් වහලා එහේ ගිහිල්ලා පටන් ගන්නවා, 10ක්, 15ක්, 20ක්. එතකොට කෝ, රැකියා උත්පාදනය? කොහෙන්ද රැකියා නිර්මාණය වෙන්නේ? අපි දන්නවා, 159කට - තුනෙන් දෙකකට - පාර්ලිමේන්තුවේ රැකියා ලැබී තිබෙනවා කියලා. මම අහන්නේ ඒ අය ගැන නොවෙයි. මම අහන්නේ රටේ විරැකියාවෙන් පෙළෙන තාරුණ්‍යය ගැන, පුංචි මිනිස්සු ගැන, සාමාන්‍ය ජනතාව ගැන. අද ජීවන වියදම අහස උසට නැඟලා. අද වනකොට රතුන් බඩු උකස් කිරීම පිළිබඳව පොඩ්ඩක් හොයා බලන්න. ඒ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඔබතුමන්ලා බලයට ආවේ ලස්සන ජීවිතයක් හදන්න. නමුත් කරලා තිබෙන්නේ ජීවිත අවලස්සන කරන එක. පොහොසත් දේශයක්, පොහොසත් රටක් නිර්මාණය කරන්න ඔබතුමන්ලා බලයට ආවේ. නමුත්, ඔබතුමන්ලා කරලා තිබෙන්නේ දුප්පත්කම ප්‍රවර්ධනය කරන එක.

මම දැන් වැදගත් කාරණාවක් ඉදිරිපත් කරන්නයි හදන්නේ. මම ඊට අදාළ ලේඛනය ඉදිරියේදී සභාගත කරන්නම්. මේ කාරණාව සංඛ්‍යාලේඛන අනුව සියයට සියයක් සත්‍යයක්. 2019 - 2025 අතර ආදායම ඉහළ පෙළ වෙත බෙදී ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, දුප්පතාගෙන් පොහොසතාට. ඒක ඉතාම පැහැදිලියි. පහළ ස්තරයේ සිටින පිරිසගේ ආදායම තියුණු ලෙස අඩු වෙලා තිබෙනවා. මේ කාල සීමාව තුළ දුප්පත්ම සියයට 20ක් වූ පිරිසගේ සැබෑ කුටුම්බ ආදායම ප්‍රතිශතාත්මකව 19.6කින් පහළ වැටිලා තිබෙනවා. ඉහළ ස්තරයේ ධනය වර්ධනය වීම ගත්තාම, ධනවත්ම සියයට 20කගේ සැබෑ කුටුම්බ ආදායම සියයට 6.8කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ධනවත්ම සියයට 20යි, දුප්පත්ම සියයට 20යි. සාමාන්‍ය ආදායම ගත්තාම, දුප්පත්ම සියයට 20ක පිරිසගේ සාමාන්‍ය ආදායම මෙන් 11.2 ගුණයකින් පොහොසත්ම කට්ටියට වැඩි වුණාට, ඒ පරතරය මේ වනවිට 14.8 ගුණයක් වෙලා තිබෙනවා. දුප්පතුන් තවත් දුප්පත් වෙලා, පොහොසතුන් තවත් පොහොසත් වෙලා තිබෙනවා. වැඩ කරන ජනතාවගේ පවුල්වලට අයත් පංගුව හැකිළිලා තිබෙනවා. දුප්පත්ම සියයට 20කගේ ආදායම් පංගුව සියයට 4.6 සිට සියයට 3.8 දක්වා පහළ වැටිලා තිබෙනවා. හැබැයි, එහෙම වෙනකොට විශේෂයෙන්ම පොහොසත්ම අයගේ පංගුව ඉහළ ගිහිල්ලා තිබෙනවා. ධනවත්ම සියයට 20 හිමිකර ගන්නා ආදායම් පංගුව සියයට 51.4 සිට සියයට 55.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒකට හේතු වෙලා තිබෙන්නේ ප්‍රමාණවත් වැටුප් නොලැබීම, උද්ධමනය අධික වීම, ජීවත්වීමේ ආධාරක ක්ෂය වීම. ඒ කියන්නේ, කුටුම්බවලින් සියයට 50කට ඉතුරුම් වියදම් කරන්නට සිදු වෙලා තිබෙනවා. සියයට 32කට වත්කම් විකුණා දමන්නට සිදු වෙලා තිබෙනවා.

ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා කියනවා නේ, යථා තත්ත්වයට පත් වුණා කියලා. යථා තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ට්‍රිලියනපතියාගේ, උග්‍ර පොහොසතාගේ වාසියට. නමුත්, යථා තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ දුප්පතාගේ, සාමාන්‍ය ජනතාවගේ, වැඩ කරන ජනතාවගේ, මැද පන්තියේ අවාසියට කියන එක මම මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි. ඒ නිසා විශේෂයෙන්ම මම මේ සමීක්ෂණය පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය ගරු නියෝජ්‍ය මුදල් ඇමතිවරයාගේත්, ගරු ජනාධිපතිවරයාගේත් වැඩි අවබෝධය සඳහා **සභාගත*** කරනවා.

ඔබතුමන්ලා සිප වැලඳ ගන්නා ආයතන කිහිපයක් තිබෙනවා නේ. IMF එක බදා ගන්නවා, උම්මා දෙනවා. ලෝක බැංකුව බදා ගන්නවා, උම්මා දෙනවා. ආසියානු සංවර්ධන බැංකුව බදා ගන්නවා, උම්මා දෙනවා. දැන් ඔබතුමන්ලා උම්මා දෙන ලෝක බැංකුව, දුප්පත්කම ගැන මොකක්ද කියන්නේ? මේක හොඳට අහගන්න, ලෝක බැංකුව මොකක්ද කියන්නේ කියලා. World Bank Group එකේ "Sri Lanka Development Update: October 2026" වාර්තාව තමයි මේ. ඔබතුමන්ලා උම්මා දෙන, සිප වැලඳ ගන්නා World Bank එක කියනවා, 2025 වර්ෂයේ දුප්පත්කම සියයට 61.1 කියලා. World Bank එක කියනවා, අපේ රටේ සියයට 60ක් දුප්පත් කියලා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කියන්නේ? ඇත්තටම මේකට ඔබතුමන්ලා වාගේම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවත් වග කියන්නට ඕනෑ. ඒගොල්ලන් නිර්මාණය කරලා තිබෙනවා,- *[බාධා කිරීමක්]* පව් නේ, මම අගමැතිතුමියට විරුද්ධව මේවා එහෙම පෙන්වන්න හොඳ නැහැ. ඔබතුමිය kiss කරන පින්තූරයකුත් තිබෙනවා. කමක් නැහැ, ඒක සාමාන්‍යයෙන් ආචාර කිරීම. මොනවාද ඔබතුමන්ලා මට පෙන්වන්න දුන්නේ? එහෙම කරන්න එපා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාවන්තිස්ස,- *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනේ, මම ඔබතුමාට උත්තරයක් දෙන්නම්. කාවන්තිස්සට උම්මා දෙන එක මසුරන් වටිනවා, IMF එකේ ප්‍රධානියාට උම්මා දෙනවාට වැඩිය. *[බාධා කිරීම්]* මොනවාද මේ පිස්සු කථා කරන්නේ? *[බාධා කිරීම්]* ඔබතුමාට ඒ උම්මා එකේ වටිනාකම තේරෙන්නේ නැහැ. ඔබතුමා ඉතින් උම්මා දීලා නේ, කොළඹ යට කර ගත්තේ. *[බාධා කිරීම්]* ඉන්න පොඩ්ඩක්, කථා කරන්න ඉඩ දෙන්න.

World Bank එකේ වාර්තාව අනුව කියනවා, ජනගහනයෙන් සියයට 61ක් දුප්පත් කියලා. කවුරු හරි ඒක බොරු කියලා කියනවාද? මම කියන්නේ බොරුවක් කියලා කියනවාද? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමන්ලාගේ කථාවලදී ඒ ගැන කියන්න. මට බාධා කරන්න එපා කියන්න, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]* මම ජනාධිපතිතුමාගේ කථාවට බාධා කළේ නැහැ. *[බාධා කිරීමක්]* මෙන්න මේක තමයි මහ පොළොවේ සත්‍යය, මහ පොළොවේ යථාර්ථය.

නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මම මේ කියන්න යන කාරණය ඔබතුමාට වැදගත්. එක පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය කිලෝ කැලරි 2,030 කියලා ඔබතුමන්ලා කියනවා. ඒක

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සම්පූර්ණයෙන් වැරදියි. ඔබතුමා යටතේ තිබෙන Medical Research Institute - MRI - එකෙන් ඒ ගැන අහන්න. පුරුෂ පක්ෂයේත්, කාන්තා පක්ෂයේත් තමතමන්ගේ ක්‍රියාශීලීත්වය අනුව අවශ්‍ය කිලෝ කැලරි ප්‍රමාණය වෙනස් වෙනවා. කිලෝ කැලරි 2,030 කියන සාමාන්‍ය අගය ගත්ත එක වැරදියි. ඒ වැරැද්ද තුළ තමයි ඔබතුමන්ලා ලොකුම ලොකු වරදක් කරන්නේ. නලින්ද ජයතිස්ස ඇමතිතුමාටත් ඒක තේරිලා හිනා වෙනවා. මම කියන දේ ඇත්ත නේද? රුපියල් 17,742ක් අවශ්‍යයි, එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න. මේ, වැරදි දත්ත, අසත්‍ය දත්ත. ඔබතුමන්ලා උම්මා දෙන ලෝක බැංකුවේ වාර්තාවත් එක්ක පොඩ්ඩක් සසඳා බලන්න. ඇත්තවශයෙන්ම රුපියල් 17,000කින්, 18,000කින් එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න පුළුවන්ද? කිලෝ කැලරි 2,030 කියන ගණනය කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි. *[බාධා කිරීමක්]*

එහෙම නම් මම ඔබතුමන්ලාට තව වාර්තාවක් ඉදිරිපත් කරන්නම්කෝ. ඒ, UNDP එකේ වාර්තාව. මේකට කියන්නේ බහුමාන දරිද්‍රතා වාර්තාව කියලා. මේ වාර්තාවෙනුත් පෙන්වන්නේ මොකක්ද? අපේ රටේ දුප්පත්කම ඉතාම බරපතළ ලෙස ඉහළ ගිහින් තිබෙන බව. දැන් ඒක එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. මේක තමයි මහ පොළොවේ සත්‍යය, මහ පොළොවේ යථාර්ථය.

දැන් මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි, මේ අය වැය තුළ කෘෂි කර්මාන්තයට සාධාරණත්වයක් ඉෂ්ට වෙලා තිබෙනවාද කියලා. කෝ, අර ගොයම් කකා ගොවීන්ට පොරොන්දු වුණු වී කිලෝවකට රුපියල් 150ක් දෙනවාය කියපු මිල? අද වී කිලෝවක් විකුණන්නේ රුපියල් 85ට, 90ට, 95ට. වී කිලෝවක උපරිම මිල රුපියල් 95යි. ගොයම් කකා කිව්වේ වී කිලෝවකට රුපියල් 150ක් දෙනවාය කියලා නේ. ගරු කථානායකතුමාත් නියෝජනය කරන දිස්ත්‍රික්කයේ,- ඔබතුමා උත්තර දෙන්න එපා, ගරු කථානායකතුමනි. හදවතින් හිතා ගන්නකෝ, වී ගොවියාට වී කිලෝවකට කීයද දෙන්නේ කියලා. අපි ඇත්ත කථා කරමු.

ඔඩපණ ණය ලබා දීලා, පොලී රහිත රුපියල් මිලියන 25ක් ලබා දීලා කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් හරහා වී මිල ඉහළ දමනවාය කිව්වා. නමුත්, ඒක ක්‍රියාත්මක කරලා නැහැ. වී ගොවිතැන විතරක් නොවෙයි, ලොකු ලූනු, අර්තාපල්, මිරිස්, ගොඩ භෝග වගාව, පලතුරු වගාව, අපනයන භෝග වගාව කියන හැම එකක්ම අද කඩා වැටිලා තිබෙනවා. උඩ රට එළවලු වගාවත් සහමුලින්ම කඩා වැටිලා තිබෙනවා. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, මේ අය වැය හරහා ඔබතුමන්ලා කෘෂි කර්මාන්තය වෙනුවෙන් අබමල් රේණුවක දෙයක්, සහනදායී දෙයක් ඇත්තවශයෙන්ම ලබා දීලා නැහැ කියන එක. ඒක තමයි මහ පොළොවේ සත්‍යය.

ඊළඟට මම ඔබතුමන්ලාට විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. ගරු අගමැතිතුමියනි, මතකද මේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඔබතුමියලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය? මේ පොතේ තිබෙනවා, බලයට ආපු වහාම IMF එකත් එක්ක තිබෙන Debt Sustainability Agreement එක වෙනස් කරනවාය කියලා. මම දන්නවා, මා කථා කරන මතයේ කවුරු නැති වුණත් බිමල් මැතිතුමා නම් ඉන්නවාය කියලා. *[බාධා කිරීමක්]* Debt Sustainability Agreement - DSA- එක වෙනස් කරනවාය කිව්වා. නමුත් වෙනස් කළේ නැහැ නේ. ආපු ගමන්ම, මිනිස්සුන්ව තෙරපලා, පාගලා, මිරිකලා, විනාශ වෙන අර IMF Agreement එකට ඔබ අත ඔසවලා, හිටපු එක්කෙනාටත් වඩා හොඳින් දැන් ඒක කරගෙන යනවා. ඒක නේ දැන් උම්මා දිදී කරන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කවුද, හිටපු එක්කෙනා?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා. ඔබතුමාට ඒ තරම්ම මතක් කර ගැනීමේ අර්බුදයක් තිබෙනවාද? *[බාධා කිරීමක්]* සිදු වුණු දේවල් මතක් කරගන්න. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මම හිතන විධියට, අපි හොඳ මිනිස්සු කණ්ඩායමක් එක්ක එක්කහු වෙනවාට බයේ බිමල් මැතිතුමා මේ ප්‍රශ්න අහන්නේ. ඒ හොඳ කට්ටිය එක්ක අපි එක්කහු වෙනවා, බය වෙන්න එපා. අපට තිබෙනවා, හොඳ filtration system එකක්. අපි හොඳට පෙරලා, කිරලා, මැනලා, බලලා ඒ වැඩකටයුතු කරන්නේ. ඒ ගැන කලබල වෙන්න එපා.

දැන් මම අහන්න කැමැතියි, DSA එක වෙනස් කරනවා කියපු පොරොන්දුව ක්‍රියාත්මක කළාද කියලා. ක්‍රියාත්මක කළාද, බිමල් රත්නායක ඇමතිතුමනි? ක්‍රියාත්මක කළාද? නැහැ නේ. රැවැට්ටුවා නේ. මේ කළේ ලොකුම ලොකු රැවටිල්ලක් නේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්නම්, එයිනුත් එහාට ගිය කතන්දරයක්. වැඩිය කවුරුත් ඒ ගැන කථා කරන්නේ නැහැ. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරුවන් එක්ක අවබෝධතාව - එකඟතාව - ඇති කර ගන්න යාමේදී ජාත්‍යන්තර කොම්පැනියක් මැදිහත් වුණා. මම ඒ කොම්පැනියේ නම කියන්නත් බය නැහැ. ඒ, ලසාර්ඩ්. ලසාර්ඩ් කියන කොම්පැනිය ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණයට මැදිහත් වුණා වාගේම, ඊට සමකාලීනව ඝානාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණයටත් මැදිහත් වුණා, සැම්බියාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණයටත් මැදිහත් වුණා. ඔබතුමන්ලා සියලු දෙනාටම මේක වැදගත් කාරණාවක්. එම නිසා පොඩ්ඩක් අහගන්න. කාටද, නරකම ඩීල් එක දුන්නේ? අපට. ඝානාව අරගෙන තිබෙනවා, හොඳ ඩීල් එකක්. සැම්බියාව අරගෙන තිබෙනවා, හොඳ ඩීල් එකක්. මේ, එකම කොම්පැනිය. ලසාර්ඩ් කොම්පැනිය ලංකාවට නරක ඩීල් එකකුත්, ඝානාවටයි, සැම්බියාවටයි හොඳ ඩීල් එකකුත් දෙන එක ගැන හොයලා බලන්න.

ගරු කථානායකතුමනි, මේ ගහපු අවාසිදායක, හොර ඩීල් එකේ Macro-linked Bonds කියලා දෙයක් තිබෙනවා. මේක හොඳට අහගන්න. මේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරුවන් එක්ක ගහපු ඩීල් එකේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් එකඟ වෙනවා, haircut එකකට; ඒ කියන්නේ ණය අඩු කිරීමකට; ගෙවන්න තිබෙන මුදල අඩු කිරීමකට. මොකක්ද Macro-linked Bonds කියන්නේ? අපේ රටේ ආර්ථික වර්ධන වේගය වැඩි වෙන්න, වැඩි වෙන්න ඒ ණය කපා හැරපු සහනය අඩු වෙනවා. එතකොට රටක් හැටියට අපට ආර්ථික වර්ධන වේගය වැඩි කරන්න තිබෙන උත්තේජකය, incentive එක, motivation එක මොකක්ද? ඇයි, වර්ධන වේගය වැඩි වෙනකොට විදේශීය ණය; ගෙවන්න තිබෙන haircut එක අඩු කරපු ප්‍රමාණය වැඩි වෙනවා. බිමල් රත්නායක මැතිතුමා මේ හැම කාරණාවකටම ඔළුව වනනවා. මේ කාරණය ඇත්තක්.

මෙන්න මේ කාරණයත් මම කියන්න ඕනෑ. අපට මේකේ වගකීම පසුගිය ආණ්ඩුවට පටවන්න බැහැ. මොකද, ඔබතුමන්ලා ඒ ආණ්ඩුවටත් වැඩිය හොඳට මේ වැරැදි ඩීල් එක කරගෙන යනවා. අපි ඒකයි කිව්වේ DSA එක වෙනස් කරන්න කියලා. ලසාර්ඩ් ආයතනය බොරුවක් කළේ; ලංකාවට වංචාවක් කළේ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ සමගි ජන බලවේගය කිසිදාක කොම්පැනිකාරයින්ට, බහුජාතික සමාගම්වලට, මුදලට, වරදාන, වරප්‍රසාදවලට යටපත් වෙන්නේ නැහැ කියන එකත් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. කරුණාකරලා මට උත්තරයක් කියන්න. මම තර්කානුකූලව ඉදිරිපත් කරන්නේ. බොරුවක් නම් බොරුවක් කියලා කියන්න. සානාව, සැම්බියාව හොඳ ඩීල් එක ගත්තා. අපේ රටට කුණු ඩීල් එකක් දුන්නා. ඒ කුණු ඩීල් එක තමයි, ආර්ථිකය උඩට යන්න, උඩට යන්න කපපු ණය ප්‍රමාණය අඩු වෙන එක, Macro-linked Bonds සඳහා වන ඒ haircut එක අඩු වෙනවා. දැන් මම අහන්න කැමතියි, macro-linked bonds ගැන කවුද පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාට හරි, රටට හරි මීට ඉස්සෙල්ලා පැහැදිලි කළේ කියන එක. ඒ ඔක්කෝම සහවා ගත්ත දේවල්. ඒවා ඔක්කෝම හංගා ගෙන ඉන්නේ. *[බාධා කිරීමක්]* නැහැ. මම කථා කරන්නේ ඔබතුමන්ලා ගැන. එහෙම නැතුව වෙන කවුරුත් ගැන නොවෙයි. මම කථා කරන්නේ ඔබතුමන්ලා ගැන. මේවා දැන දැන හංගා ගෙන ඉන්නේ. ඔබතුමන්ලා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ලබා දීලා තිබෙන සහනය මොකක්ද? ඒ අයට කරන්න ඕනෑ ප්‍රධානතම දේ මොකක්ද? සංවර්ධන බැංකුවක් හදන්න ඕනෑ. ඒක ඔබතුමන්ලාගේ අයවැය යෝජනාවල තිබුණා. කෝ, ජාතික සංවර්ධන බැංකුව? ඒ වාගේම ඔබතුමන්ලා කිව්වා, අමාරුවේ වැටුණු MSMEs ගැන. 2022 වර්ෂය වෙනකොට එවැනි පුද්ගලයන් 263,000ක් හිටියා. දැන් ඒ ප්‍රමාණය ඊටත් වැඩි ඇති. ඒවා රජයේ සංඛ්‍යාලේඛන. කෝ, ඒ අයගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම්, කෝ ඒ restructuring of loans? ඒවා කළේ නැහැ.

පසුගිය රජය ජනාධිපතිවරණය දිනන්න පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටෙව්වා. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා තුනෙන් දෙක ගන්න ඒ දේම කළා. පරාටේ නීතිය අත්හිටෙව්වා. හැබැයි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ඔබතුමන්ලා කටයුතු කළේ නැහැ. අපි මේවා කියන්නේ ඔබතුමන්ලාට දැන්වත් මේවා නිවැරදි කරගන්න. විශේෂයෙන්ම මම ඔබතුමන්ලාගෙන් මේ කාරණය අහන්න කැමතියි. හරි හෝ වැරදි හෝ ඔබතුමන්ලාට Gen Z පරපුර, තරුණ පරපුර විශාල වරමක් දුන්නා. ඒ අය අතරේ ඉන්නේ Gen Z එක විතරක් නොවෙයි. Gen Gamma කියයි; Gen Beta කියයි; Millennials කියයි. සමහරුන්ට ඡන්දය තිබෙනවා. සමහරුන්ට ඡන්දය නැහැ. නමුත් ඔබතුමන්ලා ජයග්‍රහණය කරවන්නට ඒ අය විවිධාකාරයෙන් කටයුතු කළා. අපි විශ්වාස කරන ආකාරයට ඒ අයට තිබුණු ලොකුම බලාපොරොත්තුව තමයි ඩිජිටල් ආර්ථිකය. ඩිජිටල් ආර්ථිකය වෙනුවෙන් ඔබතුමන්ලා රුපියල් බිලියන 28.5ක් වෙන් කරලා තිබෙනවා. 2026 වර්ෂයේ ඒ වෙනුවෙන් රුපියල් බිලියන 25.5ක් වෙන් කරලා තිබුණා. මේ අය වැයෙන් ඒ සඳහා වෙන් කරලා තිබෙන ප්‍රමාණය, රුපියල් බිලියන 28.5යි. ක්‍රියාත්මක වැඩසටහන්වලට තව රුපියල් බිලියන 12.1කුත් යොදවා තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා 2026 වසරට අදාළව ඩිජිටල් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පොරොන්දු 17ක් දීලා තිබෙනවා. හැබැයි, ක්‍රියාත්මක කර තිබෙන්නේ පොරොන්දු 5යි; 5යි deliver කරලා තිබෙන්නේ. තව 5ක් තවම deliver කරනවා, delay වෙලා තිබෙනවා තවත් 4ක්. 3ක් සම්බන්ධයෙන් කිසිම progress එකක් නැහැ. මම මේවා සංඛ්‍යාත්මකව කියන්නේ. මේ විස්තර ඇතුළත් ලේඛනය මා **සභාගත*** කරනවා.

මම ඔබතුමාට පොඩ්ඩක් කියන්නද digital ID එකට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා? 2025 නොවැම්බර්, 2026 තුන්වැනි කාර්තුවේ first digital ID card එක ගෙනෙනවා කිව්වා. 2026 මාර්තු කොන්ත්‍රාත්කරු තෝරා ගන්නවා කිව්වා. 2026 සැප්තැම්බර් වෙනකොටත් කොන්ත්‍රාත්කරු නැහැ. නොවැම්බර් 2026 වෙනකොට අලුත් දිනයක්වත් නැහැ. සම්පූර්ණයෙන්ම roll out වෙනවා කියලා 2027 අගෝස්තු මාසයේ කෙරෙනවා කියලා නියෝජ්‍ය ඇමතිවරයා කියලා තිබෙනවා. දැන් අපිට ප්‍රශ්න කරන්න වෙනවා. පසුගිය අය වැයේ ප්‍රගතිය ගැන මම ප්‍රශ්නයක් ඇහුවා. පසුගිය අය වැයේ යෝජනා කීයක් ඉදිරිපත් වුණාද? ඒ යෝජනාවලට අදාළව භෞතික ප්‍රගතිය කීයක් තිබෙනවාද, මූල්‍ය ප්‍රගතිය කීයක් තිබෙනවාද? බොහොම කනගාටුයි කියන්න, අනිල් ජයන්ත මැතිතුමා ඒකට උත්තර දුන්නේ නැත්තේ මෙන්න මේ වාගේ ප්‍රගතියේ බලහීනතාවක්, බෙලහීනතාවක්, නිසායි. ප්‍රගතියක් නැති නිසායි.

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
Timeout -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)
Timeout එක ඔබතුමාගේ වෙලාවේදී ගන්න. මේ ප්‍රගතියේ කිසිම දියුණුවක් නැති නිසා, ඉදිරි ගමනක් නැති නිසා එතුමා ඒ ප්‍රශ්නයට උත්තර ලබා දුන්නේ නැහැ.

ඉතින් ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා තමයි Gen Z එක රැවටිටුවේ digital economy එක හදනවා කියලා.

දැන් බලන්න, 2026 දී broadband vouchers දෙනවා කිව්වා. ඒක මේ පාරත් කියනවා. 2026දී කෙරුණෙත් නැහැ. ඒක මේ පාරත් කියනවා. Startup fund එක කෝ? Data centre incentives කෝ? IT Parks කෝ? දැන් ඔබතුමන්ලා කිව්වා නේද දිගනයි, නුවරඑළියයි IT Parks හදනවා කියලා? කෝ, ඒ IT Parks? කැටි වළාකුළුවලද, කෙඳි වළාකුළුවල ද ඒවා හදලා තිබෙන්නේ කියලා මම අහන්න කැමතියි. ඔන්න ඕකයි මම 2026 අය වැය යෝජනාවල ප්‍රගතිය ඇහුවේ. නමුත්, ඒ කාරණාව ගැන ඔබතුමන්ලා නිශ්චිත උත්තරයක් දුන්නේ නැහැ.

ඒ වාගේම මම පැහැදිලිව කියනවා, Gen Z, Gen Beta, Gen Alpha and Millennials කියන හැම තරුණ කණ්ඩායමක්ම ඔබ රැවැටිටුවා කියන එක, ඔබ මංමුළා කළා, ඔබ ඇන්දෙව්වා. අපි විශ්වාස කරනවා ඒ අය දරපු විශ්වාසය අද සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා කියලා.

මම යළිත් අහන්න කැමැතියි, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන ගැන. මම ඒ ගැන කථා කළා. එදා ඒ සඳහා "ජන සවිය" වැඩසටහන ක්‍රියාත්මක කළා. බලන්න, ඒ වැඩසටහන හදන්න ඒ කාලයේ සම්බන්ධ වුණු අය ගැන. දැන් ඔබතුමන්ලා "අස්වැසුම" කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා; "ප්‍රජා ශක්ති" කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ඒවා අසාර්ථකයි. ඒකයි ලෝක බැංකුව කියන්නේ, දුප්පත්කම ඉහළම මට්ටමක තිබෙනවා කියලා. ඒකයි අප මේ කාරණාව කියන්නේ. "ජන සවිය" නිර්මාණය කළේ කවුද? කවුද? වාමවාදී සුසිල් සිරිවර්ධන මැතිතුමා. සුසිල් සිරිවර්ධන මැතිතුමා, අයිලප්පෙරුම මැතිතුමා, විජේදාස මැතිතුමා වැනි අය තමයි වාමවාදී පුද්ගලයෝ; මිනිසුන් ගැන හිතපු පුද්ගලයෝ; මනුෂ්‍යත්වය ගැන හිතපු පුද්ගලයෝ. එම නිසා, විශේෂයෙන් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, ඔබතුමන්ලාට පැහැදිලි නායකත්වයකුත් නැහැ, හොඳ team එකකුත් නැහැ කියන එක.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

බලශක්තිය ගැන ජනාධිපතිතුමා ලොකුවට කථා කළා. පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවා කිව්වා. කරුණාකරලා මට කියන්නකෝ, කෝටි ප්‍රකෝටි ගණන් මුදල් Combined Cycle Plantsවලට වැය කරන්නේ ඇයි කියලා. බොරුවට කියනවා, LNG plus ඉන්ධන කියලා. ඒකේ LNG එකක් නැහැ. යුගදනවි, සොබාදනවි, සහස්දනවි ආදි ඔක්කෝම Combined Cycle Plants, තාප බලාගාර; පුනර්ජනනීය නොවන බලශක්තිය නිපදවන බලාගාර. ඒවා ආරම්භ කරලා අපේ රටේ බදු ගෙවන්නන්ගේ අරමුදල්වලින් කෝටි ප්‍රකෝටි ගණන් වැය කරනවා. කිසිම ඵලක් නැහැ. පිරිවැය විතරයි; ප්‍රතිලාභය නැහැ.

ඊළඟට මම තවත් ප්‍රශ්නයක් විශේෂයෙන්ම අහන්න කැමැතියි. ඔබතුමන්ලා ආරම්භ කරපු එක නිෂ්පාදන කර්මාන්තයක් ගැන, එක කර්මාන්තශාලාවක් ගැන කියන්නකෝ. ඔබතුමන්ලා රස්සා කීයක් දුන්නාද? මේ 159දෙනාගේ රස්සා ගැන නොවෙයි, මම කියන්නේ. මම කියන්නේ, රටේ ජනතාවගේ රැකියා ගැන. පීඩනයෙන් පෙළෙන, දුක් විඳින, ජන ජීවිත කඩා වැටුණු ඒ ජන කොටියාසවල රැකියා ප්‍රශ්නය විසඳුවා ද? නැහැ. විසිහතර පැයේම පව; විසිහතර පැයේම බොරුව; තුන්සිය හැටපස් දවසේම ඇන්දවිල්ල.

ක්ෂුද්‍ර මූල්‍ය ණය මර උගුලේ - microfinance debt trap එකේ - ජනතාව හිර වෙලා. ඒක debt trap එකක් විතරක් නොවෙයි, death trap එකක්. මොකක්ද, ඒ ගැටලුව විසඳන්න ගෙන තිබෙන පියවර? ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන්න ඔබතුමන්ලා ගෙන තිබෙන පියවර මොකක්ද කියලා අපි අහන්න කැමැතියි.

දිවිඹා ආපදා සහන ටික කෝ? දැන් සහන ටික දී ගන්න බැරුව, ඊළඟ අවුරුද්දේත් සල්ලි දෙන්න හදනවාලු. බිමල් ඇමතිතුමා මට පොඩ්ඩක් කියන්නකෝ, අර ටකරමක් ගියත් දෙනවා කියපු ලක්ෂ 10 දුන්නාද කියලා. දුන්නාද? *[බාධා කිරීමක්]* කොහේද දුන්නේ? අපි දිවිඹා ගැන වෙනම කරුණු කාරණා ඉදිරිපත් කරනවා.

අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ,- *[බාධා කිරීමක්]* ඔව්වර කලබල වෙන්න එපා, ඔබතුමා. දැන් හොඳට අහගෙන හිටියා නේ, පූස් පැටියා වාගේ. පොඩ්ඩක් ඉන්න. අද අධ්‍යාපන ක්ෂේත්‍රයට මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේ අධ්‍යාපන අමාත්‍යාංශයට smart board එකක් දීගන්න බැහැ; computers ටිකක් දීගන්න බැහැ; connectivity එක ක්‍රියාත්මක කරන්න බැහැ. ඊළඟට, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බරපතළ ත්‍රිත්ව අර්බුදයක් තිබෙනවා. අර්බුදයක් නැහැ කියලා කියන්න ඔබතුමන්ලාට බැහැ. ඔබතුමන්ලා යම් උත්සාහයක් දරනවා තමයි. අපි ඒක නැහැ කියන්නේ නැහැ.

ඖෂධ හිඟය අනිවාර්යයෙන්ම රටට ප්‍රශ්නයක්. උපකරණ හිඟය බරපතළ ප්‍රශ්නයක්. මානව සම්පත් හිඟය බරපතළ ප්‍රශ්නයක්. එහෙම තිබියදීත් ඔබතුමන්ලා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යවරයාගේ ඉඳලා පහළ තලයේ නිලධාරියා දක්වා වන අයගේ ඉල්ලීම් ඉටු කළාද? ඒ ඉල්ලීම් ඔක්කොම ඉටු කරන්න බැරි වෙන්න පුළුවන්. අඩුම ගණනේ යම් දැනෙන සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න ඕනෑ. වෛද්‍යවරයෙකු හැටියට ගරු කථානායකතුමාට කටින් කියන්න බැරි වුණත්, එතුමා මා කියන දේ හඳවතින්ම පිළිගන්නවා. ඒක තමයි ඇත්ත කථාව. ඔබතුමන්ලා සෞඛ්‍ය ක්ෂේත්‍රය පැහැදිලිවම අනාථභාවයට පත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රට වටේ තිබෙන්නේ මුහුදු. නමුත්, ඉතාම සොච්චමකින් තමයි ධීවර කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය ලබා දෙන්නේ. අපට වෙරළේ සිට නාවුක සැතපුම් 200ක අනන්‍ය ආර්ථික කලාපයක්, Exclusive Economic Zone එකක් තිබෙනවා. මොකක්ද ඔබතුමන්ලා සයුරු සම්පතින් - සමුද්‍ර සම්පතින්, ධීවර සම්පතින් ප්‍රයෝජන ගන්න හදපු වැඩ පිළිවෙළ? ඒ වාගේම අපි මිරිදිය කර්මාන්තය ගැනත් කථා කරන්න ඕනෑ. ඒවා ප්‍රවර්ධනය කිරීමට ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද? කිසිම වැඩ පිළිවෙළක් නැහැ.

මේ මන්ත්‍රීතුමන්ලා හැමෝම මට බල කරනවා, තවත් ප්‍රශ්නයක් අහන්න කියලා. ඇත්තටම ඒක මගේ හිතේත් තිබෙන ප්‍රශ්නයක්. අර මාළු හොයන app එකට මොකද වෙලා තිබෙන්නේ? ඒක මේ Budget එකෙන් ක්‍රියාත්මක කරනවාද? එහෙම නැත්නම් ඒ app එක ක්‍රියාත්මක කරන එක ගැන තවම පර්යේෂණ කරනවාද? *[බාධා කිරීම්]* වෙනම app එකක් හදනවා කිව්වා, මාළු ඉන්න වෙලාව කියනවා කිව්වා, මාළු ඉන්න තැන කියනවා කිව්වා, මාළු ඉන්න තැනට යන දිසාව කියනවා කිව්වා, ගමනාන්තය කියනවා කිව්වා, යන්න ඕනෑ බෝට්ටුව මොකක්ද කියලා කියනවා කිව්වා. මම අහන්න කැමැතියි, ඒ බහුවිධ ධීවර app එක කෝ කියලා. ඒ බහුවිධ ධීවර app එක කෝ?

අද වනකොට අපේ රටේ බුද්ධි ගලනය ක්‍රියාත්මක වෙනවා. උගතුන්, බුද්ධිමතුන්, වෘත්තීයවේදීන්, වෛද්‍යවරුන් රට අත් හැර යනවා. කරුණාකර මම එක ඉල්ලීමක් කරනවා. මම මේ ඉල්ලීම නොබියවයි කරන්නේ. ඒ වෘත්තීයවේදීන් මේ රටේ නවතා ගන්නට වාහන permit එක ඒගොල්ලන්ට දෙන්න. වාහන permit එක ඒගොල්ලන්ට දෙන්න. අපට ඒවා ඕනෑ නැහැ. නමුත්, මේ වෘත්තීයවේදීන් මේ රටේ නතර කර ගන්න වාහන permit එක ලබා දෙන්න. මම ඒ ඉල්ලීම පැහැදිලිව කරන්න කැමැතියි. ඒ වාගේම මේ අවස්ථාවේ,- *[බාධා කිරීම්]* ඔබතුමාගේ ඔය හඳවතේ තිබෙන - හිතේ තිබෙන - අදහස් ටික ඔබතුමාගේ කථාවේදී කියන්න. කලබල වෙන්න එපා, බිමල් ඇමතිතුමා. පටන් ගැන්මේදී පූස් පැටියෙකු වෙලා හිටියා; දැන් වෘකයෙක් වෙලා. ඇමතිතුමා, පොඩ්ඩක් ඉන්නකෝ. ආපහු පූස් පැටියා ගාණට යන්න.

ගරු කථානායකතුමනි, අපේ රටේ පරිසර සුරක්ෂිතභාවය ඇති කිරීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම ගෙන තිබෙන පියවර මොකක්ද? ඔව්, අය වැය යෝජනාවල යම් යම් penalties, යම් යම් දඩුවම් දීම්, යම් යම් අය කර ගැනීම්, වන්දි ගෙවීම් වැඩි කරලා තිබෙනවා. ඒක හොඳ දෙයක්. නමුත් හරියටම බැලුවොත්, ඒක ප්‍රමාණවත් වන්නේ නැහැ. අපි ඉල්ලීමක් කරනවා, මීට වඩා වැඩි කිරීමක් කරන්න කියලා. මොකද, එක පැත්තකින් ජනතාව තැළෙනවා, පොඩි වෙනවා; තවත් පැත්තකින්, වනජීවීන්ට, වෘක්ෂලතාවලට, රටේ ජෛව විවිධත්වයට බරපතළ හානි සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition, you have two more minutes.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව පොඩි වේලාවක් ගන්නවා, ගරු කථානායකතුමනි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු ජනාධිපතිතුමා ඊයේ අය වැය කථාවේදී රාජ්‍ය සේවකයන් ගැන කථා කරනවා මම දැක්කා. රාජ්‍ය සේවකයෝ ලක්ෂ 14ක්, 15ක් ඉන්නවා. ඒ අය ගැන දැන් කියන කථාව එතුමා කිව්වේ නැහැ, ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා. දැන් කියන්නේ මොනවාද? ලක්ෂ 14ක, 15ක රාජ්‍ය සේවයට කරන වැය කිරීම ගැන හිතා බලන්න ඕනෑලු; පඩි වැඩි කරන්න යන පිරිවැය ගැන හිතන්න ඕනෑලු; ඒ වාගේම ඒ අයට දෙන දීමනාවල ප්‍රමාණය ගැන බලන්න ඕනෑලු. මෙච්චර රාජ්‍ය සේවයක් තිබියදී රටට ලැබෙන ප්‍රතිලාභය මොකක්ද කියන එක ගැන හිතන්න ඕනෑලු. මම අහන්න කැමැතියි, ජනාධිපතිවරණයට පෙර ඔය කථාව කිව්වේ නැත්තේ ඇයි කියලා. ජනාධිපතිවරණයට පෙර ඔය කථා කිව්වාද? මම ඒ ගැන අහන්න කැමැතියි. තැපැල් ඡන්දවලට ඉස්සෙල්ලා ඔය කථා කිව්වාද? මම ඒ ගැනත් අහන්න කැමැතියි. කිව්වේ නැහැ. ගොවියාටත් ඕක නේ, කළේ. ගරු කථානායකතුමා දන්නවා නේ ඒක. "ගොවියා දෙවියා" කිව්වා, "ගොවියා රජතුමා" කිව්වා. ඡන්දයෙන් පසුව "ගොවියා කසිප්පුකාරයා"! අපේ නලින්ද ඇමතිතුමා කිව්වා, රජකම දෙන්න පුළුවන් නුවර ප්‍රදේශයේ එක්තරා ප්‍රදේශයක සිටින ගොවීන්ට විතරයි කියලා; රජා වෙන්න පුළුවන් එහේ ගොවියාට විතරයි කියලා. රටේ ලක්ෂ 21ක් වන වී ගොවි පවුල්වල අයට එහෙම රජ වෙන්න බැහැ කිව්වා. ඡන්දයට ඉස්සෙල්ලා "දෙවියා", "රජතුමා". ඡන්දය ඉවර වුණාට පසුව "කසිප්පුකාරයා"!

ඒ වාගේම තමයි ඔබතුමන්ලා රාජ්‍ය සේවකයන්ටත් බොහොම ඉහළින් සැලකුවා, ඡන්දයට පෙර. ඡන්දය ඉවර වුණු හැටියේ අහනවා, මේ රාජ්‍ය සේවයෙන් ඇති ප්‍රතිලාභය මොකක්ද, මේ අයට වැටුප් ගෙවන කොට මෙච්චර මුදලක් ගෙවන්න ඕනෑ නේද, ඒවා ගැන හිතන්න ඕනෑ නේද, මොකක්ද රටට ලැබෙන return එක කියලා. මොනවාද, මේ විහිළු කථා? ඇයි, තැපැල් ඡන්දයට පෙර මේවා කිව්වේ නැත්තේ කියලා මම අහන්න කැමැතියි.

ඒ වාගේම මම කියන්න කැමැතියි, රාජ්‍ය සේවය තුළ ඉඳලා අද විශ්‍රාම සුවයෙන් සිටින විශ්‍රාමිකයන්ගේ ප්‍රධාන ගැටලුවලට විසඳුමක් නැති බව. ඔය සොච්චම් දීමනා ටිකක් දීලා තිබෙනවා. අඩුම ගණනේ ඒ විශ්‍රාමිකයන්ට දැනෙන ප්‍රතිලාභයක් ලබා දෙන්න; දැනෙන මුදලක් ලබා දෙන්න. වැඩිහිටියන්ගේ ස්ථාවර තැන්පතුවලට ඒ කාලයේ සියයට 15ක පොලියක් ලබා දුන්නා. ඇයි, දැන් ඒක ලබා දෙන්න බැරි? මේ රටේ වැඩිහිටි ප්‍රජාව, විශ්‍රාමික ප්‍රජාව, වයස්ගත ප්‍රජාව තමන්ගේ බෙහෙත් ටික ගත්තේ, තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගත්තේ තමන්ගේ ඉතිරි කිරීම්වලට - savingsවලට - ලැබුණු ඒ සියයට 15 පොලී මුදල්වලින්. ඇයි ඒක ක්‍රියාත්මක කරන්නේ නැත්තේ කියා මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

ඒ වාගේම මම අහන්න කැමැතියි, විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කියපු යෝජනාව මේ Budget එක තුළ කෝ කියලා. ගරු අනිල් ජයන්ත මැතිතුමනි, විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කිව්වා නේද? ජනාධිපතිතුමාමයි කිව්වේ. මම ඇත්ත කියන්නේ. ඕනෑ නම් ඒ වීඩියෝ එක දාලා පෙන්වන්නම්. රුපියල් 3,000 බිල 2,000 කරනවා කිව්වා; 9,000 බිල 6,000 කරනවා කිව්වා. ගණන් හදලා බැලුවාම, එය සියයට 33ක අඩු කිරීමක් කියලා කිව්වා. ඇයි, ඒ යෝජනාව මෙහි නැත්තේ? ජනාධිපතිතුමා දැන් මෙතැන නැහැ. හැබැයි, අපේ ගරු අගමැතිතුමිය මෙතැන ඉන්නවා. කෝ අගමැතිතුමිය, අර දෙනවා කියා පොරොන්දු වුණු රුපියල් ලක්ෂ 12 විට්ස් කාර් එක? කෝ, ලක්ෂ 12 විට්ස් කාර් එක? කෝ, අර රුපියල් 50,000ට ලබා දෙනවා කියපු මෝටර්බයිසිකලය? කෝ, ඒක?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ජපන් බයිසිකලය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආ! ජපන් බයිසිකලයක් නේද දෙනවා කිව්වේ? රුපියල් 50,000ට නේද, ඒක දෙනවා කිව්වේ? 50,000ට ලබා දෙනවා කියපු ජපන් බයිසිකලය කෝ?

ඊළඟට, විශේෂයෙන්ම තෙල් ගැන ලොකු කතන්දරයක් කිව්වා. ඔබ කිව්වේ නැද්ද වරායේ ගොඩබාන ගණනටම තෙල් දෙනවා කියලා? කිව්වේ නැද්ද? අනිවාර්යයෙන්ම කිව්වා. *[බාධා කිරීම්]* මෙන්න, නලින්ද මැතිතුමා කියනවා, "කිව්වේ නැහැ" කියලා. *[බාධා කිරීම්]* තව කවුද කියන්නේ, 'එහෙම කිව්වේ නැහැ' කියලා? *[බාධා කිරීම්]* ඊළඟට කථා කරන පුද්ගලයාට මම යෝජනා කරනවා, වරායේ ගොඩබාන මිලටම තෙල් දෙනවා කියපු එක කරුණාකර හැන්සාඩ්ගත කරන්න කියලා. ඒ වීඩියෝ එක තිබෙනවා. *[බාධා කිරීම්]* වීඩියෝ එක පෙන්නන්න අවස්ථාව දෙනවාද? ගරු කථානායකතුමනි, ඒ වීඩියෝ එක පෙන්නන්න අවස්ථාව දෙනවාද? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]* වරායේ ගොඩබාන මිලටම තෙල් ටික ලබා දෙනවා කිව්වා. ඔබතුමන්ලා ඒ කාලයේ කිව්වා, ඇමතිගේ ඉඳලා නිලධාරීන් දක්වාම කොමිස් යනවා කියලා. මහා භාණ්ඩාගාරයට මුදලක් දෙනවා කිව්වා; බදු ගහනවා කිව්වා. ඔබතුමන්ලා බලයට ආවාම ඒ ඔක්කෝම ඉවත් කරනවා කිව්වා. කිව්වාද, නැද්ද? කිව්වාද, නැද්ද, නලින්ද ඇමතිතුමා?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කිව්වා, කිව්වා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කිව්වා. ඒක තමයි ඇත්ත කථාව. *[බාධා කිරීම්]* පැය පහක කථාවකට උත්තර දෙන්න අමාරුයි, බොහොම කෙටි වෙලාවක් තුළ. මම මගේ කථාව - *[බාධා කිරීම්]* මගේ කථාව - *[බාධා කිරීම්]* ආ, ඔබතුමන්ලාගෙන් වෙලාව දෙනවාද? *[බාධා කිරීම්]* ඔබතුමන්ලාගෙන් වෙලාව දෙනවාද? ඒ තරමට කථාවට කැමැතිද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
වැඩිපුර විනාඩි 12ක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව කරුණු කිහිපයක් විතරක් ඉදිරිපත් කරලා මගේ කථාවට පිළිතුරු සපයන්න ඔබතුමන්ලාට අවස්ථාව ලබා දෙනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාව, ඇත්ත ක්‍රියාව.

ඇත්තවශයෙන්ම අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද වෙලා තිබෙන්නේ, ඇති හැකි අය නැති බැරි තත්ත්වයට පත් වෙලා. නැති බැරි අය නැත්තටම නැති වෙලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අය වැය ඉදිරිපත් කිරීම තුළින් නැවත වරක් ලෝක

සම්මානයක් දිනාගෙන තිබෙනවා. කුමකින්ද? බොරුවෙන්, පවයෙන්, ඇන්දවීමෙන්, මුළා කිරීමෙන්. මේ ටොන්පව අය වැය නුදුරු අනාගතයේදී හොඳම හොඳ ජාත්‍යන්තර සම්මානයක් ලබනවාය කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. මේක අය වැයක් නොවෙයි, මේක පව වැයක්. පව වැයකුත් නොවෙයි, මේක ඇතුළේ පව වැලක්ම තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව.

ඉතින්, මම එක කාරණයක් අහන්න කැමතියි. ඔබතුමන්ලාට හැටඅට ලක්ෂයක් ජනතාව ඡන්දය ලබා දුන්නේ, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් නිර්මාණය කරන්නයි. අනේ, මේක අමතක කරන්න එපා. අද රෑට හරි කමක් නැහැ, ඔබතුමන්ලා 159දෙනාම නැවත වරක් මේ ප්‍රතිපත්ති ප්‍රකාශය කියවන්න. මුල ඉඳලාම කියවන්න; ආරම්භයේ ඉඳලාම කියවන්න. මේකේ සිහින ගොඩක් තිබෙනවා. ඔබ මේකේ තිබෙන සිහින මරා දමලා තිබෙන්නේ; ඒ සිහින නැති කරලා තිබෙන්නේ. මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාවට පොරොන්දු වුණු ඒ සිහිනවලට පණ දෙන්න, - ජීවය දෙන්න; ප්‍රාණය දෙන්න - ශක්තිය දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, මහා පාවාදීම් - great betrayals - පිළිබඳවත් අපි අහලා තිබෙනවා. ජූදාස් පාවා දීලා තිබෙනවා, බෘටස් පාවා දීලා තිබෙනවා. හැබැයි, මේක තමයි ලොකුම පාවාදීම, greatest betrayal එක. හැටඅට ලක්ෂයක ජනතාවගේ බලාපොරොත්තු, අපේක්ෂා මෙන්ම, ඡන්දය දුන් සහ නොදුන් ජනතාව ඇතුළු ලක්ෂ 220කගේ සිහිනත් මේ රජය මොට කරලා තිබෙනවා, බොඳ කරලා තිබෙනවා, විනාශ කරලා තිබෙනවා. මම මේ අවස්ථාවේ පැහැදිලිවම එක දෙයක් කියන්න කැමැතියි. කරුණාකරලා ඒ සිහින සැබෑ කරවීමට කටයුතු කරන්න.

විශේෂයෙන්ම, ගරු ජනාධිපතිතුමාත් බුදු දහම කේන්ද්‍ර කරගෙන තම අය වැය කථාව අවසන් කරන්නට යෙදුණා. මමත් මේ අවස්ථාවේදී විශේෂයෙන්ම එක දෙයක් කියන්න කැමතියි. *[බාධා කිරීමක්]* මොකක්ද? හරි, ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා දැන් උත්තර දෙන්න.

විශේෂයෙන්ම, මම ඔබතුමන්ලාට මේ ගාථාව මතක් කරන්න කැමතියි.

"න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණෝ

කම්මනා වසලෝ හෝති - කම්මනා හෝති බ්‍රාහ්මණෝ"

තමන් වසලයෙක්ද, බ්‍රාහ්මණයෙක්ද කියන එක තීන්දු වෙන්නේ තමන්ගේ උත්පත්තිය අනුව නොව, තමන්ගේ ක්‍රියාව අනුවයි.

ඇත්තවශයෙන්ම, පැහැදිලිවම මේ රජය වමට සිග්නල් දමලා දකුණට හරවලා තිබෙන්නේ, මාක්ස්වාදය පාවාදීලා, නව ලිබරල්වාදය සිප වැලඳගෙන, නැත්නම් ගිලගෙන තිබෙනවා. ඔබතුමන්ලාම හිතා බලන්න, ඔබ කරන්නේ වසලයෙකුගේ ක්‍රියාවක්ද, එහෙම නැත්නම් බ්‍රාහ්මණයෙකුගේ ක්‍රියාවක්ද කියලා. අපි නම් විශ්වාස කරන්නේ, මිනිසුන්ට එක දෙයක් කියලා තවත් දෙයක් කරන එක ඇත්තවශයෙන්ම වසල ක්‍රියාවක් කියායි.

ඉතින්, මම ඉල්ලීමක් කරනවා, නව ලිබරල්වාදය බැහැර කරලා, අන්ත මාක්ස්වාදය සහ අන්ත සමාජවාදයත් බැහැර කරලා, රටට වැදගත් එකම මාවත වන මැද මාවතට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට සහ සමාජ වෙළෙඳපොළ ආර්ථිකයට ප්‍රවේශ වෙන්න කියලා. කරුණාකරලා, අර නව ලිබරල්වාදී වසලකමින් බැහැර වෙලා, බ්‍රාහ්මණයෙකුගේ ගමන වන මැද මාවතේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට ඔබතුමන්ලා ප්‍රවේශ වෙන්න. තවදුරටත් මේ රටේ ලක්ෂ 220ක ජනතාව අනාථ කරන්න එපා කියලා ප්‍රකාශ කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Prime Minister. You have 20 minutes.

[පූ.භා. 11.16]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, 2027 වර්ෂය සඳහා වන අය වැය ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී විපක්ෂයේ ප්‍රවේශය තුළ අපි සුවිශේෂී වෙනසක් දකිනවා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඒ සුවිශේෂී වෙනස මෙයයි. අපි සාමාන්‍යයෙන් සූදානම් වෙලා ඉන්නේ, අය වැය විවාදය ආරම්භ කරමින් විපක්ෂය වෙනුවෙන් කරන පළමු කථාව ඔබතුමා විසින් සිදු කරනවා කියන බලාපොරොත්තුවෙන්. මට මතක විධියට, 2020 වර්ෂයේ සිට මම පාර්ලිමේන්තුවේ සිටින කාලය තුළ අය වැය විවාදයේ පළමු කථාව සිදු කළේ ඔබතුමායි. ඒ කථාවට ඇහුම්කන් දීමට තමයි, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටියත්, ආණ්ඩු පක්ෂයේ සිටියත් අපි සියලුදෙනාම සූදානම් වෙලා ඉන්නේ. නමුත්, අද අපි වෙනසක් දකිනවා. ගරු කථානායකතුමනි, ඒ වෙනස ගැනත් අපි සතුටු වෙනවා. නමුත්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාව අහන්නත්, අපි ආසාවෙන් ඉන්නවා. මොකද, එතකොට අපිට බලාගන්න පුළුවන් වෙනවා, සජබ න්‍යාය පත්‍රයේ වෙනසක් තිබෙනවාද, නැද්ද, එහෙම නැත්නම් එකම ප්‍රතිපත්තිය තුළද ඉන්නේ කියන එක.

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ආර්ථික න්‍යාය පිළිබඳව, ආර්ථිකය සංවර්ධනයේ ප්‍රවේශය පිළිබඳව සහ IMF, World Bank ආදි සියල්ල පිළිබඳ විශාල කථාවක් නිර්මාණය කරගෙන ගියා. ඉතින්, විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරු සියලුදෙනාත් මෙම ස්ථාවරයේමද ඉන්නේ කියන එක ගැන දැන ගන්න ඉතිරි දවස් කිහිපය තුළ අපි ඉතා කුතුහලයෙන් බලාගෙන ඉන්නවා, ඒ කථාව නිර්මාණය වුණු විධියත් එක්ක.

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කියපු කරුණු ටිකක් අපට නිවැරදි කරන්න සිද්ධ වෙනවා. සාමාන්‍යයෙන් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථාව ඉදිරිපත් කරනකොට දත්ත උපුටා ගන්නේ අය වැය කථාවෙන්මයි. නමුත්, විපක්ෂ නායකතුමා කියපු සමහර කාරණා පිළිබඳ පොඩි නිවැරදි කිරීමක් කරලා, මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි. එතුමා කිව්වා, අපේ foreign direct investments වාර්තාගත විධියට පහත වැටිලා කියලා. එය US Dollars 1 billion - *[බාධා කිරීමක්]*

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, අපිත් බලාපොරොත්තුවෙන් හිටියේ ගරු බිමල් රත්නායක මැතිතුමාගේ කථාව අහන්න.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒක නේ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
එතුමාත් ඉස්සරහ row එකේ වාඩි වෙලා ඉන්නවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
හරි, ඒක අපිට බලාගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, foreign direct investments US Dollars 1 billion බව විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළා. ගරු කථානායකතුමනි, 2016 සිට 2025 දක්වා අපිට ඇවිල්ලා තිබෙන FDIs බැලුවාම, 2025දී US Dollars 1.4 billion වාගේ ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. ඒ තමයි පසුගිය අවුරුදු 10 තුළ මේ රටට ඇවිල්ලා තිබෙන ඉහළම FDIs ප්‍රමාණය. US Dollars 1 billion මදි කියන එකට අපි සියලු දෙනාම එකඟයි. එය අපි තව වැඩි කරගන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ කථාවේදීත් එතුමා කිව්වා, අපට දියුණු කර ගන්න ඕනෑ තැනක් තිබෙනවා, ඒ තමයි අපේ විදේශ විනිමය සංචිත සහ foreign account එක කියලා. ඒක හරි. නමුත්, මේ අවුරුදු 10 තුළ ලබාගත් වැඩිම FDIs ප්‍රමාණය තමයි, අපි 2025දී වාර්තා කරලා තිබෙන්නේ. 2016 සිට 2025 දක්වා බලන විට ඒ තමයි ලබාගෙන තිබෙන වැඩිම ප්‍රමාණය.

ගරු කථානායකතුමනි, ඊළඟට විපක්ෂ නායකතුමා ඇහුවා, මේ අවුරුදු දෙක තුළ ලබාගත් ප්‍රගතිය මොකක්ද කියලා. මම හිතන විධියට, එතුමා අය වැය කථාව අහගෙන ඉඳලා නැහැ. නමුත්, මම නැවත වතාවක් ජනාධිපතිතුමා කියපු ඒ කාරණා මතක් කරනවා. මොකද, මේ කරුණු ටික සනාථ කරන එක වැදගත් නිසා.

අය වැය කථාව - 2027, පූර්විකාව යටතේ මෙසේ සඳහන් වනවා:

"• 2025 වසරේ දී ලබාගත් සියයට 5ක ආර්ථික වර්ධන වේගය අබණ්ඩව පවත්වා ගනිමින්, දිවිවා සුළි කුණාටුවේ බලපෑම මධ්‍යයේ වුවත්, 2026 පළමු කාර්තුවේදී සියයට 5.1 ක ආර්ථික වර්ධනයක් අත් පත් කර ගත්තා. දෙවන කාර්තුවේ දී, මැද පෙරදිග කලාපයේ යුද්ධමය තත්ත්වයේ වුවද සියයට 4.2 ක වර්ධනයක් ළඟා කර ගත්තා.

- දීර්ඝ කාලයක් පුරා වාර්තා කළ සෘණ ප්‍රාථමික ශේෂය, 2025 වසරේ දී සියයට 5.4ක ඉතිහාසයේ ඉහළතම ධන ශේෂය වාර්තා කළා. 2026 අය වැයට අනුව වසර අවසානයේදී රු. බිලියන 360ක් ලෙස අපේක්ෂිත ධන ප්‍රාථමික ශේෂය, සැප්තැම්බර් මස අවසන් වන විට, රු. බිලියන 1,844ක ධන ශේෂයක් වාර්තා කළා.
- 2025 වසරේදී අය වැය හිඟය සියයට 2.3ක් ලෙස, වසර 68කට පසු අඩුම අගය වාර්තා කළා.
- 2025 වසරේදී ජංගම ගිණුම, ඩොලර් මිලියන 1,719ක ඉතිහාසයේ ඉහළතම අතිරික්තයක් වාර්තා කිරීමට අපට හැකි වුණා.
- 2022 වසර අවසානයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 114ක් වූ මධ්‍යම රජයේ ණය ප්‍රමාණය, 2025 වසර අවසානය වන විට රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තු වාර්තා අනුව සියයට 95 ක් දක්වා අඩු කර ගැනීමට හැකි වුණා."

ගරු කථානායකතුමනි, මේ සියලුම කරුණු අමතක කරලා තමයි, ගරු විපක්ෂ නායකතුමා අපේ ප්‍රගතිය මොකක්ද කියලා ඇහුවේ. ඒ කියන්නේ, ඒ ණය ප්‍රමාණය අඩු කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. මේවා ගැන කථා කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. රාජ්‍ය ව්‍යවසායන්වල වෙච්ච පාඩු කොතරම්ද කියන එක මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාම හොඳින් දන්නා කාරණයක්. නමුත්, 2022දී ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52ක් වාර්තා කළ රුපියල් බිලියන 774.6ක සමස්ත බදු ආදායමට පෙර ශුද්ධ අලාභය අපි 2025දී රුපියල් බිලියන 444.4ක ලාභයක් බවට පත් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ අනුව ශුද්ධ අලාභයක් ලැබූ ඒ රාජ්‍ය ව්‍යවසායයන් අද ලාභ ලබන තත්ත්වයට පත් කරන්න මේ රජය - මේ ආණ්ඩුව - සමත් වෙලා තිබෙනවා. මේවා නොවෙයිද, රටක විය යුත්තේ? මේවා නොවෙයිද, අපි පොරොන්දු වෙච්ච දේවල්? රටක ආර්ථිකය ස්ථාවර කිරීම, රටේ තිබෙන දුෂණය, වංචාව නැති කරලා එහි ප්‍රතිලාභ රටට ලබා දෙනවා කියන එක නොවෙයිද අපි පොරොන්දු වුණේ?

විපක්ෂ නායකතුමා හැම දාම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගෙනැල්ලා පෙන්වා නොයෙක් දේවල් කියනවා. ගරු කථානායකතුමනි, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි කියපු මූලික දෙයක් තමයි, රටේ ආර්ථික ස්ථාවරත්වය ඇති කරනවා කියන එක. දුෂණය, වංචාව, නාස්තිය නැති කරලා, ඒ තුළින් ලැබෙන වාසිය ජනතාවට ලබා දෙනවා කියන එක තමයි අපේ මූලික පොරොන්දුව. පසුගිය අවුරුදු දෙක තුළ අපි පෙන්නුම් කර තිබෙන්නේ ඒක නොවෙයිද? ඒ පිළිබඳව සංඛ්‍යාලේඛනවලින් අපට මේ විධියට පෙන්වන්න පුළුවන්. ඒ සංඛ්‍යාලේඛන ගරු විපක්ෂ නායකතුමා දැකලා නැද්ද, තේරුම් අරගෙන නැද්ද කියන එක අපට ප්‍රශ්න කරන්න වෙනවා. මේ, අපි කියන කථා විතරක් නොවෙයි නේ, ගරු කථානායකතුමනි.

Transparency International එකේ Corruption Perceptions Index එක අනුව ගෝලීය ශ්‍රේණිගත කිරීම්වලින් අපි ස්ථාන 14ක් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ලෝක ආර්ථික සංසදය විසින් නිකුත් කරන ලද දර්ශකයක් අනුව සංචාරක ආර්ථිකයන්ගෙන් වේගවත්ම දියුණුවක් පෙන්නුම් කරන රටවල් අතරින් 10වන ස්ථානයට ශ්‍රී ලංකාව ඇවිල්ලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය ආයතනය විසින් සිදු කරන ලද ඇගැයීමට අනුව නැඟී එන වෙළෙඳ පොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 57ක් අතරින් ශ්‍රී ලංකාව ආයෝජන සබඳතා වැඩිදියුණු කිරීමේ ප්‍රගතියේ සිව්වන ස්ථානයත්, රාජ්‍ය ණය පිළිබඳ විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ ප්‍රගතියේ පස්වන ස්ථානයත් හිමිකරගෙන තිබෙනවා. මේවා නොවෙයිද, පසුගිය අවුරුදු දෙක තුළ අපි ලබා ගත් ජයග්‍රහණ? මේවා නොවෙයිද, අපි කථා කළ යුත්තේ? මීට අවුරුදු දෙකකට ප්‍රථමයෙන් මේ රට තිබුණු තැනත්, ආර්ථිකය තිබුණු තැනත් අනුව, අද වනකොට අපට මේ ස්ථාවරත්වය ළඟා කර ගැනීමට හැකි වුණේ කොහොමද කියන එක තමයි ගරු ජනාධිපතිතුමාගේ කථාවෙන් පිළිබිඹු වුණේ. ඒ කථාවට නොවෙයි, වෙන කථාවකටද කොහේද අපේ ගරු විපක්ෂ නායකතුමා ඇහුම්කන් දීලා තිබෙන්නේ.

එතුමා තව එකක් කිව්වා, ගරු කථානායකතුමනි. මේ අධ්‍යාපන අමාත්‍යාංශයට smart board එකක්වත් දී ගන්න බැරි වෙලා තිබෙනවා කිව්වා. Smart board එකක් නොවෙයි, මේ වනකොට 4,570ක් අපි දීලා තිබෙනවා. එකක්වත් දීලා නැහැ කියපු කථාව කෙහෙන් ආපු එකක්ද කියලා මට නම් තේරෙන්නේ නැහැ. ද්විතීයික පාසල් - Secondary schools - ගණනාවකට මේ වනකොටත් අපි Internet connection දීලා තිබෙනවා. මේ දෙසැම්බර් වනකොට ද්විතීයික පාසල් හයදහස් ගණනකට වැඩි ප්‍රමාණයකට Internet connections දෙනවා, ගරු කථානායකතුමනි.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ - National Colleges of Education - අවුරුදු ගණනාවක් තිස්සේ අත් හැර දාලා තිබෙනවා.

ඒ, අපේ ගුරුවරුන් බිහි කරන මධ්‍යස්ථාන. දියුණුව වෙනුවෙන් කිසිම ආයෝජනයක් නොකරපු ඒ විද්‍යාපීඨ නඟා සිටුවන්න අපි විශාල උත්සාහයක් අරගෙන, දැන් ඒ විද්‍යාපීඨවලටත් smart boards දීලා, smart classroom hubs හැදුවා. ඒ ප්‍රථම smart classroom එක මීට මාසයකට විතර කලින් මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අපි විවෘත කළා. විවෘත කරලා, ඒක තව විද්‍යාපීඨ 5කට අපි connect කරලා තිබෙන්නේ. ගුරුවරුන් ඩිජිටල් අධ්‍යාපනය පිළිබඳ පුහුණුව ලබා ගන්න එක අපි දැන් ප්‍රමුඛතාවක් බවට පත් කරලා තිබෙනවා. මේ කිසිවක් මෙතෙක් වෙච්ච නැති දේවල්. අවුරුදු 17කට වෙනස් - revise - නොකරපු විද්‍යාපීඨවල විෂය මාලාව අපි දැන් වෙනස් කරමින් යනවා.

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම අපි ලබා ගත් ජයග්‍රහණ ගැන කථා කරනකොට, විපක්ෂ නායකතුමා මේ සියල්ලම අමතක කරලා වෙන මොනවාදෝ කතන්දර ගණනාවක් කිව්වා. ඒ කතන්දර අපට මේ විවාදයට කොතරම් ප්‍රයෝජනවත් වනවාද කියන එක මම නම් දන්නේ නැහැ. තව කාරණයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

විපක්ෂයේ බොහෝදෙනෙක් අපෙන් ප්‍රශ්න කරන දෙයක් තිබෙනවා. මේ අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට දෙනවා, දෙනවා, දෙනවා කියලා අපි පොරොන්දු වුණා කියලා විපක්ෂය කියනවා. අපි ඒක නිවැරදි කරන්න ඕනෑ. අපි කියලා තිබෙන්නේ, අපි ඒක ක්‍රමානුකූලව ඉහළ නංවනවා කියන එකයි. අධ්‍යාපනයට විතරක් නොවෙයි, මානව ප්‍රාග්ධනය දියුණු කිරීමට අවශ්‍ය වන අනෙක් සියලුම ක්ෂේත්‍රවලට කරන ආයෝජනය අපි ක්‍රමානුකූලව වැඩි කරනවා. විශේෂයෙන්ම අධ්‍යාපනයට කරන ආයෝජනය වැඩි කරනවා කියලා අපි පොරොන්දු වුණා. ඒ පොරොන්දුව අපි ඉෂ්ට කරලා තිබෙන්නේ. මේ අවුරුද්දේ අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 749ක් අපි වෙන් කර තිබෙනවා. අධ්‍යාපනය සඳහා පළාත් අමාත්‍යාංශවලට වෙන් කරපු ප්‍රතිපාදනත් එකතු කරලා බලනකොට ඊටත් වඩා වැඩි ප්‍රමාණයක් වනවා. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ රාජ්‍ය වියදමෙන් සියයට 12.12ක් අපි වියදම් කරන්නේ අධ්‍යාපනය වෙනුවෙන්. අපි 2027 වර්ෂය සඳහා අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 749ක් වෙන් කරනවා. ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි මෙච්චර මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්නේ. රුපියල් බිලියන 104ක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රාග්ධනය වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා. අපට පෙන්වන්න, මීට කලින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රාග්ධනය වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල කොපමණද කියලා.

ගරු කථානායකතුමනි, අපි මේ අය වැය දිහා බලන්න ඕනෑ, දිග හැරෙන කථාවක් ආරම්භ කරපු ගමනක තුන්වැනි අදියර විධියටයි. අපි මේ රට භාරගන්නකොට රට තිබුණු තත්ත්වයත් එක්ක පසුගිය අවුරුදු දෙක තුළ අපි ලබා ගත යුතු දේ ලබා ගනිමින් තිබෙනවා. ඒ නිසා ස්ථාවර වෙච්ච ආර්ථිකයක් පරිවර්තනීය ආර්ථිකයක් කරා ගෙන යෑම සඳහා කළ යුතු ආයෝජන තමයි මේ අය වැය තුළින් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ අවුරුදු දෙක තුළ සෑම ක්ෂේත්‍රයකම ආයතනද, පද්ධතිද, ක්‍රියාවලිද, නෛතික තත්ත්වයන්හිද ස්ථාවර තත්ත්වයක් ළඟා කරගන්න පුළුවන් වීම තුළින් ඊළඟ පරිවර්තනීය ආර්ථිකයක් දක්වා යෑම සඳහා කළ යුතු ආයෝජන සම්බන්ධයෙන් ක්ෂේත්‍රයෙන් ක්ෂේත්‍රයට බලමින් තමයි ගරු ජනාධිපතිතුමා මේ අය වැය ඉදිරිපත් කරන්නේ. මේ, අපේ ආණ්ඩුවේ තුන්වැනි අය වැය. මේ තුන්වැනි අය වැයෙන් තමයි අපි ලබා ගත යුතු ඒ පරිවර්තනීය හැරවුම ලබාගන්න කරන විශේෂ ආයෝජන සිදු කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මෙවර අධ්‍යාපනය, සෞඛ්‍ය, ඩිජිටල් ආර්ථිකය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරන අතර යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා, විශේෂයෙන්ම ප්‍රවාහනය වැනි ක්ෂේත්‍රවලට මේ විධියට ආයෝජනයක් කරමින් රට තුළ පැන නැඟී තිබුණු, අවුරුදු ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් තිබුණු ඒ ප්‍රශ්නවලට සැලසුම්සහගතව, ඉලක්කගතව අපි මේ හැරවුම කරනවා. ඒ හැරවුම සාර්ථක වන බවටත් කිසිම සැකයක් නැහැ, ගරු කථානායකතුමනි.

ඒ වාගේම විපක්ෂ නායකතුමා කිව්වා, අපි රාජ්‍ය සේවය අතහැරලා දාලා තැපැල් ඡන්දයකට කලින් කියපු දේ නොවෙයි දැන් කියන්නේද මොකක්ද කථාවක්. ගරු කථානායකතුමනි, ඒක ලෝකයේ හොඳම විහිළුව වෙන්න ඕනෑ. රාජ්‍ය සේවය බින්දුවට වට්ටපු අය; රාජ්‍ය සේවයට තිබෙන ගරුත්වය නැති කරපු අය; තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් රාජ්‍ය සේවය මෙහෙයවන්න උත්සාහ කරපු අය දැන් මොකක්ද මේ කියන්නේ? අපි දන්නවා නේ, ඉස්සර කොහොමද මේ බඳවා ගැනීම් කරන්න යෝජනා වුණේ කියලා. මම ඒ කථාව ආයෙත් කියන්න ඕනෑ නැහැ. ඒක කියලා දැන් වන වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, නමුත් වසර ගණනාවකට පසුව නියමිත විධියට, qualifications අනුව විභාග පවත්වා කිසිම දේශපාලන මැදිහත්වීමකින් තොරව සුදුස්සාට සුදුසු තැන දෙන ඒ පොරොන්දුව මත රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් කරන්න අවශ්‍ය කටයුතු අපි දැන් ආරම්භ කර තිබෙනවා.

2019න් පස්සේ හිර වෙලා තිබුණු, - සමහර පුරප්පාඩු 2017 ඉඳන් හිර වෙලා තිබෙන්නේ - ඒ බඳවා ගැනීම් ක්‍රියාවලිය අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. ඒ vacancies පිරවීම සඳහා විභාග තියලා, ඒ විභාග ප්‍රතිඵල අනුව interviews තියලා, ඒ අනුව දැන් බඳවා ගැනීම් සිද්ධ වෙමින් පවතිනවා. අපි රාජ්‍ය සේවයට 140,000ක් පමණ බඳවා ගැනීමට අනුමැතිය දීලා, මේ වෙනකොටත් 40,000ක් බඳවාගෙන ඉවරයි. ගරු කථානායකතුමනි, ඊටත් වඩා වැදගත්ම දේ තමයි, අද රාජ්‍ය සේවකයාට හිස ඔසවාගෙන, තමාගේ අභිමානය තියාගෙන, තමාගේ දක්ෂතාව පිළිබිඹු වන විධියට වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් අපි රාජ්‍ය සේවය තුළ හදලා තිබීම. තවදුරටත් දේශපාලන අධිකාරියට හිස නවන්නේ නැති, දේශපාලන අධිකාරිය කියන කියන දේවල්වලට හිස නවාගෙන ඉන්න ඕනෑ නැති, කොන්ද කෙළින් තියාගෙන ඉන්න පුළුවන් රාජ්‍ය සේවකයෙක් අපි බිහි කරලා තිබෙනවා. ඒ රාජ්‍ය සේවකයාට වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් අපි හදාගෙන යනවා, ගරු කථානායකතුමනි. නිහතමානීව කටයුතු කරන ආණ්ඩුවක් හැටියට අපි මේ කාරණයත් දන්නවා. අපි රට භාර ගන්නකොට තිබුණු තත්ත්වයත්, අපිට වුවමනා තැනට මේ රට ගෙනියන්න අවශ්‍ය කරන පරිවර්තනය ගැනත් අපිට හොඳ අවබෝධයක් තිබෙනවා. කඩා වැටුණු ආයතන නැවත පටන් ගන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. අපි මේ රට භාර ගන්නකොට රට නැවතිලා තිබුණේ. නැවතුණු රටක් නැවත වතාවක් ඉදිරියට ගෙනියන එක ලෙහෙසි වැඩක් නොවෙයි. නමුත්, ඒක අපි කරලා තිබෙනවා. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමාගේ කථාවේදීත් එතුමා රාජ්‍ය සේවකයන්ට ආරාධනාවක් කළේ. මොකද, දැන් අපිට අභියෝගයක් තිබෙනවා. ඒ අනුව ඉතිහාසගත capital investment එකක් අපි 2027දී කරන්නට නියමිතයි. මේ capital investment එක සාර්ථක කරගන්න නම් අපි සියලුදෙනාට මහන්සි වෙලා වැඩ කරන්න වෙනවා; අපි සියලුදෙනා එකතු වෙලා ඒ වෙනුවෙන් වැඩ කරන්න වෙනවා. ඒ ඉලක්කයට යන්න නම් අපට සාමාන්‍ය රිද්මයට වැඩ කරන්න බැරි වෙනවා, ගරු කථානායකතුමනි. මේ අවුරුදු දෙකේ අපිට පෙනුණා, අපේ රාජ්‍ය සේවය කොහොමද කටයුතු කරන්නේ කියලා. අලුත් රිද්මයට අනුව, මේ විධියට target දීලා, මේ විධියට දුෂණය, නාස්තිය නැතිව වැඩ කරන්න අපේ රාජ්‍ය සේවකයා අනුගත වෙමින් යනවා. ක්‍රමානුකූලව ඒ අනුගත වීම සිද්ධ වෙනවා. නමුත්, අපිට 2027දී අභියෝගය තිබෙන්නේ අපට පැවරුණු මේ කාර්යභාරය ඒ වසර තුළ සාර්ථකව කරගෙන යන්නයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister, you have two minutes remaining.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

ගරු ජනාධිපතිතුමා අපිට - හැම අමාත්‍යවරයෙකුටම - ඒ අභියෝගය දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමාත්, අපිත් රාජ්‍ය සේවයේ අයට ඒ වැඩකටයුතු කරන්න පුළුවන් වාතාවරණයක් සකස් කර දී තිබෙනවා; ඒ අභිමානය සහ ගෞරවය ලබා දීලා තිබෙනවා. ඔබේ දක්ෂතාවට, ඔබේ හැකියාවට අපි තැනක් ලබා දෙනවා. ඒ අනුව තමයි අපිට මේ කටයුත්ත කරගෙන යන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා තමයි ගරු ජනාධිපතිතුමා රාජ්‍ය සේවකයන්ට ආරාධනාවක් කළේ. අනේ මන්දා! විපක්ෂ නායකතුමා වෙන කාගේ හරි අය වැය කථාවක් අහගෙන හිටියාද කියලා. එතුමා මේ උත්තර දෙන්නේ වෙන අය වැය කථාවක් අහගෙන ඉඳලා ද දන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා ඊයේ අය වැය කථාව අවසන් කළේ සියලු දෙනාටම ආරාධනාවක් කරමින්. මේ රට අපි ගොඩනඟන්න ඕනෑ. අපිට රට තුළ මේ විධියට බෙදිලා, මේ ආකාරයෙන් දුප්පත් විධියට එකිනෙකාට විවේචන එල්ල කරමින් මේ රට ඉදිරියට ගෙනියන්න බැහැ, ගරු කථානායකතුමනි. ගරු ජනාධිපතිතුමාත් ආරාධනා කළේ ඒකටයි. ඔව්, අපි අතර වෙනස්කම් තිබෙනවා. ඒ වෙනස්කම් ප්‍රජාතන්ත්‍රවාදී රටකට අවශ්‍යයි නේ. වෙනස් මතවාදවලට, වෙනස් ප්‍රවේශවලට අපි ගරු කරනවා. නමුත්, විවේචන සිද්ධ විය යුත්තේ කරුණු මත, දත්ත මත. මොකක් හෝ න්‍යායාත්මක වෙනසක් තුළ අපිට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් අවසානයේ විපක්ෂයද, ආණ්ඩුවද කියලා වෙනසක් නැහැ, අපි සියලු දෙනාම වැඩ කරන්නේ මේ රට දියුණු කරන්නයි. අන්න ඒ ආරාධනාවයි ගරු ජනාධිපතිතුමා අවසානයේදී කළේ. ඒ ඉලක්කය වෙනුවෙන් අපි සියලුදෙනා එකට වැඩ කරමු. එකිනෙකාව විවේචනය කරන එකත් ඒ ගමනේ කොටසක් නේ. නමුත්, ඒ විවේචන සිද්ධ විය යුත්තේ යම්කිසි ආකාරයකින් බුද්ධිමත් විධියට, කරුණු මත සහ ශිෂ්ට සම්පන්න විධියට. අපි කවුරුත් එකතු වෙලා වැඩ කරමු කියන ආරාධනාව තමයි ගරු ජනාධිපතිතුමා කළේ. අන්න ඒ විධියට අපි වෘත්තීයභාවය රැකගෙන මේ සංවාදය කරමින් ඉදිරියට යනවා නම්, මම හිතන විධියට විපක්ෂයේත්, අපේත් අරමුණ එකක් විය යුතුයි. ඒ අරමුණ එකක් කියලා අපි තවම හිතනවා. ඒක අපට තිබෙන මොකක්වත් පෞද්ගලික වුවමනාවක් නොවෙයි; ඒක බලලෝභීකම නොවෙයි; අපේ පක්ෂය විතරක් ආරක්ෂා කරගන්න එකක් නොවෙයි. අපි මේ රට ආරක්ෂා කරගන්න ඕනෑ. මේ රටේ මිනිස්සු වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ කියන අරමුණ අපි දෙගොල්ලන්ටම තිබෙනවා කියන එක අපි තවමත් විශ්වාස කරන්න කැමැතියි. ඒක අපට විතරක් තිබෙන අරමුණක් නොවෙයි කියන එකත් මම කියන්න කැමැතියි. අන්න ඒ අරමුණ වෙනුවෙන් එකට වැඩ කරමු කියන ආරාධනාව තමයි ගරු ජනාධිපතිතුමා කළේ. මමත් ඒ ආරාධනාව නැවත වතාවක් මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි. විවේචන කරන්න. ඒක නොවෙයි ප්‍රශ්නය. නමුත් අවසාන අරමුණ වෙනුවෙන් අපි එක ගමනක යමු. ඒ ගමනේ කොටස්කරුවන් හැටියට අපට විවිධ කාර්යභාරයන් පැවරෙන්න පුළුවන්. ඒ වාගේම එක එක කාලවලදී විවිධ වගකීම් අපට පැවරෙන්න පුළුවන්. නමුත් අපි යන ගමන එකයි. අපේ ඉලක්කය එකයි. ඒ වෙනුවෙන් අපි සියලු දෙනාම වැඩ කරමු කියන ඉල්ලීම කරමින්, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Upali Pannilage. You have 16 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.39]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම 2027 ජාතික පුරවැසි අය වැය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ආරම්භයේදීම යම් කරුණු කිහිපයක් කියන්න මම කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි කිසිම ආයතනයක කිසිම පුද්ගලයෙකුගේ වාර්තා සිඹ ගන්නේවත්, ඒවා අන්ධානුකරණයෙන් ඒ විධියට පිළිගන්නේවත් නැහැ. නමුත්, වගකිව යුතු රජයක් විධියට, වගකීම් දරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු විධියට ලෝකයේ වෙන සිදුවීම් පිළිබඳව, ඒ වාගේම යම් යම් ආයතන විසින් ඉදිරිපත් කරන දත්ත පිළිබඳව, පර්යේෂණ පිළිබඳව සහ සැබෑ මූලාශ්‍ර පිළිබඳව අපට යම් අධ්‍යයනයක් තිබෙනවා වාගේම ඒවා පිළිබඳව අපි අවධානය යොමු කර තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. World Bank Group එකේ Report එකක් තිබෙනවා, "Poverty and Equity Brief: October 2026, Sri Lanka" කියලා. ඒකේ මොනවාද කියලා තිබෙන්නේ? I quote:

> "Sri Lanka's macroeconomic rebound has yet to translate into a recovery in household welfare."

That is the welfare level.

> "Poverty is projected to decline from 16.9 percent in 2025 to 15.8 percent in 2026…"

මොකක්ද කියන්නේ? Poverty decline වෙලා තිබෙනවා, 2024දී, 2025දී සහ 2026දී. ඒ වාගේම World Bank Group එක, "Sri Lanka Development Update October 2026, From Recovery to Transformation" කියලා වාර්තාවක් ඉදිරිපත් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොනවාද, ඒකේ ප්‍රධාන වශයෙන් කියා තිබෙන්නේ? I quote:

> "Sri Lanka has reached an important milestone in its recovery from the 2022 crisis, with real GDP returning to pre-crisis levels. The economy expanded by 4.7 percent in the first half of 2026, ..."

මම repeat කරනවා, "The economy expanded by 4.7 percent in the first half of 2026.

> "...marking twelve consecutive quarters of growth and reflecting the benefits of macroeconomic stabilization, fiscal consolidation, exchange rate reforms, and debt restructuring. Strong industrial activity, investment growth, and resilient services supported the recovery, while fiscal performance significantly exceeded expectations."

මේක තමයි ලෝක බැංකු වාර්තාවෙන් කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකක්ද කියන්නේ? 2026 වසරේ පළමු අර්ධයේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 4.7කින් වර්ධනය වෙලා තිබෙනවා. එය අඛණ්ඩව, කාර්තු 12ක වර්ධනයක් බව අපට පෙනෙන්න තිබෙනවා. ඒ වාගේම 2022 වසරේ ආර්ථික අර්බුදයට පෙර පැවති සැබෑ දළ දේශීය නිෂ්පාදනයේ තත්ත්වයට දැන් අපි ළඟා වෙමින් තිබෙනවා. ඒ වාගේම 2026දී ආර්ථික වර්ධනය සියයට 4.4ක් වෙනවා කියලා පුරෝකථනය කර තිබෙනවා. 2027 වසරේ ආර්ථික වර්ධනය ඒ වාගේම සියයට 4.2ක තත්ත්වයකට වර්ධනය වනු ඇතැයි කියා පුරෝකථනය කර තිබෙනවා.

ඊළඟට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මොකක්ද කියන්නේ? 2026 මාර්තු මාසයේ IMF එකේ Fifth and Sixth Reviews පිළිබඳ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා, 2025දී ආර්ථික වර්ධනය සියයට 5යි, 2026දී යම් පසුබෑමක් තිබුණත්, ඒක යම් ප්‍රමාණයකට පවත්වා ගෙන යන බව. ඊළඟට, ආසියානු සංවර්ධන බැංකුව මොකද කියන්නේ? ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධාන නිරීක්ෂණ අනුව, 2024 සහ 2025 වසර දෙකේදීම ශ්‍රී ලංකාවේ සියයට 5ක ආර්ථික වර්ධනයක් වාර්තා කරනවා කියනවා. ADB එක මොකද කියන්නේ? 2025දී සියයට 5යි, 2026දී සියයට 4යි, 2027දී සියයට 4.2යි කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු මෙහෙම තිබෙනකොට මෙතුමන්ලා අමුතු විධියේ දත්ත ඉදිරිපත් කරනවා; අමුතු විධියේ වාර්තා ඉදිරිපත් කරනවා. ඒවායේ කිසිම පදනමක් නැහැ; කිසිම මූලාශ්‍රයක් නැහැ. තමන්ට ඕනෑ විධියට අර්ථකථනය කරනවා.

2026 "World Bank Macro Poverty Outlook Report" එකේ එක කොටසක් මා උපුටා ගන්නවා. ඒකේ International Poverty Level එක ගැන ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ කියැවෙනවා. ඇමෙරිකානු ඩොලර් තුනට අඩු ඒක පුද්ගල ආදායමක් ලබන ප්‍රතිශතය ලංකාවේ 6.9යි. දළ වශයෙන් ගත්තොත්, ඩොලර් 3ක් කියන්නේ, රුපියල් 333න් වැඩි කරලා බැලුවොත්, මාසිකව සාමාන්‍යයෙන් රුපියල් 29,700ක්. ඒ කියන්නේ අපේ පවුලක සාමාන්‍යයෙන් හතරදෙනෙක් ඉන්නවා කියලා ගත්තොත්, රුපියල් 118,800ට වඩා අඩු ආදායම් ලබන පවුල් ඉන්නේ අපේ රටේ සියයට 6.9යි. ඉතින් විපක්ෂ නායකතුමාත් ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අපේ රටේ දරිද්‍රතාව පිළිබඳව අන්තර්ජාතික මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව විතරක් නොවෙයි, අපේ රටේම මහ බැංකුවත් සැබෑ ලෙස, නිවැරදි ලෙස පර්යේෂණ කරලා, දත්ත රැස් කරලා, ඒවා විශ්ලේෂණය කරලා ඉදිරිපත් කරපු දත්ත - තොරතුරු - සම්පූර්ණයෙන්ම නොමහ යවන විධියට වෙනත් විධියේ අර්ථකථන ඉදිරිපත් කිරීම පිළිබඳව මම ඉතාම කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනතාවට සැබෑ තොරතුරු ලබා දෙන එක අපේ වගකීමක්. ඒක මේ ව්‍යවස්ථාදායකයේ සිටින සියලු මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරයක්. ඒ නිසා ජනතාවට සැබෑ තොරතුරු ලබා දීමේදී, යම් යම් වාර්තා උපුටා ගැනීමේදී ඒවා නිවැරදි ලෙස උපුටා ගැනීම වැදගත් වෙනවා. දත්ත උපුටා ගැනීම සඳහා විද්‍යාත්මක පදනමක් තිබෙනවා. ඒවා අර්ථකථනය කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේද තිබෙනවා. ඒ ඔස්සේ තමයි ඒවා උපුටා ගන්න ඕනෑ; ඒවා ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැතුව නිකම් කටට ආවාට වචන පාවිච්චි කරන එක ගැළපෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් විධියට.

ඉතින් මම පැහැදිලි කරන්න කැමැතියි, මේ ඉදිරිපත් කරපු දත්තත් එක්ක, ගත වෙච්ච වසර දෙකක කාලය පුරා අපේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේත්, ඒ වාගේම සමාජයීය ක්ෂේත්‍රයේත්, ඒ වාගේම සංස්කෘතික සහ අනෙකුත් ක්ෂේත්‍රවලත් අප විසින් ඇති කරනු ලැබූ ස්ථාවරත්වයත්, ඒ ස්ථාවරත්වය ඔස්සේ අපි ළඟා කරගෙන තිබෙන වර්ධනයනුත්, ඒ වර්ධනයේ ප්‍රතිඵල අපි කොහොමද මේ රටේ ජනතාව වෙත පෙරළා ලබා දෙන්නේත් කියන කරුණ පිළිබඳව.

අය වැය ලේඛනයක් කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛන ප්‍රමාණයක් විතරක් නොවෙයි. සංඛ්‍යාලේඛන ඉතාම වැදගත්. නමුත් අපේ රටේ ජනතාව අපේක්ෂා කරන ආර්ථික හා සමාජයීය පරිවර්තනය පිළිබඳවත්, ඒ වාගේම රජයේ ඉදිරි වැඩ පිළිවෙළ පිළිබඳවත්, ඔවුන්ගේ දර්ශනය - vision එක -, ඔවුන් අවසානයේ ගමන් කරන තැන මොකක්ද කියන එක පිළිබඳවත්, ඒ දර්ශනය ළඟා කර ගැනීම සඳහා අප විසින් අනුගමනය කරන අපේ කාර්යභාරය, අපේ මෙහෙවර - mission එක - කුමක්ද කියන එක පිළිබඳවත් පිළිබිඹු කරනවා, අය වැය ලේඛනය තුළින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ජනතාව ජාතික ජන බලවේගයට 2024 වර්ෂයේදී ආණ්ඩු බලය ලබා දීලා දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. ඒ ගත වෙච්ච කාල සීමාව තුළ මේ රටේ ජනතාව අප වෙතින් අපේක්ෂා කළ සමාජ, දේශපාලනික සහ ආර්ථික ප්‍රතිසංස්කරණ රාශියක් ඔවුන් වෙත දිනා දීමට අපි සමත් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම ඒ ජනතාව අපෙන් අපේක්ෂා කළේ, දේශපාලන සංස්කෘතියේ වෙනසක්. ඒ දේශපාලන සංස්කෘතිය, පාලකයිනුයි, පාලිතයිනුයි විධියට තිබුණු සම්බන්ධතාව, සාමාන්‍ය මහජනතාවත්, මහජන නියෝජිතයිනුත් අතර තිබෙන සම්බන්ධතාවක් දක්වා, සහයෝගීතාවක් දක්වා පරිවර්තනය කිරීමේ වැඩ පිළිවෙළ තමයි ප්‍රධාන වශයෙන්ම ගත වෙච්ච වසර දෙකක කාල සීමාව තුළ අපේ රජය විසින් අනුගමනය කළේ. ඒ වාගේම ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය මනා ලෙස ඉටු කරමින් සමාජ ක්ෂේත්‍රයේත්, දේශපාලන ක්ෂේත්‍රයේත්, ආර්ථිකයේත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය මැදිහත්වීම, ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය මැදිහත්වීම තමයි, ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී මුලින්ම ඉදිරිපත් කළේ. අප විසින් පසුගිය වසර දෙකක කාල සීමාව තුළ නීතිමය ක්ෂේත්‍රයේ ඇති කරනු ලැබූ ප්‍රතිසංස්කරණ තිබෙනවා. ජනතාව අපේක්ෂා කරන, අපේ දර්ශනය කරා යාමට අපේ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා, අප අනුගමනය කරමින් තිබෙන කාර්යභාරයට ළඟා වීම සඳහා 2027 වර්ෂයේදීත්, ඉදිරි වර්ෂවලදීත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා තමයි ඒ නීතිමය ප්‍රතිසංස්කරණ අපි හඳුන්වා දෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

සමාජයක් පවතින්නේ නීති මතම පමණක් නොවෙයි. සමාජයක් පවතින්න සමාජ ප්‍රතිමාන සහ සමාජ අගයන් ගොඩනැඟීමත් අවශ්‍යයි. සමාජය ගත්තාම සමාජ පර්යායක් - social order එකක් - තිබෙනවා. සමාජයක් ගොඩනැඟිච්ච විධියක් තිබෙනවා. ඒක ගොඩ නැහෙන්නේ සමාජ සංස්කෘතියත් එක්ක; සමාජයේ තිබෙන පවුල, ඥාතිත්වය, ආගම, අධ්‍යාපනය වැනි ආයතනත් එක්ක. එතැනින් එහාට ගියාට පසුව, මේවා තුළින් සමාජය පවත්වා ගෙන යන්න බැරි වුණාට පසුව තමයි අපට නීති ප්‍රතිසංස්කරණ අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අපි 2025, 2026 අය වැය ලේඛන තුළිනුත්, ඒ අනුගමනය කරපු ක්‍රියාමාර්ග තුළිනුත්, අපි නීතිමය ක්ෂේත්‍රයෙන් පමණක් සමාජ ප්‍රතිසංස්කරණ අපේක්ෂා කළේ නැහැ. නීතියෙනුත් සමාජ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. නමුත්, සමාජය තුළ ගොඩනැහෙන්න ඕනෑ දයාව, ආදරය, කරුණාව, අනෙකාට ගරු කිරීම යන ගුණාංගත්. විශේෂයෙන් ගෝත්‍රික සමාජ, ඒ සංස්කෘතික තත්ත්වයන් අත්විඳින සමාජයක සිට දියුණු මානව සමාජයක් දක්වා සමාජය පරිවර්තනය කරන්න, සියලු ජන වර්ගයන්ට සමානව සලකන, කාන්තාවන්ට, පිරිමින්ට සමානව සලකන, දරුවන්ට, වැඩිහිටියන්ට සමානව සලකන, සමාජ ප්‍රතිමාන සහ අගයන් - social norms and social values - සහිත සමාජයක් දක්වා මේ සමාජය පරිවර්තනය කරන්න තමයි අපි මේ අය වැය තුළින් උත්සාහ කරන්නේ. ඒ නිසා තමයි හුදෙක් ආර්ථික සංවර්ධනයට පමණක් නොවෙයි, සමාජ සාධාරණත්වය වෙනුවෙන්, ආගම සංස්කෘතිය වෙනුවෙන්, සමාජයේ දියුණුව වෙනුවෙන් අපි මේ අය වැයෙන් විශාල වශයෙන් මුදල් වෙන් කර තිබෙන්නේ.

ගරු අගමැතිතුමිය මීට සුළු මොහොතකට කලින් ප්‍රකාශ කළා වාගේ අපේ මේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරපු ආකාරයට ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක් ගොඩනැඟීම තමයි අපේ අරමුණ, අපේ පරමාර්ථය. එය දිනා ගැනීම සඳහා ගුණාත්මක අධ්‍යාපන පද්ධතියක් ගොඩනැඟිය යුතුයි. ඒ වෙනුවෙන් තමයි 2027 අය වැය ලේඛනයෙන් අපි රුපියල් බිලියන 749ක් - රුපියල් මිලියන හත්ලක්ෂ හතළිස්නවදහසක් - වෙන් කරලා තිබෙන්නේ. අගමැතිතුමිය කිව්වා, එය රාජ්‍ය වියදමෙන් සැලකිය යුතු පංගුවක් කියලා. අපේ රටේ රාජ්‍ය වියදමෙන් සැලකිය යුතු විශාල පංගුවක් අධ්‍යාපනය - සාමාන්‍ය අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනයේ සිට වෘත්තීය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය - ගොඩ නඟන්න අපි වෙන් කර තිබෙනවා. දියුණු මානව සම්පතක් ගොඩ නැඟුවොත් තමයි මේ සමාජය අපේක්ෂා කරන ඒ පරිවර්තනය අපට දිනාගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි, සමාජයීය ක්ෂේත්‍රය තුළ සමාජ ප්‍රාග්ධනය - social capital - සහ මානව ප්‍රාග්ධනය - human capital - දියුණු කිරීමත් අපේ මේ අය වැය ලේඛනයේ ප්‍රධානම අරමුණක් වෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැමදාම අපේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැන කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන පිටු 231ටම වග කියනවා. හැබැයි, ප්‍රතිපත්තියක් කියන්නේ, ලියවිල්ලක් කියන්නේ, යම් වගකීමක් දරනවා වාගේම ඒක ඒ විධියටම follow කරන එක නොවෙයි. ලෝකයේ ඇති වෙන, සමාජයේ ඇති වෙන සන්දර්භයන්ට ගැළපෙන විධියට ඒවා අවශ්‍ය පරිදි සකසා ගනිමින් ක්‍රියාත්මක කිරීම තමයි අපේ වගකීම. ඉතින්, අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා.

අපි මොකක්ද ආර්ථිකය සම්බන්ධයෙන් කියා තිබෙන්නේ? අපි ඉතාම පැහැදිලිව මුලින්ම කියා තිබෙනවා, සාර්ව ආර්ථික ස්ථාවරත්වය ගැන. සාර්ව ආර්ථිකය ස්ථාවර කර ගැනීමට තමයි, 2025 සහ 2026 අය වැය ලේඛනවලින් අපව මෙහෙයවුයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ගත වුණු අවුරුදු දෙක තුළ අපි සාර්ව ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා; ණය ප්‍රතිව්‍යුහගත කරලා තිබෙනවා; අය වැය හිඟය අඩු කරගෙන තිබෙනවා; ණය ගෙවීමේ හැකියාව වැඩි කරගෙන තිබෙනවා; විදේශ සංචිත වර්ධනය කරගෙන තිබෙනවා; ඒ වාගේම, රාජ්‍ය මූල්‍ය චිනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒත් එක්කම, මා කලින් කිව්වා වාගේ අපි ආසන්න වශයෙන් සියයට 5ක ආර්ථික වර්ධනයකුත් මේ අවුරුදු දෙක තුළ -2025 සහ 2026 අවුරුදු දෙක තුළ- ළඟා කරගෙන තිබෙනවා.

අපි ඒ ඔස්සේ ආර්ථිකය ස්ථාවර කරගෙන, ආර්ථිකයේ යම් වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙන්න මේ වර්ධනය කර ගත්තු ආර්ථිකයේ ප්‍රතිලාභ පෙරළා ජනතාව වෙත ලබා දීම තමයි, ඒ ඔස්සේ සමාජ, ආර්ථික හා සංස්කෘතික පරිවර්තනයක් ඇති කිරීම තමයි, 2027 අය වැය ලේඛනය තුළිනුත්, ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය කථාව තුළිනුත් අපට පිළිබිඹු වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා 2027 අය වැය ලේඛනය කියන්නේ, එක පැත්තකින් මේ රටේ ස්ථාවර වුණු මේ ආර්ථිකය තවදුරටත් වර්ධනය කර ගනිමින්, ඒ වර්ධනය කර ගත්තු ආර්ථිකයේ ප්‍රතිලාභ හැකිතාක් සාධාරණ ලෙස පෙරළා ජනතාව වෙත ලබා දීමේ අය වැය ලේඛනයක්. අපි ජනතාවට පොරොන්දු වුණේ නැහැ, විපක්ෂයේ මෙතුමන්ලා කියපු එක එක විධියේ දේවල්. අපි ජනතාවට පොරොන්දු වුණේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරනවා කියලායි. නිෂ්පාදන ආර්ථිකයේ මූලික කොටස් 3යි. නිෂ්පාදනය වර්ධනය වෙන්න ඕනෑ, නිෂ්පාදනයට හැකිතාක් ජනතාව සහභාගි කරවා ගන්න ඕනෑ, ඒ වර්ධනය වෙච්ච නිෂ්පාදනයේ ප්‍රතිලාභ හැකිතාක් සාධාරණ ලෙස ජනතාවට බෙදිලා යන්න ඕනෑ. අපි දැන් ආර්ථිකය ස්ථාවර කරගෙන තිබෙනවා; යම් වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. එහි ප්‍රතිලාභ ජනතාවට හැකිතාක් සාධාරණව බෙදී යන්නේ කොහොමද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ වෙනුවෙන් තමයි, මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා තමයි ලංකා ඉතිහාසයේ කවදාවත් නැති විධියට ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් ට්‍රිලියන දෙකක් - බිලියන 2,000ක් - වෙන් කරලා තිබෙන්නේ. ඒ සංවර්ධන ව්‍යාපෘති හරහා ජනතාවට ප්‍රතිලාභ ලැබෙනවා.

ඊළඟට, වැටුප් හා දීමනා විධියටත් ජනතාවට ප්‍රතිලාභ ලැබෙනවා. අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් 2025දී වැඩි කළා; 2026දී වැඩි කළා; 2027දීත් වැඩි කළා. 2027 අය වැයෙන් යම් දීමනා ප්‍රමාණයක් නැවත ගරු ජනාධිපතිතුමා විසින් යෝජනා කරලා තිබෙනවා. අන්න ආර්ථිකයේ ප්‍රතිලාභ පෙරළා ජනතාවට ලැබෙන ආකාරය. ඊළඟට, සුබසාධනය හරහාත් ජනතා ප්‍රතිලාභ ලබා දෙනවා. රටේ රැක බලා ගත යුතු ජනතාව අපි රැක බලා ගන්න ඕනෑ. ආබාධ සහිත පුද්ගලයන්, වකුගඩු රෝගය වැනි රෝගාබාධවලින් පෙළෙන පුද්ගලයන්, අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයන් හා වෙනත් රැක බලා ගත යුතු අය වෙනුවෙන් සමාජ ආරක්ෂණය සඳහා 2027 අය වැයෙන් ගරු ජනාධිපතිතුමා ආසන්න වශයෙන් රුපියල් බිලියන 236ක් වෙන් කරලා තිබෙනවා. අන්න සමාජ ආරක්ෂණය හරහා නැවත වතාවක් ජනතාවට ඒ ප්‍රතිලාභ ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මට සඳහන් කරන්න තිබෙන්නේ, මේ 2027 අය වැය ලේඛනය කියලා කියන්නේ නිකම්ම නිකම් සංඛ්‍යාලේඛන ප්‍රමාණයක් පමණක්

නොවන බවයි. මෙය මේ රටේ සමාජ, ආර්ථික හා දේශපාලන පරිවර්තනයක් උදෙසා වූ මූලාරම්භයක්. ඒ පරිවර්තනය වෙනුවෙන් අපි සියලුදෙනා කැප වෙනවා. ඒ පරිවර්තනයේ සැබෑ ප්‍රතිඵල ළඟා කර ගැනීම වෙනුවෙන් අපි අපේක්ෂා දල්වාගෙන බලා සිටිනවා කියන එක මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බෙහෙවින් ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wijesiri Basnayake. You have 10 minutes.

[පූ.භා. 11.56]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2027 අය වැය විවාදයේදී මට කථා කිරීම සඳහා කාලය වෙන් කිරීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ විවාදයේදී විශේෂයෙන්ම අපේ විපක්ෂ නායකතුමා පටලවාගත්තා. එතුමා වසල සූත්‍රය ගෙනැල්ලා අප පිළිබඳව අර්ථකථනයක් කළා. වමට සිග්නල් දමලා දකුණට යනවා නම් වසලයෙක්ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුදුරජාණන් වහන්සේ වසල සූත්‍රයේදී අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාට ප්‍රධාන කරුණු 8ක් දේශනා කළා. ක්‍රෝධය, බද්ධ වෛරය, ප්‍රාණඝාතය, සොරකම, මුසාවාදය, දුරාචාරය, මවුපියන්ට නොසැලකීම, මව්පියන්ට සහ සහ වැඩිහිටියන්ට නොසැලකීම, මසුරුකම සහ වංචාව යනාදිය තිබෙනවා නම් අන්න ඒ පුද්ගලයා තමයි වසලයෙක් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විපක්ෂ නායකතුමාගෙන් ප්‍රශ්න කරනවා, මේ වැදගත් විවාදයේ විපක්ෂයේ ආරම්භක කථාව කිරීමට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමාට නොදීම පිළිබඳව. ඒ වාගේම අපි ඒ ගැන දුක් වෙනවා. අප බලාපොරොත්තු වුණේ ඊයේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද අය වැය පිළිබඳව ආර්ථික විද්‍යාඥයෙකුගෙන් හොඳ critique එකක්. හැබැයි දැන් ඇල් වතුර වාගේ. අපට මතකයි, 2026 අය වැයේදී හර්ෂ ද සිල්වා මැතිතුමා ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ආදායම් කළමනාකරණය, මූල්‍ය විනය පිළිබඳව කථා කරමින් කිව්වා, භාණ්ඩාගාරය ඉතිරිලා යනවා කියලා. අන්න ඒ නිසාද දන්නේ නැහැ මෙවර එතුමාගේ නම කැපිලා තිබෙන්නේ. හරිම කනගාටුයි!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" තමයි මහ ජනතාවත් එක්ක අප එළැඹුණු ගිවිසුම. අපි ඒ ගිවිසුම කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් ක්‍රියාත්මක කරමින් යනවා. මේ වන විට අපි අය වැය දෙකක් මේ මහ පොළොවේ ක්‍රියාත්මක කරලා තිබෙනවා. අද දවසේ ආරම්භ කරපු මේ අය වැය විවාදය අපි දෙසැම්බර් මාසයේ මැද දක්වා මාසයක් පුරාවට සිදු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක ආර්ථිකයක ප්‍රධාන අංශ 4ක් තිබෙනවා. ඒවා තමයි, මූර්ත අංශය, මූල්‍ය අංශය, රාජ්‍ය මූල්‍ය අංශය සහ විදේශ අංශය. මෙන්න මේ 4 බොහොම වැදගත්. විශේෂයෙන්ම රටක සාර්ව ආර්ථික කළමනාකරණ ක්‍රියාවලියේදී මේ අංශවලට අදාළ ප්‍රතිපත්තිවල බලපෑම, ඒ වාගේම මේ අංශ අතර පවතින අන්තර් සම්බන්ධතාව අවබෝධ කර ගැනීම බොහොම වැදගත්. විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය අංශය සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තියට අපි කියනවා "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය" කියලා. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය කිරීමේදී අපි පාවිච්චි කරන ප්‍රධාන උපකරණයක් තමයි, රජයක වාර්ෂික අය වැය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් මොකක්ද අය වැයක් කියන්නේ? රජයක අය වැයක් කියන්නේ ඒ රජය විසින් නිශ්චිත ඉදිරි කාල පරිච්ඡේදයක් තුළ ඉපයීමට අපේක්ෂිත ආදායමත්, ඒ වර්ෂය තුළ දැරීමට නියමිත වියදමත්, ඒ වාගේම ආදායම ඉක්මවූ වියදමක් ඇති අවස්ථාවක ඒ හිඟය - budget deficit එක - කොහොමද පියවා ගන්නේ, අතිරික්තයක් තිබෙනවා නම් අපි කොහොමද ඒ අතිරික්තය ප්‍රයෝජනයට ගන්නේ කියන කාරණා පැහැදිලි කරන ඇස්තමේන්තුවටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2027 අය වැය යටතේ අපේ මහජන ගිවිසුමේ මූලික අරමුණු කිහිපයක් ඉෂ්ට කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ රටෙන් දුප්පත්කම පිටු දැකීම, සාධාරණ සමාජයක් නිර්මාණය කර ගැනීම, අල්ලස, දූෂණය සහ නාස්තිය තුරන් කර ගැනීම, ආර්ථික සංවර්ධනය වේගවත් කරලා මේ රටේ ජනතාව තුළ විශ්වාසය තහවුරු කරලා හැම පුරවැසියෙකුටම යහපත් වූ ජීවිතයක්, සුවපත් වූ ජීවිතයක් ගොඩ නහා ගැනීමට අවස්ථාව සලසා දීම කියන අරමුණු ඉෂ්ට කර ගැනීමයි අපේ බලාපොරොත්තුව.

මේ රට බිඳ වැටිලා තිබුණු හැටි ඔබට මතක ඇති. 2022දී මේ රටේ ආර්ථිකය සෘණ 7.3 යි. අපි දැක්කා ඒ කාලයේ මේ රටේ ගෑස් අර්බුදයක් තිබුණා; ගෑස් ටැංකි පිපුරුවා; ඉන්ධන පෝලිම් තිබුණා; මිනිස්සු ඉන්ධන පෝලිම්වල ඉඳලා මිය ගිහින් ඇදගෙන වැටුණා; අත්‍යවශ්‍ය බෙහෙත් හිඟයක් තිබුණා. අන්න ඒ වාගේ තත්ත්වයක තිබුණු රට අපි අය වැය දෙකකින් ඉස්සරහට ගෙන එනවා; ආර්ථිකයෙහි ස්ථාවරභාවයක් ඇති කර ගන්නවා. පසුගිය වර්ෂයේ - 2025දී - අපේ රටේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් තිබුණා. 2026 මුල් කාර්තුවේ අපි සියයට 5.1ක ආර්ථික වර්ධනයක් ළඟා කර ගත්තා. මේ මොහොතේ ලෝකයේ ඇති වෙලා තිබෙන, මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන යුද්ධය නිසා ලෝක ආර්ථික වර්ධන වේගය සියයට 3.1ක තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තිබියදීත් අපි මේ වර්ෂයේ දෙවෙනි කාර්තුවේ සියයට 4.2ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම අපි දක්ෂ වෙනවා 2025 අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ට ගෙන එන්න. මේක තමයි වසර 68කට පස්සේ වාර්තා වුණු අඩුම අය වැය හිඟය. ඒ වාගේමයි අපි 2025 ජංගම ගිණුමේ දැවැන්ත අතිරික්තයක් නිර්මාණය කර ගන්නවා, ඒක ඩොලර් මිලියන 1,719ක්. මෙය, ඉතිහාසයේ ඇති කර ගත්තු ඉහළම අතිරික්තයයි.

ඒ විතරක් නොවෙයි. ලෝක මට්ටමේ ණය ශ්‍රේණිගත කිරීම්වලින් අපව පහළට දාලා තිබුණේ. ණය ශ්‍රේණිගත කිරීම් අනුව අපි හිටියේ CCC+ මට්ටමේ. එතැන ඉඳලා අද වෙනකොට B - කියන වර්ගීකරණය දක්වා අපි ඉහළට ඇවිත් තිබෙනවා. දැන් ලෝක බැංකුව අපව නම් කර තිබෙනවා; වර්ගීකරණය කර තිබෙනවා ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට. අප අත්පත් කරගත් ඒ ආර්ථික වර්ධනය; ඒ සංවර්ධනය පිළිබඳව ඔබ සියලු දෙනාටම පැහැදිලියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේ ඉදිරිපත් කර තිබෙන අය වැය හරහා අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? ඒ ආර්ථික ස්ථාවරත්වයේ සිට පරිවර්තනීය යුගයක් කරා ගමන් කිරීමට අපට අවශ්‍යයි. සියයට 7ක ඉහළ මට්ටමක වර්ධනයක් අපට අවශ්‍යයි. ඒ වර්ධනය ලබා ගන්න මූලික උපාය මාර්ගික අරමුණු - strategic objectives -

[ගරු විජේසිරි බස්නායක මහතා]

7ක් ඔස්සේ අපි මේ අය වැය නිර්මාණය කර තිබෙනවා. අපට අවශ්‍යයි, මේ රටේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කර ගන්න. ඒ වාගේම, ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව - resilience of the economy - ඇති කර ගන්න අපට අවශ්‍යයි. අන්න ඒ සඳහා, අපි ගිය වසරේත් තිරසර විධියට රාජ්‍ය ආදායම වැඩි කරගෙන තිබෙනවා. ඒ වාගේම, විචක්ෂණශීලී ලෙස අපි වියදම් කළමනාකරණය කරගෙන තිබෙනවා. ඒ වාගේම, සැලසුම් සහගත ලෙස ණය කළමනාකරණය කරනවා. ප්‍රශස්ත ලෙස ණය කළමනාකරණය කරනවා. ඒ විතරක් නොවෙයි. ශක්තිමත් ලෙස, ක්‍රමයෙන්, අනුක්‍රමයෙන් අපි විදේශ සංචිත ගොඩනඟමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මෙවැනි තත්ත්වයක් යටතේ, ඒ ප්‍රධාන උපාය මාර්ගික අරමුණු 7 ඔස්සේ අපට මේ රට ඉහළට ගෙන එන්න අවශ්‍යයි. මේ අවස්ථාවේ ශක්තිමත් විධියට මධ්‍ය කාලීන ආර්ථික ඉලක්ක පිහිටුවා සියයට 7ක ආර්ථික වර්ධනයක්, නැත්නම් ඊට එහා ගිය තිරසර ආර්ථික වර්ධනයක් ලබා ගන්න අවශ්‍ය සැලසුම තමයි අපි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. මේ හරහා අපි ශක්තිමත් හා විශ්වසනීය රාජ්‍ය මූල්‍ය පදනමක් ගොඩනඟනවා. ඒ සඳහා, සුවිශේෂ වූ කාරණා ගණනාවක් ඔස්සේ යෝජනා රාශියක් අපි මේ අය වැය තුළ ඉදිරිපත් කර තිබෙනවා. මේ ඉලක්ක අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රාථමික අතිරික්තය සියයට 2.3ක අගයෙහි පවත්වා ගන්න අපට අවශ්‍යයි. ඒ වාගේම, අය වැය හිඟය සියයට 5ට වඩා අඩු මට්ටමේ තබා ගන්න අපට අවශ්‍යයි. ඒ වාගේම, රාජ්‍ය ණය තිරසර මාවතකට - sustainable path එකකට - ගෙනෙන්න අවශ්‍යයි. අපේ මූලිකම ඉලක්කය වන්නේ මෙන්න මේ කාරණා ටිකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා වූ සුවිශේෂ සැලැස්ම තමයි 2027 අය වැය යටතේ මේ ඉදිරිපත් කර තිබෙන්නේ. ආර්ථික වර්ධනය පිළිබඳව, ඒ පරිවර්තනය පිළිබඳව ඉදිරිපත් කර තිබෙන ඒ දැවැන්ත ප්‍රතිපත්ති හරහා අපි උත්සාහ කරනවා, පුරවැසියන්ගේ ගෞරවය රකින රටක්; දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන රටක්; ශ්‍රමයට නිසි වටිනාකමක් දෙන රටක් නිර්මාණය කරන්න. ඒ වාගේම, මේ රටේ ස්වාභාවික සම්පත් අනාගත පරපුර සඳහා ඉතාම සුරක්ෂිත ලෙස රැක බලා දීම අපේ සිහිනයක්. අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, අපිත් එක්ක එකතු වෙලා 2027 අය වැය මේ මහ පොළොවේ ක්‍රියාත්මක කරමු, මේක ක්‍රියාත්මක කරලා අපේ රට ලෝකයේ ප්‍රබල රටක් බවට පරිවර්තනය කරමු කියලා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 20 minutes at your disposal and the Floor is yours.

[අ.භා. 12.06]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2027 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන මෙම අය වැය දෙස බලනකොට, මෙම අය වැය හරහා රටේ ජනතාවට දීලා තිබෙන සහන මොනවාද? ඒ ගැන සාකච්ඡා කරන්න පසුගිය අවුරුදු දෙක තුළ ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ වීම, රටේ උද්ධමනය වාගේ රටේ ආර්ථිකයට සම්බන්ධ කාරණා අරගෙන බලමු. ගරු අගමැතිතුමිය කියනවා අපි දැක්කා, රට භාරගන්නකොට තිබුණු තත්ත්වයේ සිට දැන් හොඳ තත්ත්වයකට රට ගෙනැත් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව රට භාරගන්නකොට ඇමෙරිකානු ඩොලරයක අගය තිබුණේ රුපියල් 287ට. අද ඩොලරයේ අගය රුපියල් 330 දක්වා ඉහළ ගොස්, රුපියල අවප්‍රමාණ වෙලා තිබෙනවා. ඒ තුළින් පමණක් රටේ ජන ජීවිතයට අවශ්‍ය ආනයනය කරන දේවල්වල මිල සියයට 15ක්, 20කින් වැඩි වෙලා තිබෙනවා. මේකට නොයෙකුත් කාරණා කියන්න පුළුවන්. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, මුදල් ඇමතිවරයා විධියට ගරු ජනාධිපතිතුමා ඊයේ දවසේදී අය වැය කථාව කරනකොට රටේ භාණ්ඩාගාරයේ මුදල් කොච්චර වැඩි වෙලා තිබෙනවාද, රටේ භාණ්ඩාගාරයේ මෙච්චර මුදල් ප්‍රමාණයක් අපි ළඟ තිබෙනවා, අපි මුදල් එකතු කරලා තිබෙන්නේ කියලා කිව්වා. හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වනකොට රටේ මුදල් භාණ්ඩාගාරයේ ඉතුරු වෙලා තිබෙන්නේ කොහොමද? ඒ, ප්‍රාග්ධන වියදම් කිසිවක් සිදු කරලා නැති නිසා. ඒ කියපු ඉලක්ක සම්පූර්ණ කරලා නැති නිසා. ප්‍රාග්ධන වියදම් ඉලක්ක සම්පූර්ණ කරගෙන නැත්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රට තුළ මුදල් ඉතුරු වන එක අහන්න දෙයක්ද? මේ අවුරුද්දේ පළමුවැනි මාස හය ඇතුළත 2026 අය වැයෙන් වෙන් කරපු මුදල් කොච්චර වියදම් කරලා තිබෙනවාද කියන ප්‍රශ්නය තමයි මම අද උදෑසන ස්ථාවර නියෝග 27(2) යටතේ ඇහුවේ. ඒකට පිළිතුරක් නැහැ. අපේ විපක්ෂ නායකතුමා මේ ප්‍රශ්නය දිගින් දිගටම ඇහුවා. මොකද, අය වැය විවාදයේදී කථා කරන්න අපි එය දැන ගන්න ඕනෑ.

මම හිතන්නේ මේ රටේ ජනතාවට මේ අය වැය හරහා සහන නොලැබීමට හේතුවක් තිබෙනවා කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි සාමාන්‍ය ජනතාවට තේරුම් ගන්න පුළුවන් භාෂාවෙන් කියනවා නම්, මම මේ අය වැයෙන් දීලා තිබෙන සහන සංසන්දනය කරන්නේ cricket match එකක් එක්ක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඔබතුමා දන්නවා, cricket match එකක දෙවැනියට bat කරනවා නම්, ලකුණු 250ක් වාගේ පොඩි ඉලක්කයක් නම් defend කරන්න තිබෙන්නේ, සාමාන්‍යයෙන් සමහර captainsලා බලනවා, අන්තිම overs දහයේදී හොඳම සහ දක්ෂම bowlersලා ටික දාලා කොහොම හරි ලකුණු ගැනීම සීමා කරගෙන match එක දිනන්න. ඒ කියන්නේ, අන්තිම overs 10 වෙනකල් හොඳම bowlersලාව තියාගෙන ඉන්නවා. හැබැයි සමහර අවස්ථාවල ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 30වැනි over එකේදි part-time bowler කෙනෙක් දානවා. එතකොට match එක ගහලා, match එක පැරදිලා ඉවරයි. හොඳටම බෝල දාන කට්ටිය අවසානයේ දාන්න බලාගෙන ඉන්නවා. නමුත්, දාන්න බෝලයක් ඉතුරු වෙන්නේ නැහැ. මොකද, match එක පැරදිලා ඉවරයි. අන්න ඒ වාගේ තමයි ආණ්ඩුවත්. මේ අය වැය තුළින් පඩි වැඩි කිරීම් ඇතුළු සහන දෙන්න පුළුවන්කම තිබෙනකොට නොදී ඉතුරු කර කර ඉන්නවා. මොකද, 2028, 2029 මැතිවරණයක් ඉලක්ක කරගෙන මෙන්න මේ සහන ටික දෙමු, මේ ඉතුරු කර ගත්ත සල්ලි ටික තියාගෙන අපි ඒ අවස්ථාවේදී සහන ටික දෙමු කියලා. එහෙම වෙන්න පුළුවන්. ඒක politically ගන්න decision එකක්. හැබැයි, සමහර අවස්ථාවල 35වැනි over එකේදී match එක ඉවර වෙනවා වාගේ, මේ ආණ්ඩුවෙන් ජනතාවට තිබෙන පීඩනයත් එක්ක තුන්වැනි අවුරුද්ද වෙනකොට, ඊළඟ අය වැය එන්න කලින් මේ ආණ්ඩුවට තිබෙන ජනතාවගේ ප්‍රසාදය නැති වෙලා ආණ්ඩුව ගෙදර යන තත්ත්වයට වැටෙන්න පුළුවන්. මොකද, සහන ටික දෙන්න ඡන්දෙ කාලය එනකල් බලාගෙන ඉන්නකොට, ජනතාව ජීවත් වෙන්න බැරි තත්ත්වයට පත් වෙලා, ජනතාවට එපා වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2027 අය වැයෙන් ලබා දී තිබෙන සහන දෙස බැලුවොත්, PAYE Tax එක ගෙවිය යුතු සීමාව වැඩි කර තිබෙනවා. සාමාන්‍යයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, PAYE Tax එකේ සහනය හරහා රුපියල් 162,500ක් පඩි ගන්න කෙනෙකුට මාසිකව රුපියල් 750ක saving එකක් ලැබෙනවා. රුපියල් 200,000ක් පඩි ගන්න කෙනෙකුට රුපියල් 750ක ඉතිරියක් ලැබෙනවා. රුපියල් 250,000ක් ගන්න කෙනෙකුට රුපියල් 1,750ක ඉතිරියක් ලැබෙනවා. රුපියල් 300,000ක් ගන්න කෙනෙකුට රුපියල් 5,000ක ඉතිරියක් ලැබෙනවා. ඒ තමයි PAYE Tax එක හරහා දීලා තිබෙන සහනය.

ඊළඟට අපි බැලුවොත්, ජනාධිපතිතුමා solar panels ගැන කථා කළා. එක ගෙදරකට රුපියල් 25,000ක් දෙනවා කියලා කිව්වා, battery system එකක් සවි කරන්න. Solar panels සම්බන්ධයෙන් ජනාධිපතිතුමා කියන ඒ සහනය දුන්නොත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙන් කරලා තිබෙන මුදල් අනුව උපරිම දෙන්න පුළුවන් ගෙවල් 14,000කට පමණයි. එක පැත්තකින් මහා පරිමාණයේ solar panel හිමියන්ට සහන දීලා තිබෙනවා, අවස්ථාව දෙනවා. නමුත්, බැටරි මිලදී ගැනීම වෙනුවෙන් පවුල් 14,000කටයි මුදල් දෙන්නේ.

ඊළඟට, Tourism Development Levy එක අයින් කරපු එක ගැන කිව්වා. මම ඒ ගැන ජනාධිපතිතුමාගෙන් ඇහුවා. පාසිකුඩාවල ඇති hotels ඒ බද්ද ගෙවන්නේ නැහැ කියලා කිව්වා. ජනාධිපතිතුමා කියන ආකාරයට, එයින් රුපියල් මිලියන 40ක annual loss එකක් තමයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ tourism කරන ප්‍රධාන ආයතනවල turnover එකෙන් සියයට 1ක් ගෙවන්න ඕනෑ නම් මිලියන 40ක් වෙන්න බැහැ, ඊට වඩා වැඩි පාඩුවක් වෙන්න ඕනෑ. ඒවා අය කර ගන්න රජය අපොහොසත් වෙලා තිබෙනවා. සාමාන්‍ය ජනතාවට බදු ගහනවා. හැබැයි, එම බද්ද අය කර ගන්න අපොහොසත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තමයි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමත්. මම නම් හිතන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එකවර 2030 වනකල්ම අය වැය කථාව කළා නම් ඉවරයි කියලා. මොකද, 2027දී මෙච්චරක් දෙනවා, 2028දී මෙච්චරක් දෙනවා, 2029දී මෙච්චරක් දෙනවා කියනවා. රටේ ජනතාව බලාගෙන ඉන්නේ මේ අවුරුද්දේ ඉදිරිපත් කරන අය වැය කථාව හරහා ඊළඟ අවුරුද්දේ ලැබෙන සහන මොනවාද කියලායි. ඒ කියන්නේ රාජ්‍ය නිලධාරීන්ට, පොලීසියේ මහත්වරුන්ට ලබන July මාසයෙන් පස්සේ තමයි ගෙවීමේ වැඩිවීමක් වෙන්නේ. රාජ්‍ය නිලධාරීන්ගේ පඩි වැඩි කරනවා. හැබැයි, Julyවලින් පස්සේ දෙන්නේ. එහෙම නැත්නම් අපි රාජ්‍ය නිලධාරීන්ට වැටුප් වැඩි කරනවා; භාගයක් ලබන අවුරුද්දේ, භාගයක් ඊට පස්සේ අවුරුද්දේ දෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ජනාධිපතිතුමා සහ මුදල් අමාත්‍යාංශය හරහා අපට දෙන දත්ත අනුව ඉතා පැහැදිලිව මුදල් අතිරික්තයක් තිබෙනවා. එහෙම නම් ජනතාවට සහන දෙන්න ඕනෑ. සාමාන්‍ය ජනතාවට තේරුම් ගන්න පුළුවන් විධියට මම ඒක කියන්නම්. ගෙදරක තාත්තාට රුපියල් 50,000ක පඩියක් ලැබෙනවා, නමුත් පුතා බඩගින්නේ ඉන්නවා. පුතාට කියනවා, "පුතේ, මම මේ සල්ලි ටික ඉතුරු කරගන්න ඕනෑ. නුඹට කන්න දෙන්නේ ලබන අවුරුද්දේ ජූලි මාසයේ" කියලා. පුතාට ගෙදර බඩගින්නේ ඉන්න කියනවා. පුතාට ඇඳුමක් ගන්න සල්ලි ඉල්ලනවා. ගෙදර සල්ලි තිබෙනවා. හැබැයි කියනවා, "පුතේ, ඒ සල්ලි තිබුණාට මම මේ සල්ලිවලින් ඔයාට මොනවත් දෙන්නේ නැහැ" කියලා.

සාමාන්‍ය විධියට කියනවා නම්, මේක තමයි අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය. මේ කාරණය කියන්නේ අපි නොවෙයි. Primary surplus එකක් තිබෙනවා. අවුරුදු ගණනාවකට පස්සේ තමයි මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ. අපි තමයි ඉතුරු කරලා තිබෙන්නේ, අපි තමයි රාජ්‍ය ආදායම එකතු කරලා තිබෙන්නේ කියලා කියනවා. නමුත් රටේ ජීවත් වන මිනිස්සුන්ට හරියට ආහාර වේලක් ගන්න විධියක් නැතුව ඉන්නකොට, උද්ධමනය නිසා රටේ ජීවන වියදම වැඩි වෙලා, ජීවන බර උසුලාගන්න බැරි තත්ත්වයක් තිබෙනකොට, ඒ මිනිස්සුන්ට සහනයක් දෙන්නේ නැතුව කියනවා, "අපි ළඟ සල්ලි තිබෙනවා. හැබැයි, අපි එක්කෝ මැතිවරණයක් ඉලක්ක කරගෙන ඉස්සරහට දෙන්නම්. එහෙම නැත්නම් ලබන අවුරුද්දේ ජූලි මාසයේ දෙන්නම්. මොකද, මම දැන් වියදම් කරන්නේ නැහැ. ජූලි මාසයේ තමයි දෙන්න වෙන්නේ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ජනතාවගේ සුබසාධනයට වඩා මේ රටේ තිබෙන වැදගත් ප්‍රශ්නය මොකක්ද කියන එක මම අහන්න කැමැතියි. උදාහරණ පෙන්වා දෙනවා නම් මට ඕනෑ තරම් උදාහරණ දෙන්න පුළුවන්, කොහෙන්ද තව මුදල් එකතු කරගන්න තිබුණේ, කොහෙන්ද තව වියදම් අඩු කරගන්න තිබුණේ කියලා. හැබැයි, මේ අය වැය ඇතුළේ ඉදිරිපත් කර තිබෙන හොඳ දේවලුත් අපි අගය කරන්න ඕනෑ. පොත් සඳහා අය කරපු VAT එක අයින් කරලා තිබෙනවා. ඒක අපි බලාපොරොත්තු වෙච්ච දෙයක්. ඒක මීට අවුරුදු දෙකකට කලින් කරන්න තිබුණු දෙයක්. ඒ වාගේම, sprats and Maldive fish සඳහා අය කරපු බදු අඩු කරලා තිබෙනවා. ඒ අනුව හාල්මැස්සන්, උම්බලකඩ කන අයට විශාල සහනයක් ලබා දීලා තිබෙනවා. ඇත්තටම ඒක හොඳයි. බද්ද අඩු කරලා තිබෙනවා. ඉතින් ඒ වාගේ හොඳ වැඩ අපි අගය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මුදල් වෙන් කරනවා කිව්වාට මහ පොළොවේ යථාර්ථයේ ඒ මුදල් වියදම් වෙලා තිබෙනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනයෙන් ගිය අවුරුද්දට allocate කරපු මුදල් මේ අවුරුද්දේත් තිබෙනවා. ඒවායේ ප්‍රගතිය බලන්න ඕනෑ.

අපේ ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා මේ වෙලාවේ සභාවට එන එක හොඳයි. මම මෙච්චර වෙලා බලාගෙන හිටියේ. අපේ චන්ද්‍රසේකර් ඇමතිතුමාට මේවා කියලා වැඩකුත් නැහැ. එතුමාත් බලාගෙන ඉන්නවා, ඔබතුමා එනකල් මේකට පිළිතුරක් දෙයි කියලා. ඔබතුමා ආපු එක හොඳයි.

ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමනි, මුදල් එකතු කරගත්තාට වඩා ජනතාවට සහනයක් දෙන්න තිබුණා. විශේෂයෙන් මේ අවුරුද්දේ හෝ සහනයක් දෙන්න තිබුණා. මුදල් තිබෙනවා කියලා ඔබතුමන්ලාම තමයි කියන්නේ. තිබෙන මුදල්වලින් සහනයක් දෙන්න අකැමැති ඇයි කියන ප්‍රශ්නයට ඔබතුමා හරි පිළිතුරක් දෙන්න. ජනාධිපතිතුමා කථා කරනකොට අපි මැදින් පැනලා ප්‍රශ්න අහන්න කැමැති නැහැ. හැබැයි ඔබතුමාගෙන් අහනවා, සල්ලි තිබෙනවා නම් ජනතාවට සහන නොදෙන්නේ ඇයි කියලා. රටේ ජනතාවට තෙල් මිල දරාගන්න බැහැ, විදුලි බිල දරාගන්න බැහැ, පඩියෙන් ජීවත් වෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගිය අවුරුද්දේ ports and aviation ගැන කථා කළා. ගිය අවුරුද්දේ ජනාධිපතිතුමා 2026 අය වැය ඉදිරිපත් කරමින් කිව්වා, Trincomalee domestic airportsවලට සහ Jaffna International Airport එකට Rs. 1 billion වියදම් කරනවා කියලා. අය වැය කථාවේ 14වන පිටුවේ ඒ පිළිබඳව සඳහන් වනවා. ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමනි,

[ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

Trincomalee domestic airports and Jaffna International Airport එකට ගිය අවුරුද්දේ Rs. 1 billion කොහේද වියදම් කළේ? මේ අවුරුද්දේ සීගිරියට Rs. 1 billion වෙන් කරලා තිබෙනවා. නොයෙක් දේවල් සංවර්ධනය කරනවා කියලා එහෙම කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන් කරන මුදල් වියදම් වෙන්නේ නැත්නම් මෙලෙස මුදල් වෙන් කිරීමේ අරමුණ මොකක්ද?

මුදල් වෙන් කරනවා නම් වියදම් කරන්න ඕනෑ. අද රාජ්‍ය නිලධාරීන් වැඩ කරන්න කැමැති නැහැ. මොකද, රාජ්‍ය නිලධාරීන් බය වෙලා ඉන්නේ. රාජ්‍ය නිලධාරිනුත් යම් අවස්ථාවල පළිගැනීම්වලට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේ කාරණා නිසා රාජ්‍ය නිලධාරිනුත් අද වැඩ කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තව කාරණයක් මම කියන්න ඕනෑ. Sir, another important matter that I must raise is this. Generally, a Budget Speech is the policy direction of the Government for the next year. The Budget Speech is not only a statement of the country's fiscal position or the economic position, but also the country's or the Government's plan or what the Government plans to do in the following year. That is a policy statement.

Sir, it is very unfortunate that in the Hon. President's Budget Speech, not a single word had been mentioned about the Tamil national question. Not a single word! Historically, if we take the Budget Speeches made, when former President Ranil Wickremesinghe - even though he did not deliver on any of his promises - made his policy statement, he would mention that the Tamil national question must be resolved. Even former President Gotabaya Rajapaksa - it is another thing that we did not expect him to deliver anything; we knew that he was not going to do anything - mentioned that the national ethnic question must be resolved. So did former President Maithreepala Sirisena. So, every President of the country, every Head of State, in their policy statements, had acknowledged the fact that there is an unresolved national issue - the Tamil national question - and that it needs to be resolved. Various governments had proposed various mechanisms. None of them had succeeded, but, at least, it was mentioned.

There should have been a mention of accountability and the justice mechanism. The Hon. Minister of Justice and National Integration is here. I acknowledge, Hon. Minister, that you have almost doubled the budgetary allocations for the Office on Missing Persons and the Office for Reparations, but the domestic mechanism proposed is a mechanism that the victim community has rejected. So, you are allocating money to a mechanism, of which the victim community is not going to be part. Therefore, I do not know who justice is going to be for.

Previous Governments, in their policy statements, would mention the Provincial Council Elections. But, this time, not a single word about the Provincial Council Elections, Sir! About the Provincial Council Elections, what have you all mentioned? You are taking away the powers of Provincial Councils. By bringing six District General Hospitals - the District Hospitals of Mullaitivu, Mannar, Kilinochchi, Vavuniya, Avissawella and Gampaha - under the Central Government, you are taking away the powers given to the Provincial Councils whilst not holding the Provincial Council Elections. Last year, the powers given to the provinces under environmental policies, you had taken back without the consent of the provincial councils. Then, about land release, not a word, Sir!

I do not know, Sir, the trajectory of this Government is worrying me; it is really worrying me. If the objective is to say that there is no Tamil national question, that you all have resolved any ethnic issue that this country faced, then, Sir, I think the Tamil people will teach this Government a very harsh lesson in the future.

I must also mention, Sir, that not only about the Provincial Council Elections, but also about the new Constitution, there has not been a single word. What is happening to your plans and proposals for abolishing the Executive Presidency? Where is the new Constitution? Not a word about the new Constitution, Sir! I can keep going on mentioning the other matters. The Government is bringing in repressive laws such as the PSTB and the Prevention of Organized Crimes Bill. You all are saying that you are getting rid of the PTA, but you all are bringing in laws that are far worse than the laws you are trying to replace them with. So, Sir, I do not understand this Government's trajectory on these matters.

இது கார்த்திகை மாதமாகும். வடக்கு, கிழக்கில் இருக்கின்ற மக்களைப் பொறுத்தளவில் இது மிகவும் முக்கியமானதொரு மாதமாகும். இந்த மாதத்தில் அரசியல்வாதிகளும் மக்களும் மாவீரர் துயிலும் இல்லங்களைத் துப்புரவுசெய்து, விடுதலைப் போராட்டத்துக்காகத் தங்களுடைய உயிர்களைத் தியாகம் செய்த மாவீர்களை நினைவுகூருவார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுடைய நீண்டகாலத் தேவையாக இருந்த கிரான் பாலத்துக்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்திருக்கிறார். அதனை நாங்கள் வரவேற்கின்றோம். அதேபோல், பொண்டுகள்சேனை பாலத்துக்கும் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கிறது. அதையும் வரவேற்கின்றோம். ஏனைய பாலங்கள் மற்றும் குளங்களுக்கு பெரியளவில் நிதி ஒதுக்கப்படவில்லை. கடந்த ஆண்டில் ஒதுக்கப்பட்ட அதே விடயம் மீண்டும் இந்த ஆண்டில் சொல்லப்பட்டு இருக்கிறது. கடந்த ஆண்டில் ஆய்வு அறிக்கையை எடுத்து, இந்த ஆண்டில் பணிகளை ஆரம்பிப்பதாகச் சொன்ன விடயத்தை, மீண்டும் இந்த வரவு செலவுத்திட்டத்தில் புதிய முன்மொழிவாக முன்மொழிந்து இருக்கிறார். பிரச்சினையில்லை! ஏதோவொரு வகையில் செய்து முடித்தால் சந்தோஷம்! இந்த கார்த்திகை மாதத்தில் அரசாங்கம் ஒரு பாலத்துக்கு நிதி ஒதுக்கியிருக்கிறது என்பதற்காக, அரசாங்கம் செய்கின்ற தவறான விடயங்களை குறிப்பாக தமிழ் மக்களைப் புறக்கணிப்பதை, அவர்களுடைய அபிலாஷைகளை நிராகரிப்பதை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுடைய மக்களைப் பொறுத்தளவில், மிக முக்கியமான விடயம் காணி சம்பந்தமான விடயமாகும். என்னிடம் வரவு செலவுத்திட்ட

மதிப்பீட்டு அறிக்கை இருக்கிறது. எங்களுடைய வைத்தியர் பத்மநாதன் சத்தியலிங்கம் எனக்கு அருகில் இருக்கிறார். வவுனியா மாவட்டத்தில் கிவுல் ஓயா திட்டத்துக்காக 2027ஆம் ஆண்டுக்கு 2,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கிறது. மேலும், 2028ஆம் ஆண்டில் 7,400 மில்லியன் ரூபாயும் 2029ஆம் ஆண்டில் 4,600 மில்லியன் ரூபாயும் என மொத்தமாக கிட்டத்தட்ட 23,000 மில்லியன் ரூபாயை அரசாங்கம் இதற்காகச் செலவு செய்யவுள்ளது. கிவுல் ஓயா திட்டத்தின் மூலம் என்ன செய்யப் போகிறார்கள்? தமிழ் மக்களுடைய பாரம்பரியக் காணிகளையும் விவசாய நிலங்களையும் அழித்து, அந்த இடத்தில் இன்னுமொரு சமூகத்துக்குத் தேவையான நீர்ப்பாசனத் திட்டம் மேற்கொள்ளப்பட இருக்கின்றது. இந்தத் திட்டத்துக்கான நடவடிக்கைகளை இந்த அரசாங்கம் முன்னெடுத்துக்கொண்டு இருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுடைய மக்களும் எங்களுடைய நிலமும் எங்களுக்கு மிகவும் முக்கியமானவை. எங்களுடைய மக்களின் அரசியல் உரிமையைப் பறிப்பதற்காக 1948ஆம் ஆண்டிலிருந்து மாறி மாறி ஆட்சிக்கு வந்த சகல அரசாங்கங்களும் முன்னெடுத்த விடயங்களை இந்த அரசாங்கமும் முன்னெடுக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தளவில், மாதுரு ஓயா தெற்கில் மேற்கொள்ளப்படவுள்ள நீர்ப்பாசனத் திட்டத்துக்கு இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாக நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. மாதுரு ஓயா தெற்கு பிரதேசத்தில்தான் மயிலத்தமடு - மாதவனை மேய்ச்சல்தரை இருக்கின்றது. அப்படியென்றால், அரசாங்கத்தின் நோக்கம் என்னவாக இருக்கலாம்! மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரையில் ஏனைய சமூகத்தவர்களைக் கொண்டுவந்து குடியேற்றி, நீர்ப்பாசனத் திட்டத்தை உருவாக்கினால் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற தமிழ் மக்கள் வாழ முடியாத சூழல் ஏற்படும். தேசிய இனவிகிதாசாரத்தின் அடிப்படையில்தான் மகாவலி காணிகள் பகிரப்பட வேண்டும் என்ற கோரிக்கை வரலாற்று ரீதியாக இருந்து வருகின்றது. ஆனால், இதுவரை தமிழ் மக்களுக்கு மகாவலி காணிகள் கிடைத்ததாக வரலாறு இல்லை. மொத்தமாக வழங்கிய காணியில் 1.5 சதவீதம்தான் தமிழ் மக்களுக்கு வழங்கப்பட்டு இருக்கிறது.

இவ்வாறான பின்னணியில், இந்தக் கார்த்திகை மாதத்தில் எங்களுடைய அரசியல்வாதிகளாக இருக்கலாம், பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், ஏனைய அரசியல்வாதிகளாக இருக்கலாம். "ஐயய்யோ! சனாதிபதி கிரான் பாலத்துக்கு நிதி ஒதுக்கியிருக்கி இருக்கிறார்; ஆகவே, நாங்கள் அவருக்கு ஆதரவாகச் செயற்பட வேண்டும்" என்றோ, "ஐயய்யோ! சனாதிபதி அவர்கள் வவுனியா மாவட்ட செயலகத்துக்கு நிதி ஒதுக்கி இருக்கிறார்; ஆகவே, நாங்கள் அவருக்கு நன்றியுள்ளவர்களாக இருக்க வேண்டும்" என்றோ, "ஐயய்யோ! சனாதிபதி அவர்கள் முல்லைத்தீவு மாவட்டத்தில் ஒட்டுசுட்டான் பிரதேச செயலக கட்டிடத்துக்கு 18 மில்லியன் ரூபாய் ஒதுக்கியிருக்கிறார்; ஆகவே, நாங்கள் அவருக்கு நன்றியுள்ளவர்களாக இருக்க வேண்டும்" என்றோ -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, you have two minutes left.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Sir.

முல்லைத்தீவையும் திருகோணமலையையும் இணைக்கும் கொக்கிளாய் பாலமானது மிகவும் முக்கியமானது. அதற்கு நிதி ஒதுக்கப்பட்டுள்ளதை நாங்கள் வரவேற்கின்றோம். ஆனால், எங்களுடைய அடிப்படை அரசியல் உரிமையை மறுத்து, இந்த விடயங்களுக்காக தமிழ் சமூகமாகிய நாங்கள் ஒருபொழுதும் எங்களுடைய அடிப்படைக் கொள்கையிலிருந்து விலகிப் போக முடியாது. அரசாங்கத்துக்கு 2 வருடத்துக்கும் மேல் கால அவகாசம் வழங்கப்பட்டு இருக்கிறது. யாழ்ப்பாணத்துக்கு metro bus சேவையைக் கொண்டுவருவதற்காக நாங்கள் எங்களுடைய அடிப்படை அரசியல் உரிமையை இழக்கத் தயாரில்லை கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுடைய தொப்புள் கொடி உறவுகளான மலையக சமூகத்தைப் பற்றியும் ஒருசில வார்த்தைகள் சொல்ல வேண்டும். எங்களுடைய மலையக மக்கள் இந்த அரசாங்கத்தையும் சனாதிபதியையும் நம்பி இருக்கிறார்கள். அவர்களுக்கு இந்த அரசாங்கம் செய்யும் துரோகம் மாபெரும் துரோகம்! அன்று நாட்டில் கடன் மறுசீரமைப்புச் செய்யும்பொழுது, JVP கட்சியில் இருந்த தற்போதைய சனாதிபதி, பிரதமர், வெளிவிவகார அமைச்சர், நான் உட்பட பலர் EPF, ETFஇலிருந்து அரசாங்கம் வரி அறவிடுவதை கடுமையாக எதிர்த்தோம். ஏனென்றால், இந்த நாட்டில் EPF, ETFக்கு பங்களிப்புச் செய்யும் மக்களில் பெருந்தோட்டங்களில் வேலைசெய்யும் எங்களுடைய தோட்டத்தொழிலாளர்களும் உள்ளடங்குகிறார்கள். அதில் அவர்களுக்கும் பெருமளவு பங்கு இருக்கின்றது. அவர்கள் ஓய்வுபெறுகின்ற காலத்தில் அந்த EPF, ETF நிதியைத்தான் நம்பியிருக்கிறார்கள். அதுதான் அவர்களுடைய saving. அவர்களுக்கு அந்த நிதி முதலீடாக இருக்கும். ரணில் விக்கிரமசிங்ஹ அரசாங்கம் EPF, ETFமீது 14 சதவீத வரியைக் கொண்டுவந்தபொழுது, அதை நாங்கள் கடுமையாக எதிர்த்தோம்.

இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து 2 வருடங்களாகியும், அதே வரியை இப்பொழுதும் அறவீடு செய்கிறது. அதாவது, பெருந்தோட்ட மக்களின் EPF, ETFஇலிருந்து வரியை அறவீடு செய்கிறது. அது அவர்களுக்குத் தெரியாது. மாதாந்தம் அவர்களுடைய கைக்குக் கிடைக்கின்ற சம்பளத்தில் ஒரு தொகை EPF, ETFக்குப் போகும். அவர்கள் ஓய்வுபெறும் காலத்தில்தான் தெரியவரும், தங்களுக்கு வரவேண்டிய EPF, ETF தொகையிலிருந்து ஒவ்வொரு வருடமும் 14 சதவீதம் வரி அறவீடு செய்திருக்கிறார்கள் என்பது. PAYE Tax அறவிடுவது யாரிடமிருந்து? மாதாந்தம் 162,500 ரூபாய்க்குக் குறைந்த தொகையை வருமானமாகப் பெறுபவர்களுக்கு tax இல்லை. அதாவது, மாதாந்தம் 162,500 ரூபாய்க்குக் குறைவான தொகை வருமானமாகக் கிடைத்தால் PAYE Tax செலுத்தத் தேவையில்லை. ஆனால், 50,000 - 60,000 ரூபாய் சம்பளம் எடுக்கின்ற சாதாரண தோட்டத் தொழிலாளர்களின் EPF தொகையிலிருந்து இந்த அரசாங்கமும் வருடாந்தம் 14 சதவீத வரியை அறவிடுகின்றது.

மாண்புமிகு சனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையில், 2045ஆம் ஆண்டில் முடிவுக்கு வர இருக்கும் தோட்டங்களின் குத்தகை ஒப்பந்தங்கள் தொடர்பில் சொல்லியிருந்தார். பெருமளவான பெருந்தோட்டங்களை குத்தகை அப்படையில்தான் தனியார் நடத்துகிறார்கள்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, your time is up.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, it is only 12.28 p.m. Are we winding up for lunch before 12.30 p.m.?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member., you can have a few more minutes.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I do not think anybody would speak during the last few minutes.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, finish your speech. Then, we will suspend for lunch.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பெருமளவான பெருந்தோட்டங்கள் இருப்பது அரச காணியில்தான். அந்த அரச காணிகள் குத்தகை அடிப்படையில் பெரிய கம்பனிகளுக்கு வழங்கப்பட்டன. இவ்வாறு வழங்கப்பட்ட ஒப்பந்த காலப்பகுதி 50, 100 ஆண்டுகளைக் கொண்டது. அதாவது, நீண்ட காலத்துக்கு வழங்கப்படும். இந்த ஒப்பந்தங்கள் அனைத்தும் 2045ஆம் ஆண்டில் முடிவடைய இருக்கின்றன. ஆனால், 2027ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட உரையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லியிருக்கிறார், ஒரு குழுவை நியமித்து பெருந்தோட்ட நிறுவனங்களுடனான lease ஒப்பந்தத்தை நீடிப்பதா, இல்லையா என்ற முடிவுக்கு நாங்கள் வர வேண்டும் என்று. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தப் பெருந்தோட்ட companiesக்கு இந்த **leas** ஒப்பந்தத்தை நீடித்துக் கொடுத்தால், தங்களுக்குச் சொந்தக் காணியொன்று கிடைக்கும் என்ற மலையக மக்களின் கனவு நிறைவேறாமலேயே போய்விடும். ஏனென்றால், 2045ஆம் ஆண்டு முடிவடைய இருக்கும் குத்தகை ஒப்பந்தத்தை நீடித்துக் கொடுத்தால், இன்னும் 50 அல்லது 100 வருடங்களுக்கு பிறகுதான் அந்தக் காணிகள் மீண்டும் அரசாங்கத்துக்குக் கிடைக்கும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, your time is up. We have to suspend for lunch.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I will wind up.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பெருந்தோட்ட மக்களின் நலனுக்காக வழங்குவதாகச் சொன்ன காணி உரிமையை இந்த அரசாங்கம் தடை செய்யக்கூடாதெனக் கேட்டுக் கொள்கின்றேன். எது எவ்வாறு இருப்பினும், நாங்கள் இந்த அரசாங்கத்தின் நல்ல விடயங்களுக்கு எங்களுடைய பூரண ஆதரவை வழங்குவோம். ஆனால், எங்களுடைய மக்களுக்கு எதிரான விடயங்களை இந்த அரசாங்கம் முன்னெடுக்கும்பொழுது, அதனை எதிர்க்க வேண்டிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது என்ற விடயத்தைச் சொல்லி, பேசுவதற்குச் சந்தர்ப்பம் தந்த உங்களுக்கு நன்றி சொல்லி விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Debate on the Appropriation Bill, 2027 of this House shall stay suspended till 1.30 p.m. for lunch.

රැස්වීම රීට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ රජය බලයට පත් වෙලා මේ ඉදිරිපත් කර තිබෙන්නේ තුන්වැනි අය වැය ලේඛනය. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේ අවසාන කොටසේ මෙන්න මෙහෙම වාක්‍යයක් කියනවා.

"අවසානයේ අපේ දරුවන්ට අපි ඉතිරි කර යා යුත්තේ අපි එකිනෙකාට වඩා කොතරම් ඉහළින් සිටියාද කියන කථාව නොවෙයි. අපි සියලුදෙනා එකතු වී මේ රට කොතරම් ඉහළට ඔසවා තැබුවාද කියන කථාවයි".

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බංකොලොත්භාවයට පත් වෙච්ච රටක් ආර්ථික ස්ථායීකරණයට ලක් කරලා අවුරුදු දෙකකට පස්සේ හැරවුම් ලක්ෂ්‍යයක් ගන්න, ආර්ථිකය පරිවර්තනය කරන්න අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා. බලයට එන්න කලින් අපි කිව්වා, අපි මේ රටේ පරිවර්තනයක් කරනවා කියලා. මේ රටේ දේශපාලන සංස්කෘතිය පරිවර්තනය කරනවා කිව්වා, මේ සමාජය මේ යන විධිය වැරදියි, මේක අපි පරිවර්තනය කරනවා කිව්වා, ඒ වාගේම අපි මේ රටේ ආර්ථිකය පරිවර්තනය කරනවා කියා කිව්වා. මේ ආර්ථිකයේ පරිවර්තනයේ හැරවුම් ලක්ෂ්‍යය ගන්නා අවස්ථාව තමයි අපි බලයට පත් වෙලා තුන්වැනි අවුරුද්දේ ඉදිරිපත් කරනු ලැබූ මේ අය වැය ලේඛනය.

මෙහිදී විශේෂත්වයක් වුණා, විපක්ෂයෙන් පිළිතුරු කථාව ඉදිරිපත් කරනකොට. අපි දැකපු විධියට මෙච්චර කාලයක් - 2021 ඉඳලා 2026 වනතුරුම - ආර්ථිකය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් තිබෙන ගරු මන්ත්‍රීවරයෙක් තමයි විපක්ෂයේ පිළිතුරු කථාව ඉදිරිපත් කළේ. 2024දී ඉරාන් වික්‍රමරත්න මැතිතුමා පිළිතුරු කථාව ඉදිරිපත් කළා. අනෙක් හැම අවුරුද්දකම වාගේ ආචාර්ය හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමා තමයි පිළිතුරු කථාව ඉදිරිපත් කළේ. හැබැයි, අද ඒක වෙනසක් වෙලා විපක්ෂ නායකතුමා පිළිතුරු කථාව ඉදිරිපත් කළා. මට තේරෙන්නේ නැහැ, එතුමා මොනවාද කිව්වේ කියලා. එතුමා එක අවස්ථාවක කියනවා, මේක අපේ රටේ හීන බොඳ කරපු අය වැයක් කියලා. මට හිතා ගන්න බැහැ මොකක්ද බොඳ කළ හීනය කියලා. මේ රටේ තාරුණ්‍යයේ හීන මරලා දාපු පියාණෝගේ පුතාණෝ ඇවිල්ලා කියනවා, මේක මේ රටේ හීන බොඳ කරන අය වැයක් කියලා. එක් අවස්ථාවක කියනවා, මේ අය වැය ලේඛනය මහා පාවාදීමක් කියලා. අපිට මතකයි, මේ රටේ තරුණ සොල්දාදුවන්ට වෙච්ච දේ මොකක්ද කියලා, බෙදුම්වාදීන්ට ආයුධ දීලා. ඒ විධියට මහා පාවාදීමක් කරපු පියාණෝගේ පුතාණෝ ඇවිල්ලා කියනවා, මේ අය වැය ලේඛනය මහා පාවාදීමක් කියලා. පව ගොඩාක් කිව්වා. හැබැයි, දැන් කථාව කරන්න කලින් අපිට ඒවාට ටිකක් උත්තර දීගෙන යන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා කියපු තව කාරණයක් තමයි, මේ රටේ විරැකියාව වැඩි වෙලා තිබෙනවා කියන එක. මේ රටේ විරැකියා අනුපාතය 2020දී තිබුණේ සියයට 5.5ක් ලෙසයි. 2026 වෙනකොට එය සියයට 4.1ක්, 4.4ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම තාරුණ්‍යයේ විරැකියාව ගත්තොත්, - මේක ආකාර දෙකකට ගන්න පුළුවන් - 2020 වසරේ තිබුණේ සියයට 26.5ක් ලෙසයි. ඒක 2026ට වෙනකොට සියයට 18.5ට අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම කිව්වා, ඍජු විදේශ ආයෝජන එන්නේ නැහැ කියලා. ඇවිල්ලා තිබෙන ආයෝජන ප්‍රමාණය ගත්තොත්, 2020 වසරේ ඩොලර් මිලියන 434යි; 2021 වසරේ ඩොලර් මිලියන 592යි; 2022 වසරේ ඩොලර් මිලියන 884යි; 2023 වසරේ ඩොලර් මිලියන 713යි; 2024 වසරේ ඩොලර් මිලියන 759යි; 2025 වසරේ වැඩිම ප්‍රමාණය ඇවිල්ලා තිබෙනවා, ඩොලර් මිලියන 1,047ක් විධියට. ඒත් එක්කම අපිට මේ වෙනකොට, ඉදිරි වර්ෂ තුන සඳහා, Colombo Port City එකට commit වෙලා තිබෙනවා primary BSI and secondary BSI දෙකේම එකතුව වශයෙන් ඩොලර් බිලියන 2.3ක ප්‍රමාණයක්. ඒ අනුව, ඉදිරි වර්ෂ 5 සඳහා අපිට committed FDIs ප්‍රමාණයක් තිබෙනවා. ඉතින් මේවාත් එක්ක තමයි අපි කථා කරන්න ඕනෑ. නමුත්, අවාසනාවකට ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළේ සම්පූර්ණයෙන් ව්‍යාජ දත්ත ලේඛන ටිකක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අය වැය ලේඛනය ගැන කථා කරන්න කලින්, අපේ රාජ්‍ය ආදායම හැසිරෙව්වේ කොහොමද කියලා බැලුවොත්, 2015 ඉඳලා 2019 දක්වා - ඒ කියන්නේ ආර්ථික අර්බුදයට කලින් - මේ රටේ රාජ්‍ය ආදායම තිබුණේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 12.6ක් විතර. ඒක 2022 වන විට හොඳටම වැටෙනවා, හොඳටම drop වෙනවා. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.2ක් දක්වා අඩු වෙනවා. 2025 වෙනකොට අපි භාණ්ඩාගාරයට මුදල් එන ප්‍රධාන ආකාර තුනෙහිම අගයන් ඉතිහාසයේ වැඩිම අගයන් බවට පත් කරලා, රාජ්‍ය ආදායමේ අගය වැඩිම අගය බවට පත් කරලා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 16 වාගේ ප්‍රමාණයකට, ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයකට අපි අරගෙන එන්න සමත් වෙලා තිබෙනවා. 2026 අවුරුද්දේදී එහි දිගුවක් විධියට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16.6ක් වාගේ ප්‍රමාණයකට යන්න හැකියාව ලැබෙනවා. 2025 අවුරුද්ද ගත්තොත් ඒ අවුරුද්ද තමයි, අපි මේ සම්බන්ධයෙන් හොඳටම කටයුතු කරපු අවුරුද්ද. 2025 සහ 2026 අවුරුද්දේ පළමු මාස 8හි රාජ්‍ය ආදායම සංසන්දනය කළොත්, 2025දී රුපියල් බිලියන 3,301යි. හැබැයි, 2026 පළමු මාස 8හි අපි එය 4,002ක් දක්වා වැඩි කර ගන්නවා. සියයට 21.2ක වර්ධනයක් ඇති කර ගන්නවා, අපිම ලබාගත්ත වැඩිම ප්‍රමාණයටත් වඩා එහාට ගිහින්. 2027 වෙනකොට අපි බලාපොරොත්තු වෙනවා මේක සියයට 16ක වාගේ මට්ටමක තියා ගෙන යන්න. කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන රාජ්‍ය ආදායම් විධියට අපි මේක දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20ක වාගේ ප්‍රමාණයකට යෑමේ බලාපොරොත්තුවක් තිබෙනවා, හැකියාවක් තිබෙනවා. අපිට විශ්වාසයක් තිබෙනවා, අපේ ඉලක්කවලට යන්න හැකියාව ලැබෙයිකියලා.

විශේෂයෙන්ම ඍජු සහ වක්‍ර බදු සියයට 25-75 අතර තිබෙන එක සියයට 40-60 වාගේ ප්‍රමාණයට අඩු කරගෙන ජනතාවටත් සහන දෙමින් මේ වැඩේ කර ගැනීමේ හැකියාව අපට තිබෙනවා කියන එක අපි ඔප්පු කරලා තිබෙනවා, මේ අවුරුදු දෙක තුළ. ඒ වාගේම පළමු මාස අටේ රාජ්‍ය ආදායම ගත්තත්, 2025 අවුරුද්දත් එක්ක සංසන්දනය කළොත්, එය 2025දී රුපියල් බිලියන 3,712යි. 2026 අවුරුද්දේ ඒක වැඩි වෙනවා, රුපියල් බිලියන 3,966 දක්වා. හැබැයි, ඒකේ වැඩිවීම සියයට 6.9යි. එතකොට අපි රාජ්‍ය ආදායම වැඩි කර ගන්නවා, සියයට 21.2කින්; රාජ්‍ය වියදම වැඩි වෙන්නේ සියයට 6.9කින්. පැහැදිලියි. වියදම් කොහොමත් වැඩිපුර තිබුණා, කලින් අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට. ආදායම අඩුවෙන් තිබුණේ. අපි ආදායම ගොඩක් වැඩි කර ගත්තා. වියදම වැඩිවීමේ ප්‍රමාණය අඩුයි. ඒ දෙක අතර පරතරය, ඉතිහාසයේ අඩුම අය වැය පරතරය, එනම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක් බවට පත් කිරීමේ හැකියාව ලැබුණා, ගිය අවුරුද්දේ. ඒක අවුරුදු 68කට පසුව ලබපු ලොකුම ජයග්‍රහණයක්. මේ හැමදේම වෙන්නේ මේ අවුරුද්ද ගත්තත්, "දිටිවා" ආපදාවෙන් වූ හානි recover කර ගන්න මුදලුත් යොදන අතරේ. 2026 අවුරුද්දේ දළ වශයෙන් කියනවා, assumption එකක් තිබෙනවා, මේක පුරෝකථනය කරලා තිබෙනවා, අය වැය අතර පරතරය - අය වැය හිඟය - සියයට 3.7ක් වාගේ වෙයි කියලා. ඉතින් 2027 සඳහා එය සියයට 3.8ක් වාගේ වෙයි කියලා පුරෝකථනය කරලා තිබෙනවා. හැබැයි, "දිටිවා" නිසා අපට මේක සියයට 4.5 දක්වා යන්න පුළුවන්. හැබැයි, අපේ දාලා තිබුණු සීමාව අනුව ඒක දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5කට වඩා අඩු අගයකට යන්න බලාපොරොත්තුව තිබෙනවා. ඒ හැකියාව බොහෝ විට අපට ලබා ගන්න පුළුවන්කම තියෙනවා, අපේ යන මේ ආර්ථික ගමන අනුව.

ඊළඟට ප්‍රාථමික අතිරික්තය ගත්තොත්, 2025 අවුරුද්දේ පළමු මාස අටේ රුපියල් බිලියන 1,276.5ක් තිබුණා. 2026 අවුරුද්දේ ඒක අපි වැඩි කර ගත්තා, රුපියල් බිලියන 1,644.5ක් දක්වා. ප්‍රාථමික අතිරික්තය සාමාන්‍යයෙන් 2026 අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.6ක්. මේක වැඩි අගයක්. අපි බලාපොරොත්තු වෙච්ච ඉලක්ක, අපි දීපු targetsවලට වඩා, අපි set කර ගත්ත targetsවලට වඩා වැඩිපුර achievement එකක්. 2027 අවුරුද්ද අවසන් වෙනකොට මේක පුරෝකථනය කර තිබුණේ සියයට 2.6කට වාගේ. සමහර විට දශම තුනක් වාගේ අඩුවීමේ හැකියාවක් තිබෙනවා, "දිටිවා" නිසා වෙච්ච හානිය සහ එය recover කර ගැනීම වෙනුවෙන් යන මුදලුත් එක්කම. කෙසේ නමුත්, අපි තිබ්බ ඉලක්කය - target එක - අනුව ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක ඉලක්කයට වඩා පහළට නොයා මේක බේරා ගැනීමේ හැකියාව අප සතුව තියෙනවා.

ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් prediction එකක් දීලා තියෙනවා, ලෝක ආර්ථික වර්ධනය මන්දගාමී තත්ත්වයේ

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

තිබෙනවා කියලා. මේ ලෝක ගැටුම්, අර්බුද උග්‍රවීම හරහා තෙල් නිෂ්පාදනය අර්බුදයට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම තෙල් සැපයුම බාධාවට ලක් වෙලා තිබෙනවා. මේ සියලු කරුණු කාරණා එක්ක ගත්තාම ලෝකයේ ආර්ථික වර්ධනය මන්දගාමී තත්ත්වයකට එයි කියලා prediction එකක් දීලා තිබෙනවා. ඒකේ ලක්ෂණ අපි දකිනවා. හොඳ ආර්ථිකයක් තිබුණු යුරෝපීය රටවල් ගත්තාම ඒ රටවල් පවා සෑහෙන අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. ප්‍රංශයේ inflation එක වැඩි වෙලා තිබෙනවා. එහි energy inflation එක සියයට 24.1ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඉතාලිය ගත්තොත්, සැප්තැම්බර් මාසයේ තිබුණු උද්ධමනය සියයට 4.1 සියයට 5.2ට පනිනවා, එක මාසයට; සැප්තැම්බර් ඉඳලා ඔක්තෝබර් වෙනකොට එක මාසයකදි ඒ විධියට පනිනවා. ඒවා අපට වඩා ලොකු ආර්ථිකයක් තිබෙන, විදේශ වත්කම් තිබෙන, export income එක තිබෙන, අපට වඩා සෑහෙන සංවර්ධනය වෙච්ච රටවල්. ඒගොල්ලන්ගෙත් margins set කරලා තියෙනවා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සම්පූර්ණ ණය ප්‍රමාණය සියයට 60කට අඩුවෙන් තියා ගන්න කියලා. එතකොට අය වැය පරතරය සියයට 5ට වඩා අඩුවෙන් තියා ගන්න වෙනවා. අපි දන්නවා, බෙල්ජියමේ five-party coalition එක අර්බුදයකට යන බව, අය වැය පරතරය සියයට 5ට තියා ගන්න බැරුව. ඉතින් මේ වාගේ, ලෝකය අර්බුදයට යනකොට අපිට සෑහෙන දුරට අපේ ආර්ථිකය කළමනාකරණය කර ගැනීමේ හැකියාව ලැබිලා තිබෙනවා, මේ අවුරුදු දෙක තුළ අපි කරපු වැඩත් එක්ක. ඒකේ දිගුවක් විධියට තමයි 2027 අය වැය ලේඛනය අප ඉදිරියට එන්නේ.

2027 අවුරුද්දේ අපි බලාපොරොත්තු වෙනවා, ආර්ථික වර්ධනය සියයට 4ක, 5ක වාගේ අගයක තියා ගන්න. ඒකත් බොහෝ විට අපට ළඟා කර ගත හැකි දෙයක්. මේ හැම දෙයක්ම අපට කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ අපි පසුගිය අවුරුදු දෙක තුළ ගත්ත ආර්ථික ස්ථායීකරණය අනුවයි; ඒ ආර්ථික ස්ථායීකරණය හරහා දිගුවක් විධියට අපි මේ පරිවර්තන ආර්ථිකයකට යන නිසායි.

ඊළඟට අපි ණය ප්‍රමාණය අරගෙන බලමු. 1950දී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ - GDP එකේ - ප්‍රතිශතයක් විධියට ණය ප්‍රමාණය තිබුණේ සියයට 17ක් වාගේ ප්‍රමාණයක. හැබැයි, මේ නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමයත් එක්ක 1977න් පස්සේ විදේශ ණය සංචිත ප්‍රමාණය වැඩි වෙනවා; සියයට 30ටත් වඩා වැඩි වෙනවා. මොකද, 1990 ගණන් වෙනකොට මේක සියයට 50 පනිනවා. ඊට පස්සේ 2022 වෙනකොට මේක උපරිමයකට එනවා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 114 දක්වා ප්‍රමාණයකට. හැබැයි, අපට දුන්නා, target එකක් මේක අඩු කර ගන්න කියලා; 2032 වෙනකොට සියයට 95ට වඩා අඩු කර ගන්න කියලා. හැබැයි, මේ වෙනකොටත් අපට හැකි වෙලා තියෙනවා, ඒක සියයට 90ට වඩා අඩු කර ගන්න. සියයට 95ක ගාණකට ආවා, 2026 වෙනකොට. 2027 වෙනකොට අපට තවත් අඩු කර ගැනීමේ හැකියාව තියෙනවා, මේ ආර්ථික කළමනාකරණය කරගෙන යන විධිය අනුව.

ඒත් එක්කම තිබෙනවා, විදේශ ණය සේවාකරණය. අපි ණය ගෙවන විධිය ගත්තොත්, 2025 අවුරුද්දේ අපි ඩොලර් මිලියන 3,707ක් ගෙව්වා. 2026 අවුරුද්දේ ඩොලර් මිලියන 3,590ක් ගෙවිලා. 2025දී ඩොලර් මිලියන 3,700 ගණනයි; 2026දී ඩොලර් මිලියන 3,500 ගණනයි. 2027 අපට ගෙවන්න තිබෙන්නේ ඩොලර් මිලියන 2,986යි. ඒ කියන්නේ, පළමුවැනි අවුරුදු දෙකේ ගෙවපු විදේශ ණය ප්‍රමාණයට වඩා අඩුවෙන් තමයි 2027දී ගෙවන්න තිබෙන්නේ. 2028දී ගෙවන්න තිබෙන්නේ ඩොලර් මිලියන 3,574යි. මේ ඉලක්කම් එක්ක බැලුවාම ඕනෑම කෙනෙකුට තේරෙනවා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මේ ඉලක්කම් නිකම් කියෙව්වත් තේරෙනවා, දැන් කොහොමද ආර්ථිකය ස්ථායිකරණය වෙලා තිබෙන්නේ කියලා.

ඒ වාගේම, මේ යන විධිය අනුව විදේශ ණය සේවාකරණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5ක් ඉක්මවා නොයන ඉලක්කමක තියාගන්න අපට හැකියාව ලැබෙනවා. දළ වශයෙන් summary එකක් විධියට ගත්තොත්, 2022 පූර්ණ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය ඍණ - minus - සියයට7.3යි තිබුණේ. 2025දී එය සියයට 5ට වැඩි වෙනවා; හැකිළිලා තිබිලා වර්ධනය වෙනවා. 2022 වර්ෂයේ උද්ධමනය තිබුණේ සියයට 57.2ට. 2025 වසරේ එය සියයට 2.1ක් වෙනවා, මිල ස්ථායීකරණය හරහා. දැන් අටයි දශම ගණනකට වැඩි වෙලා තිබෙනවා. හැබැයි, ලෝකයේ පවතින මේ යුද ගැටුම් අවසන් වෙලා අපේ ආර්ථිකය මේ යන ගමන මේ විධියට ගියොත් 2027දී අපට එය සියයට 5ක් වාගේ ප්‍රමාණයකට අඩු කර ගැනීමට හැකි වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

2022 රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.2ක තිබුණේ. අපි ඒක සියයට 16.6 දක්වා, දෙගුණයකට වඩා වැඩි කර ගන්නවා. 2022 ප්‍රාථමික ශේෂය තිබුණේ minus 3.7ට. 2025 වසරේ අපි එය සියයට 5.4ට වැඩි කර ගන්නවා. ඒකේ දිගුවක් විධියට අපි 2027දීත් රාජ්‍ය ආදායම වැඩි කර ගනිමින් යනවා. ඊට පසුව මධ්‍යම <u>රජයේ ණය</u> ප්‍රමාණය මා කලිනුත් කිව්වා වාගේ 2021දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 114යි තිබුණේ. අපි මේ වන කොට එය සියයට 95කට වඩා අඩු කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

2022දී දළ නිල සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 1.9යි තිබුණේ. එය මේ වන විට ඩොලර් බිලියන 7 පැනලා තිබෙනවා. මේ හැම දෙයක්ම මේ ආර්ථිකයේ පිළිබිඹුවක්.

වෙනදා නම් අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සේ පළමුවෙනි කාර්තුව ඇතුළත ව්‍යාපෘති පටන් ගන්න අපට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මොකද, මුදල් ලේඛන ඉදිරිපත් කළාට රජයට ආදායම ලැබෙන්නේ මුළු වර්ෂය පුරාවටයි. හැබැයි, දැන් මුදල් එකතු වෙලා තිබෙන නිසා අපි කියලා තිබෙනවා, පළමුවැනි මාසයේ ඉඳලාම ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් කැඳවලා, අවශ්‍ය සියලු දේවල් කරලා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න පටන් ගන්න කියලා. මේක තමයි අපි කරපු ලොකුම දේ.

ඒත් එක්කම, අපි ඉතිහාසයේ කවදාවත් නැති විධියට වැඩිම මුදල් ප්‍රමාණයක් ව්‍යාපෘති සඳහා වෙන් කරලා තිබෙනවා; මේ ඉතිරි කර ගත්තු සල්ලි ටික ව්‍යාපෘති සඳහා වෙන් කරලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් expressways ඉදි කිරීම සඳහා වෙන් කළ මුදල් ගත්තොත්, මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල-ගලේවෙල දක්වා කොටසට රුපියල් මිලියන 30,000ක්, රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා රුපියල් මිලියන

27,000ක්, මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසට රුපියල් මිලියන 53,450ක්, පොතුහැර-රඹුක්කන කොටසට රුපියල් මිලියන 4,500ක්, රඹුක්කන-ගලගෙදර කොටසට රුපියල් මිලියන 23,050ක්, Port Access Elevated Highway එකට රුපියල් මිලියන 10,750ක් වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. අධිවේගී මාර්ග - highways - ඉදි කිරීම වෙනුවෙන් ඉතිහාසයේ කවදාවත් අය වැය ලේඛනයකින් වෙන් නොකරපු මුදලක් - රුපියල් මිලියන 1,48,700ක් හෙවත් රුපියල් බිලියන 148.7ක් - වෙන් කර තිබෙනවා.

තනි ව්‍යාපෘතියක් වශයෙන් දුම්රිය විදුලිකරණය ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් බිලියන 80ක් වෙන් කරනවා. එච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ මේ අවුරුදු දෙක තුළ අප ගොඩ නහාගත්තු ආර්ථික ස්ථායිකරණය නිසා. මේ ඉදිරිපත් කරපු අය වැය, අවුරුදු දෙකක ස්ථායීකරණයෙන් පසුව පරිවර්තන යුගයකට යන අය වැයක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.43]

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින 2027 වර්ෂයේ අය වැයට අදාළව පවත්වනු ලබන විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මගේ කථාව පටන් ගන්න කලින් යම් කාරණයක් සඳහන් කළ යුතුව තිබෙනවා. ගත වෙච්ච මේ වසර දෙක තුළ ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අප ඉදිරිපත් කළ අය වැය ලේඛන දෙකත්, මෙම අය වැය ලේඛනයත් පිළිබඳ හොඳ දෙයක් විපක්ෂ නායකතුමාගෙන් අපට අහන්න ලැබෙයි කියලා මම හිතුවා. විපක්ෂ නායකතුමා විධියට විපක්ෂයේ කාර්යභාරය ඉටු කරමින් එතුමා අපට යමක් කියයි කියන බලාපොරොත්තුව අපට තිබුණා. නමුත් අද මොකද වුණේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමහර මහුල් ගෙවල්වල, අවමහුල් ගෙවල්වල මාර විධියට මහන්සි වෙලා වැඩ කරන කණ්ඩායමක් ඉන්නවා. තමන්ගේ ගෙදර අය, ඥාතීන් - ඒ මිනිස්සු - ඒ වෙනුවෙන් මාර කැප කිරීමක් කරනවා; පුදුමාකාර වෙහෙස මහන්සියක් වෙනවා. ඔය අතරේ ඉන්නවා, මොනවත්ම කරන්නේ නැතිව එහාට යන ගමන් මොකක් හරි හොරකම් කරගෙන යන, මෙහේට යන ගමන් මොකක් හරි හොරකම් කරගෙන එන කණ්ඩායමක්. ඒ අය එහෙම කරලා අහනවා, "කෝ මෙතැන තිබුණු එක, කෝ අතැන තිබුණු බඩුව, කෝ මෙතැන තිබුණු කෑම ටික?" කියලා. එහෙම අහන කණ්ඩායමක් ඉන්නවා. ඒ අය ලැහැස්ති වෙලාම ඉන්නේ ඒ වැඩේට. මට විපක්ෂ නායකතුමාත් පෙනෙන්නේ ඒ විධියට. එතුමා අද උදේ ඇවිත් අපෙන් අහනවා, "කෝ අරක, කෝ මේක, කෝ ආරක්ෂාවට වෙන් කරපු එක, කෝ අධ්‍යාපනයට වෙන් කරපු මුදල්?" කියලා. ලජ්ජයි, කියන්න! අපෙන් නොවෙයි එහෙම අහන්න ඕනෑ. එයාලා එයාලාගෙන්ම තමයි ඒක අහගන්න ඕනෑ. අවුරුදු 76ක් කරන්න බැරි වෙච්ච හරිය කරන්න තමයි අප මේ පරිවර්තනය කරමින්, ස්ථාවර කරමින්, යහපත් දිශාවකට රට යොමු කරමින්, කළමනාකරණය කර ගනිමින් මෙසේ වැඩ කරගෙන යන්නේ. බංකොලොත් වුණු, විනාශ වුණු, හිතා ගන්නවත් බැරි තැනක තිබුණු රටක් ඒ කළමනාකාරිත්වය තුළින් යම් මට්ටමකට ඔසවා තබන්න සමත් වුණා කියන එක අපි මේ අවුරුදු දෙක තුළ ඔප්පු කර තිබෙනවා.

විපක්ෂ නායකවරයාගෙන් අප බලාපොරොත්තු වන්නේ එතැනින් එහාට ගිය දැක්මක් සහිත කාරණයි; මෙන්න මේක මේ ආකාරයට කරන්න කියා පෙන්වන නායකත්වයකුයි. නමුත් මොකක්ද වෙලා තිබෙන්නේ? එතුමාගේ කථාවේ එක කොටසක කියනවා, "අපි කිරලා මැනලා තමයි මිනිස්සු ගන්නේ" කියලා. කිරලා මැනලා ගත්තු විධිය අපි දැක්කා. මේ රටේ කුඩුකාරයන්ගෙන්, පාතාලකාරයන්ගෙන් අල්ලස් ගත්තු සංවිධායකයන් හදා තිබුණේ ඒගොල්ලන්. තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඩ්‍රෝන මැෂින් ගෙනාවා, රජයට කියන්නේ නැතුව. හොරකම් කරන අයයි හදලා තිබෙන්නේ. ඉතින් කිරලා, මැනලා කරපු විධිය අපි හොඳට දන්නවා. ඒ නිසා මම විපක්ෂය ගැන ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන් මෙදා අය වැයේ ඇති විශේෂ කාරණා ටිකක් ගැන, අප කවුරුවත් කථා බහට ලක් කරන්නේ නැති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සඳහන් සාධනීය යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

මේ අය වැය යෝජනාවලියේ සඳහන්, දැනට පළමු ශ්‍රේණිය සඳහා ආරම්භ කර ඇති නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2027 වසරේ සිට 2 ශ්‍රේණිය සහ 6 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කිරීමට කර ඇති යෝජනාව ඉතාම කාලෝචිත, ඉතාම වැදගත් යෝජනාවක් කියා අපි හිතනවා. මෙච්චර කාලයක් හැම වෙලාවේම බඩට කන්න හිතන එක විතරයි කළේ. නමුත් අධ්‍යාපනයෙන්; ඉගෙන ගැනීමෙන් තොරව, නව දේවල් සොයා ගැනීමෙන් තොරව අපට අනාගතයක් ගැන හිතන්න බැහැ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන අනවශ්‍ය බයගුල්ලන්, අනවශ්‍ය හොල්මන්, අනවශ්‍ය අවතාර මතු කළා, මේ විපක්ෂය. එහෙම කරලා එම ප්‍රතිසංස්කරණ නැත්තට නැති කළා. ගිය අවුරුද්දේ අපේ දරුවන්ට දෙන්න තිබුණු අගනා අවස්ථාවක් තමයි ඒ අය අහිමි කළේ. ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ අපි ඉදිරිපත් කළ තුන්වැනි අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව ඉතාම සාධනීය එකක් විධියට මම දකිනවා.

ඒ වාගේම අභ්‍යාස පොත්, පෙළ පොත්, ශබ්ද කෝෂ, ළමා චිත්‍ර පොත් සහ වෙනත් මුද්‍රිත අධ්‍යාපනික ප්‍රකාශන සඳහා එකතු කළ අගය මත බද්ද සම්පූර්ණයෙන් ඉවත් කිරීමට ගෙන ආ යෝජනාව සහ අදහස ඉතාම හොඳ එකක් කියලායි මා හිතන්නේ. අපට පසුගිය කාලය පුරාවටම තිබුණු චෝදනාවක් සහ අපට ඉදිරිපත් කරපු යෝජනා අතර තිබුණු දෙයක් තමයි මේ වැට බද්ද ඉවත් කරන්න කියන එක. ඔන්න අපි පොරොන්දු වුණු විධියටම ඒ දේ ඉෂ්ට කර තිබෙනවා. පියාපත් ලැබෙන්නේ ඉගෙන ගන්න අවස්ථාවක් ලැබුණොත්. ඒ සඳහා තිබෙන කිසිදු අවස්ථාවක් අපි අවහිර කරන්නේ නැහැ. ඔන්න අපි පොරොන්දු වුණු විධියට ඒ දේවල් සඳහා තිබුණු වැට බද්ද ඉවත් කළා.

ඒ වාගේම විශ්වවිද්‍යාල පද්ධතිය සහ ශිෂ්‍ය නේවාසිකාගාර ගැනත් කථා කළ යුතුයි. මොකද, එම දරුවන්ට ඉගෙන ගන්න සුදුසු වාතාවරණයක් තිබුණේ නැහැ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සිරගත කරලා වාගේයි ඉන්නේ. ඔවුන්ට තමන්ගේ කාමරය ඇතුළේ, තමන් ඉන්න තැන සුව පහසුව ඉන්න වටපිටාවක් නැහැ. සමහර දරුවෝ නේවාසිකාගාර පහසුකම් නැතුව විවිධ තැන්වල කුලියට ඉඳිමින් තමන්ගේ අම්මා, තාත්තා හම්බ කරන සල්ලිවලින්

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

බොහොම අමාරුවෙන් තමයි අධ්‍යාපනය ලබන්නේ. ඔන්න අපි ඒ වෙනුවෙනුත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අතර පේරාදෙණිය සහ වයඹ විශ්වවිද්‍යාලවල සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 8,000ක ආයෝජනයක් සිදු කිරීමට නියමිතයි. ඒ වාගේම වවුනියාව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල නිල නිවාස ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් මිලියන 2,050ක මුදලක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේමයි සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත්තත්, මා හිතන විධියට මෑත ඉතිහාසයේ හොඳම සෞඛ්‍ය අමාත්‍යවරයා සහ හොඳම සෞඛ්‍ය ක්ෂේත්‍රය බිහි කරන්නට අපි සමත් වුණා. අපි ඔබට පොරොන්දු වුණා, ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන පිහිටුවන බවට. නමුත් විපක්ෂය එදා අපව හාස්‍යයට ලක් කළා; ඇත්ත අදහස උකහා ගන්නේ නැතුව හාස්‍යයට ලක් කළා, ගෙදර ඉඳලා කොත්තමල්ලි බොන්න කිව්වා කියලා. ගෙදර ඉඳලා කොත්තමල්ලි බොන්න නොවෙයි, 2027 සහ 2029 අතර කාලය තුළ දිවයින පුරා ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන 1,000ක් පිහිටුවීම සඳහා රුපියල් බිලියන 17.44ක් ආයෝජනය කිරීමට සැලසුම් කර තිබෙනවා. මේ සඳහා 2027 වර්ෂයේදී රුපියල් මිලියන 3,600ක මුදලක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දන්නවා, පාසල් යන වයසේ දරුවන් විශාල ප්‍රමාණයක් අක්ෂි ආබාධවලින් පෙළෙන බව. තම දරුවන්ට අවශ්‍ය ඇස් කණ්ණාඩි අරගෙන දෙන්න සමහර දෙමව්පියන්ට සල්ලි නැහැ. විපක්ෂයේ ඔබතුමන්ලා රට භදපු ඒ 76 අවුරුද්දේ ඉතුරු කරපු දේවල් තමයි ඒවා. ඒවා තමයි අප මේ නිවැරැදි කරමින් යන්නේ. දෘෂ්ටි ආබාධ හේතුවෙන් පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට සිදු වන බාධා වැළැක්වීම සඳහා නොමිලේ ඇස් කණ්ණාඩි ලබා දීමට රුපියල් මිලියන 100ක් අපේ ආණ්ඩුවෙන් වෙන් කර තිබෙනවා. අපට ඇස් නොපෙනෙන දරුවන් ඕනෑ නැහැ. මෙය එක් අදියරක් පමණයි. ඇස් කණ්ණාඩි දාන්නේ නැති, ඇස් දෙක හොඳට පෙනෙන, අනාගතයක් සහිත දරුවන් හදන්න අපි පියවර අරගෙන තිබෙනවා වාගේම, සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන ආදී සියලු ක්ෂේත්‍රවල දියුණුවක් ඇති කිරීමට අවශ්‍ය එක් පියවරක් අපි 2027 අය වැය තුළින් යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන කථා කළොත්, පසුගිය කාලයේදී මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපට විවිධ යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අනුව, චීන රජයේ පරිත්‍යාගයක් ලෙස විදුලි බස් රථ 100ක් මෙරටට ලැබීමට නියමිතයි. එම බස් රථ ධාවනය කිරීම සඳහා අවශ්‍ය ඩිපෝ ඉදිකිරීම, ආරෝපණ යටිතල පහසුකම් සැකසීම සහ රියැදුරන් පුහුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 4,500ක මුදලක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ග්‍රාමීය මාර්ගවල ප්‍රවාහන පහසුකම් ශක්තිමත් කිරීම සඳහා ආසන 33කින් යුත් කුඩා බස් රථ 200ක් මිලදී ගැනීමට රුපියල් මිලියන 4,000ක මුදලක් වෙන් කර තිබෙනවා. මේ ආදී වශයෙන් ඒ ඒ අමාත්‍යාංශ සඳහා අපි වෙන් කර තිබෙන මුදල් සම්බන්ධයෙන් ඉදිරි කාරක සභා අවස්ථාවලදී සාකච්ඡා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම නිසා අපට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙපමණයි. මේ සංඛ්‍යාලේඛනවලට එහා ගිය ඉතාම හොඳ දැක්මකින් යුතුව සකස් කළ අය වැය යෝජනාවලියක් තමයි 2027 අය වැය යෝජනාවලිය. ඒක අධ්‍යයනය කරන්න කියලා විපක්ෂයට කියනවා. විපක්ෂය අපටත් වඩා හොඳින් මේ අය වැය අධ්‍යයනය කළ යුතුයි. විපක්ෂය බණ කියන්න අවශ්‍ය නැහැ. අපි වස් කව්වලට බයත් නැහැ, නූල්වලටත් බයත් නැහැ. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි ක්‍රිකට් ක්‍රීඩාවේ පමණක් නොව ඕනෑම ක්‍රීඩාවකදී එල්ල වන සියලු ප්‍රහාරවලට මුහුණ දීමට සූදානම් ආණ්ඩුවක්. එම නිසා එතුමන්ලාට කවදාවත් අපිව මේ පිටියෙන් ඉවත් කරන්න බැහැ කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.52]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මෙම විවාදයට සහභාගි වීමට පෙර කථිකයන් කිහිපදෙනෙකු විසින් චෝදනාවක් ඉදිරිපත් කරනවා මට ඇහුණා. "මහා භාණ්ඩාගාරයේ සල්ලි තිබෙනවා" කියන ප්‍රශ්නය තමයි දැන් ඔවුන් මතු කරන්නේ. මේ රට බංකොලොත් වෙමින් තිබුණු කාලයේත් ඔය විධියටම ප්‍රශ්න කළා නම්, මේ රට බංකොලොත් නොවෙන්න තිබුණා.

අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ කථා ඇහෙනකොට මට කල්පනා වෙනවා, මේ ආණ්ඩුව කරපු වරද ආර්ථිකය සවිමත් කරලා භාණ්ඩාගාරයට මුදල් එකතු කිරීමද කියලා. ඒක මේ ආණ්ඩුව කරපු වරදක්ද කියන එක තමයි දැන් මට අහන්න සිදු වෙලා තිබෙන්නේ. මෙන්න මේවා තමයි දෙබිඩි කථා.

කෙසේ හෝ වේවා, ගරු විපක්ෂ නායකතුමා අද විවාදය ආරම්භ කරමින් කථා කළා. මගේ මතය නම්, එතුමා ඒ කථාව ගෙදරදී ලියාගෙන ආවා මිසක්, අපේ Budget එකේ තිබෙන කරුණු කියවලා ලියපු කථාවක් නොවෙයි කියන එකයි. එක් අවස්ථාවකදී කිව්වා, මේක සරදියෙල්ගේ අය වැයක් කියලා. එහෙමලු, අපි කිව්වේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම දන්නා තරමින් සරදියෙල් මේ රටේ මුදල් ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කරලා නැහැ. කෙසේ හෝ වේවා, එතුමාගේ කථාව අපි පැත්තක තියලා මම මගේ කථාවට එන්නම්.

Hon. Deputy Chairperson of Committees, I rise today to speak in support of the Appropriation Bill, 2027, a Budget that does not merely manage numbers on a ledger, but also charts a decisive, disciplined and compassionate course from economic survival to genuine national revival.

Madam, you would understand that when we inherited the country, it was officially bankrupt. We have come out of bankruptcy now. And in 2025, we achieved all the revenue targets, which was historical. In fact, the Inland Revenue Department, the Excise Department as well as the Sri Lanka Customs, all, achieved their targets. That is why the Treasury has money. Our target in the first few years had been to stabilize the economy. That is what we did with the previous Budget. Now, we want to transform; we want to take the leap to transformation and this Budget is designed for that purpose.

Madam, you will understand that this country cannot go forward with external and internal shocks. Therefore, we have to have a resilient economy which could withstand external and internal shocks. And, we have shown that we could withstand internal shocks. The massive loss of property due to Cyclone "Ditwah" we experienced, which caused nearly US Dollars 3.4 billion worth of damage, we withstood and recovered. Then, of course, after that challenge, our Government was challenged by the war between Iran and America over the Hormuz Strait, and the energy prices are soaring all over the world. People are feeling the pinch, the crunch or whatever name you call it, and some of the people did expect that our country would also suffer due to that, that there will be fuel queues and power cuts. Nothing of that sort happened. In order to compensate for this impact, over Rs. 147 billion has been spent. That is how these subsidies have been given. I heard some of them saying, "Give fuel at the same price you unload it at the port." Well, we are giving it at a price less than that because we know that we have to absorb the shock. We were able to absorb this shock and will continue with the challenges simply because we have achieved all our revenue targets, which was historical; it has not happened in this country before.

For decades, Madam, our economy was trapped in a cycle of short-term populism followed by painful austerity. We borrowed to consume, printed money to cover deficits, and when the inevitable economic crisis struck, it was the ordinary working citizen of Sri Lanka who paid the highest price. This Budget, which is presented for 2027 by the Hon. President Anura Kumara Dissanayake, breaks that cycle once and for all. It proves that fiscal discipline and social justice are not enemies; when guided by honest governance, they become partners.

Let us first look at the macroeconomic foundation this Budget lays. Under the strict guardrails of the Public Financial Management Act, this Government has refused to take the easy road of reckless spending. Primary expenditure is capped at 13 per cent of GDP, inflation has been tamed - well, somewhat tamed because, last month it went up to 8 per cent simply due to the Middle East war, which we will curtail - interest rates have been stabilized and we are firmly on a trajectory to bring our debt-to-GDP ratio down to 95 per cent by 2032, while propelling our economy towards a sustained growth rate exceeding 7 per cent. In fact, I was told by my Colleague here that we have already achieved the 95 per cent target, and we have to sustain it.

Crucially, Madam, look at how this Budget raises revenue. For years, the answer to every fiscal shortfall was to squeeze the salaried worker and the compliant taxpayer even harder, while tax evaders walked free. This Budget flips this approach on its head. By upgrading to RAMIS 3, which we have already done, introducing real-time API-based e-invoicing and implementing a data-driven, risk-based tax audit system, we are closing loopholes and removing human discretion - and, therefore, corruption - from tax administration. When everyone pays their fair share, no single citizen is crushed under an unfair burden.

Secondly, this is a Budget that unleashes the productive energy of our entrepreneurs and small businesses. You cannot build a prosperous nation by taxing a stagnant economy; you must grow the pie, so to speak. For far too long, tax incentives and State facilitation were reserved exclusively for mega conglomerates with political connections. By slashing the minimum investment threshold for tax incentives from US Dollars 3 million down to US Dollars 250,000, this Budget opens the doors of opportunity to mid-sized Sri Lankan innovators and regional investors. That is something we have already done, although I thought I should say it in this Budget because that is the direction we are heading.

Even more importantly, we have addressed the single biggest obstacle facing our small and medium enterprises: access to affordable credit. With over Rs. 174 billion dedicated to SME development including concessional loans at 3 per cent interest, targeted support for women-headed household, export-oriented enterprises and the operationalization of the National Credit Guarantee Institution, a young entrepreneur with a viable business plan no longer needs massive collateral or political patronage to get started. Combined with our simplified National Tariff Policy and the Trade National Single Window, we are making it easier to produce in Sri Lanka and export to the world.

Thirdly, the Budget, 2027 positions Sri Lanka squarely in the 21st Century digital economy. With an allocation of Rs. 35.6 billion for digital transformation, including the rollout of our Unique Digital Identity, we are building the digital public infrastructure needed to make Government services faster, cleaner and corruption-free. We are establishing a Rs. 1.5 billion Startup Fund, creating Virtual Special Economic Zones, opening up new IT hubs in Digana and Nuwara Eliya and are offering five-year tax exemptions for AI data centres. Therefore, we are telling our bright young engineers and software developers, you do not have to leave your motherland to build world-class technology; you can build it right here at home.

At the same time, we have not forgotten the backbone of our real economy: our farmers, our rural communities and our physical infrastructure. A staggering Rs. 91.7 billion has been allocated to restore our historic irrigation networks, including giants like the Senanayake Samudraya and Gal Oya. When we invest in irrigation, we invest in food security and rural dignity. Alongside

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

this, Rs. 58.2 billion for expressways, rural roads and bridges, plus Rs. 6.9 billion for 600 new SLTB buses and modern railway units will ensure that goods move efficiently from the farm gate to the port and the working people commute with dignity.

Finally, Madam, let me speak about the moral heart of this Budget, how it treats the working people and the most vulnerable citizens of this country. Critics claimed that strict fiscal discipline w10ould mean abandoning the poor and freezing public wages. This Budget proves them wrong. We have allocated Rs. 130 billion towards revising public sector salaries and pensions, recognizing that an efficient, incorruptible Public Service must be fairly compensated.

We have corrected a historic injustice by raising the daily wage of our plantation workers, the very people who sustain our tea economy, to Rs. 1,750 per day. In fact, this was done last year. But, it must be noted that the Government, in order to implement it continuously and smoothly, will continue to contribute a Rs. 200 daily attendance incentive, and money has been allocated for that this year as well. Therefore, we have corrected that historical mistake.

Then, let us look at how we protect those who need the State most. Over Rs. 230 billion has been allocated under Aswesuma to shield the low-income households. I do understand that some people claim that this is a waste of money as these families are forever dependent on that money. It is true and I understand that we should not let them be dependent on it; we must allow them to stand on their own feet. We must understand that a Budget is not just about numbers; it is not a balancing game of numbers, but it must serve the people. When we say develop the economy, that means we must create a happier nation. Therefore, it is important to have a safety net for those who are unfortunate and who might fall through the cracks of social inequalities. For that purpose, we will continue this programme.

We have allocated money for the housing initiative “A Place of Your Own - A Beautiful Life” and also made major investments in our Primary Healthcare Centres. For example, for Suwa Seriya alone, Rs. 1.7 billion has been allocated. We have also allocated nearly Rs. 3 billion to replace the existing ambulances because we look at the safety and health aspects of the population.

Madam, a Budget is, ultimately, a statement of a government's values. The Budget, 2027 values honesty over corruption, production over speculation and inclusion over privilege. It asks every sector of society to contribute according to its capacity, while guaranteeing that the fruits of recovery are shared by all.

For these reasons, Madam, I urge every Hon. Member of this House, regardless of party lines, to look at the substance of these Proposals, support this progressive blueprint for national renewal and to vote in favour of the Budget, 2027. Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමානාත්මතාව, සමාජ සාධාරණත්වය, සමාජ යුක්තිය, මනුෂ්‍යත්වය ඉල්ලා මොර දීපු, සටන් වැදිච්ච විමුක්තිකාමීන්ගේ දිනය අදයි. ඒ, "ඉල් මහ විරු සමරුව" යෙදුණු දිනයයි. ඒ සහෝදරත්වයට උපරිම ගෞරවය සහ ආචාරය පිරිනමමින් මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි.

මේ අය වැය ලේඛනයේ පූර්විකාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට මෙන්න මේ කාරණා 3 නැවතත් අවධාරණය කරනවා. ඒ තමයි, සමානාත්මතාව, සමාජ සාධාරණත්වය සහ මනුෂ්‍යත්වය. ශ්‍රී ලාංකීය පුරවැසියාට අභිමානවත්ව ලෝකය ඉදිරියේ නැඟිටින්න පුළුවන් ආර්ථික ක්‍රමයක් නිර්මාණය කිරීමේ අරමුණින් ස්ථාවර ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා දැවුරුද්දක් පුරාවට ජාතික ජන බලවේගය ආණ්ඩුව විශාල කර්තව්‍යයන් කරගෙන ගියා. දැන් එහි සාර්ථකත්වය අපි අත්විඳිමින් ඉන්නවා. අපට මේ ගමන වේගවත්ව ඉදිරියට යෑමේ අවශ්‍යතාව තිබෙනවා. මේ ගමන ඉදිරියට යෑමේදී, වේගවත් සංවර්ධනයක් අත් පත් කර ගැනීමේදී, සමාජයේ සියලුම කණ්ඩායම්වලට ඒ සංවර්ධනයේ ඵල ප්‍රයෝජන ලබා ගැනීම අනිවාර්ය කාරණාවක්. මෙහිදී කිසිම ජන කණ්ඩායමක් අත් හරින්න අපි සූදානම් නැහැ. ඒ වාගේ අර්ථයකින් තමයි ගරු ජනාධිපතිතුමා ස්වකීය අය වැය ලේඛනය ඉදිරිපත් කළේ.

එතුමා ලක්ෂ සංඛ්‍යාත වූ ආබාධ සහිත ප්‍රජාව රැක බලාගැනීම, ඔවුන්ට අයිතිවාසිකම් පිරිනැමීම විතරක් නොවෙයි, ඔවුන්ව සවිබල ගැන්වීමේ අභියෝගයත් රජය විසින් භාර ගන්නා බව ඊයේ මේ ගරු උත්තරීතර සභාවේදී ප්‍රකාශයට පත් කළා. ඒ අනුව ආබාධ සහිත ප්‍රජාවට අපි රුපියල් 10,000ක් දක්වා දීපු දීමනාව, වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාවත් එක්කම මේ අවුරුද්දේදී 12,500 දක්වා සියයට 25කින් වැඩි කරන්න තීරණය කළා. මේ තුළින් අපි සුබසාධනවාදය ක්‍රියාත්මක කරන අතර මොවුන්ව බලගැන්වීම සඳහා විශාල වැඩ කොටසක් කරමින් පවතිනවා.

ගරු ජනාධිපතිතුමා කිව්වා වාගේම මීට අවුරුදු 15කට කලින් තමයි, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නේ ආබාධ සහිත ප්‍රජාවට රජයේ පොදු ආයතනවලින් සේවාවන් ලබා ගැනීමේදී නිර්බාධිත තත්ත්වයක් ඇති කළ යුතුයි, ප්‍රවේශ පහසුකම් සලසා දිය යුතුයි කියලා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ තීන්දුව තවමත් යථාර්ථයක් බවට පත් වෙලා නැහැයි කියන එක අපට හොඳටම පෙනෙනවා, සමාජයට ගිහිල්ලා බැලුවාම. ඒ සඳහා අපි 2026 අවුරුද්දේදී රුපියල් මිලියන 1,000ක් වෙන් කළා. අපි නතර වෙන්නේ නැහැ, අපේ ආණ්ඩුව විසින් ඊළඟ අවුරුද්දේදීත් භෞතික ප්‍රවේශ පහසුකම් සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා, Clean Sri Lanka වැඩසටහන තුළ. වැදගත්ම කාරණය තමයි, තවදුරටත් ආයතන ප්‍රධානීන්ට මේ භෞතික ප්‍රවේශය සකස් කර නොදීමේ වගකීමෙන් අත්මිදෙන්න බැහැයි කියන එක ගරු ජනාධිපතිතුමා අවධාරණය කිරීම. ඒ නිසා අපි කියනවා, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, ආයතන ප්‍රධානීන්ට තමන්ගේ පරිශ්‍රයේ ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශය ලබා නොදුන්නොත් එහි වගකීම ඔබ භාර ගත යුතුයි කියා. මොකද,

පොහොසත් ආණ්ඩුවක් විධියට අපි රුපියල් මිලියන 1,000ක් මේ සඳහා වෙන් කර තිබෙනවා. මේ රුපියල් මිලියන 1,000 භාවිත කරමින් ආබාධ සහිත ප්‍රජාවට ප්‍රවේශ පහසුකම් ලබා දීම සිදු කළ යුතුයි. ඒක ආබාධ සහිත ප්‍රජාවගේ අයිතියක්, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක්. මේ සඳහා ගැඹුරින් අවධාරණාත්මකව, වගකීම් සහගතව බැඳෙන්න කියන කාරණය මේ වෙලාවේ මතක් කරන්න මා සතුටුයි.

මේ ප්‍රවේශය කියන කාරණය භෞතික ප්‍රවේශයට විතරක් සීමා වන්නේ නැහැ. ඩිජිටල්කරණයේදීත් මේ ප්‍රවේශය අත්‍යවශ්‍යයි. ආබාධ සහිත ප්‍රජාවට සෑම වෙබ් අඩවියක් හරහාම ස්වකීය වෛකල්පික මාධ්‍යයක් ඔස්සේ සම්බන්ධ වීමේ අයිතිය තිබෙනවා. තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිය තිබෙනවා. ඒ නිසා තමයි, W3C ප්‍රමිතීන්ට අනුව වෙබ් අඩවි සහ තමන්ගේ ඩිජිටල් මාධ්‍ය, ඩිජිටල් සේවාවන් නිර්මාණය කිරීම අනිවාර්යය කරමින් ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළේ, ඩිජිටල් ලෝකයට සහසම්බන්ධ වීමට ආබාධ සහිත ප්‍රජාවටත් අයිතියක් තිබෙන බව. ඒක තහවුරු කිරීම රජයක වගකීමක්. ඒ රජයේ වගකීම ජාතික ජන බලවේගය ආණ්ඩුව පිළිගන්නා බවත්, ඒක යථාර්ථයක් බවට පත් කිරීම සඳහාත් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

ඒ එක්කම ඉතා වැදගත් කාරණාවක් ගරු ජනාධිපතිතුමා අවධාරණය කරනවා. රාජ්‍ය ආයතන තුළ ආබාධිතතාව ආමන්ත්‍රණය කිරීම සඳහා කේන්ද්‍රස්ථාන - focal points - පිහිටුවන්න ඕනෑ. ඒ focal points තමයි, එම රාජ්‍ය ආයතනයේ සිටින ආබාධිත පුද්ගලයන්ගේ ආබාධිතතාව ආමන්ත්‍රණය කරන සියලු වැඩසටහන්, සියලු කර්තව්‍යයන්වලට මූලිකත්වය දෙන්නේ. ඒ එක්කම එම ආයතන තුළින් ආබාධිත පුද්ගලයන්හට සේවාවන් ලබා ගැනීමේදී මෙන්න මේ කේන්ද්‍රීය ස්ථානය සක්‍රියව, සජීවීව ඒ සඳහා දායක විය යුතුයි. ඒ දායක වීම හරහා ආබාධ සහිත තැනැත්තන්ට සේවාවන්වලට ළඟා කිරීම පහසු කරනවා විතරක් නොවෙයි, මේ ප්‍රතිපත්තිය තමයි ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 33වන වගන්තියෙන් අවධාරණය කළේ. 33වන වගන්තියෙන් අවධාරණය කරන දේ ලබන අවුරුද්දේදී අපි මේ අය වැය ලේඛනයෙන් යථාර්ථයක් බවට පත් කිරීමෙන් ප්‍රකාශ කරන්නේ ලක්ෂ සංඛ්‍යාත ආබාධ සහිත ප්‍රජාවට ස්වකීය අභිලාෂයන්, ස්වකීය අයිතීන් ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව තහවුරු කරන බවයි.

ඒ එක්කම අපි කියන්න ඕනෑ, ආබාධ සහිත ප්‍රජාවගේ ආබාධිත බව අවම කර ගැනීම සඳහා සහායක උපකරණ ලබා ගැනීමේ විශාල අවශ්‍යතාවක් තිබෙන බව. ඒ තුළින් තමන්ගේ ආබාධිතතාවත් එක්ක තිබෙන අභියෝග අවම කරගනිමින් සමාජයේ අභිමානවත් පුරවැසියෙක් බවට පත් වෙන්න පුළුවන්. ඒ සඳහා රුපියල් මිලියන 150ක් ආබාධිත තැනැත්තන් සඳහා වන ලේකම් කාර්යාලය යටතේ වෙන් කරලා තිබෙනවා. මේක නොවෙයිද අපි බලාපොරොත්තු වන යුක්තිය? මේක නොවෙයිද අපි බලාපොරොත්තු වන සමාජ සාධාරණත්වය? ඒ එක්කම ආබාධ සහිත දුවා දරුවන් රැක බලා ගැනීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන මේ අවුරුද්දේ සක්‍රියව ක්‍රියාත්මක වනවා. ඉදිරි අවුරුද්දේදී ද ඒ වැඩසටහන ඉදිරියට ගෙන යාම සඳහා ජනාධිපතිතුමා ස්වකීය අය වැය ලේඛනය හරහා තවත් ප්‍රතිපාදන ප්‍රමාණයක් - රුපියල් මිලියන 200ක් - වෙන් කරමින් ඒ වැඩසටහන සක්‍රියව ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කරනවා.

ඒ එක්කම තවත් වැදගත් කාරණාවක් තමයි, රාජ්‍ය නොවන සංවිධාන මඟින් ආබාධ සහිත තැනැත්තන් රැකබලා ගනිමින් ස්වකීය ආයතන පවත්වාගෙන යෑම වෙනුවෙන් රජයේ සහාය ලබා දීම. ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරනවා. ඒ එක්කම මෙට්‍රෝ බස් සේවය වඩාත් ප්‍රචලිත කරන අතර, අපේ අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අපි බලාපොරොත්තු වෙන්නේ ආබාධිත සහිත තැනැත්තන් අවම කරන්නයි. ඒ සඳහා තමයි පාසල් ළමයි වෙනුවෙන් ඇස් කණ්ණාඩි ලබා දීමේ වැඩසටහනක් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව එක කාරණයක් කියන්න අවසර දෙන්න.

අධ්‍යාපන ක්‍රමය තුළ ඩිජිටල්කරණය හරහා අධ්‍යාපනික අවස්ථා පුළුල් කරමින්, ආබාධ සහිත දුවා දරුවන්ට ඩිජිටල් අධ්‍යාපනයක් ඔස්සේ තමන්ගේ අභිලාෂයන් ඉෂ්ට කර ගන්න අවකාශ සැලසීමට මිලියන ගණනක් වෙන් කරමින්, ඉතාම සුබ හෙට දවසක් ආබාධ සහිත ප්‍රජාවට උරුම කර දීම සඳහා මේ අය වැය ලේඛනය ඉවහල් වන බව සපථ කරමින්, ඒ සඳහා මුදල් වෙන් කරපු ගරු ජනාධිපතිතුමාටත්, මේ ආණ්ඩුවටත් ආබාධ සහිත ප්‍රජාවගේ නියෝජිතයෙක් විධියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 2.15]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මම හිතන විධියට, මෙය වැදගත්ම අය වැය විවාදයක් සහ ඉදිරිපත් කිරීමක්. මෙය සාමාන්‍ය ජනතාවගේ බෙල්ලට තොණ්ඩුව වැටිලා, හිර වෙලා, මිරිකිලා, බලාපොරොත්තු ගොඩක් සහිතව මැරෙන්න ඉන්න අවස්ථාවක ඉදිරිපත් කරන අය වැයක්. මම හිතන්නේ ඔබතුමන්ලා අද පොඩ්ඩක් තැති ගැන්මකට පත් වෙලා තිබුණා. මොකද, අපේ විපක්ෂ නායකතුමා හොඳ කථාවක් කළා. මම හිතන්නේ ඒක නිසා ගොඩක් අය අපහසුතාවට පත් වෙලා තිබෙනවා. අපේ විපක්ෂයේ කථා කොහොමද ඉදිරිපත් වන්නේ, ඒ අනුපිළිවෙළ මොකක්ද කියන එක සම්බන්ධයෙන් කථා කරනකොට ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මට කිව්වා, "පසුගිය වතාවේ අය වැය විවාදයේදී ආණ්ඩු පාර්ශ්වයෙන් මුලින්ම කථා කරලා තිබෙන්නේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා" කියලා. පසුගිය වතාවේ ඔයගොල්ලන්ගේ පැත්තෙන් අය වැය විවාදය start කරලා තිබෙන්නේ එතුමා. මෙවර ඔයගොල්ලන්ගේ පැත්තෙන් අය වැය විවාදය පටන් ගත්තේ අගමැතිනිය. මම හිතන විධියට, අපේ විපක්ෂ නායකතුමා දේශපාලනික වශයෙන් ඉතාම හරබර කථාවක් ඉදිරිපත් කළා. අපි එතුමාට ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වනවා. ඔබතුමන්ලා ඒකට තැතිගැන්මට ඕනෑ නැහැ. ඔබතුමන්ලාගේ කාර්යභාරය හරියට කළොත් ඔබතුමන්ලා විපක්ෂ නායකතුමාගේ කථාව ගැන එච්චර අවධානය යොමු කරන්න අවශ්‍ය නැහැ.

ඔබතුමන්ලා හැම වෙලාවේදීම කියනවා, අවුරුදු 76ක ශාපය, අවුරුදු 77ක ශාපය කියලා. අපේ සාක්ෂරතාවය තිබුණේ සියයට 94ක් ලෙසයි. ආසියාවේ අපිට යුරෝපයට සමාන සාක්ෂර හැකියාවක් තිබෙනවා. අද නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ අපි ආණ්ඩුව භාර දෙන කාලයේ - 1994 අවුරුද්දේ - තිබුණු දත්ත මම කියන්නේ. මම ඉන්දියාවට ගිහිල්ලා නරේන්ද්‍ර මෝදි මහත්මයාගේ වැඩසටහනකදී ඒ ගැන කථා කරනකොට ඉන්දියාවත් මවිතයට පත් වුණා. ඉන්දියාවේ සාක්ෂරතාව ඉතාම පහළ අගයක්. සියයට හැත්තෑ ගණන්, හැටගණන් තමයි පාකිස්තානයේ, බංග්ලාදේශයේ සාක්ෂරතාවය.

සාමාන්‍යයෙන් අපේ රටේ උපතේදී ආයු අපේක්ෂාව අවුරුදු 80යි. මේ රට පාවිචල් කරන්න එපා. මේ රට හුණ්ඩුවක් නොවෙයි. මේ රට විශාල සංවර්ධනයක් වෙච්ච රටක්. ඔබතුමන්ලාගේ ඇඳුම් බැලුවොත්, ඔබතුමන්ලාගේ විලාසය බැලුවොත්, ඉන්න තැන් බැලුවොත් ඔබතුමන්ලා 159දෙනාම හොඳට ඉන්නවා. අපිට එහෙම ඔබතුමන්ලාගේ අහේනියක් පෙනෙන්න නැහැ. ඒ හින්දා බොරු කියන්න එපා, මෙහෙමයි, මේ රට විනාශ වෙලා කියලා. ඔබතුමන්ලා දන්නවා, 1994න් පස්සේ වාමාංශික පක්ෂ ඇවිල්ලා මේ රට සංවර්ධනය කරපු හැටි. ඔබතුමන්ලා දැන් ඇමෙරිකාවට ආදරය කරනවා, ඉන්දියාවට ආදරය කරනවා, යුරෝපයට ආදරය කරනවා. ඒ රටවලට යනවා. එහෙම ඒ රටවල්වලට ගිහිල්ලා කනවා, බොනවා; හැම්, බේකන් කනවා, ගෑරුප්පුවලින්. දැන් ඔබතුමන්ලාගේ සමාජවාදය නැහැ, විප්ලවවාදය නැහැ. ඔබතුමන්ලා ඒක පිළිගත්තා. සංවර්ධන ව්‍යාපෘති නවත්වලා අවුරුදු ගණනක් තිස්සේ මේ රට විනාශ වුණා. සංවර්ධන ව්‍යාපෘති ඔක්කෝම නැවැත්වූවා. ඔක්කොටම ගැරහුවා. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය පටන් ගන්නකොට, ඇඟලුම් කර්මාන්තය පටන් ගන්නකොට, ඇමෙරිකාවත් එක්ක MCC ගිවිසුම පටන් ගන්නකොට - ඒ ඔක්කෝටම - ගැරහුවා.

දැන් ජනාධිපතිතුමා උජාරුවෙන් කියනවා, අපි අර රටත් එක්ක, මේ රටත් එක්ක FTAs sign කරනවා කියලා. ඒවා පටන් ගන්නකොට මම ඒ විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. ඒ කාලයේ ඔබතුමන්ලා අපේ බෙල්ල මිරිකන්න ආවා, sign කරන්න එපා, රට පාවා දෙනවා, චීනයේ ව්‍යාප්තවාදය, ඉන්දියාවේ ව්‍යාප්තවාදය කියලා. ඔබතුමන්ලා මේ සියල්ල නැවැත්වූවා. 1988 -1989 කාලයේ ඉන්දියාවත් එක්ක ගනුදෙනු කරනවා කියලා මේ රටේ අහිංසක ජනතාව 60,000ක් මැරුණා. දැන් ටිල්වින් සිල්වා මහත්මයා ඉන්දියාවට ගිහිල්ලා ගෑනු ළමයි සහ ඒ රටේ ඉන්න නායකයන්ව බදා ගන්නවා. කොහොමද, මෙහෙම කරන්නේ? මම දන්නවා, චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, විශේෂයෙන්ම අපේ අධිකරණ ඇමතිතුමා එහෙම ඒ සම්බන්ධයෙන් සාධාරණ ලෙස කථා කරපු අය කියලා. එතකොට මේ කියන කථාව අසත්‍යයක්. 1994න් පස්සේ යම්කිසි ආකාරයකට මේ රට අඩාළ වුණා. මහවැලි ව්‍යාපෘතියත්, ඇඟලුම් කර්මාන්තයත් සංවර්ධනය කරන්න අපිට බලයට එන්න හම්බ වුණේ නැහැ, අවුරුදු ගණනක්.

ඔබතුමන්ලා දැන් රටේ තත්ත්වය බලන්න. ආයෝජන කීයද? ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1යි. දුප්පත් රටක ආයෝජන තිබෙන්න ඕනෑ, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3ක් විධියට. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, දුප්පත් වුණත් බංග්ලාදේශයේ, පාකිස්තානයේ, ඉන්දියාවේ අඩුම ගණනේ ආයෝජන සියයට 3ක් තිබෙන්න ඕනෑ කියලා. අඩුම ගණනේ ඩොලර් බිලියන 3ක ආයෝජන එන්න ඕනෑ. අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 100යි. හැබැයි, ලංකාවේ ඒ ඩොලර් බිලියන 1ක ආයෝජනත් රනිල් වික්‍රමසිංහ මහත්මයා අත්සන් කරපු ආයෝජන. පුළුවන් නම් නැඟිටලා මට කියන්න, ඔබතුමන්ලාට ඩොලර් බිලියන 2ක ආයෝජන ඇවිල්ලා තිබෙනවා කියලා. ඔබතුමන්ලාත් එක්ක රණ්ඩු වන එක නොවෙයි මම මේ කරන්නේ. මම මේ කරන්නේ සාධාරණීය ආර්ථික විග්‍රහයක්. අපිට ආයෝජන එන්න ඕනෑ. ඔබතුමන්ලා අදානි සමාගම අපේ රටින් පැන්නුවා. ජනාධිපතිතුමා බොරු කිව්වේ. ඒ වෙලාවේදී මම කථා කළා, ලෝකයේ තිබෙන ඔක්කෝම සංවිධානවලට. මම අදානි සමාගමටත් කථා කරලා මේ ගැන ඇහුවා. මට අදානි සමාගම කිව්වා, පුළුවන් නම් කොහේ හරි රටකින් ඇමෙරිකානු ඩොලර් ශත 8.3ට අඩු විදුලි ඒකකයක් ගෙනැල්ලා පෙන්වන්න කියලා. Transmission line එකට ඩොලර් මිලියන 200යි. අපිට ඒක දීලා යනවා, අවුරුදු 10කට පස්සේ. කවුද, මෙහෙම දෙන්නේ? ජනාධිපතිතුමා මේ කථා කරන්නේ ධම්මික පෙරේරාට දුන්නු මෙගාවොට් 50ක සුළං විදුලි බලාගාර ව්‍යාපෘතිය ගැන. ලෝකයේ හැම තැනම තිබෙනවා, විදුලිය ඒකකයක් ඩොලර් ශත 3.5ට. ඒ, මෙගාවොට් 50 සුළං විදුලි බලාගාරයක්. ඒකට අවශ්‍ය කරන්නේ නැහැ, යටිතල පහසුකම්. මෙගාවොට් 500ක් කියලා කියන්නේ, ගිගාවොට් 1ක් කියන්නේ,- අපි බලයේ හිටියා නම් ගිගාවොට් 2ක විදුලි බලාගාරයක් ගෙනෙනවා, අදානි සමාගම හරහා. අදානි සමාගමේ සුළං විදුලි බලාගාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළා නම් අපිට green hydrogen නිෂ්පාදනය කරන්න පුළුවන්. එහෙනම් ඒ පැත්තේ අපිට university එකක් පටන් ගන්න පුළුවන්. එහෙනම් අපිට ගාමිණී දිසානායකලා, ලලිත් ඇතුලත්මුදලිලා, ජේ.ආර්.ලා කළා වාගේ ඒ ප්‍රදේශය සංවර්ධනය කරන්නත් පුළුවන්. ඒ වාගේම ලංකාව model එකකට ගන්නත් පුළුවන්, සුළං විදුලි බලය නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන්. අපේ වටේ තිබෙන ප්‍රමාණය ගිගාවොට් 60ක්. අපිට ඒක ගන්න තිබුණා. ඇයි එළෙව්වේ? මම ඔබතුමන්ලාට අභියෝගයක් කරනවා, පුළුවන් නම් ඒකකයක් ඩොලර් සත 8ට අඩුවෙන් මෙගාවොට් 500ක් නිෂ්පාදනය කරන කර්මාන්තයක් ගෙනැල්ලා පෙන්වන්න. මම මේ සාධාරණ ලෙස කියන්නේ. ඒ හින්දා ජනතාවගේ ඇස් වහලා ගහලා හරියන්නේ නැහැ. මේවා සංවර්ධනය නොකළොත් අන්තිමට අපේ රටේ

ජනතාව තමයි දුක් විඳින්නේ. මේකට ආයෝජන එන්න ඕනෑ. ආයෝජන එන්නේ නැතිව මේ රට සංවර්ධනය කරන්න බැහැ. අඩුම ගාණේ මේ වෙනකොට ඩොලර් බිලියන 5ක් එන්න ඕනෑ. ඒක පටන් ගන්න තිබුණා. ඇමරිකාවේ MCC එක පටන් ගන්න තිබුණා. ජපන් සමාගම කරන්න හදපු Light Rail Transit Project එක පටන් ගන්න තිබුණා. මේ ටික ගේන්න තිබුණා. අපේ ආණ්ඩුවක් තිබුණා නම් අවුරුද්දක් ඇතුළත, අපි අඩුම ගාණේ ඩොලර් බිලියන 5ක් ගේනවා. අපි සාධාරණව වැඩ කරන අය. සජිත් ප්‍රේමදාස මහත්මයා ඇතුළු අපි ඉතා සාධාරණව වැඩ කරන අය. අපි හොරකම් කරන්නේ නැහැ. අපි බලයේ හිටපු කාලයේ අපේ අමාත්‍යාංශවලින් අපිට විරුද්ධව චෝදනා නැහැ. දක්ෂ කණ්ඩායමක් අපට ඉන්නවා. අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා අවුරුදු කීයක් තිස්සේ දේශපාලනයේ ඉන්නවා ද කියලා අහලා බලන්න. එතුමන්ලාට විරුද්ධව චෝදනා නැහැ. ඒ හින්දා ඔබතුමන්ලා මේ ගහන ගැහිල්ල, ගහන කට්ටියට ගහන්න. හොරු ඉන්නවා නම් හොරුන්ට ගහන්න. ඔක්කෝටම ගහන්න එපා. අපි හැමදෙනාම හොරු කියලා ඔබතුමන්ලාට කියන්න බැහැ.

හොරකම් කරපු සමහර අය දැන් ඉස්සරහ ඉන්නවා. ගල් අඟුරු වංචාව, කන්ටේනර් වංචාව, NDB වංචාව, අධ්‍යාපන වංචාව ඇතුළු වංචා ගොඩක් තිබෙනවා. හැබැයි, හැමදෙනාටම එහෙම කියන්න අපට බැහැ. ඔබතුමන්ලා මේ ආයෝජන ලංකාවට ගෙනැල්ලා නැහැ. ඒ හින්දා ඒ ආයෝජන සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටට ආයෝජන එන්නේ නැහැ. ඉන්න ආයෝජකයනුත් රටින් පිටවෙලා යනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලා අපේ රට බංකොලොත් වෙච්ච එක ගැන කියනවා. ඔව්, අපේ රට බංකොලොත් වුණා තමයි. අපි අනාවැකි කිව්වා. අපි කිව්වා, "ගෝඨාභය රාජපක්ෂට අත්දැකීම් නැහැ, ඒ නිසා බලය දෙන්න එපා" කියලා. ගෝඨාභය රාජපක්ෂට වුවමනාවක් තිබුණා රට දියුණු කරන්න. හැබැයි, එතුමාට අත්දැකීම් තිබුණේ නැහැ. එතුමාට හොඳ කණ්ඩායමක් හිටියේ නැහැ. එයා කවුරුවත් ගණන් ගත්තේ නැහැ. එතුමා බලයට ඇවිල්ලා ටික කාලයකින් මොකක්ද වුණේ? අපේ රට බංකොලොත් වුණා. ඒ විධියට බංකොලොත් වුණාට පස්සේ මොකක්ද වුණේ? ඊට පස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති වුණා. අපි දේශපාලන වශයෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක විරුද්ධයි. හැබැයි, එතුමාගේ හොඳ දේවල්වලට අපි හොඳයි කියනවා. එතුමාගේ නරක දේවල් සම්බන්ධයෙන් රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා, මම ඇතුළු අපේ කණ්ඩායම, එතුමාට කෙළින්ම attack කළා. අපි දැනුත් එහෙමයි. දැනුත් එතුමා හමුවුණාම මම එතුමාට කියනවා, "මෙන්න මේ දේ වැරදියි" කියලා. හැබැයි, එතුමා ඍණ මට්ටමක තිබුණු අපේ රටේ ආර්ථිකය ධන 5.5කට ගෙනාවා.

අපේ රට ලෝකය ඉදිරියේ බිමටම වැටිලා තිබුණේ. ලෝකයේම පැසසුමට ලක් වෙන්නේ ඔබතුමන්ලා නොවෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා කරපු දේයි. අපේ රටේ ආර්ථිකය බිමට වැටිලා ඍණ වෙලා තිබෙනකොට එතුමා ධන 5.5කට ආර්ථික වර්ධනය ගෙනැල්ලා, විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.5කට ගෙනාවා. තවම තිබෙන්නේ එතැන. ඔබතුමන්ලාගේ ආර්ථික වර්ධනය පල්ලෙහාට යනවා. අඩුම ගාණේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 13ක වත් ඉන්න ඕනෑ. මේ උඩට යන ගමන නවතින්න බැහැ. එක තැන ලොප් වෙනවා කියලා කියන්නේ, නැවතිලා තිබෙනවා කියන්නේ එතැන මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා කියන එකයි. ඔබතුමන්ලා භාර ගත්තේ එහෙම රටක්.

ඔබතුමන්ලා දැන් ආදායම් ලබා ගන්නේ මොනවායින් ද? අපි රනිල් වික්‍රමසිංහ මහත්මයාට තමයි බණින්නේ. මොකද, electricity bill එක වැඩි කළේ එතුමා. ඒ වාගේම, ඔය බදු දැල දැම්මේ එතුමා. ඔය බදුවලින් තමයි ආදායම එන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා ගහපු බදු ටික තමයි උඩට උඩට කැඩීගෙන එන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ direct tax එක සියයට 33යි. දැන් direct tax එක සියයට 22යි. ඔබතුමන්ලා මේ දුප්පත් ජනතාවට බදු ගහන්නේ. දැන් මේ සේවය කරන සේවකයින්ගේ පඩිය කීයද කියලා අහලා බලන්න. මේ සේවකයන් ජීවත් වෙන්නේ කොහොමද කියලා අහලා බලන්න.

ඒ වාගේම තමයි ව්‍යාපාර. ව්‍යාපාර බොහොමයක්ම අපේ රටින් පිටත් වෙලා යනවා; HSBC ආයතනය යනවා; ඒ වාගේම, Standard Chartered Bank එක යනවා; MAS Holdings ආයතනය යනවා. ඒ වාගේම, මෙන්න මේ කාරණයත් ඔබතුමන්ලා හොඳට හිතේ තියාගන්න. මේ අවුරුද්දේ තේ අපනයනය ගත්තොත්, ඩොලර් බිලියනයක් පාඩුයි. තේ අපනයනය කරන මගේ යාලුවෝ කිහිප දෙනෙක් ඉන්නවා. ඒ අය කියනවා, මේක මේ රටේ කරන්න බැහැ කියලා. මොකද, මේවාට CESS එක ගහනවා, VAT එක ගහනවා, අරවා ගහනවා, මේවා ගහනවා, බෙල්ල මිරිකනවා. ඔබතුමන්ලා ඔය "හිරේ දානවා, හිරේ දානවා" කියලා ඔක්කෝම ව්‍යාපාරිකයෝ බය වෙලා ඉන්නේ. මිනිස්සු බැංකුවලට සල්ලි දාන්නේ නැහැ; ඒ සල්ලි ඔවුන් එළියේ තියාගන්නේ. චතුරංග නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන පොඩ්ඩක් සොයා බලන්න. ඔබතුමන්ලා සාධාරණව මේ බිස්නස් ගැන දන්නවා නේ. ඔබතුමන්ලා ව්‍යාපාරවල හිටපු උදව්ය නේ. මම මේ තරහට කියනවා නොවෙයි. People are scared to keep their money and are also scared to deposit it in banks. මිනිස්සු බයෙන් ජීවත් වෙන්නේ. භීෂණය. 1988-89 කාලයේ මැරෙන්න බය වුණා. දැන් ජීවත් වෙන්න බය වෙලා. මේක විහිළුවක් නොවෙයි. මේක ඔබතුමන්ලාට කවදා හරි තේරේවි. ඔබතුමන්ලා මට හිනා වෙන්න; මට ගහන්න. හැබැයි, තව මාස හයක් ගිහිල්ලා බලන්න, මේ නිෂ්පාදකයෝ විනාශ වෙනවා. නිෂ්පාදකයෝ රටේ ඉන්නේ නැහැ. - *[බාධා කිරීමක්]* Do not answer me now. පිටරට යන අපේ රටේ උදව්යගෙන් ඩොලර් බිලියන 8ක විතර ආදායමක් එනවා නේ. මොකද, අපේ රටේ ගොඩක් අය රට යනවා. ලංකාවේ ඉන්න බැහැ. ඒකයි එවැනි ආදායමක් අපට ලැබෙන්නේ. බැරි වෙලාවත් ඔය දැනට ලැබෙන ඩොලර් බිලියන 8 නැති වුණොත් ඔබතුමන්ලාත් සුන්; අපිත් සුන්. ඒ හින්දා ඔබතුමන්ලා මේ ගැන පොඩ්ඩක් සංවේදීව බලන්න.

ඒ වාගේම, මේ අවුරුද්දේ සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියනයක් අඩුයි. ඩොලර් බිලියනයක් - US Dollars 1 billion - අඩුයි. ඒ කියන්නේ, රුපියල් බිලියන 350ක්. ඒ කියන්නේ විශාල පාඩුවක්. මෙහෙම වුණාම රට එහෙමම ඇද වැටෙනවා. ව්‍යාපාර ඇදගෙන වැටෙනවා; ව්‍යාපාර රටින් පිටව යනවා. ඔබතුමන්ලා බලන්න, තව මාස 6කට විතර පස්සේ තත්ත්වය කොහොමද කියලා. ඔබතුමන්ලාට මම අභියෝග කරනවා. තවත් මාස 6කින් මොකක්ද වෙන්නේ කියලා බලන්න. ව්‍යාපාර මේ රට අතහැරලා ගිහිල්ලා, විශාල වශයෙන් මේ රටට ආයෝජන එන්නේ නැතිව, විශාල ආර්ථික බාධකවලට ඔබතුමන්ලාට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ඊළඟට, IMF එක සම්බන්ධයෙනුත් මම කථා කරන්න ඕනෑ. බලන්න, IMF එක දිහා. මෙන්න මේවා ගැන කථා කරන්න ඔබතුමන්ලා එන්නකෝ. IMF එකට ඔබතුමන්ලා ගැහුවා නේ, බැන්නා නේ. IMF එක පන්නපන් කිව්වා නේ. IMF එක යන්න ඕනෑ තමයි. මොකද, IMF එක තිබුණොත් අපි ඉවරයි. මොකක්ද IMF එකෙන් කරන්නේ? හදිසියකට ගිනි පොලීකාරයෙකුගෙන් ණය ගන්න ඕනෑ. හැබැයි, අවුරුද්දෙන් දෙකෙන් ඒ ණයෙන් බේරෙන්න ඕනෑ. ව්‍යාපාරිකයෙක් නිසා ඔබතුමාත් ඒ බව දන්නවා නේ. නැත්නම් IMF එක මොකද කරන්නේ? IMF එක ඒක නිසා

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

තමයි බෙල්ල හිර කරන්නේ. Indirect tax කියන්නේ සාමාන්‍ය ජනතාව ගෙවන tax එක. ඒක පොහොසත් මිනිස්සු ගෙවන tax එකක් නොවෙයි. එතකොට ඔබතුමන්ලාගේ direct tax සියයට 22යි. ඔබතුමන්ලාගේ අනෙක් ඔක්කෝම indirect tax. එතකොට, අපේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ direct tax සියයට 33යි, indirect tax සියයට 67යි. ඒක, ඉතා අඩු ප්‍රමාණයක්. Indirect tax ඔබතුමන්ලාගේ කාලයේදී ඉතා විශාල ලෙස වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඔබතුමන්ලා බදු ගහන්නේ සාමාන්‍ය දුප්පත් මනුස්සයාගේ භාණ්ඩවලට. ඒ indirect taxවලින් තමයි මේ ප්‍රමාණය එන්නේ.

IMF එක ගැන කියනවා නම්, ඔබතුමන්ලා IMF එකට ගැහුවා නේ. ඇයි දැන් අපෙන් අහන්නේ? ආයෙත් සලකා බලන්නේ මොනවාද? IMF එකෙන් අයින් වෙන්න. ඒකෙන් අයින්වෙලා, ඔබතුමන්ලාට තිබෙන ව්‍යාපාරික මොළය යොදවලා කටයුතු කරන්න. මම ඔබතුමන්ලාට කියන්න ඕනෑ, IMF එක නැත්නම් ඔබතුමන්ලා අද බංකොලොත් කියලා. ඔබතුමන්ලා කියනවා නේ ආණ්ඩුවට මෙච්චර සල්ලි තිබෙනවා, මෙච්චර බදු ආදායමක් තිබෙනවා කියලා. ඒ ඔක්කෝම IMF එකේ වැඩ. IMF එකේ තුන් දෙනෙක්, හතර දෙනෙක් තමයි මේ රට run කරන්නේ. එහෙම නැතිව ඔබතුමන්ලා කරන දෙයක් නැහැ. IMF එක කියන විධියට ඔබතුමන්ලා කරනවා. එතකොට taxes ටික එකතු වෙනවා. ඊට පස්සේ ඔබතුමන්ලා උජාරුවෙන් ඇවිල්ලා කියනවා, මෙච්චර ප්‍රමාණයක් tax එකතු වුණා කියලා. ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කළ රුපියල් බිලියන 1,300න් රුපියල් බිලියන 500යි වියදම් කරලා තිබුණේ. එතකොට මොනවාද ආයෙත් කථා කරන්නේ?

ඔබතුමන්ලා මෙතැනට එන්න කලින් හොඳ ව්‍යාපාර කළා නේ. ප්‍රාග්ධනයට වෙන් කරපු මුදලින් සියයට 30ක්, 40ක් වියදම් කරලා කොම්පැනිය ගොඩ ගන්න පුළුවන්ද? ඔබතුමන්ලා මහනුවරට යන රේල් පාර හැදුවා ද කියන්නකෝ. මට යන්න විධියක් නැතිව තවම බලනවා. මම අදත් check කරලා බැලුවා. නමුත් රඹුක්කනට විතරයි තිබෙන්නේ. මීටර් 20ක රේල් පාර හදාගන්න බැරි වෙලා තිබෙනවා අවුරුද්දක් යනකොට. මම මේ ඔබතුමන්ලාට hint ගහනවා නොවෙයි. ඇත්ත නේ කථාව. අපිට දෙන්නකෝ. මම මාස දෙකෙන් ඕක හදලා පෙන්වන්නම්. මම කටයුතු කළ අමාත්‍යාංශය, International Trade Ministry එක, යටතේ "ශිල්ප සේනා" වැඩසටහන හරහා, මාස 4න්, *-[බාධා කිරීමක්]* හිනාවෙන්න එපා. මිල්ලනිය ප්‍රදේශයේ අක්කර 500ක්, *-[බාධා කිරීමක්]* ඔබතුමන්ලාට පුළුවන් හිනාවෙන්න විතරයි නේ. අවුරුද්දක් ගිහිල්ලාත් රේල් පාර මීටර් 20ක් හදාගන්න බැහැ. මට හිනාවෙලා වැඩක් තිබෙනවාද මහත්තයෝ? හිනාවෙන්න මිනිස්සුන්ට. මේ මිනිස්සුන්ට ගමට යන්න බැහැ. හිනාවෙන්න මිනිස්සුන්ට.

IMF එකට යන්න එපා කියලා අපි කියනවා. IMF එකට ගියොත්, අපි ඉවරයි, අපි කම්මුතුයි. IMF එකට යන්න එපා. ඔබතුමන්ලා ඒකෙන් අයින්වෙන්න. IMF එක කියන්නේ ගිනි පොලීකාරයෙක්. IMF එක හොඳයි, අපට ප්‍රයෝජන ගන්න. මොකද, IMF එක කියන්නේ නැහැ, රට සංවර්ධනය කරන්න කියලා, ආයෝජන ගේන්න කියලා. *[බාධා කිරීම්]* අහගන්නකෝ. අපි අග්‍රාමාත්‍යතුමිය කථා කරනකොට hint ගැහුවේ නැහැ නේ. සංවර වෙන්න. අග්‍රාමාත්‍යතුමිය කථා කරද්දී, වෙන කවුරු හරි කථා කරද්දී අපි බාධා කළේ නැහැ නේ. මේ points කියන්නේ. කවදාවත් කථා කරන්නේ නැති මුහුණු ටික තමයි යටින් කෑ ගහන්නේ. විනාඩි 5කවත් කථාවක් දෙන්නේ නැහැ. හැංගිලා ඉඳලා එහෙන් මෙහෙන් කෑ ගහනවා. නැඟිටලා කථා කරන්නකෝ.

මේ IMF එක සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගත් තීන්දුව, - ජනාධිපතිතුමාගේ body language එකෙන් මම මාස දෙකකට කලින් අපේ කට්ටියට කිව්වා, IMF එකට යන්න පාර කපන්නේ, අහුවෙන්න එපා කියලා. මම එහෙම කිව්වා. මොකද, ජනාධිපතිතුමා, ව්‍යාපාර සම්බන්ධයෙන් එච්චර අත්දැකීම් නැති වුණාට දේශපාලනයේදී_

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්තප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ජනාධිපතිතුමාගේ මීටරේ අපි දන්නවා. ඔයගොල්ලන් ඔක්කෝම වඩා හොඳයි. එතුමා දන්නවා, IMF එකට යන්නේ නැතිව අපේ උන්ට මේක භාර දුන්නොත් කම්මුතුයි කියලා. ඒ නිසා ජනාධිපතිතුමා, IMF එකේ guideline අරගෙන මේක තව මාස 6ක්, අවුරුද්දක් ඇදගන්න තමයි එතුමා බලන්නේ. අපි කියනවා, IMF එකට යන්න එපා කියලා. මේ රටේ දුප්පත් ජනතාව විනාශ වෙයි. බදු ගහලා ඒ මිනිසුන් ටික මරලා දමයි.

මම කෙනෙක්ගෙන් ඇහුවා, අතට එන්නේ කීයද කියලා. එතකොට කිව්වා, රුපියල් 50,000යි කියලා. මම ඒක හදලා පෙන්වන්නම්. රුපියල් 50,000යි කිව්වාම, ඔබතුමන්ලා හිතලා බලන්නකෝ. හිනාවෙන්න එපා. ඔබතුමන්ලා කනවා බොනවා නේ කැන්ටීන් එකෙන්. නමුත් රටේ සාමාන්‍ය මිනිස්සුන්ට එහෙම කරන්න බැහැ නේ. උදාහරණයක් විධියට, රුපියල් 100ක් ගන්න මනුස්සයෙක් ගත්තොත්, උද්ධමනය සියයට 10යි. එතකොට ඒ මනුස්සයාගේ රුපියල් 100න් ඉතුරු වෙන්නේ රුපියල් 90යි. එතකොට රුපියල අවප්‍රමාණය, 290 ඉඳලා 335යි කියලා ගත්තොත්, එතැන සියයට 20යි. එතකොට එතැන සියයට 20ක් අවප්‍රමාණය වුණාම රුපියල් 70යි ඉතුරු වෙන්නේ. එතකොට සියයට 20ක විතර බද්දක් වැදෙනවා නේ ගෙන්වන භාණ්ඩ ඔක්කෝටම. සියයට 20ක් වැදුණාම තව රුපියල් 20ක් අඩු වෙනවා. එතකොට ඉතිරි වෙන්නේ රුපියල් 50යි. ඔබතුමන්ලා ආවට පස්සේ රුපියල් 100ක් ගන්න මනුස්සයෙක් ගේම් එක පටන් ගන්නේ රුපියල් 50න්. එතකොට, ජීවත්වෙන්න පුළුවන්ද?

මම කට්ටියගෙන් ඇහුවා, අතට කීයක් ලැබෙනවාද කියලා. එතකොට කිව්වා, රුපියල් 50,000යි අතට එන්නේ කියලා. එතකොට රුපියල් 25,000කින් මේ මිනිස්සු ජීවත්වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෙදරක හතර දෙනෙක් නැත්නම් පස්දෙනකු ඉන්නවා. ඔබතුමා දන්නවා නේ. එතකොට ඒ මිනිස්සු ජීවත්වෙන්නේ කොහොමද? ඔබතුමන්ලා කියනවා, දුප්පත් රේඛාව රුපියල් 17,000යි කියලා. එක් කෙනෙකුට රුපියල් 17,000යි නම්, පවුලේ හතර දෙනෙක් හෝ පස්දෙනකු ඉන්නවා නම්, රුපියල් 17,000යි, රුපියල් 32,000යි, රුපියල් 64,000යි. එතකොට රුපියල් 25,000ක් ගන්න මනුස්සයා ජීවත් වෙන්නේ කොහොමද? ඒ මනුස්සයා ජීවත් වෙන්නේ කනකර බඩු ටික උගස් කරලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ රුපියල් බිලියන 500ක්. රුපියල් බිලියන 1,300යි, මුළු රටේම කනකර බඩු උගස් කිරීම්වල මුළු වටිනාකම. මේ අවුරුදු එකහමාරට රුපියල් බිලියන 600යි. රුපියල් බිලියන 500 පහුකරලා තිබෙනවා. මම මේ විස්තර ගත්තේ මාස දෙකකට තුනකට කලින්. කොහොමද, මිනිස්සු ජීවත් වෙන්නේ? කනකර බඩු උගස් කරනවා කියන්නේ අන්තිම අවස්ථාව, the last straw; they have nowhere else to go. ඔබතුමන්ලා හිනාවෙනවා, ආණ්ඩු බලයේ ඉන්නකොට. නමුත් ඔබතුමන්ලා මේ පැත්තේ ඉන්නකොට කථා කරපු දේවල් දැන් TV එකේ පෙන්වනවා.

ඒ වාගේම දුප්පත්කම කියන එක ගත්තොත්, මිනිස්සු ජීවත්වෙනවා නොවෙයි. අද ගොවීන්ට සිදුවෙලා තිබෙන දෙය බලන්නකෝ, ගරු ඇමතිතුමා.

ඒ අයට තමන්ගේ වී ටික විකුණා ගන්න බැහැ නේ. ඔබතුමන්ලා පිට රටින් හාල් ගෙනාවා, මෙට්‍රික් ටොන් 150,000ක්. Plan කරන්න බැහැ, ඔබතුමන්ලාට. "භූතයාට" ගෙවනවා, අරකට ගෙවනවා, මේකට ගෙවනවා කියලා ඒ මිනිස්සු වැය වන ගණන් ටික මට කිව්වා. අඩුම ගණනේ රුපියල් 90ක් යනවා, ලංකාවේ වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න. තෙත වී කිලෝවක් දෙන්න පුළුවන් රුපියල් 85ට. රුපියල් 85ට දුන්නාම, ඒ ටික විකුණා ගන්නත් බැහැ. මොකද, අර පොඩි හාල් තමයි ඒගොල්ලන් නිෂ්පාදනය කරලා තිබෙන්නේ. බාස්මතී සහල් වාගේම තමයි.

අපි ගියා, අනුරාධපුරයේ සහ පොළොන්නරුවේ ගොවීන් හමු වෙන්න. නමුත් ඒගොල්ලෝ කියනවා, වී මෝල් හිමියන් ඒ වී ගන්නේ නැහැ කියලා. රහ වුණාට ලොකු මෝල්වලින් ඒවා ගන්නේ නැහැ කිව්වා. එතකොට ඒ අයට වී ටික විකුණා ගන්න බැහැ; තමන්ගේ දරුවාට මොනවා හරි අරගෙන දෙන්නවත් බැහැ. මොකද, කන්න දෙකක වී තවම ඒ අයගේ ගෙවල්වල. ඒගොල්ලෝ කියනවා, "අපි වහ බීලා මැරෙනවා, මහත්තයෝ" කියලා. "අපි වල් නාශක ආයෙත් කුඹුරුවලට යොදන්නේ නැහැ, දරුවන්ටත් බොන්න දීලා අපි ඒක බඩට දමා ගන්නවා" කියලා. ඒ, ඉතාම දුක්ඛිත ජීවිත; අහිංසක මිනිස්සු. ඒ මිනිස්සු දේශපාලනයක් දන්නේ නැහැ. අපි දේශපාලනය පොඩ්ඩක් කියන්න ගියත්, ඒ මිනිසුන් දේශපාලනය ගැන කථා කරන්න දන්නේ නැහැ. හරිම අහිංසක මිනිස්සු ඒ ගම්වල ඉන්නේ. ඒ මිනිසුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. මම මේක ඔබතුමන්ලාට පහරක් ගහන්න කියනවා නොවෙයි. මේකට මොනවා හරි පිළියමක් යොදන්න. මොකද, ලාභ ලබා ගන්න බැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දවසක් කාරණයක් කිව්වා. මමත් ඒක විශ්වාස කරනවා. මේ අක්කර දෙකේ, අක්කර දෙකහමාරේ පොඩි කුඹුරු කැලිවලින් අපට චීනයේ තිබෙන නිෂ්පාදනය ගන්න බැහැ කියලා කිව්වා. අක්කර 100, 200, 300 ආදි වශයෙන් corporate system එකක් කවදා හරි ගෙනෙන්න ඕනෑ. එවැන්නක් ගෙනෙන්න ඕනෑ බව ඇත්ත. හැබැයි, ඒ මිනිසුන්ගෙන් ලාභ ලබා ගන්න බැහැ. රටෙන් සියයට 20ක ජනතාවක් කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙනවා. ඒ මිනිසුන්ගෙන් ලාභ ලබා ගන්න බැහැ. ඒ අපේ ජීවනාලිය. ඒ කාලයේ ඉඳලාම අපි ජීවත් වෙන්නේ ඒ මිනිස්සු නිසා. ඒ කාලයේ ඔය කොම්පියුටර් අනම්මනම් බයිලා තිබුණේ නැහැ නේ. ශ්‍රී වික්‍රම රාජසිංහ, පරාක්‍රමබාහු ආදි වශයෙන් අපේ රටේ රජවරු ගොවිතැනෙන් නේ අපේ රට ස්වයංපෝෂිත කළේ. ඒක නිසා තමයි "රජ්ජුරුවෝ" කියලා කිව්වේ. නමුත් දැන් ගොවියා "කසිප්පුකාරයා" කරලා. ඔබතුමන්ලා බලය ලබා ගන්නාට පස්සේ හැම මනුස්සයාටම ගහනවා නේ. ඔබතුමන්ලාට දැන් ඒ ඔක්කෝගේම දුක අමතකයි නේ. ඔබතුමන්ලාට උපාධිධාරින් අමතකයි; ඒ වාගේම pensionersලා අමතකයි. ඔබතුමන්ලා දොස්තරලාටත් පහර ගහනවා; ඔක්කෝටම පහර ගහනවා. ඔබතුමන්ලා මේ නීතිය තදබල කරලා, ඒකට අදාළව විතරක් මුදල් වෙන් කරලා තිබෙන්නේ, ඊළඟට එන උද්ඝෝෂණවලට අම්බානකට නෙළන්නයි. ඒ ගැන හොඳට බලන්න. හොයලා බැලුවාම පෙනෙනවා, තිබෙන සල්ලි ටික ඔක්කෝම ඔබතුමන්ලා පොලීසියට, CID එකට, නීතිපති දෙපාර්තමේන්තුවට තමයි වෙන් කර තිබෙන්නේ කියලා. ඒ, ඊළඟට එන උද්ඝෝෂණයට නෙළන්න. එහෙම කරන්න එපා. මේ රටේ දුප්පත් ජනතාව ගැනත් ඔබතුමන්ලාගේ අවධානය පොඩ්ඩක් යොමු කරන්න කියා මම ඉතාම බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඒ ගොවීන්ට හොඳ මිලක් සහිත වී වගා කරන්න අවශ්‍ය බීජ නැහැ. මම අර කලින් කියපු බීජ වර්ග මොකවත් අද නැහැ. අද එක බීජ වර්ගයයි දෙකයි එන්නේ. ඒවා වගා කළාම අඩු ගණනේ ඒගොල්ලන්ට රුපියල් 85ටවත් ඒ වී කිලෝවක් විකුණා ගන්න බැහැ කියන්නේ, ඒක ඔබතුමන්ලාගේ අපේ සියලුදෙනාගේම ප්‍රශ්නයක්. අපි බලයට ආවත් ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න අපට සිදු වෙනවා. එතකොට අපි කරන්න ඕනෑ, ඒ මනුස්සයාව ජීවත් කරවීමයි. ඒ අයගෙන් අපට ලාභ ලබා ගන්න බැහැ. එහෙම නම්, ඒ අය ජීවත් කරවන්න වී කිලෝවකට රුපියල් 110ක්, 120ක් වාගේ මිලක් දෙන ක්‍රමයක් හදන්න, පිටරටින් හාල් ගෙන්වන්නේ නැතුව. ඔබතුමන්ලාට වුණේ මොකක්ද? ඔබතුමන්ලා හාල් ගෙන්වන ක්‍රමය දන්නේත් නැහැ නේ. අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මෙතැන අනම්මනම් කයිය ගැහුවාට හාල් ගෙන්වන්න දන්නේ නැහැ. වෙන ඒවා නම් දන්නවා. හාල් ගෙන්වන්න දන්නේ නැහැ. ඉතින් එක පාරට ටෙන්ඩර් කීපයක්ම දැම්මා. ඒවා miss වුණා. ඒ නිසා කලින්ම ගෙන්වා තියා ගත්තා. කලින්ම ගෙනාවාට පස්සේ මොකද වෙන්නේ. මිනිස්සු ඒ හාල ගන්න කැමැතියි. ඒ හාලට කියන්නේ "පොන්නි සම්බා" කියලා. පොන්නි සම්බාවලට තමයි මිනිස්සු ආසා. අර පොඩි හාලට මිනිස්සු කැමැති නැහැ. එතකොට ඒගොල්ලන් කියනවා, "අපට ඒ වී විකුණා ගන්න බැහැ, සර්. අපි අරගෙන ගියාම ඒවා හරවලා එවනවා" කියලා. එතකොට දැන් කන්න දෙකක වී ඒ ගෙවල්වල තිබෙනවා. අඩුම ගණනේ ඔබතුමන්ලා ඒවා බාස්මතී වාගේ පැකට් කරලා හෝ මොකක් හරි system එකක් හදලා ඒ ටික මිල දී ගන්න වැඩ පිළිවෙළක් හදන්න, ඔය අනම්මනම් නොකර. එතකොට ඒ මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් වෙනවා නේ; ඊළඟ කන්නය වගා කරන්න පුළුවන් ආදායමක් එනවා නේ. අපිත් උදව් කරන්නම්, ඕනෑ නම්. නමුත්, ඔබතුමන්ලා අපට කැමැති නැහැ කියලා අපි දන්නවා. හැබැයි, අපට හැකියාවක් තිබෙනවා. ඔය කාරක සභා ආදි හැම තැනකටම ගිහිල්ලා අපි උදව් කරනවා. අපි කකුලෙන් අදින්නේ නැහැ. අප ඒ හැම තැනකටම ගිහිල්ලා දෙන්නේ ධනාත්මක අදහස්. මොකද, අපි ආණ්ඩුවක් ගන්න කොට මේ රටට කෙළවිලා තිබිලා හරියන්නේ නැහැ නේ. ඒ මිනිස්සු නැති වෙලා, ඒ මිනිසුන්ට ගොවිතැන් කරන්න බැරි වෙලා, බෙල්ල වැල දමා ගත්තාට පස්සේ අපට ආයෙත් රටක් කරන්න මිනිස්සු ඉතුරු වෙන්නේ නැහැ නේ. ඒ නිසා අපි සාකච්ඡා කරමු, ඒ කන්න දෙකේ වී ටික මිල දී ගන්නේ කොහොමද කියලා. ඇත්තටම ඒ හාල් රහයි. බාස්මතී වාගේ ඒ හාල් රහයි කියලා කියනවා. හැබැයි, ලොකු මෝල්වලින් ඒවා ගන්නේ නැහැ.

ඊළඟට විශේෂයෙන් මත්ස්‍ය කර්මාන්තය ගැනත් කිව්වා. මත්ස්‍ය කර්මාන්තය ගැන කියන කොට නම් අපටත් හිනා යනවා. නියෝජ්‍ය ඇමතිතුමා, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 60ක් අඩු වෙලා තිබෙනවා; කරදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 10ක් අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා app එකක් හදනවා කිව්වා. ඔබතුමන්ලා app එකක් හදලා තිබෙනවා කියලා අපට ආරංචියි. හැබැයි, app එක දීලා තිබෙන්නේ මාළුන්ට. දැන් මාළු දන්නවා, දැල දමන්නේ කොහේටද කියලා. දැන් මාළු දන්නවා, බෝට්ටුව එන්නේ කොහේටද කියලා. එතකොට ඒ app එක පාවිච්චි කරගෙන, අපේ මාළු අල්ලන මිනිස්සු ටික avoid කරගෙන ඒ මාළු ටික බේරිලා යනවා. අපි මේ ගැන විහිළුවෙන් හරි කියන්න ඕනෑ. මොකද, ජනාධිපතිතුමා කිව්වා, හුළඟ හමන දිශාව, උෂ්ණත්වය අනුව මාළු ඉන්න තැන හොයාගෙන, කියපු ගමන් ගිහිල්ලා අල්ලන්න පුළුවන් කියලා. ඔබතුමන්ලා අර ට්‍රැක්ටරයෙන් විශාල මාළු දැල් අදින එකත් නැවැත්තුවා නේ. දැන් මාළු දැල් අදින්න මිනිස්සු නැහැ. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා. ගිහිල්ලා බලන්න, මාළු දැල් අදින්න අද කවුද එන්නේ කියලා. මමත් දවසක් මුහුදු ළඟ දැල් අදින තැනක හිටියා. දැල් ඇදලා ඇදලා අවසානයේ මාළු කිලෝ 10ක්, 15ක් වාගේ ප්‍රමාණයක් ආවා. මොකද, ට්‍රෝලර් යාත්‍රාවලින් ලෝකය වටේම ඇවිල්ලා මාළු අල්ලනවා.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

තමුන්නාන්සේලා app එකක් හදලා- *[බාධා කිරීමක්]* නියෝජ්‍ය ඇමතිතුමාටත් හිනා; අපටත් හිනා. අඩුම ගණනේ ට්‍රෝලර් යාත්‍රා 200ක් 300ක්වත් අරගෙන මුහුදට දැම්මොත් ඔය වගේ app එකක් හදලා අපට මාළු අල්ලන්න පුළුවන්. ඔබතුමා දැක්කාද, Norway, Finland වගේ රටවල මාළු අල්ලන විධිය? ඒ අය අල්ලන්නේ එක මාළු ජාතියයි. අපි වාගේ ඔක්කොම මාළු ජාති අල්ලාගෙන යන්නේ නැහැ. ට්‍රෝලර් එකක් යනවා; bluefin නම් bluefin, yellowfin නම් yellowfin අල්ලනවා. ඒකත් ක්‍රමානුකූලවයි වෙන්නේ. අපි ඔබතුමන්ලාට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි, මේ. ඉදිරියේදී අප බලයට ආවාම අපිත් මේ කියන ඒවා අනිවාර්යයෙන් කරන්න ඕනෑ. මම යෝජනා කරනවා, අඩුම ගාණේ ට්‍රෝලර් යාත්‍රා 200ක් 300ක්වත් co-operative ක්‍රමයකට දෙන්න කටයුතු කරන්න කියලා. ඒ ධීවරයන්ට දැන් ලාම්පුතෙලුත් නැහැ; ඒ ඔරුවල යන්නත් බැහැ. මොකද, ඒවායෙන් වැටෙනවා; මැරෙනවා. ඒ හින්දා ට්‍රෝලර් යාත්‍රා 200ක් 300ක් co-operative ක්‍රමයකට දීලා මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කරන්න කියන්න. පවුල් 40කට විතර දෙනවා, එක ට්‍රෝලර් යාත්‍රාවක්. ඒ අය ඒක සුද්ද කරන්න ඕනෑ, ඒකේ වැඩ කරන්න ඕනෑ. ඒ අයට share එකක් හම්බ වෙනවා. ඒ ක්‍රමය අනුගමනය කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම, SMEs ගැන කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, SMEs ඉවරෙටම ඉවරයි. SMEs සියයට 40ක් ගෙවලා නැහැ තමන්ගේ පොළී වාරිකයයි, ණය වාරිකයයි. Forty per cent of businesses. - *[Interruption.]* I will give you the statistics. I will give you the source and we will discuss. This is not a hint at you. Yesterday, we also met them. It may be 38 per cent. ගෙවලා නැහැ. මම ඒ තොරතුරු දෙන්නම්. මම ඔබතුමාට ඕනෑම අභියෝගයක් කරනවා- *[බාධා කිරීමක්]* සියයට 38ක් ගෙවලා නැහැ තමන්ගේ පොළී සහ ණය වාරික. ගෙවන්නේ නැත්තේ ඇයි? මේ ආර්ථිකය තුළ නිෂ්පාදනයක් නැහැ. ඔබතුමන්ලා යටිතල පහසුකම්වලට සල්ලි දැම්මේ නැති වුණාම, සල්ලි එන්නේ නැහැ ආර්ථිකයට. බිලියන 1,300න් බිලියන 500යි ආයෝජනවලට - ප්‍රාග්ධන ආයෝජනවලට - වියදම් කරන්න දීලා තිබෙන්නේ. පාරවල් හදන කොට, බෝක්කු හදන කොට, ඇළ වේලි හදන කොට ඒ ප්‍රාග්ධන මුදල් ටික ගලා ගෙන එනවා සමාජයට. එතකොට ඒ බිස්නස්කාරයන්ට ආදායම් එනවා. නමුත් දැන් බිස්නස්කාරයන්ට සල්ලි නැහැ. ගිහිල්ලා බැංකුවලින් අහන්න. ණය දෙන්නද කියලා අසමින් බැංකු ඔවුන් හොයා ගෙන යනවා. ඒ කිව්වේ, ලොකු ලොකු අය ගැනයි; පොඩි අය ගැන නොවෙයි. මම ඕනෑ ඔට්ටුවක් අල්ලනවා, ඒ සියයට 40ක ප්‍රමාණය ඊළඟ අවුරුද්ද වෙනකොට සියයට 55, 60 බවට පත් වෙනවා කියලා. මොකද, ගෙවන්න බැරි මනුස්සයාට ගෙවන්න බැහැ, ඇමතිතුමා. ඒ මනුස්සයා ගෙවන්න අකැමැත්තෙන් ගෙවන්නේ නැතිව ඉන්නේ නැහැ. ඒ මනුස්සයා ගොඩක්ම හිර වුණා. මොකද, ඒ ණය පොලියට ආයෙත් පොලිය වැටෙනවා. ඒ පොලියත් වැටෙන කොට ඒ මිනිසුන්ට ගෙවා ගන්න බැරි තත්ත්වයක් එනවා, ඊළඟ අවුරුද්ද වෙනකොට. දැන් ඒගොල්ලන් ඔක්කොම සුන්බුන් එකටම දාලා තිබෙනවා. ඒ, ඔබතුමන්ලාගේ වැරැද්දකින් වෙච්ච දෙයක් නොවෙයි.

කොරෝනා වැනි, කලින් සිදු වුණු ව්‍යසනවලින් විශාල පිරිසක් විනාශ වෙලා ඉන්නවා. ඒගොල්ලන් සම්බන්ධයෙන් පරාටේ නීතිය ඉවත් කර තිබුණා. හැබැයි, ආයෙත් ඒක දැම්මා. එතකොට ඒ තිබෙන පොලීවලට ආයෙත් පොලී වැටෙනවා. බිස්නස් එකක් කරලා බලන්න ඕනෑ. ඒක අපේ කාගේ හරි වැරැද්දක් නොවෙන්න පුළුවන්. සමාජයේ වෙච්ච බෝම්බ පිපිරීම් ආදි ඔක්කොම දේවල් නිසා ඇති වුණු තත්ත්වයක් වෙන්න පුළුවන්. ඒ මොනවා හරි වෙලා ඒ මිනිසුන්ට ඒ ණය ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා නේ. හිතන්නකෝ අවුරුද්දක් තිස්සේ business නැත්නම් කොහොමද පොලී ගෙවන්නේ කියලා. එතකොට විශාල මිනිස්සු ප්‍රමාණයක් අමාරුවේ වැටෙනවා. ඒ අමාරුවේ වැටිලා ඉන්න මිනිසුන්ට අනිවාර්යයෙන් අත දුන්නේ නැත්නම් ඒ ව්‍යාපාර බිඳ වැටෙනවා. ව්‍යාපාර මිලියන 1.3කින් මේ වනකොට ලක්ෂ 5ක් අයින් වෙලා ඉවරයි. ඒ අය ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයටත් කලින් ඉඳන් අයින් වෙලා ගියා; දැනුත් අයින් වෙලා යනවා. දැන් ඒ පිරිසට තවත් ලක්ෂ 2ක් අනිවාර්යයෙන් ඉතා ශීඝ්‍රයෙන් එකතු වෙලා ඇති. ඊළඟ අවුරුද්ද වෙනකොට බිස්නස්කාරයන්ගෙන් ලක්ෂ 4ක්වත් ඉතිරි වෙන්නේ නැහැ. ඔය ලොක්කෝ ලොක්කෝ නම් - හාන්ස්ලා, වාන්ස්ලා, බාන්ස්ලා, හුලංගමුවලා - ජනාධිපතිලා එන එන කෙනාව අල්ලා ගන්නවා. හුලංගමුව අපේත් adviser; ඔයගොල්ලන්ගේත් adviser; මහින්ද රාජපක්ෂගේත් adviser. රනිල් වික්‍රමසිංහ, ෆොන්සේකා එක්කත් set වෙලා හිටියා. ඒ අය වටේ මේ ටික දෙනා තමයි කැරකෙන්නේ. ඔබතුමන්ලා ඒ ගැන හොඳට හොයලා බලන්න. අපි නම් කවදාවත් ගන්නේ නැහැ. ධම්මික පෙරේරාත් adviser. එතුමා පොහොට්ටුවෙන් ජනාධිපති අපේක්ෂක වෙන්නයි හිටියේ. ඔබතුමන්ලා මෙතැනදී පොහොට්ටුවට පලු යන්න ගහනවා; නැති වෙන්න පහර ගහනවා. හැබැයි, පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂක ඔබතුමන්ලාගේ දකුණු අත. ඒ වගේම තමයි John Keells එක. ඔබතුමන්ලා ඉෂාර නානායක්කාරට plug දෙනවා, 'මේකත් ගන්න' කියලා. ඒ වාගේමයි, Akbar Brothers. ඔබතුමන්ලා සුළං බල, සූර්ය බල ව්‍යාපෘති ඔක්කොම දෙන්නේ දුප්පත් එකාට නොවෙයි නේ. ඔබතුමන්ලා ධනවාදයට, පොහොසත් මිනිසුන්ට විරුද්ධ යැයි කියන මාක්ස්වාදී, නැක්සලයිට් පක්ෂයක්. හැබැයි අද ඔබතුමන්ලා ලොකුම ධනවතුන් බවට පත් වෙලා ඉන්නවා. අද ඔබතුමන්ලා දකුණට කපලා තිබෙන කැපිල්ල බලන්න. මා හිතන්නේ ඒ කපපු කැපිල්ලට වාහනයක සුක්කානමක්වත් හදන්න බැහැ. වමට සිග්නල් දාලා දකුණට කැපුවා. ඔබතුමන්ලා වමේත් නොවෙයි නේ; වමේත් කෙළවරේම නේ. ඔබතුමන්ලා වාමාංශික, නැක්සලයිට්, මාක්ස්වාදී ඔක්කෝටම විරුද්ධයි; පිටරට දේවලට විරුද්ධයි; පොහොසත් මිනිසුන්ට විරුද්ධයි; ඉන්දියාවට විරුද්ධයි; බටහිරට විරුද්ධයි; විවෘත ආර්ථිකයට විරුද්ධයි. එහෙම විරුද්ධ වෙලා මේ හරවපු හැරවිල්ල ඔබතුමන්ලාටත් control කර ගන්න බැරිව U-turn එකක් වැදිලායි තිබෙන්නේ. දැන් පසුපසට යනවා යැවිල්ලක්, හොයාගන්නත් බැරි වෙන්න.

බලශක්තිය සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. ඔබතුමන්ලාට අදානි ගේන්න තිබුණා නේ. ඔබතුමන්ලා මට හොයලා දෙන්න, මෙගාවොට් 500ක්, ගිගාවොට් 1ක් නිපදවිය හැකි, එහෙමත් නැත්නම් ඩොලර් මිලියන 200ක් දීලා transmission line එකක් හදලා අවුරුදු 10කට පසුව අපට භාර දිය හැකි ආයෝජකයෙක්. මම ඔට්ටුවක් අල්ලනවා. එහෙම හැකියාව තිබෙන ඉන්දියාවේ ඉන්න ඒ බලවත්ම පුද්ගලයා මේ රටට ආවා නම් ඉන්දියාවෙන් තව කර්මාන්ත කීයක් අපේ රටට එයිද? අදානි කිව්වා, "I am willing to invest US Dollars 2 billion in Sri Lanka. If you could find any investor willing to offer a unit of wind power below US cents 8.3, you tell me, you call me and I will bring the price down. We had discussions and bargained with the Government so many times and arrived at this price, and this price is not profitable for us." ඒගොල්ලන්ට ඒකෙන් ලාභයක් ගන්න බැහැ. හැබැයි, ඒගොල්ලන් ඒකට එකඟ වුණා. නමුත්, හොඳම ආයෝජකයෙක් ගෙනාවා නම් අද රටට ඩොලර් බිලියන දෙකක් වටිනා සම්ප්‍රේෂණ මාර්ගයක් තිබෙනවා. එහෙම නම් මෙහේ මිනිස්සු අද දුක් විඳින්නේ නැහැ. අද ආයෝජනවලට සල්ලි ටික ගලාගෙන එනවා. එහෙම නම් ආයෝජන ඇවිල්ලා ආර්ථික සංවර්ධන වේගය වැඩි වෙලා. දැන් ඒ ආර්ථික වර්ධනය නැහැ,

ඇමතිතුමා. රනිල් වික්‍රමසිංහ මහතා පාලනය භාර දෙනකොට ආර්ථික වර්ධන වේගය සියයට 5.5යි. ඔබතුමන්ලා ආවාම එය සියයට 4.5ට අඩු වුණා. අන්තිමට මේ අවුරුද්දේ සියයට 4 දක්වා අඩු වුණා. ඊළඟ අවුරුද්ද වනකොට ආර්ථික වර්ධන වේගය සියයට 3.5ට, සියයට 3.1ට අඩු වන බව ලෝක බැංකුව කියනවා. අපි නොවෙයි කියන්නේ. මේ reverse එකට යන යෑම, මේ පහළට යෑම, යන්න ඕනෑ ඉහළට. අඩුම ගණනේ සියයට 7.8ක, 8.2ක ආර්ථික වර්ධන වේගයක් තිබෙන්න ඕනෑ. මොකද, we are coming from below; we are coming from the bottom, from the dungeons. So, you have to go up, not down.

අපි ජපානයෙන් ඉල්ලන්නේ නැහැ, සියයට 3ක ආර්ථික වර්ධන වේගයක්. ඇමෙරිකාවෙන් ඉල්ලන්නේ නැහැ. ඒවා දියුණු වුණු රටවල්, ඒවාට බැහැ. හැබැයි, පහළ මට්ටමක සිටින රටකට අනිවාර්යයෙන් ඉහළට යන්න පුළුවන්. ඔබතුමන්ලාට මතක ඇති ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ ආර්ථික වර්ධන වේගය සියයට 8.2යි. 1994 වනතුරු එහෙමයි. 1994න් පස්සේ වාමාංශික බයිලා ආණ්ඩු ඇවිල්ලා, මාසයකට, දෙකකට, තුනකට ඇවිල්ලා කළා නේ. සියයට ඍණ 1.5යි. 2001දී සියයට ඍණ 1.5ක තිබුණු ආර්ථික වර්ධන වේගය අපේ කාලයේ ධන අගයකට ගෙනාවා; සියයට 6.8ට අරගෙන ආවා. අන්න එහෙමයි කළේ. ඒ කරපු ඒවා ගැන ඔබතුමන්ලා හොඳ කියන්න. මහවැලිය, ඇහලුම් කර්මාන්ත නැත්නම් ඔබතුමන්ලා අද "ෆ්ලැට්." මහවැලියෙන් සියයට 50ක් විදුලි බලය ආවේ නැත්නම් ඔබතුමන්ලා අද කොහොමද බලශක්ති අර්බුදයට විසඳුම් හොයන්නේ? එහෙම නම් ගල් අහුරු ගෙනැල්ලා කෙළවිලා. දැන් නැව් 19ක් ගෙනැල්ලා ඒ ගල් අහුරු ගිලිලා! අපට එහෙම නම් "සදා සොත්ථි භවන්තු තේ" තමයි වෙන්නේ. එම නිසා ඒ කාලයේ එවැනි ව්‍යාපෘති කරපු අපේ නායකයන්ට අගයක් දෙන්න, ඇමතිතුමා.

ඒ වාගේම education ක්ෂේත්‍රය ගැනත් කියන්න ඕනෑ. අගමැතිතුමිය, my Friend. I like her. She, at least, has decency. A couple of you, at least, have decency. I will tell you that. ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමිය කිව්වා අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරනවා කියලා. එතුමිය මුළු රට වටේම පෙළපාළි ගියා. ඒ කාලයේ genuinely ඒ වැඩේ කළේ, මම දන්නවා. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන්න ඕනෑ කියලා කිව්වේ නැද්ද? ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා. ඔබතුමා බොරු කියන්නේ නැහැ නේ. බොරු කීම හරාම්. ඒ නිසා නිකම්වත් ඔබතුමා බොරුවකට ඔළුව හොල්ලන්න එපා. ආගමෙන් දෙනවා දඬුවම. ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා, අපේ යාළුවා. එතුමා අහගෙන ඉන්නවා. එතුමා දන්නවා ඒක ඇත්ත කියලා. හැබැයි, අධ්‍යාපනයට කීයද වෙන් කරලා තිබෙන්නේ? සියයට 1.92යි නේ. ගිය අවුරුද්දේ සියයට 1.96යි. අධ්‍යාපන විෂය භාර ඇමතිතුමිය අගමැතිතුමිය වෙලාත්, එතුමියට වෙන් කර ගන්න බැහැ නේ. නියෝජ්‍ය ඇමතිතුමනි, එතුමියට මේ දවස්වල පොඩි ෂොට් එකක් දෙනවා නේද? අපේ ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාත් දන්නවා, අගමැතිතුමිය විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව පොඩ්ඩක් upset එකේ හිටියේ; she was against it.. ඔබතුමාත් බොක්කෙන්ද කියා මම දන්නේ නැහැ. Answer එකක් ඕනෑ නැහැ. මම දැක්කා, එක අවස්ථාවක ජනාධිපතිතුමා එතුමියට අත දුන්නේත් නැහැ. Morally, you must stand for what you believe. අපි ඒක අගය කරනවා. ඒ කාලයේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමන්ලා, අපි අපේ පක්ෂය තුළ වරදක් තිබෙනවා නම්, ඊට විරුද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ සියයට 1.96ක් අධ්‍යාපනයට වෙන් කරලා, මෙවර සියයට 1.92ට අඩු කරලා තිබෙනවා. එතුමියට වෙන් කර ගන්නත් බැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රුපියල් 50,000ක මාසික ආදායමක් ලබන පවුලක් පාසල් යන ළමයින්ගේ school vansවලට ගෙව්වාම කොහොමද ඉතුරු වියදම් ටික කර ගන්නේ කියලා අහන්නකෝ. අර මන්ත්‍රීවරු තුන්දෙනාගෙන් අහන්නකෝ. මම බොරු කියනවා නම් ඔබතුමන්ලා පුළුවන් නැගිටලා කියන්න. එක්කෙනෙක් නැගිටින්නේ නැහැ, ඔක්කොම දන්නවා මම ඇත්ත කියන්නේ කියලා. මම අහලා බැලුවා. ලජ්ජාවේ කියන්න බැහැ කියලා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜூன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, විශේෂයෙන්ම Gen Z ගැන කථා කළා. තරුණයන්ට මොනවාද කරන්න පුළුවන් කියලා බලන්නකෝ. දැන් තරුණයන්ගේ තිබෙන ලොකුම දේ තමයි ඉංග්‍රීසි දන්න එක. Mobile phone එකෙන් ඉංග්‍රීසි ඉගෙන ගන්නවා. ඒ නිසා ඒගොල්ලන්ට පොඩි credit එකක් දෙන්න පුළුවන් නම් හොඳයි. අනෙක් එක තමයි- ආ, මට අමතක වුණා, ඔබතුමන්ලා කිව්වා මතකද, මුහුදු මැදින් පාරක් හදනවා කියලා? මාළුන්ට එහාට මෙහාට යන්න බැහැ කියලා මම කිව්වේ. කෝ, ඒ පාර? දැන් මන්ත්‍රීවරු මුහුණට මුහුණ බලනවා. Mount Laviniaවල මුහුදු මැද්දෙන් පාරක් හදනවා කිව්වා. මම කිව්වා, ඒ පාර හැදුවාට පස්සේ මාළුන්ට දෙපැත්තට මාරු වෙන්න බැහැ කියලා. මාළු උද්ඝෝෂණය කරලා හරි ඒක නවත්වලා තිබෙනවා. දැන් මෙවර ඒ පාර ගැන කථාවක් නැහැ. ඔහොම තමයි අනෙක් ඔක්කොම.

මේ අය වැයේදී කියනවා, බලශක්ති ක්ෂේත්‍රය වෙනුවෙන් මේක ගේනවා, අරක ගේනවා කියලා. දැන් අර flying passenger drone එකක් ගෙනාවා නේ. දැන් ඒක ලංකාවේ නිෂ්පාදනය කරනවා කියලා ඊළඟ අවුරුද්දේ බොරුවක් කියයි. ඇමතිතුමාව අගය කරනවා, භය නැතුව ඒකට නැග්ගා. මම නම් ඒකට නගින්නේ නැහැ. ගරු හර්ෂණ ඇමතිතුමනි, අපි ඇත්තටම එතුමාව අගය කරනවා, එතුමා ඒකේ නැගලා ගියපු එකට. I was wondering how he had the guts to get in to it for the first time. ඒක අගය කරනවා, ඒකට ඇමතිතුමාට salute එකක් ගහනවා. අලුත් බලශක්ති ඇමතිතුමා ගියේ. හිටපු ඇමතිතුමා නම් යන්නේ නැහැ, කෙළින්ම crash කරනවා එහෙම නම්. ගරු ඇමතිතුමා ගිහිල්ලා try කළ එක නම් අගය කරනවා. මම දැක්කා, දකුණු ආසියාවේ පළමුවැනි වතාවටයි එහෙම එකක් කළේ කියලා කියනවා. හොඳයි, if you could actually manufacture that in Sri Lanka, it would be great. We will also give our fullest support.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, මම අවසාන කාරණය වශයෙන් අධිකරණය ගැන කථා කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කරන මර්දනය නවත්වන්න. ඔබතුමන්ලා බොරු කියන්නේ. ගල් අහුරු වංචාව කියන්නේ, කෙළින්ම හිරේ දාන්න පුළුවන් කාරණා නේ. ගල් අහුරු, NDB, එයාර් ලංකා ගනුදෙනුව හා කන්ටේනර් ප්‍රශ්නය කියන්නේ හිරේ දාන්න පුළුවන් කාරණා. ඒ කන්ටේනර්වල තිබුණා කෝටි ගණනක කුඩු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වුණු කාලය අවසානයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව මිනිත්තු 3ක් ලබා දෙන්න.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
සජබයේ මහ ලේකම්තුමනි, හිතන්නකෝ කන්ටේනර් 300ම අහු වුණා නම් කොහොමද කියලා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
රටේ කුඩු අඩු වෙලා නැහැ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Red label ගහලා තියෙද්දි නේ කන්ටේනර් ටික නිදහස් කළේ. හිරේ නේ ඉන්න ඕනෑ. පොඩි ලියුමක් නැහැ කියලා,- *[බාධා කිරීමක්]* මම දන්නවා, ඔබතුමා සාධාරණයි කියලා ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි. ඒකයි මම ඔබතුමා එක්ක ගනුදෙනු කරන්නේ. You may remember that we were fighting in the Law College canteen. We used to talk about how to make this country a better place. I was genuine; you were also genuine during that time. We are still genuine.

නාමල් රාජපක්ෂ එක්ක දේශපාලන වශයෙන් මගේ විරුද්ධකම් තිබෙනවා. හැබැයි, he is now a Colleague of mine. Because he is a politician, he is in jail. එතුමාව අතුළේ තියාගෙන මොකක්ද කරන්නේ? සුශීෂ්වර බණ්ඩාර ආණ්ඩුවට විරුද්ධව කථා කළා, ජනාධිපතිතුමාට විරුද්ධව කථා කළා. දැන් ඇතුළේ; ඇප දෙන්නේ නැහැ. අනෙක් අයට bail. Bail is the norm, ගරු ඇමතිතුමා. ඒවාට සාක්ෂිකාරයෝ ඉන්නවාද? පිට රට ඉන්න පිස්සෙක් කියන කථා නේ. Challenge කළා නේ, මමත් වැරදිලා. I have blasted him so many times, and he challenged, "මගේ උපාධියේ වරදක් තිබෙනවා නම්, පුළුවන් නම් පෙන්වන්න, කිව්වා. He challenged, so I cannot blame him for the same thing again. මොකක්ද මේ? දවස් කීයක්ද හිරේ? එදා විපක්ෂයේ ඉන්නකොට අනුර කුමාරලා අපි සටන් කළේ ඕවාට. මට අනුර කුමාර මහත්තයත් එක්ක තරහා ඒකයි. මම අනුර කුමාර මහත්තයාගේ මුහුණ දිහා බලන්නෙත් නැහැ, මට ලජ්ජයි. මගේ හිත ඇතුළේ තරහක් තිබෙනවා. අපි ඒ කාලයේ canteen එකේ වාඩි වෙලා රාජපක්ෂලා කරන පිස්සු වැඩ ගැන කථා කළා, "මේ කරන්නේ මොන බලු වැඩක්ද?" කියලා. අපි ඒ කාලයේ බැසිල් රාජපක්ෂලාට විරුද්ධයි, දැනුත් විරුද්ධයි. ඔබතුමන්ලා ඒ කාලයේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නේ. දැන් ඔබතුමන්ලා එක්ක අපි කථා කරනවා නේ. අපි කථා නොකර ඉන්නේ නැහැ. ඔබතුමන්ලා අපේ මුතුන් මිත්තන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඇති. ඔබතුමන්ලා අපේ නෑයෝ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඇති ඒ කාලයේ නිවන්න කිව්වාම ලයිට් එකක් දැම්මා කියලාත්. එහෙමයි කියලා අපි ඔබතුමන්ලා එක්ක කථා නොකර ඉන්නේ නැහැ. 159ම එක්කම මම කථා කරනවා. ඒවා මතක් කර කර අපට කථා නොකර ඉන්න පුළුවන්ද?

මට නාමල් රාජපක්ෂ එක්ක ප්‍රතිපත්තිමය ගැටලුවක් තිබෙනවා. නමුත්, මට දේශපාලනය කරන්න ගැටලුවක් නැහැ. එතුමාට විරුද්ධව මම කථා කළා. එතුමා මට විරුද්ධව කථා කළා. ඔබතුමන්ලා එක්කත් එහෙමයි. තව අවුරුද්දක් විතර යනකොට අනුර කුමාරලා, බිමල්ලා විපක්ෂයේ ඉන්න පුළුවන්. එතකොටත් අපි කථා කරලා එකට සටන් කරයි. අපි මර්දනයට විරුද්ධව හැම කෙනාත් එක්කම එකතු වෙනවා. "එක්ව සටන් කරමු - වෙන්ව ගමන් කරමු". අපට දේශපාලනය කරන්න ඕනෑ නැහැ, එකට. හැබැයි, මේ හිරේ දාන දැම්ම්ල්ලට බිස්නස්කාරයෝ භයයි. හිනා වෙන්න එපා මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාට මේවායේ return එක එනවා. මේ හදන නීති ඔක්කෝම වැරදියි. පොලිස් නිලධාරියෙකුට කෙනෙක්ව අවුරුදු දෙකක් හිරේ දාන්න පුළුවන්, තරහ නම්. මේවා විහිළු නොවෙයි. රාජපක්ෂලාත් පිස්සු කෙළියේ ඔහොමයි. හිතනවා, හරි ජොලි කියලා. හරි සොම් කියලා හිතනවා ඇති. නීති හදලා, CID එක අතට අරගෙන, Bribery Commission එක අතට අරගෙන ඕනෑ, ඕනෑ කෙනාව හිරේ දානවා. කථා කළොත් හිරේ දානවා; වැඩියෙන් කථා කළොත් හිරේ දානවා. කථා කළ හැම කෙනාම හිරේ දැම්මා. Bail දෙන්න ඕනෑ නේ. That is the norm. ඇයි bail නොදෙන්නේ, පිට රට යයි කියලාද? Passport එක තහනම් කළාම රටේ ඉන්නවා නේ. නාමල් සාක්ෂිකාරයන් කාටවත් තර්ජනය කළා කියලා චෝදනා තිබෙනවාද? නැහැ. එක පුද්ගලයෙකුටවත් තර්ජනය කළා කියලා කොහේවත් චෝදනා නැහැ. Then, on the first day, you must give bail. That is the norm. දඬුවම දීලා ඉවර වුණාට පස්සේ ආයේ මොකටද නඩු අහන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමන්ලාත් හිරේ ගිහිල්ලා බලන්න දවස් 7ක්, අවුරුද්දක්. වැරදි පුද්ගලයෙක් ආවොත් ඔබතුමන්ලාගේ සෑහෙන ප්‍රමාණයක්, ඉස්සරහා පේළියේ ඉන්න ඔක්කෝම හිරේ. දැන් හිනා වෙන්න කෝ. ඔහොම තමයි බැසිල් හිනා වුණේ, ඔහොම තමයි ගෝඨා හිනා වුණේ, ඔහොම තමයි චමල් හිනා වුණේ, මට. අද කොහොමද? අද ඔබතුමන්ලා ඒගොල්ලන්ට දෙන ගේම ඒගොල්ලන් දවසක ඔබතුමන්ලාට දෙන්න පුළුවන්. ඒ හින්දා මර්දනය සහ නීති විරෝධී දේවල් කරන්න එපා. අණ පනත් ගෙනැල්ලා රුපියල් 35,000ක් පඩි ගන්න පොලිස් මහත්තයෙකුට බලතල දෙන්න එපා. ඒ මහත්තයාට රුපියල් ලක්ෂ 10ක් දුන්නොත්, බොරු පැමිණිල්ලකට හරි නඩුවක් දාලා ලක්ෂ 10 ගන්නවා. මේවා හොඳයි අයර්ලන්තය, ෆින්ලන්තය වාගේ දියුණු රටවලට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Give me one more minute, Sir.

මම ආණ්ඩුවෙන් ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ මර්දනය නවත්වන්න කියලා. ඔබතුමන්ලාට විරුද්ධව කථා කරන මිනිසුන්ව තමන්ගේ අධිකරණය පාවිච්චි කරලා, අධිකරණය අතකොළුවක් බවට පත් කරගෙන හිරේ දානවා. තීන්දුවක් දුන්නොත්, Order එකක් දුන්නොත් ඒ judgeව අයින් කරනවා; පොලිස්පතිතුමාට දුන්නා තීන්දුවක් අහිංසක මිනිස්සු හිරේ දාන්න එපා කියලා. ගම්පහ judgeව මාරු කළා. Are you laughing about it? ඔබතුමන්ලා ඒක අනුමත කරනවාද? හාජී, අනුමත කරනවාද? You are a God-fearing person. Do you agree with that? You tell me. මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආගම නිසා තමයි ඔබතුමන්ලා බොරු නොකියන්නේ. නැත්නම් බොරු කියනවා. You tell me honestly. ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, රට බංකොලොත් කරන්න එපා, රට සංවර්ධනය කරන්න කියලා. ඔබතුමන්ලාට තව යම් කාලයක් තිබෙනවා. ඒ කාලය තුළ පුළුවන් ධෛර්යය දාලා රට සංවර්ධනය කරන්න. අපි මේ කියන දේවල් වෛරයෙන් ගන්නේ නැතිව සාධනීයව ගන්නා ලෙස ඉල්ලා සිටිමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.50]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තූතියි.

ඇත්තටම පාර්ලිමේන්තුවේ එලෙස බොරු කියන්න පුළුවන් කොහොමද? ඒ කියපු දත්ත ගොඩක් බොරු. විශේෂයෙන් මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු දත්ත. *[බාධා කිරීමක්]* දැන් අපට තිබෙනවා ප්‍රශ්න කිහිපයක්. 2015-2019 කාලය තුළ මේ රට පාලනය කළේ කවුද? 2015-2019 කාලයේ තිබුණු බදු ක්‍රමය මොකක්ද? බදු එකතු කර ගන්න බැරි වුණේ කොහොමද? ආයෝජන ආවේ මිලියන 700කට අඩුවෙන්. 2015-2019 මේ රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ කළේ නැත්තේ ඇයි? ලෝකය එක්ක අපි සම්බන්ධ නොවුණේ ඇයි? ව්‍යුහාත්මක වෙනස්කම් කළේ නැත්තේ ඇයි? විදුලි බලයට ආයෝජනය කළේ නැත්තේ ඇයි? ඔබතුමන්ලාට දැන් වේදනාවක් දැනෙනවා තමයි. ඉතින්, මොකක්ද කරන්නේ? අපට ආණ්ඩු බලය ලැබුණා. අපි ඒවා කරනවා. That is what we are going to do.

Hon. Presiding Member, this entire Budget is about the economic strategy of this country. The Government's role is actually to present the strategies for the next few years, and the Opposition's role is to speak about the policy differences they propose. Now, we have a big problem here. The Opposition cannot bring any policy difference or alternative strategy to the table.

Generally, we were expecting after the presentation of the Budget, that an economic expert from the Opposition would commence the Debate, but this time, the Hon. Leader of the Opposition happened to speak first. He is not in a position to understand economic stabilization and growth or the consistency of the policies of the IMF and the World Bank, but just goes on and on. Unfortunately, not only about policies, but he cannot even distinguish between a kiss and a hug. That is the problem. - *[Interruption]* I cannot give you my time.

If one asks what this Budget is all about, we would say that it is about the industrial policy the Opposition could not implement over the last 30 years. For four decades, there was no industrial policy for the country. So, if you would really look at this entire Budget, it is about the industrial policy.

We had to go through a stabilization process because the country was bankrupt. So, from 2022 to 2026, there has been stabilization process going on. We all know about it and the IMF was part of it. Before we came to power, we said, "We will go ahead with this Agreement" and successfully completed the Agreement. Previous Governments failed to complete the earlier IMF Agreements 16 times. We are the only Government that completed the full cycle of an IMF Agreement, created a precedent and showed how a Government could work alongside development partners and make the country stable. Now, our role is to take this country forward achieving growth, and that is what this Budget is all about

All these years, they ran the economy with twin deficits, a fiscal deficit and a foreign currency Current Account deficit. We have changed that. Now, there is no fiscal deficit or a foreign currency deficit. So, why are you shouting about a fear? The country is not going to fall in any way. Debt sustainability has been achieved; fiscal discipline has been maintained, and that is what we have been doing for the last two years. Now, we are moving on to the phase of growth.

The Opposition has to clearly say their stance on the IMF and the World Bank. You have to, because you are saying two things which nobody could understand. We have always been against those institutions because we have had bad experiences across the world. What we are now saying is that the country is dependent on those organizations because you all had not developed the nation. You had 30 to 40 years to do that. When the country is vulnerable, when the country is weak, you have to seek the support of those institutions. That is the reality, and we are facing that reality. We have come through that as well.

Throughout the entire Budget Speech of the President, he clearly articulated how that growth is going to be achieved. But, the Opposition was not listening to it. I think the people who understand know that in that, we talk about reforms, the reforms that had never happened in this country before.

The rule of law, digitalization, the Public-Private Partnership Bill, the Tariff Policy, the State-Owned

[ගරු චතුරංග අබේසිංහ මහතා]

Commercial Enterprises Management Bill and the Investment Protection Bill were not available to investors all these years. And, we are the only Government which is going to bring in those legislations. We have been doing it this year, and we will continue to do so in the future as well.

Then, infrastructure development. Without infrastructure development, no investment is going to come in. Why should investors come? The infrastructure development the previous Governments did was not useful. The Hambantota Port, the Mattala Rajapaksa International Airport and the highway leading to that area were not priorities at that point of time. Instead, they should have built the Central Expressway. That is where production is happening; Kurunegala and Kandy will be our next industrial areas. So, you all should have done that. Now, we are doing it. We are ensuring that infrastructure is developed. All the ports are being developed, the transportation system is being developed, all the highways are being started and all the airports are going to be developed, including Ratmalana and Palaly Airports and the expansion of the Katunayake Airport. Those are infrastructure requirements for investors to come to this country.

When it comes to market connectivity, you all said that some people were against the FTAs and all that proposed to be brought in. You all did not go into FTAs with feasibility studies and ensuring that the local industries are protected. Now, we have done all that and are ready to enter into FTAs. So, with those, this country will get connected to India, China, the Middle East, Africa and Europe. Therefore, those are the priorities of this Government. And, it is only when we give that direction, investments will start flowing in.

Then, in terms of industrial inputs, you all had not done much. You all had not invested in the energy sector. We are going to invest in energy storage systems; we are going to invest in the petroleum refinery. You had not done any of that. You had not ensured energy security for this country. Who is going to come to a country where energy supply is not secure? In terms of technological transformation, we are 20 years behind. We are now investing Rs. 40 billion in technological transformation. Tell me of an era in which you had invested in technology over the last 20 years.

With regard education reforms, we are 30 to 40 years behind. Where are the skills, the mindset and the capability required to enter into the modern job market? So, that is the change we are making to meet the inputs required for industrial growth.

On the other side, we are bringing in incentivization. We have that opportunity now because the IMF programme is coming to an end. We can provide incentives, prioritizing certain sectors. We are now going to introduce incentives for industries, which extend beyond the Western Province. The previous administrations had not been able to do so. Yes, I agree that garment factories were established in rural areas during the 1980s. But, since then, what has happened? The North has not been developed; the East has not been developed; the Central Province has not been developed. So, we need to give incentives. Now, we are giving a 200 per cent capital allowance for investments. You all keep lying about investments, and also said that the Hirdaramani Group and MAS Holdings are moving their operations out of the country. MAS Holdings was the company where I worked previously. And, it is their global strategy; they are expanding their footprint. They want to reduce the risk of concentrating their operations in one country, and they are expanding into other countries, which is a good thing to do. Maliban Biscuit Manufactories (Private) Limited is moving out, the CBL is also moving out and the Lanka Transformers Limited has moved out of the country. That is a good thing to do. When a country's GDP is concentrated, businesses should expand into other countries. That does not mean they are going to stop their operations here; both companies are growing within Sri Lanka.

If we take the other factors, we talk about foreign direct investments. There are certain fundamentals needed for foreign direct investments to come in. When you were in power, you could not establish a Single Window for Trade. When you were in power, you could not establish a Single Window for investment. We are doing it now. We are the ones who are making those reforms, ensuring that investors have land and industrial zones to invest in and clarity on what they can invest in and what kind of incentives they would get. You never had those things in place. When it comes to investment promotion, beyond the BoI, we are now creating an organization which will promote Sri Lanka. That is a must, a requirement because of the capabilities and requirements needed at this point.

Then, if we look at from a poverty and vulnerability perspective, this is the only Government that is doing a proper programme on poverty alleviation, and for the last two years, it has been happening.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Could I take two more minutes?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට වැඩිපුර විනාඩි දෙකක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay, you get two more minutes, Hon. Deputy Minister.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Thank you very much.

When it comes to poverty alleviation, earlier, poverty was used as a tool for politics. The reason why they did not touch those areas was because they were scared. Now, we are the ones who are reforming and we are not afraid of it. We are explaining to people what poverty means and how we would ensure they are supported and uplifted. Last year, we invested Rs. 25 billion on the Prajashakthi Programme to uplift those communities and in going forward, that is what is going to happen. We are not just throwing money into it. It was their strategy to say that if you are tall, you would get a certain job and if you are short, you would get some other job. Also, if you all wanted to distribute bananas to the people, you put your name on them and distributed. That is what they were doing. That kind of politics is over now. So, we are trying to uplift those people, ensuring that the money we spend goes down to the very roots in improve their lives. That is why we are improving the Sathosa; that is why we are improving the cooperative sector, and that has never happened before.

Then, if you take the SOEs, they allowed the SOEs to die. Today, we are running smoothly because the CPC was saved. Now, they talk about all these loss-making government institutions. It was due to their actions. China runs SOEs properly; South Korea runs SOEs properly; India runs SOEs properly. SOEs have a role to play. SOEs are not looked at only from a balance sheet perspective, but also from an economic perspective, taking into consideration the macroeconomic impact they are making to establish a just society and a reasonably fair market.

And, when it comes to incentivization of industries, see the amount of effort we are putting in. Now, the Ministry of Finance has become our development bank. We had two development banks and you all killed them! You killed both development banks set up for development of these industries. Now, you talk about SMEs; now, you are crying about the SMEs. All the SMEs went bankrupt between 2019 to 2022. We are doing our level best to support and restructure them. In going forward, look at what the SMEs get. Last year, SMEs got Rs. 107 billion worth of capital at a lower interest, and 3,000 of them got credit guarantees. They will never go bankrupt because the Government has guaranteed their loans. That is how we changed the situation. So, now, the Ministry of Finance is our development bank. This year, we are giving Rs. 174 billion worth of low-cost loans for SMEs. Not only for SMEs, but we also give them to different sectors such as tourism, fisheries and the IT sector, which was missing from our growth plans. We are taking those loans to the rural level, to women-headed families and also to people who are giving employment to Aswesuma families. So, that is how we are elevating and directing the economy. Since the Central Bank is independent now, the Ministry of Finance has to carry out development on the fiscal side, and that is also happening.

Also, the policy direction of the Government with regard to facilitating the private sector is very clear and the private sector will thrive. That is the strategy of this Government and we made very clear to the private sector and they are investing heavily. Who says that the private sector is dying? No, the private sector is investing. Last year, the private sector took Rs. 2.1 trillion worth of debt. Where does the money go? It is going in for growth. The Government is already investing Rs. 2 trillion in the economy. That is how growth is going to happen. So, when it comes to these growth factors, now, we have a Rs. 2 trillion capital budget and an incentive promotion including land. The Sri Lanka Expo will be held in 2027, after 15 years with more than 1,000 foreign delegates signing up for it. Also, development financing, labour reforms, tourism growth and digital economic growth will bring this country to its full potential.

Therefore, I invite all of you to look at this Budget holistically and support the economy, which will thrive with a growth of 7 per cent within the next few years. Thank you.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය කථාව 2027,-

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අය වැය කථාව සඳහන් වන, අපට ලබා දීලා තිබෙන මේ සටහන් පොතේ ඇති ගැටලුවක් පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. "අය වැය කථාව - 2027" පොතේ ඇති තාක්ෂණික සටහන්වල සහ ඇමුණුම්වල කිසිම තැනක ගරු ජනාධිපතිතුමා සඳහන් කළ විශ්වවිද්‍යාල 50 සහ වැව් 450 ඉදිකිරීමට අදාළ ප්‍රතිපාදන පිළිබඳව සඳහන් වෙලා නැහැ. ඒක සිදු වුණු දෝෂයක්ද, එහෙම නැත්නම් ඇත්තවශයෙන්ම එවැනි වියදමක් සඳහන් කරලා නැද්ද කියන එක මම දැනගන්න කැමැතියි. මුදල් ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා ඒ සඳහා පිළිතුරු ලබා දිය යුතුව තිබෙනවා. මොකද, අපට දීලා තිබෙන පොතේ තාක්ෂණික සටහන්වල තිබෙන වියදම්වල ඒ ගැන සඳහනක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, අපි ඒ ගැන වෙනම අවධානය යොමු කරමු.
මීළඟට, ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.05]

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்னன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் விவாதிக்கப்படுகின்ற தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் மூன்றாவது வரவு செலவுத்திட்டமானது மிகவும் வரவேற்கத்தக்கது. இன்று கார்த்திகை வீரர்கள் ஞாபகார்த்த நாளாகும். கார்த்திகை வீரர்கள் எதிர்பார்த்த விடயங்களுடன்கூடிய, அவர்கள் கண்ட கனவுகளுடன்கூடிய ஓர் ஆட்சிமுறை இன்று இந்த நாட்டில் உருவாக்கப்பட்டு இருக்கிறது.

இந்த நாட்டை 76 வருட காலமாக 'ஆட்சி' என்ற போர்வையில் நாசமாக்கிய எதிர்க்கட்சியினர் தங்களுடைய கருத்துக்களை மிகவும் நகைச்சுவையாக இந்த உயர் சபையில் முன்வைப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. சற்று நேரத்துக்கு முன்னர் இங்கு பேசிய எதிர்கட்சி உறுப்பினர் ஒருவர், ஆளுங்கட்சிக்கு தனது அறிவுரைகளை வழங்கியது மட்டுமல்லாமல், வேதனைகளையும் கொட்டித் தீர்த்தார். பரமார்த்த குருவுக்கும் அவருடைய சீடர்களுக்கும் இந்த எதிர்க்கட்சி வரையறுக்கப்பட்டு இருக்கின்றது. பரமார்த்த குருவும் அவருடைய சீடர்களும்போல் செயற்படுகின்ற இந்தக் கூட்டு எதிர்க்கட்சியானது, இன்று காலாவதியான நிலைமைக்குத் தள்ளப்பட்டு இருக்கின்றது.

நேற்று இந்தச் சபையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் நிதி அமைச்சர் என்ற அடிப்படையில் இந்த அரசாங்கத்தின் மூன்றாவது வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்தார். அதில் விசேடமாக பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு மீண்டும் உறுதிப்படுத்தப்பட்டு இருப்பது வரலாற்று முக்கியத்துவம் வாய்ந்த ஒரு விடயமாகும். கடந்த காலங்களில் எதிர்க்கட்சியினர் மூலைமுடுக்குகளில் எல்லாம் கூறித் திரிந்தார்கள், தோட்டத் தொழிலாளர்களுக்கு வழங்கப்பட்டு வந்த 200 ரூபாய் ஊக்குவிப்புக் கொடுப்பனவு இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் நீக்கப்படப் போவதாக. ஆனால், நேற்று இந்தச் சபையில் வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்து உரையாற்றிய மாண்புமிகு சனாதிபதி அவர்கள் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வை உறுதிப்படுத்தி இருக்கிறார். அதுமட்டுமல்ல, பெருந்தோட்டத்துறையின் அபிவிருத்தியைக் கருத்திற்கொண்டு, 13,000 மில்லியன் ரூபாயை அரசாங்கம் ஒதுக்கியிருக்கின்றது.

கடந்த 76 வருடங்களாக இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்கள் ஏறெடுத்தும் பார்க்காத மலையக சமூகத்தை, இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஏனைய சமூகங்களுக்குச் சமமான ஒரு சமூகமாக மாற்றியமைப்பதைக் கருத்திற்கொண்டே செயற்படுகின்றது. இந்த நாட்டை வளமான நாடாக மாற்றுவது மட்டுமல்ல, இந்த நாட்டில் வாழும் ஏனைய சமூகத்தினருக்குச் சமமாக மலையகத்தில் வாழுகின்ற பெருந்தோட்டத் தொழிலாளர்களின் வாழ்வியலை வளமாக்குவதற்கான முன்மொழிவுகளும் இந்த வரவு செலவுதிட்டத்தில் முன்மொழியப்பட்டு இருக்கின்றன. எனவே, இந்த வரவு செலவுத்திட்டமானது, விசேடமாக மலையக சமூகத்துக்குக் கிடைத்திருக்கின்ற ஒரு வரப்பிரசாதமாகும். இந்த வரவு செலவுத்திட்டமானது, அதிகூடிய வாக்குகளால் நிறைவேற்றப்படும் என்பதை நான் இந்தச் சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இங்கு பேசிய எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கூறினார், "தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கு இரண்டு வருட காலத்தில் 20 மீற்றர் நீளமுடைய ரயில் பாதையைக்கூட அமைக்க முடியாமல் போனது" என்று. இந்த நாட்டை 76 வருட காலமாக மாறி மாறி ஆட்சி செய்த ஆட்சியாளர்களால், வெள்ளையர்களால் அமைக்கப்பட்ட ரயில் பாதைக்கு மேலதிகமாக அமைக்க முடியாமல் போனதையிட்டு அவர்கள் வெட்கித் தலைகுனிய வேண்டும். வரவு செலவுத்திட்ட உரையானது மிகவும் புத்திசாதுரியமான தாக இருக்க வேண்டும். பரமார்த்த குருவின் சீடர்கள்போல் இன்று எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் வரவு செலவுதிட்டம் மீதான விவாதத்தில் கலந்துகொண்டு தங்களுடைய கருத்துக்களை முன்வைக்கிறார்கள். ஏன் இன்று எதிர்க்கட்சியினர் இந்த நிலைக்குத் தள்ளப்பட்டு இருக்கிறார்கள்? இந்த வரவு செலவுத்திட்டத்தை விமர்சிப்பதற்கு அவர்களுக்கு ஒன்றுமில்லை. அதனால் எங்கேயோ மூலையில் ஏதோ ஒன்றைப் பிடித்துக்கொண்டு, "எங்களாலும் செய்ய முடியாமல் போனது; நீங்களும் செய்யவில்லை" என்று கவலையுடன் வரவு செலவுத்திட்டம் தொடர்பில் உரையாற்றிச் சென்றதை நாங்கள் காணக் கூடியதாக இருந்தது.

எதிர்க்கட்சித் தலைவர் கூறினார், "இந்த வரவு செலவுத்திட்டம் வெறும் மாயாஜாலம்" என்று. பெருந்தோட்டத் துறையின் அபிவிருத்திக்காக 13,000 மில்லியன் ரூபாய் ஒதுக்கியுள்ளதை எதிர்க்கட்சித் தலைவர் கூர்ந்து கவனிக்கவில்லைபோல் தெரிகின்றது. அதேபோல், தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை உயர்த்துவது தொடர்பான விடயமும் அவருடைய கண்ணில் படவில்லை போலும்; காதுகளுக்கு எட்டவில்லை போலும். இந்த நாட்டில் வாழும் கீழ்மட்ட மக்களின் வாழ்வியலை மேம்படுத்துவதற்காக சில அத்தியாவசியப் பொருட்களின் விலைகளைக் குறைப்பதற்கு ஏதுவான நடவடிக்கைகள் எடுக்கப்பட்டு இருக்கின்றன. இம்முறை வரவு செலவுத்திட்டத்தில், இந்திய அரசாங்கத்தின் நிதி உதவியுடன் மலையக வீடமைப்புத் திட்டத்தை மேலும் மேம்படுத்துவதற்கான வேலைத்திட்டங்களும் முன்மொழியப் பட்டு இருக்கின்றன.

இந்த அரசாங்கத்தின் மூன்றாவது வரவு செலவுத் திட்டமானது, வடக்கு, கிழக்கில் வாழுகின்ற மக்களுக்கு மட்டுமன்றி, மலையகத்தில் வாழுகின்ற மக்களுக்கு மட்டுமன்றி, முழு நாட்டிலும் வாழுகின்ற மக்களின் வாழ்வை வளமாக்குவதற்கான வேலைத்திட்டங்களை உள்ளடக்கி யுள்ளது. இந்த வேலைத்திட்டங்களை எதிர்க்கட்சியினர் சரியாகப் புரிந்துகொள்ளாத நிலைமையில், பரமார்த்த குருவின் கதைகளுக்கு வரையறுக்கப்பட்டு இருப்பது மிகவும் வேதனைக்குரிய விடயமாகும். இச்சபையில் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்ற 2027ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டமானது, இந்த நாட்டிலுள்ள உழைக்கும் வர்க்கத்தினருக்குக் கிடைத்த ஒரு வரப்பிரசாதம் எனக் கூறி, என்னுடைய உரையை முடிக்கின்றேன். நன்றி. வணக்கம்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරණා කිහිපයක් සිංහලෙන් කථා කරලා, ඉන් පස්සේ මාතෘකාවට අදාළව මගේ කථාව පටන් ගන්නවා කියලා මම කල්පනා කළා.

එකක් තමයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හිතාගෙන ඉන්නවා - ඒ ගැන අපි නම් ඒ තරම් හිතන්නේ නැහැ - මේ සභාව ඇතුළේ කෑගහලා, උපරිම බොරු වපුරලා යන්න පුළුවන් කියලා. ගැලරියටත් වූන් එකක් දීලා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, live බලාගෙන ඉන්න ජනතාවටත් වූන් එකක් දීලා, මේ ආණ්ඩුව මෙහෙමයි, මෙහෙමයි කියලා යන්න පුළුවන් කියලා හිතාගෙන ඇවිල්ලා එතුමන්ලා මේ සභාවේ කථා කරනවා. නමුත්, එළියේ සමාජය ගත්තාම ඇත්තටම ජනතාව අපේ ආණ්ඩුව ගැනත්, අපේ ජනාධිපතිතුමා ගැනත්, අපේ වැඩ පිළිවෙළ ගැනත් ඉතාම සතුටින් ඉන්නවා. මිනිස්සු උදේ ඉඳලා හවස් වෙනකල් අපට කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අපේ ජනාධිපතිතුමා පැය හතරකට වඩා කථා කරලා මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව - කඳුකරයේද, උතුරු-නැඟෙනහිරද, අනෙක් හැම පැතිවලම හැම ජනතාවම - ආවරණය කරමින් ලස්සන අය වැය කථාවක්, සහනදායී අය වැයක් ඉදිරිපත් කළා. නමුත් මම දැක්කා, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද උදේ ඉඳලා හවස් වෙනකල් කෙඳිරිගගා, කෙඳිරිගගා එක එක ඒවා කියමින් ජනතාවට වූන් එකක් දීගෙන හිටපු ආකාරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විපක්ෂයේ ඉන්න සියලු දෙනාට මේ කාරණය කියන්න කැමැතියි. අපි 2024දී මේ රට භාරගන්න කොට මේ රට බංකොලොත් රටක්. ඒ බංකොලොත් රට භාර අරගෙන, අපි මේ රටේ ජනතාවට දුන් පොරොන්දුවක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ සිටින සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව; උතුරු-නැඟෙනහිර, දකුණේ, කඳුකරයේ -මලෙයහම්- සියලු ජනතාව එකතු කරගෙන, ඒ ජනතාවට පොහොසත් රටක, ලස්සන ජීවිතයක් ලබා දෙනවා කියන එක. ඒ අනුව, පොහොසත් රටක ලස්සන ජීවිතයක් ලබා දෙන්න තමයි ඊයේ දවසේ අපේ ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ අය වැය කථාව ඉදිරිපත් කළේ. ඒක මම විපක්ෂයට මතක් කරනවා.

කෞරව තලෛමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, 2024ආම් ආණ්ඩු නාංකළ් ඉන්ත නාට්ට෈යුම් මක්කළ෈යුම් පොරුප්පේර්කුම්පෝතු, නාට්ටු මක්කළුක්කුක් කොටුත්ත වාක්කුරුතියොන්රු ඉරුක්කින්රතු. අතුතාන් ඉන්ත නාට්ටිල් පුතිය අරසියල් කලාසාරත්තෛ උරුවාක්කුවෝම් එන්පතු. අතුමාත්තිරමල්ල, කොලෛ, කොළ්ළෛකළ් නිරෛන්ත ඉන්ත නාට්ට෈ අතිලිරුන්තු මීට්ටෙටුත්තු, එතිර්කාලප් පරම්පරෛ යිනරුක්කු අළකානතොරු නාට්ට෈ප් පෙර්රුක් කොටුප්පතාකවුම් නාංකළ් උරුතියළිත්තෝම්. අතන් අටිප්පටෙයිල්තාන්, නේර්රෛය තිනම් නාට්ටින් සනාතිපති මාණ්පුමිකු අනුර කුමාර තිසානායක්ක අවර්කළ් එමතු අරසාංකත්තින් මූන්රාවතු වරවු සෙලවුත්තිට්ටත්තෛ මුන්වෛත්තාර්.

කටන්ත ඉරණ්ටු වරුටංකළිල් පල වේලෛත්තිට්ටංකළ් ඉන්ත නාට්ටිල් සෙය්යප්පට්ටුළ්ළන. තනිත්තනි නපර්කළුක්කු, තනිත්තනි ඉනංකළුක්කු, තනිත්තනිප් පිරිවිනර්කළුක්කු එන්රු ඉල්ලාමල්, නාට්ටිල් වාළුම් අනෙත්තු මක්කළුක්කුම් වළමානතොරු නාට්ටිල් අළකාන වාළ්ක්කෛයෛප් පෙර්රුක් කොටුප්පතුතාන් එමතු අරසාංකත්තින් මුක්කිය නෝක්කමාකුම්. අන්ත නෝක්කත්තෛ අටිප්පටෙයාක වෛත්තුත්තාන් නාංකළ් ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තෛ මුන්වෛත්තුළ්ළෝම්.

අරස තුරෛයිලුළ්ළ අනෙත්තු ඌළියර්කළුම් සරියාන මුරෛයිලුම් සන්තෝෂමාකවුම් පණිපුරින්තාල්තාන්, මක්කළුක්කුච් සිරන්ත සේවෛයෛප් පෙර්රුක්කොටුක්ක මුටියුම්. ඉතනෛක් කරුත්තිර්කොණ්ටු, අරස ඌළියර්කළින් අටිප්පටෛච් සම්පළත්තෛ මූන්රු කට්টංකළිල් උයර්ත්තුවතර්කු පෙරියතොරු තොකෛ ඔතුක්කප්පට්ටතු. අතන් අටිප්පටෛයිල්, 2025ආම් ආණ්ටුක්කාන වරවු සෙලවුත්තිට්ටත්තිල් අවර්කළින් අටිප්පටෛච් සම්පළම් අතිකරික්කප්පට්ටතු. අතේපෝන්රු, 2026ආම් ආණ්ටුක්කාන වරවු සෙලවුත්තිට්ටත්තිලුම් අතිකරික්කප්පට්ටතු. නේර්රෛය තිනම් සමර්ප්පික්කප්පට්ට 2027ආම් ආණ්ටුක්කාන වරවු සෙලවුත්තිට්ටත්තිලුම් අවර්කළින් අටිප්පටෛච් සම්පළම් අතිකරික්කප්පට්ටු ඉරුප්පතෛ නීංකළ් පාර්ත්තිරුප්පීර්කළ්. අතේපෝන්රු, කෂ්ටප් පිරතේසංකළිල් කෂ්ටප්පට්ටු කටමෛපුරිකින්ර සිල තුරෛකළිලුළ්ළ අරස ඌළියර්කළුක්කු අටිප්පටෛච් සම්පළම් තවිර, ඌක්කුවිප්පුක් කොටුප්පනවෛයුම් කොටුප්පතර්කු ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තින්මූලම් මුන්මොළින්තුළ්ළෝම්.

ඉන්ත නාට්ටිලුළ්ළ අනෙත්තුත් තරප්පිනරෛයුම් උළ්වාංකිය ඔරු වරවු සෙලවුත්තිට්ටමාකවේ නාංකළ් ඉතෛප් පාර්ක්කින්රෝම්. කුරිප්පාක, තොළිලාළර්කළ්, පෙණ්කළ්, වයෝතිපර්කළ්, මාණවර්කළ් මර්රුම් සෙන්ර අරසාංකංකළාල් කණක්කිලෙටුක්කාමල් විටප්පට්ටිරුන්ත පලම් කුරෛන්තවර්කළ් එන අනෛවරුක්කුම් සේවෛකළෛයුම් සලුකෛකළෛයුම් පෙර්රුක්කොටුක්කක්කූටිය ඔරු වරවු සෙලවුත්තිට්ටත්තෛත්තාන් ඉන්ත මුරෛ එංකළතු මාණ්පුමිකු සනාතිපති අවර්කළ් මුන්වෛත්තිරුක්කිරාර්.

ඉන්ත විටයංකළෛක් කූරුම්පෝතු සිලරුක්කුත් තෝන්රුම්, මලෛයකත්තිල් පිරන්තු, මලෛයකත්තිල් වළර්න්තු, මලෛයක මක්කළින් වාක්කුකළෛප් පෙර්රු පාරාළුමන්රත්තුක්කු වන්ත නාන්, මලෛයක මක්කළ් තොටර්පාකප් පේසාතු පොතුවාකප් පේසික්කොණ්ටු ඉරුප්පතාක. මලෛයක මක්කළින් සම්පළ අතිකරිප්පෛ නාංකළ් සෙන්ර වරවු සෙලවුත්තිට්ටත්තිල් මේර්කොණ්ටපෝතු සිලර් කූරිනාර්කළ්, 10 රූපායාල්කූට උයර්ත්තික් කොටුක්ක මුටියාතු එන්රු. එනිනුම්, අරසාංකත්තිනතුම් පෙරුන්තෝට්ට නිරුවනංකළිනතුම් ඔත්තුළෛප්පුටන් 400 රූපාය් සම්පළ උයර්වු අවර්කළුක්කු වළංකප්පට්ටතු. අතේපෝන්රු, 2027ආම් ආණ්ටිලුම් වළංකුවතර්කු 3,800 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු එන්පතෛ මිකවුම් කෞරවමාකවුම් සන්තෝසමාකවුම් තෙරිවිත්තුක්කොළ්කින්රේන්.

පාටසාලෛ මාණවර්කළුක්කුත් තේවෛයාන අප්පියාසක් කොප්පිකළ් මර්රුම් අච්චිටප්පට්ට කල්වි නූල්කළුක්කු ඉව්වළවු කාලමුම් විතික්කප්පට්ට පෙරුමති සේර් වරියෛ ඉන්ත අරසාංකම් මුර්රාක නීක්කියුළ්ළතු. ඉතු වරලාර්රිල් මුතර්තටවෛයාකුම්. අතුමාත්තිරමල්ල, ඔව්වොරු මාවට්ටත්තිලුම් වීතිප් පුනරමෛප්පු උට්පට අපිවිරුත්ති වේලෛකළුක්කාක සෙන්ර මුරෛ නිති ඔතුක්කියතෛප් පෝලවේ, ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිලුම් 2,000 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු. අතුමාත්තිරමල්ල, අන්තප් පිරතේසංකළිලුළ්ළ මක්කළින් තේවෛකළෛක් කණ්ටරින්තු, අවර්රෛප් පූර්ත්තිසෙය්වතර්කාක අරසාංකත්තාල් ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිල් නිති ඔතුක්කප්පට්ටුළ්ළතු.

[ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය]

නුවරෙලියා මාවට්ටත්තෙ පිරතිනිතිත්තුවප්පටුත්තුම් ඔර් උරුප්පිනර් එන්ර අටිප්පටෙයිල්, අනෙත්තු අමෙච්සුකළ් මූලමාක ඔදුක්කප්පටුම් නිතියෙප් පයන්පටුත්ති එංකළුටෙය පිරදේසංකළිල් වාළුම් මක්කළින් පිරච්සිනෙකළෙ පටිප්පටියාකත් තීර්ප්පතර්කුරිය වේලෙකළෙ නාංකළ් සෙය්වෝම්. අතුමාත්තිරමල්ල, සෙන්ර වරවු සෙලවුත්තිට්ටත්තිල් ඔදුක්කප්පට්ට නිතියෙයුම්, ඉන්ත වරුටත්තිල් ඔදුක්කප්පට්ට නිතියෙයුම් පයන්පටුත්ති, වීතිප් පුනරමෙප්පු, කෝයිල් පුනරමෙප්පු පෝන්ර අපිවිරුත්ති වේලෙකළෙයුම් නාංකළ් මුන්නෙටුප්පෝම්. සෙන්ර වරුටංකළිල් සමර්ප්පික්කප්පට්ට වරවු සෙලවුත්තිට්ටත්තෙප් පෝන්රේ ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිලුම් මලෙයක මක්කළ් උළ්වාංකප්පට්ටුළ්ළාර්කළ් එන්පතෙ සන්තෝසත්තුටන් තෙරිවිත්තු, විටෙ පෙරුකින්රේන්. නන්රි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.21]

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම අපි මේ පවත්වන්නේ අපේ රටේ 81වන අය වැය පිළිබඳ විවාදයයි; 2027 වර්ෂයට අදාළ වන අය වැය පිළිබඳ විවාදයයි. රටක අය වැය පිළිබඳ හොඳින් සලකා බැලුවාම, ඒ අය වැය හොඳින් අධීක්ෂණය කළාම අපට දැනගන්න පුළුවන් ඒ රට යන්නේ කොහේටද, ඒ රටේ අනාගතය කුමක්ද කියලා. ඒ වාගේම, මේ අය වැයෙන් අපට දැනගන්න පුළුවන් මේ ආණ්ඩුවට අභියෝග ජය ගැනීමට විශාල ශක්තියක් තිබෙන බව. ඒ වාගේම, මේ අය වැයෙන් ඉතාම පැහැදිලිව ප්‍රක්ෂේපණය වනවා, අභියෝග හමුවේ ආර්ථිකය මැනවින් කළමනාකරණය කර ගැනීමට විශේෂ හැකියාවක් මේ ආණ්ඩුවට තිබෙන බව.

අපි දන්නවා, මෙතෙක් ඉතිහාසයේ ලංකාවේ සිදු වෙච්ච දැවැන්තම ආපදාව "දිවිවා" සුළි කුණාටුවෙන් වෙච්ච ආපදාව බව. ලෝක බැංකුව සිදු කළ ගණනය කිරීමේදී, ප්‍රමාණාත්මකව ගත්තොත්, එය ඩොලර් බිලියන 4කට ආසන්නයි කියලා තහවුරු කරනවා. ඒ වාගේම, එම ආපදාවෙන් පරිසරයට සිද්ධ වෙච්ච හානිය සලකා එම හානිය ඩොලර් බිලියන 6.8කට ආසන්නයි කියලා පරිසරවේදීන් විග්‍රහ කරනවා. ඒ ඩොලර් බිලියන 6.8 කියන්නේ එවකට අපේ රටේ භාණ්ඩාගාරයේ තිබුණු විදෙස් මුදල් ප්‍රමාණය හා සමාන මුදලක්. මෙවැනි ආකාරයේ ව්‍යසනයක් කවදාවත් මේ රටට සිද්ධ වුණේ නැහැ කියලා මම හිතනවා. හැබැයි, මේ රටේ මහජනතාව, රාජ්‍ය සේවය, ත්‍රිවිධ හමුදාව, ආණ්ඩුව, ජනාධිපතිතුමා, ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ඇතුළු සියලු දෙනා එක්කාසු වෙලා ඒ වෙලාවේ ඒ අභියෝගය ජය ගත්තා. ඒ වාගේම තමයි, ඇති වෙච්ච ආපදාවලට අදාළව මේ ආණ්ඩුවේ මූල්‍ය කළමනාකරණය යටතේ වන්දි ගෙවලා තිබෙනවා. මේ වන කොටත් බහුතරයකට වන්දි ගෙවලා අවශ්‍ය කරන නැවත ඉදිකිරීම් කටයුතු ද සිද්ධ වෙනවා.

මේ ළඟදී මට හමු වුණා, කිහිපදෙනෙක්. ඔවුන් කිව්වා, "මන්ත්‍රීතුමා, ඒ ව්‍යසනය කොච්චර ප්‍රබල වුණත්, අප ගැන හිතන ආණ්ඩුවක් අප විසින් පත් කර තිබීම ගැන අපි සතුටු වෙනවා" කියලා; "ව්‍යසනය ප්‍රබලයි. හැබැයි, අපව රැක ගන්නා ජනතාවාදී ආණ්ඩුවක් ඒ වෙලාවේ පත් වී තිබීම ගැන සතුටු වෙනවා" කියලා කිව්වා. විපක්ෂය කොච්චර කෑගැහුවත්, අවුරුදු 8කට පෙර - 2016 -2017 කාලයේ - ඇති වෙච්ච නායයෑම්වලින් පවුල් විශාල ප්‍රමාණයක් අවතැන් වෙලා තිබුණු රටක්, මෙක. ඒ රටේ තමයි මේ දැවැන්ත ව්‍යසනය වුණේ.

ඊළඟ අභියෝගය හැටියට අපට විශේෂයෙන්ම ආවේ, මැද පෙරදිග යුද්ධය. මේ මැද පෙරදිග යුද්ධයේදී නැව් ගාස්තු විශාල වශයෙන් ඉහළ ගියා, රක්ෂණ ගාස්තු ඉහළ ගියා, අපේ රටේ එළවලු ටික පිටරටවලට යවන්න බැරිව ගියා, අපේ රටේ පලතුරු ටික පිටරටවලට යවන්න බැරිව ගියා. මෙවැනි ආකාරයේ අර්බුද රාශියකට අපි මුහුණ දුන්නා. මේ ව්‍යසනය හේතු කොට ගෙන තෙල් මිල ඉහළ යෑම නිසා පසුගිය කාලයේ ඩොලර් බිලියන 2ක් අමතරව වියදම් කරන්න අපට සිද්ධ වුණා. හැබැයි, ජනතාවාදී ආණ්ඩුවක් ලෙස ඒ සියලු අභියෝගවලට මුහුණ දෙන්න අපට පුළුවන් වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම තමයි සියයට 5කට ආසන්න ආර්ථික වර්ධන වේගයක් ද පවත්වා ගන්න අපට පුළුවන් වුණා. මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 5.1ක මට්ටමක තිබුණා. ඊළඟ කාර්තුවේ එය සියයට 4.8 දක්වා අඩු වුණා. අපට එවැනි ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යෑමට පුළුවන් වීම නිසා මේ ආණ්ඩුවේ මූල්‍ය කළමනාකරණය ගැන අලුතින් කියන්න ඕනෑ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ මෙවර අය වැය දිහා හොඳින් බැලීමේදී අපට පෙනෙන කාරණයක් තිබෙනවා. මේ රටේ ජාතික ආර්ථිකය නිර්මාණය වෙලා තිබෙන්නේ, ජාතික ආර්ථිකයට පෝෂණය ලැබෙන්නේ එක පැත්තකින් පෞද්ගලික ආයෝජනවලින්; අනෙක් පැත්තෙන් රාජ්‍ය ආයෝජනවලින්.

අපේ රටේ මේ වනකොට කර තිබෙන රාජ්‍ය ආයෝජනවලට වඩා විශාල රාජ්‍ය ආයෝජන ප්‍රමාණයක් සිදු කිරීමට අපි මෙවර අය වැයෙනුත් මුදල් වෙන් කරලායි තිබෙන්නේ. හැබැයි, පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රමාණය ඉතාම කුඩායි. මේ දෙකේ වෙනස අහසට පොළොව වාගෙයි. ආණ්ඩුව විධියට අපට අවශ්‍ය වන්නේ, පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රමාණය වැඩි කිරීමයි; ජාතික ආර්ථිකයේ සැලකිය යුතු කොටසක් පෞද්ගලික අංශය විසින් නියෝජනය කිරීමයි. අන්න ඒ වෙනුවෙන් ආණ්ඩුව මේ අවුරුද්දේ අය වැයෙන් බදු සහන ලෙස රුපියල් මිලියන 67,687ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ණය සහන. අඩු පොලී ණය සහන සඳහා රුපියල් මිලියන 174,000ක් වෙන් කර තිබෙනවා. ඒ මොනවාටද? පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි කරන්න. පෞද්ගලික අංශයෙන් මේ රටේ ජාතික ආර්ථිකය නියෝජනය කරන තවත් අලුත් ව්‍යවසායකයන් විශාල පිරිසක් මේ රටට ඕනෑ. අන්න ඒ වෙනුවෙන් අපි මේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් යළි පණ ගැන්වීම, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් නහා සිටුවීම, කාන්තා මූලික පවුල් නහා සිටුවීම, ග්‍රාමීය ව්‍යවසායකයන්, ධීවර අංශය සහ සංචාරක අංශයේ homestays ආදිය දියුණු කිරීම සඳහා අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් අතට අපි දන්නවා, මෙතෙක් රාජ්‍ය අංශයට වෙන් කළ විශාලතම මුදල මෙවර වෙන් කර තිබෙන බව. රාජ්‍ය අංශය ගත්තොත්, එම අංශයට වෙන් කරනු ලබන ප්‍රාග්ධනයට සාපේක්ෂව රාජ්‍ය සේවයට වෙන් කරන මුදල ඉතා අඩුයි. අපි ඒක පිළිගන්නවා. පසුගිය ටිකේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කෑ මොර දුන්නේ මේකේ මහා සුරපුරයක් තිබුණු විධියටයි. පසුගිය අවුරුදු 6ක, 7ක, 8ක කාලය තුළ රාජ්‍ය සේවයට කිසිදු සේවකයෙකු බඳවා ගත්තේ නැහැ. හැබැයි අපි පිළිගන්නවා, මේ ප්‍රසාරණය වන ආර්ථිකයට, මේ විශාල capital එකට වියදම්

කරන්න හොඳ ශක්තිමත් රාජ්‍ය සේවයක් අවශ්‍යයි කියලා. රාජ්‍ය සේවය වෙනුවෙන් බඳවා ගැනීම් මේ වන කොටත් සිදු වෙමින් පවතිනවා. රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම සඳහා 120,000කට ආසන්න බඳවා ගැනීම් ප්‍රමාණයක් අපි මේ අවුරුද්ද තුළ සිදු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අපි දන්නවා, රාජ්‍ය සේවය තුළ බහුතරයක් ඉතාම හොඳින් තමන්ගේ කාර්යය ඉටු කරන බව. ඒ වාගේම තවත් සුළු පිරිසක්, ව්‍යත්තීය සමිති කිහිපයක් එකතු වෙලා වෙන වෙන දේශපාලන agendasවලට අනුව ක්‍රියාත්මක වෙමින්, මේ රටේ ආර්ථිකය හැකිළීමටත් කටයුතු කරන බව මා සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයට පෞද්ගලික අංශය ජාතික ආර්ථිකයට දක්වන දායකත්වයත්, රාජ්‍ය අංශයට දක්වන දායකත්වයත් එක්කාසු කරගෙන මේ ආර්ථිකය විශාල කිරීමේ, එහෙම නැත්නම් GDP එක ප්‍රසාරණය කිරීමේ කටයුත්ත තමයි අප මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඊළඟ ප්‍රසාරණය තුළ තවත් රුපියල් බිලියන 400කට ආසන්න ප්‍රමාණයක මුදල් ප්‍රසාරණයක් සිදු කර ගන්න. ඒ ඔස්සේ එහි ආයෝජනවලින් ලැබෙන මුදල් ප්‍රාග්ධන වියදම් සහ වෙනත් දේවලට තව තවත් යොදවන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, අපේ රටේ ආර්ථිකයට එකතු කරනු ලබන ජාතික සම්පත්; මේ රටේ තිබෙන ඛනිජ සම්පත් බහුතරයක් යන්නේ අමුම අමු ද්‍රව්‍ය විධියට බව. ඒකට තව value additions කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා, මිනිරන් ආශ්‍රිතව value addition එකක්; එහෙම නැත්නම් අගය වැඩි කිරීමක් සිදු කිරීමට අවශ්‍ය කරන පියවර ගන්නා බව. ඒ වාගේම ඛනිජ වැලි ආශ්‍රිතව value addition එකක් කරන්නත් ඕනෑ. මේකට තවත් අගය එකතු කිරීමක් සිදු කරන්න ඕනෑ. දැන් අප කරන්නේ මේවා එක එක සංඝටක ලෙසට වෙන් කරලා පිට රට පටවන එකයි.

අපි දන්නවා, ඛනිජ වැලිවල සැලකිය යුතු ප්‍රමාණයකින් - විශාල වශයෙන් - දුර්ලභ පෘථිවි මූලද්‍රව්‍ය - rare earth elements - තිබෙන බව. අන්න ඒ පෘථිවි මූලද්‍රව්‍ය තමයි මේ ලෝකයේ මේ වෙනකොට ඉදිරි තාක්ෂණික පිම්ම පනින්නේ. ඒවාට විශාල ඉල්ලුමක් තිබෙන බව අපි දන්නවා. එම ඉල්ලුමත් එක්ක තමයි බොර තෙල්වලට වැඩිය පදනම් වෙලා ඊළඟ යුද්ධ ඇති වෙන්නේ. ඒ වාගේම දේශපාලනය කැරකෙන්නේ එතැනටයි. මේ රටේ තිබෙන දුර්ලභ පෘථිවි මූලද්‍රව්‍ය - rare earth elements - තුළින් අපට ඉස්සරහට ගමන් කරන්න පුළුවන් වෙයි කියලා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1950 දශකයේ වාගේ තමයි අපේ රටේ තෙල් ගවේෂණය ආරම්භ වෙන්නේ. විටින් විට රාජ්‍යයන් කිහිපයක්ම ඒ වෙනුවෙන් දායකත්වය සැපයුවා. කැනඩාව, ප්‍රංශය හා රුසියාව විශාල වශයෙන් දායකත්වයක් සැපයුවා. නමුත්, සමහර තෙල් ගවේෂණ කටයුතු අතරමඟ නතර වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010න් පසුව නැවත තෙල් ගවේෂණ කටයුතු පටන් ගත්තා. අපි ඒවාට exploration wells කියලා කියනවා, wildcats කියලාත් කියනවා. එවැනි exploration wells 7ක් ඉදි කළා. ඒ exploration wells 7න්, දෙකක ගෑස් තිබෙනවා කියලා තහවුරු වෙලා තිබෙනවා. නමුත්, ප්‍රමාණ සමීක්ෂණයක් තවම සිදු වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1981දී අපේ රටට මායිම්ව විශේෂයෙන්ම පෝක් සමුද්‍ර සන්ධිය ආසන්නයේ, - අපි කියනවා, කාවේරි ද්‍රෝණිය කියලා - අපේ sea boundary එකට කිලෝමීටර 20ක් එහායින් PH-9-1 කියලා තෙල් ළිඳක් ඉන්දියාව විසින් ඉදි කළා. එය 1980 දශකයේ මුල තමයි පටන් ගත්තේ. ඒකේ production එක ගත්තොත්, දිනකට බොර තෙල් බැරල් 1,400ක් නිපදවුවා. ඒ වාගේම ස්වාභාවික වායු ප්‍රමාණය ඝන අඩි දහස් ගණන්වලින් ගත්තොත්, 570ක ගෑස් ප්‍රමාණයක් නිපදවුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ එම ප්‍රදේශය තෙල් සහ ගෑස්වලට ඉතාම හොඳ විභවයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ගෑස් පමණක් තිබුණාට අපිට ආර්ථිකමය වශයෙන් විශාල ලාභයක් අත්පත් කර ගන්න නොහැකි බව. ඒකට හේතුව, අපට නළ පද්ධතියක් නැහැ. නැව් මඟින් ගෑස් ප්‍රවාහනය කරලා හොඳ ලාභයක් ලබන්න බැහැ. හැබැයි, තෙල් සහ ගෑස් දෙකම තිබුණොත් අපිට හොඳ ලාභයක් ගන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එය දේශපාලනිකව ගන්නේ නැහැ. තෙල් හම්බ වෙලා ගෑසුත් හම්බ වුණොත් තමයි අපි සතුටු වෙන්නේ. බොරුවට මහජනතාව රවටිටන්න වේදිකාවල කියවන්නේ නැහැ. Exploration පටන් ගත්තාට පස්සේ අපේ රටේ ගෑස්වලින්, අපේ රටේ තෙල්වලින් රට වටේ අපේ කාර් එකකින් යනවා කියලා සිහින මවලා අපි මිනිස්සු රවටිටන්න යන්නේ නැහැ. අද අපේ රජය ඉතාම විනිවිදභාවයකින් යුතුව ඒ සඳහා tenders call කරලා තිබෙනවා. ඒ අනුව මේ පිළිබඳ සමීක්ෂණ කටයුතු, ගවේෂණ කටයුතු අපට ඉදිරියේදී කරන්න පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඛනිජ සහ ඛනිජ තෙල්වලින් අපේ රටට හොඳම ආර්ථිකමය වාසි - optimum benefits - අත්පත් කරනවා. Optimum benefits ලබා දීම සඳහා මේ රජය කැප වෙනවා. අන්න ඒකට මෙවර අය වැයෙන් අපිට ප්‍රතිපාදන ලබා දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු ඇන්ටන් ජයකොඩි මහතා
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
හොඳයි, මම අවසන් කරන්නම්.

අපි මේ රට ගොඩනඟලා ආර්ථිකමය වශයෙන් හොඳ තැනකට ගෙනෙනවා වාගේම, සමාජයත් ඉතා හොඳ තැනකට ගෙනෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් සෞඛ්‍ය, අධ්‍යාපනය, ක්‍රීඩා සහ අනෙකුත් කටයුතු සඳහා මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අපේ බලාපොරොත්තුව තමයි තව අවුරුදු කිහිපයකින් මේ රට පොහොසත් රටක් බවට පරිවර්තනය කිරීම. ඒ පොහොසත් රටක් බවට පරිවර්තනය කිරීමේ කැඩපතක් විධියට අපිට මෙවර අය වැය වාර්තාව හඳුන්වා දෙන්න පුළුවන්. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.35]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දිනත් විවාද කරන්නේ වර්තමාන ආණ්ඩුවේ තුන්වැනි අය වැය ලේඛනය ගැනයි. අපි වසර දෙකක් තුළ රට යම් දිශාවකට යොමු කරලා, මේ රට පියවරක් ඉස්සරහට අරගෙනයි මෙම අය වැය ඉදිරිපත් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ගැන කථා කරන්න කලින් මම පොඩි අදහසක් කියන්න කැමැතියි.

මේ වසර දෙක ගත කරනකොට අපි මුහුණ දුන් අභියෝග තුනක් තිබෙනවා. එකක් තමයි, 2025 අවසානයේදී ආපු "දිට්වා" සුළි කුණාටුව. "දිට්වා" සුළි කුණාටුව නිසා රුපියල් කෝටි ලක්ෂයකට වඩා damage එකක් අපේ රටට සිද්ධ වුණා. අපි ඒ අභියෝගයත් භාර ගත්තා. ඒ වාගේම 2026 පෙබරවාරි මාසයේ 28වෙනි දා අරාබිකරය සහ ඇමෙරිකාව මූලික කරගෙන ආරම්භ වුණු යුද්ධය මත පදනම් වෙලා ඇති වන බලපෑම්වලට මුහුණ දෙමින් දැන් මාස අටක් වාගේ කාලයක් අපි ගත කරමින් ඉන්නේ. ඒ අතරතුරේදී - "දිට්වා" ආපදාවෙන් පස්සේ - එල් නිනෝ තත්ත්වය ඇති වෙලා දිස්ත්‍රික්ක 9ක ජනතාව මාස කිහිපයක් බරපතළ බේදවාචකයකට මුහුණ දුන්නා. අපි ඒ සියලු අභියෝගයන්ට මුහුණ දෙමින් තමයි මේ අය වැය ඉදිරිපත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් දිගින් දිගටම කියන කරුණු දිහා බැලුවාම අපට හිතෙනවා, විපක්ෂය කොහොමද මේ අය වැය පිළිබඳව දකින්නේ කියලා. 2027 අය වැයෙන් ආණ්ඩුවේ ඉලක්කය මොකක්ද? එහෙම ඉලක්කයක් පිළිබඳව අඩු තරමේ දේශපාලනික වශයෙන් ගත්තත්, එතුමන්ලා විග්‍රහයක් දැක්කාද කියලා අපට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ආණ්ඩුව භාර ගන්න අවුරුදු කිහිපයකට පෙර රටේ ආර්ථිකයට වෙලා තිබුණු දේ මොකක්ද කියලා දන්නවා. එතකොට මැද පෙරදිග යුද්ධයක් තිබුණේ නැහැ. "දිට්වා" සුළි කුණාටුව වාගේ විශාල බලපෑමක් ඇති වෙලා තිබුණෙත් නැහැ. ඒ වාගේම වෙනත් කිසිදු බාහිර බලපෑමක් විසින් ආර්ථිකයට කිසිදු හානියක් වෙලා තිබුණෙත් නැහැ. එවැනි තත්ත්වයක් තුළත් 2022 වර්ෂය වෙනකොට අපේ ආර්ථිකයට මොකක්ද වුණේ කියලා අපි දන්නවා. රටේ ආර්ථිකය ඒ මට්ටමට වැටුණේ ස්වාභාවික හෝ වෙනත් විපතක් නිසා නොවෙයි. විපතක්, දේශපාලනඥයෝ සහ ඒකට සම්බන්ධ වෙච්ච සමහර නිලධාරීන් හදපු නිසා. ඒ හදපු විපතේ අවසාන ප්‍රතිඵලය තමයි, රටේ ආර්ථිකය සහමුලින් බිඳ වැටිලා, කඩා වැටිලා, මිනිසුන්ගේ ජන ජීවිතය විනාශ වුණු රටක් බවට පත් වීම. එවැනි රටක් තමයි තිබුණේ. එහෙම තිබුණු රට ගොඩගැනීම තමයි අපේ ඉලක්කය. අපේ ඉලක්කය වුණේ, අය වැය ඉදිරිපත් කරනවා, ආණ්ඩුවක් අරගෙන කියන එක. ඒ අය වැයේ දුර දැක්ම තමයි මේ වැටිච්ච රට කොහොමද ඉස්සරහට ගෙනියන්නේ කියන එක. ඉස්සරහට යන්න ඕනෑ. මේ රට වට්ටපු එකට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු තීරණ ගණනාවක් දීලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් තිබෙනවා, මේ රට වට්ටන්න මැදිහත් වෙච්ච දේශපාලන අධිකාරියේ තුන්දෙනෙක්ම ආණ්ඩු පක්ෂය නියෝජනය කරපු ප්‍රධාන පක්ෂයේ හිටපු රාජපක්ෂ පවුලේ තුන් දෙනෙක් බව. ඒ අයත් එක්ක එකතු වුණු කණ්ඩායමකටත් තීන්දුවක් දීලා තිබෙනවා, ඒගොල්ලන් තමයි ඒකට වගකිව යුත්තෝ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, ඒ තත්ත්වයන් ඇතුළේ රටේ ආර්ථිකය කොයි විධියටද තිබුණේ කියලා. රටේ ආර්ථික වර්ධන වේගය තිබුණේ, ඍණ අගයක. එය සියයට ඍණ 12.4යි. ඒ වාගේම උද්ධමනය සියයට 69.8යි. ඊළඟට, ඩොලරය රුපියල් 372යි. නිල විදේශ සංචිත ඩොලර් මිලියන 50ටත් අඩුයි. ඔන්න ඕක තමයි රටේ පැවැති ආර්ථිකය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථිකය එතැනට වැටිලා තිබුණේ. වාහන ගෙන්වන්නෙත් නැති, ඒ කියන්නේ ආනයන සීමා කරලා, කර්මාන්ත සියල්ල කඩා වැටිලා, ඉදිකිරීම් කර්මාන්තය සහමුලින්ම නතර වුණු රටක තමයි අපි මේ උත්සාහ කරන්නේ පියවරක් ඉස්සරහට තියලා ආර්ථිකය ස්ථාවර කරන්න. අන්න ඒක අපි කොහොමද 2025දී කළේ? 2025දී අපි භාර ගන්නකොට තිබුණු තත්ත්වයත් එක්ක අද තිබෙන තත්ත්වය සැලකිල්ලට අරගෙන බලන්න.

මම දැක්කා විපක්ෂයේ සමහර අය කියනවා, රනිල් වික්‍රමසිංහ ගෙනැවිත් දුන් තැන ඉඳලාලු, අපි පටන් ගත්තේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැටුණු රටේ වාහන ආනයනය සියයට සියයක් නතර කළාම, ඩොලර් ඉතිරි වෙනවා. කර්මාන්ත ක්‍රියාවලිය නතර වුණාම මුදල් ඉතිරි වෙනවා. ආර්ථිකය පුංචිම පුංචි එකක් බවට පත් කළාට පස්සේ රටේ වර්ධන වේගය සියයට 5 නොවෙයි, ඊටත් එහා යන්න පුළුවන්. හැබැයි, ආර්ථිකය පුංචි එකක්; අකුළලා දාලා. ඒක තමයි රනිල් වික්‍රමසිංහගේ ආර්ථිකය කියන්නේ. අපි මොකද කළේ? මේ ආර්ථිකයේ නවතා තිබුණු සියලු ක්‍රියාකාරකම් නැවත තිබුණු මට්ටමට සක්‍රිය කරලා වාහන ආනයනයද, අනෙකුත් ඒවා ද, ඉදිකිරීම් කර්මාන්තය ද නැවත සියයට සියයක් පටන් අරගෙන ආර්ථිකය ශක්තිමත් කරලා ස්ථාවර තත්ත්වයට ගෙනාවා. ඒ ස්ථාවර තත්ත්වයට පත් කිරීම කළේ නිකම්ම නොවෙයි. 2024 වෙනකොට තිබ්බ්ච, එදා රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් කරපු අය වැය ඇතුළේ අපි මාස තුනක් ගිහිල්ලා, 2025 වර්ෂය වෙනුවෙන් මාස 4කට තාවකාලික අය වැයක් ඉදිරිපත් කරලා, 2025 මාර්තු මාසයේ ස්ථිර අය වැයක් ඉදිරිපත් කරලායි ඒ තත්ත්වය ඇති කළේ. ඒ මාර්තු මාසයේ සිට ඉදිරි මාස 9ක කාලය ඇතුළත ආර්ථික වර්ධන වේගය සහ අනෙකුත් සියල්ල අපි කොතැනටද ගෙනාවේ? රුපියල් ට්‍රිලියන 1.2ක අතිරික්ත මුදලක් බැංකුගත වන මට්ටමට අපි ආර්ථිකය ගෙනාවා. ඒ විතරක් නොවෙයි. අපි අපේ රට ලෝකයේ ආර්ථික දර්ශක විශාල ප්‍රමාණයකින් ඉදිරියට අරගෙන ඇවිත් ආර්ථිකය ස්ථාවර තත්ත්වයට පත්වුණු බව ලෝකයට කියන්න පුළුවන් තැනකට 2025 අය වැයට පසුව ගෙනාවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආර්ථිකය ස්ථාවර තත්ත්වයට පත් වුණාට පස්සේ අපි නිකම් හිටියේ නැහැ. අපි රුපියල් ට්‍රිලියන 1.2ක් ඉතිරි කළා කියනකොට, අපි සල්ලි ඉතිරි කරගෙන ඉන්නේ ඇයි කියලා විපක්ෂ නායකතුමා හැම දාම අහනකොට අපට කියන්න තිබෙන්නේ, දෙන්න ඕනෑ හැම කෙනෙකුටම අපි සහන දුන්නා කියලායි. ආර්ථිකය පුළුල් වුණාට වැඩක් නැහැ, ආර්ථිකයේ උපයා ගැනීම් සාධාරණ විධියට මිනිසුන් අතරට යන්නේ නැත්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව ලබා දීලා, ආබාධිත අයට දෙන දීමනාව ලබා දීලා, වැඩිහිටි දීමනාව ලබා දීලා, කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවියාට දීමනා ලබා දීලා, පාසල් දරුවන්ට දීමනා ලබා දීලා, විශ්වවිද්‍යාල ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයට දීමනා ලබා දීලා - සියලු ක්ෂේත්‍රවල පීඩාවට පත් වෙච්ච ජනතාවට දෙන්න ඕනෑ සහන ටික දීලා - තමයි ඔය කියන මුදල ඉතිරි වෙලා තිබුණේ. මෙතුමන්ලා කියනවා, සහන දෙන්න, දෙන්න කියලා. මම දැක්කා, විපක්ෂය පැත්තෙනුත් ඒ ගැන කථා කරනවා. සහන දෙන්න, දෙන්න කිව්වාට සහන විතරක් දීලා හරියන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "දිට්වා" සුළි කුණාටුව ආපු

වෙලාවේ ඇති වෙච්ච මහ ව්‍යසනයට මුහුණ දෙන්න වෙන කිසිම කෙනෙකුට බැරි තත්ත්වයක් ඇතුළේ අපේ ආර්ථිකයේ තිබුණු ස්ථාවරභාවය මත අපි රටක් හැටියට ඒකට මුහුණ දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ස්ථාවරභාවය මත අපි අත්පත් කර ගත් දේවල් මොනවාද? Fitch Ratings ආයතනයට අනුව අපේ ආර්ථිකය CCC+ සිට B- දක්වා promotion එකක් ලබාගෙන තිබෙනවා. Transparency International ආයතනයට අනුව ගෝලීය දූෂණ සංජානන දර්ශකයේ 121හි තිබුණු අපේ රට ස්ථාන 14කින් පහළට ගෙනැල්ලා 107හි තබා තිබෙනවා. ඒ වාගේම ගෝලීය සාම දර්ශකයේ ස්ථාන 14ක් ඉදිරියට ගෙනැල්ලා අපි 67වැනි ස්ථානයෙහි තබා තිබෙනවා. ඒ වාගේම තනිව සංචාරය කරන්නන්ගේ වර්ගීකරණයට අනුව ලෝකයේ පළමුවැනි ස්ථානයට අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම සංචාරක ආර්ථිකයන්ගෙන් වේගවත්ම සංවර්ධනයක් පෙන්නුම් කරන රටවල් අතර 10වැනි ස්ථානයට ලංකාව ගෙනැල්ලා තිබෙනවා. පවුලේ සැමට එකට සංචාරය කළ හැකි ලෝකයේ හොඳම රට හැටියට ශ්‍රී ලංකාව ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම නැඟී එන වෙළෙඳ පොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 57 අතර හතරවැනි ස්ථානයට අපි ගෙනැල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විපක්ෂ නායකතුමා ඇතුළු මේ අයගෙන් අහන්න තිබෙන්නේ ඔබතුමන්ලා ලෝකයේ ආර්ථිකයක් ඉදිරියට යනවා කියලා මනින්නේ මොකෙන්ද කියලායි. විදේශීය රටවල මිනිස්සු, ආයෝජකයින් ලෝකයේ රටක් ආර්ථික වශයෙන් ස්ථාවර තත්ත්වයට පත් වෙලා ආයෝජනයට සුදුසුයි කියලා මනින්නේ මොනවායින්ද? විපක්ෂ නායකතුමාගේ හැටියට නම් මනින්න අලුත් නිර්ණායකයක් හොයන්න ඕනෑ. කොහොමටත් විපක්ෂ නායකතුමා හැම දාම අලුත් නිර්ණායක හොයන්න කැමැති කෙනෙක් නේ. ඒ හින්දා විපක්ෂ නායකතුමාට අලුත් නිර්ණායක මත තමයි මේ රටේ ආර්ථිකය ස්ථාවර නොවුණා කියලා කියන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය විශේෂයෙන් කියන්න කැමැතියි. මෙන්න මේ කියන ආර්ථික දත්ත සහ ස්ථාවර තත්ත්වයන් 2026 වසරට ගෙනැල්ලා, 2026දී ආර්ථිකය ස්ථාවර තත්ත්වයට ගෙනාවාට පස්සේ දැන් අපට අභියෝගයක් තිබෙනවා. මොකක්ද, ඒ අභියෝගය? ඒ, මෙන්න මේ සීමාවෙන් පසු අපේ ආර්ථිකය වේගවත්ව ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියන එකයි. ඒක නිකම්ම නිකම් ගෙනියන්න බැහැ. ආයෝජකයින් ගෙන්වන්නත්, අනෙක් ආර්ථික ක්‍රියාවලි වේගයෙන් පරිවර්තනය කරන්නත් අදාළ පසුබිම හදන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පසුබිම තමයි මේ අය වැය ඇතුළේ නිර්මාණය කරලා තිබෙන්නේ. ඉන් එකක් තමයි, මාර්ග පද්ධතිය වේගයෙන් හදන්න ඕනෑය කියන එක. ඒ වාගේම ආර්ථික මූල්‍යාකරණය පිළිබඳව අපට බලපා තිබෙන සමහර නීති රීති විසින් හිර කරලා තිබෙන තත්ත්වයෙන් අපි ඒවා නිදහස් කරගන්න ඕනෑ. ඒකට දැනටමත් අපි යම් නීති රීති ප්‍රමාණයක් හදලා තිබෙනවා. තව ප්‍රමාණයක් හදන්නත් ඕනෑ. ඒ සඳහා නීති රීති හදලා පවතින ඒවා වෙනස් කරන්න ඕනෑ. අවුරුදු 100ක්, 200ක් පරණ සමහර නීති තිබෙනවා. අපව හිර කරන එම නීති රීති වෙනස් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යටිතල පහසුකම් පද්ධතිය තවදුරටත් ශක්තිමත් කරගැනීම තමයි මේ අය වැයේ සම්පූර්ණ ඉලක්කය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ තුළ මාර්ග පද්ධතිය වෙන්න පුළුවන්, රක්ෂණය සහ අනෙකුත් සියලුම ආයතන පද්ධතිය තුළින් ලැබෙන පහසුකම් ටික වෙන්න පුළුවන්, සන්නිවේදනය වෙන්න පුළුවන්, ඩිජිටල්කරණය හරහා ඇති යම් බාධක, ප්‍රමාදවීම් ඉවත් කරදීම් වෙන්න පුළුවන්, මේ හැම එකක්ම මේ අය වැය තුළ ගරු ජනාධිපතිතුමා යෝජනා කර තිබෙන්නේ 2027 වසරේ සිට ඉස්සරහට යන ගමනේදී ආර්ථිකය ස්ථාවර කිරීමටයි. ඒ යන ගමනට කොහේද බාධාවක් තිබෙන්නේ, කොහේද යම් විධියක පීඩාවක් තිබෙන්නේ කියා සොයා බලා ඒ සියල්ල වෙනස් කර, ඉදිරියට යන්න පුළුවන් පාර විවෘත කර ගැනීම තමයි මේ අය වැයේ සම්පූර්ණ පදනම වෙලා තිබෙන්නේ. නමුත් මේ පිළිබඳව කිසිදු අවබෝධයක් නැතිවයි විපක්ෂ නායකතුමා කථා කළේ. මෙතැන පොල් ගෑවාද, වෙන මොනවා හරි කළාද කියලා අපි දන්නේ නැහැ. අද උදේ පාන්දර එතුමා විනාඩි 40ක් අරගෙන අහපු ප්‍රශ්නවලට අපට කියන්න තිබෙන්නේ ඒකයි. පසුගිය අවුරුදු දෙක තුළ විපක්ෂ නායකතුමා මෙතැනදි සිදු කළ කථා ටික අරගෙන හරියට බැලුවොත්, ඒවායෙන් එක එක වචනය තිබුණු ඒවා කපා හැරියොත්, පැය 100ක් කථා කර තිබෙනවා නම්, පැය 10ක්වත් ප්‍රයෝජනවත් දෙයක් කථා නොකරපු විපක්ෂ නායකයෙක් තමයි ඉන්නේ.

මම අවසාන වශයෙන් කියනවා, අපි ඉලක්ක සහගත ආර්ථික ගමනක් යන බව. ඒ ගමන සාර්ථක කර ගැනීම සඳහා හොඳ අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අය වැය 2027 වසරේ ක්‍රියාත්මක කර අවසන් වනකොට, විපක්ෂයට දකින සිහින ටික ඇතුළේ ජීවත් වෙන්න විතරයි පුළුවන් වන්නේ.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.47]

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2027 ජනවාරි 01වැනි දා සිට දෙසැම්බර් 31 දක්වා වන මුදල් වර්ෂය තුළ අපේ රජය විසින් ක්‍රියාත්මක කරන ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳව වන අපේ ගරු ජනාධිපතිතුමාගේ අය වැය ප්‍රකාශනයට අපි ඊයේ දිනයේදී සවන් දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ තෙවැනි අය වැය මෙයයි. අපි 2024 වසරේදී හෙට වාගේ දවසක තමයි පාර්ලිමේන්තු මැතිවරණයට මුහුණ දුන්නේ. අපි ආණ්ඩුව පිහිටුවා වසර දෙකක කාලයක් ගත වී තිබෙනවා. අපි මේ තෙවැනි අය වැය ඉදිරිපත් කරන්නේ මේ රටේ සමාජ පරිවර්තනයක් සිදු කරමින් පවතින මොහොතකයි.

ඉතිහාසය තුළ රටේ රාජ්‍ය බලය දිනාගැනීම සඳහා විශාල කැප කිරීම් කරපු පිරිසක් සිටිනවා; විශාල මැදිහත්වීම් කළ පිරිසක් සිටිනවා. මේ, අපි ඒ සහෝදරයින් සමරන අවස්ථාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිවර්තනීය වෙනසක් කරලා, විශාල කැප කිරීමක් කරමින් පවතින කාලයක් තමයි මේ කාලය. අපි දන්නවා, මේ පරිවර්තනීය කාලය තුළ, මේ මොහොත වන විට අපි අපේ රටේ දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති කර තිබෙන බව. ඒක ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා, අග්‍රාමාත්‍යතුමිය, ඇමති මණ්ඩලය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තුළත්, ඒ වාගේම ප්‍රාදේශීය සභා සහ නගර සභා යන සියල්ල තුළත් සිදු වී තිබෙනවා. අපි ඉතිහාසයේ කියපු දෙයක් තිබුණා. අන්න ඒ දේ දැන් අපි ඉෂ්ට කරමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණු අප සියලුදෙනාම අපේ

[ගරු රත්න ගමගේ මහතා]

විශ්‍රාම වැටුප් අහෝසි කරගෙන, අපේ වරප්‍රසාද අහෝසි කරගෙන පෙරළා ජනතාවගේ මුදල් තිබෙන පෙට්ටගමට ඒ මුදල් එකතු කරමින් ජනතා මෙහෙවරක් කරන අවස්ථාව; දේශපාලන සංස්කෘතියක් බිහි කරන අවස්ථාව තමයි මේ.

අපේ ආණ්ඩුව බලයට ආ පසු සමහරු අපෙන් ඇහුවා, ඔයගොල්ලන්ට මේ වෙනස කරන්න පුළුවන්ද කියලා. අපි ඒ වෙනස කරමින් පවතිනවා. මේක අපි දේශපාලන පක්ෂයකට මුවා වී කරන දෙයක් නොවෙයි. දේශපාලන, සංස්කෘතික පරිවර්තනයක් කියනකොට, විපක්ෂය ඇතුළු කවුරුත් ඒ පරිවර්තනයට සම්බන්ධ වෙන්න ඕනෑ. රටක ජනතාව කියන්නේ පක්ෂයක කොටසක් නොවෙයි. රටක ජනතාව කියන්නේ සමස්තයක්. එවැනි පරිවර්තනයක් කරනකොට, මේ රට ගොඩනැඟීම සඳහා අපේ ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙන්න පුළුවන්, රාජ්‍ය නිලධාරීන් වෙන්න පුළුවන්, පෞද්ගලික අංශය වෙන්න පුළුවන්, ඒ සියලුදෙනාගෙන් ලැබෙන සහයෝගය, මෙහෙය වාගේම රටවාසීන්ගෙන් ලැබෙන සහයෝගයත් අවශ්‍යයි. එවැනි දෙයක් පදනම් කර ගනිමින් තමයි 2027 අය වැය සැකසුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව වෙනුවෙන් කෙටි කාලීන සහන ලබා දෙන, දිගු කාලීන සැලසුම් සහිත අය වැයක් තමයි, මේ අය වැය. එය පදනම් කර ගනිමින් සකස් කළ මෙම අය වැය රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනැඟීම, මහජනතාවට සහන සැලසීම, ඒ වාගේම කෙටි කාලීන ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ දිගු කාලීන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම වශයෙන් වූ අංශ හතරකින් අපට හඳුන්වන්න පුළුවන්.

අපි දන්නවා, ආර්ථික වර්ධන වේගය සම්බන්ධයෙන් සාකච්ඡා කළ බව. ඒ වාගේම, අපි ඉදිරි වර්ෂය සඳහා වන සැලසුම් පිළිබඳවත් සාකච්ඡා කළා. අපේ රටේ ආර්ථිකය ගොඩනඟා ශක්තිමත් කිරීම සඳහා විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයට, වැවිලි කර්මාන්තයට, ධීවර කර්මාන්තයට, කර්මාන්ත ක්ෂේත්‍රයට සහ ඩිජිටල් ආර්ථිකයට ඉලක්ක සහගතව දැවැන්ත මුදලක් වෙන්කර තිබෙනවා. ඒවායින් තමයි ආර්ථිකය සවිබලගන්වන්නේ. උදාහරණයක් වශයෙන් කිව්වොත්, මා නියෝජනය කරන ධීවර අමාත්‍යාංශය සඳහා ඉතිහාසයේ වැඩිම මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය මෙවර වෙන්කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගන්දර සහ පේසාලේ ඇතුළු ස්ථානවල ධීවර වරායවල් සහ නැංගුරම් පොළවල් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 6,500ක මුදලක් වෙන් කර තිබෙනවා. ධීවර කර්මාන්තය වෙනුවෙන් මේ ආකාරයට වරායවල්, ධීවර තොටුපොළවල් සහ නැංගුරම් පොළවල් ඉදිකරන්න සහ සංවර්ධනය කරන්න ඉතිහාසයේ කවදාවත් මෙතරම් මුදලක් වෙන් කරලා නැහැ. ඒ විතරක් නොවෙයි, නවීන තාක්ෂණය සම්බන්ධයෙනුත් අපි කටයුතු කර තිබෙනවා.

දැන් මේ සභාවේදී විපක්ෂයෙන් මතු කළ අදහසක් තමයි, "app එක කෝ" කියන එක. ඒ app එක තිබෙනවා. මෙරට ධීවරයන්ට මත්ස්‍ය සම්පත් සොයා ගැනීම සඳහා වන app එකක් තිබෙනවා. ධීවරයන් ලක්ෂයක පමණ ප්‍රමාණයක් මේ වනවිට එය භාවිතයට ගන්නවා. ඒ කියන්නේ, ඒක use කරනවා. දැන්ත - තොරතුරු - පදනම් කරගත් දින දෙක තුනක් වැනි කාල සීමාවකට අදාළ database එකක් තමයි එහි අන්තර්ගත වෙන්නේ. එම නිසා ඒ app එක තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අපි පසුගිය දිනවල විදේශීය රටවල් සහ සමාගම් සමඟත් සාකච්ඡා කළා. ඒ වාගේම, පෞද්ගලික දුරකථන සන්නිවේදන ආයතන කිහිපයක් සමඟත් සාකච්ඡා කළා. අපි මේ වැඩසටහන තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා තමයි මෙවර අමාත්‍යාංශයට වෙන් කළ මුදලින් රුපියල් මිලියන 1,000ක් - රුපියල් බිලියනයක් - ඒ වෙනුවෙන් වෙන් කර තිබෙන්නේ. දැනට මේ app එක භාවිත කරනවා. එය වැඩිදියුණු කිරීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් බිලියනයක් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අපේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් තවත් වැදගත් කාරණයක් කියන්න ඕනෑ. අපි නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟන විට කළ යුතු එක් දෙයක් තමයි, මේ රටට කරන ආනයන අධෛර්වත් කිරීම. ඒ වාගේම, අපේ රටේ නිෂ්පාදනය වැඩි කළ යුතුයි. අපේ ආණ්ඩුව බලයට එනවිට මේ රටේ ටින් මාළු පරිභෝජනයෙන් සියයට 99ක්ම ආනයනික ටින් මාළු. මේ රට තුළ නිෂ්පාදනය කළේ සියයට 1ක් පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනවිට මේ රටේ ටින් මාළු පරිභෝජනයෙන් ආනයනය කරන්නේ සියයට 1ක් පමණයි. එසේ ආනයන කරන්නේත් සූරියකාන්ත තෙල් - sunflower oil - සහිත ටින් මාළු. අපේ රජය, සියයට 99ක්ව පැවැති ටින් මාළු ආනයනය නතර කරලා, මේ රටේ නිෂ්පාදනය වර්ධනය කර තිබෙනවා. මේ වනවිට අපි මේ රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟා තිබෙනවාය කියන කාරණය පෙන්වන්න පුළුවන් ප්‍රධාන සලකුණක් තමයි මේක. දැන් ඒවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ නේ. විපක්ෂය මේ ගැන නොදන්නවා නොවෙයි, දන්නවා.

මේ අය වැය විවේචනය කළාට, මේ සභාවෙන් එළියට ගියාට පස්සේ කියන්නේ මේ අය වැය හොඳයි කියලා. මම කියන්නේ, මෙතුමන්ලාගේ හෘදය සාක්ෂිය පරීක්ෂා කරන්න කියායි. විපක්ෂයේ හෘදය සාක්ෂිය ECG පටියකට අරගන්න කියන එකයි මම කියන්නේ. එතකොට බලන්න පුළුවන්, ඒ ECG පටියේ සටහන් වෙන්නේ මොනවාද කියලා. හෘදය සාක්ෂිය කියනවා, ඒක ඇත්ත කියලා. මෙතැනින් එහාට ගියාම මේ අය වැය සුපිරියි. මේ සභාව ඇතුළට ආවාට පස්සේ මේ අය වැය වැඩක් නැහැ. මෙතැනින් එළියට ගියාම එක කථාවක් කියනවා, මේ පැත්තට - Chamber එකට - ආවාම තවත් කථාවක් කියනවා. මොකක්ද, මේ කථාව? ඒ නිසා මේ අය වැය සාර්ථක අය වැයක් බවට ඔවුන්ගේ හෘදය සාක්ෂියත් සාක්ෂි දරනවා. මේක නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟන අය වැයක්.

ඒ වාගේම, අපේ රටේ වැවිලි කර්මාන්තය ගැනත් අපි බලමුකෝ. අය වැය ලේඛනය අනුව තේ වගාව සඳහා පොහොර ලබා දීමට රුපියල් බිලියන 5ක් වෙන්කර තිබෙනවා. රබර් වගාව සඳහා පොහොර ලබා දීමට රුපියල් බිලියනයක් වෙන්කර තිබෙනවා. මේවා ලබා දෙන්නේ මොකටද? නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා සහන ලබා දීමක් මේ කරන්නේ.

අනෙක් කාරණය මේකයි. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මුහුණ දෙන්න වුණු තත්ත්වය ලෙහෙසි නැහැ නේ. Cyclone එකක් ආවා. ඒකෙන් විපතට පත් ජනතාවට අපි උදව් කළා. "දිට්වා" සුළි කුණාටුව ඇති වුණා. ඒ අවස්ථාවේදීත් ජනතාවට උදව් කරන්න සිදු වුණා. "El Niño" කියනවා, "La Niña" කියනවා. අපි ඒවාටත් මුහුණ දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" බෙදවාචකයෙන් සමහර ප්‍රදේශවල නිවාස විතරක් නොවෙයි, මහ පොළොවත් එක්කම කඩාගෙන ගියා. සුනාමියෙන් foundation එකත් එක්කම නිවාස සම්පූර්ණයෙන්ම ගලවාගෙන ගියා තමයි. "දිට්වා" ව්‍යසනයෙන් ඇතැම් ප්‍රදේශවල මහ පොළොවත් විනාශයට පත් වුණා. නිවාස අහිමි වූ ජනතාවට අපි අඩුවෙන් සැලකුවේ නැහැ. නිවසක් ඉදිකර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 50ක මුදලක් ලබා

දුන්නා. මහ පොළොව නාය ගියා නම් ඒ සඳහාත් රුපියල් ලක්ෂ 50ක මුදලක් ලබා දුන්නා. ඒ අනුව එවැනි අවස්ථාවලදී රුපියල් කෝටියක් ලබා දුන්නා. ගෙදරක දුවෙක් කසාද බන්දනකොට - දීග දෙනකොට - දෙමව්පියන් දැවැද්ද සඳහාවත් එවැනි මුදලක් දෙන්නේ නැහැ නේ. නමුත්, මේ ආණ්ඩුව එහෙමත් කළා.

අනික් කාරණය මේකයි. මෙය මැද පෙරදිග අර්බුදයක් පවතින කාල සීමාවක්. විදේශ රටවල තෙල් ලීටරයක මිල කීයද කියලා බලන්න. ඒ රටවල තෙල් ලීටරයක මිල ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරලා බලන්න. එවැනි අර්බුදයක් පවතින අවස්ථාවකදීත් අපි තෙල් මිල පාලනය කරගෙන පවත්වාගෙන යනවා. එවැනි තත්ත්වයක් තුළත් ජනතාවට කෙටි කාලීන සහන ලබා දීමට හැකි වීම මොන තරම් හොඳ දෙයක්ද? ඒක විපක්ෂය තේරුම් ගන්න ඕනෑ. ඔවුන් මේ ගැන නොදන්නවා නෙවෙයි, දන්නවා. පැත්තකට ගියාම අය වැය හොඳයි කියලා කථා කරනවා. නමුත්, මෙතැනට ආවාම ඒක විවේචනය කරනවා.

ඒ විතරක් නොවෙයි, මෙය අපි ආර්ථිකය ගොඩනඟමින් ඉදිරියට යන මොහොතක්. ඒ වාගේම, ජනතාවට සහන ලබා දෙන මොහොතක්. ඇත්තටම අපි දන්නවා, පසුගිය කාලයේදී "නිවසක්" කියන එක තමයි ජනතාවට සිහිනයක් බවට පත් වෙලා තිබුණේ කියන එක. සමහර අවස්ථාවල සමහර ඇමතිවරු එක් එක් තැන්වල නිවාස හැදුවා. අක්කරයක භූමියක් ගත්තොත්, ඒ අක්කරය තුළ නිවාස 7, 8 හැදුවේ. ඒ නිවාස පොඩි ගිනි පෙට්ටි වාගේයි. ඒවායේත් පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ සඳහා ඇතැම් අවස්ථාවල රුපියල් ලක්ෂයක මුදලක් ලබා දුන්නා. හැබැයි, එයත් ආපසු ගෙවන්න සිදු වුණා. නමුත්, අපේ රජය බලයට පත්වුණාට පස්සේ නිවාස සංවර්ධනය සම්බන්ධයෙන් පැහැදිලි ඉලක්කයක් ඇතිව කටයුතු කරනවා. මේ රජය යටතේ නිවාස සංවර්ධන අධිකාරියට සහ නිවාස අමාත්‍යාංශයට ඉලක්කයක් තිබෙනවා. ඒ වාගේම ඉතාම පැහැදිලි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. එක් නිවසක් සඳහා රුපියල් මිලියනය බැගින් ලබා දෙමින් පසුගිය කාලය වනවිට නිවාස 16,000ක් ඉදිකර අවසන් කර තිබුණා. එම එක් නිවසක් සඳහා රුපියල් මිලියනයක් ලබා දී තිබෙනවා. ගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් එක් නිවසක් සඳහා රුපියල් මිලියන 1.5ක් - රුපියල් ලක්ෂ 15ක් - වෙන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ජනතාවට සැබෑ සේවයක් ලබා දෙන රජයක් වශයෙන් තමයි අපේ රට ගොඩනඟමින් ඉදිරියට යන්නේ. ලබන වර්ෂයේදී එක් නිවසකට රුපියල් ලක්ෂ 15 බැගින් ලබා දෙමින් තවත් නිවාස දසදහසක් ඉදිකිරීමේ ඉලක්කයක් අපට තිබෙනවා. ඒ වාගේම ඉන්දියානු නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. නිවාස කියන එක බොහොම වැදගත්. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ කටයුත්ත අපේ රජයෙන් සිදු කරනවා. ඒ සඳහා රුපියල් බිලියන 10ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම ප්‍රධාන අවශ්‍යතාවක් තමයි, ජලය. ජල සැපයුම සඳහා රුපියල් බිලියන 77ක් වෙන් කර තිබෙනවා. ඒ සඳහා රට පුරා ව්‍යාපෘති තිබෙන්නේ 12ක් වාගේ ප්‍රමාණයකුයි. ප්‍රධාන ව්‍යාපෘති අපි ක්‍රියාත්මක කරනවා. මේ මොහොත වනවිට අපි රටක් වශයෙන් ඉදිරියට යනවා. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට මම කියන්නේ මේ අය වැය සෑම ක්ෂේත්‍රයකටම සහන ලබා දෙන අය වැයක්, ඒ නිසා ඒ ගැන සාධාරණ විවේචනයක් කරන්න කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයට මෙවර අය වැයෙන් සහන විශාල ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා, ලබන වර්ෂයේ සිට ගාල්ල නගරය සංවර්ධනය කරන්න. මේ වනවිටත් ගාල්ල නගරයේ තිබෙන තැපැල් කාර්යාලය, පොලිසිය ඒ ස්ථානවලින් ඉවත් කරලා, අලුතින් නගරය සැලසුම් කරන්න මුදල් ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා. ඒ වාගේම දැනට ගාලු උරුම නගර සංවර්ධන සැලැස්ම යටතේ තිබෙන ගාල්ල බන්ධනාගාරය එම ස්ථානයෙන් ඉවත් කර බූස්ස ප්‍රදේශයේ ස්ථාපිත කරන්නත් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා.

ගාල්ල නගරයට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ජල ප්‍රශ්නය. විසල් ගාල්ල නගර ජල සම්පාදන කියන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 37,000ක පමණ මුදලක් වැය වෙනවා. එයින් රුපියල් මිලියන 3,000ක් අය වැයෙන් ලබා දෙන්න ගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. ඒ විධියට මෙවර අය වැයෙන් ගාල්ල නගරයට විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ වාගේම ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම නගරය සංවර්ධනය කරන්න වැය වන රුපියල් මිලියන 3,350න්, රුපියල් මිලියන 600ක මුදලක් මෙවර අය වැයෙන් ලබන වර්ෂය සඳහා වෙන් කර තිබෙනවා. ඊට අමතරව ගාල්ල හිනිදුමපත්තුවයි, මාතර මොරොවක්කෝරළයයි, රත්නපුර දිස්ත්‍රික්කයයි ඒකාබද්ධ කරලා ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා මැදිහත් වෙලා කරනු ලබන සංචාරක කලාපයක් තිබෙනවා. ඒ සංචාරක කලාපය වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම ගාල්ල දොඩංදුව ප්‍රදේශයේ කැස්බෑ මධ්‍යස්ථානයක් ඉදි කරන්නත් රුපියල් මිලියන 50ක් වෙන් කර තිබෙනවා. වරාය සංවර්ධනය සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 5,000ක මුදලෙන් ගාල්ල, හික්කඩුව, අම්බලන්ගොඩ ධීවර වරායන් 4 සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1,500ක මුදලක් වෙන් කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමා ගාල්ල දිස්ත්‍රික්කයට දක්වපු සැලකිල්ල පිළිබඳව දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මගේ ප්‍රණාමය පළ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8 කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.00]

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අපේ ආණ්ඩුවේ තුන්වැනි අය වැය කථාව ගරු ජනාධිපතිතුමා ඊයේ දිනයේදී ඉදිරිපත් කළා. විපක්ෂ නායකතුමා අද උදේ පාන්දර සභාවට ඇවිල්ලා විවාදයේ පළමුවැනි කථාව කරමින් ප්‍රකාශ කළා, ජනාධිපතිතුමා මොහොමඩ් අලී වාගේ ජනතාවගේ බඩට ගැහුවාය කියලා. හැබැයි, අපිට කියන්න තිබෙන්නේ, ජනාධිපතිතුමා මොහොමඩ් අලී වාගේ ගහලා තිබෙන්නේ ජනතාවගේ බඩට නොවෙයි, මේ විපක්ෂයේ ඔළුවලට කියන එකයි. දැන් විපක්ෂය මඤ්ඤං වෙන තරමටම වැදිලා තිබෙනවා. කියන්නේ මොකක්ද, කරන්නේ මොකක්ද කියලා තේරෙන්නේ නැති තරමට වාගේම අය වැය කථාව කියන්නේ මොකක්ද කියන එක තේරෙන්නේ නැති තරමට එතුමන්ලා කටයුතු කරලා තිබෙනවා. අපේ විපක්ෂ නායකතුමාගේ කථාව අස්සේ තිබුණේම මේකයි. ජනාධිපතිතුමා අය වැය ප්‍රකාශයේ වැදගත් දේවල් ඔක්කොම කියලා ඉවර වෙලා කිව්වා, ඔය මැටි පිළිමවලට ඉදිකටු ගහලා, නූල් අමුණලා එහෙම

[ගරු කංචන වැලිපිටිය මහතා]

නැත්නම් හූනියම් කරලා, මේ ආණ්ඩුව වටිටන්නවත්, මේ රට ගොඩනඟන්නවත් බැහැ කියලා. විපක්ෂ නායකතුමා අල්ලාගෙන තිබෙන්නේ එච්චරයි. මේ අය වැයේ හරය තේරුම් ගන්න බැරි තරමටම විපක්ෂය අසරණ වෙලා තිබෙන්නේ. ඒක නිසා අපි කියන්න ඕනෑ, මේ අය වැය කියන්නේ හුදෙක්, හුදෙකලා වූ අය වැයක් නොවෙයි කියන එක. ඉතිහාසයේ පැවති ආණ්ඩු ඒ වාගේ අය වැය ප්‍රකාශයන් ඉදිරිපත් කරන්න ඇති. හැබැයි, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව මේ අය වැය ඉදිරිපත් කරන්නේ 2025 අය වැයත්, 2026 අය වැයත්, 2027 සඳහා වන මේ අය වැයත් එකට සම්බන්ධ කරලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අපි ආණ්ඩු බලය ගන්නකොට මේ රට තිබුණේ කොහොමද කියලා. 2020ට පෙර අපි හිටියේ ඉහළ මැදි ආදායම් ලබන රටක් හැටියට. හැබැයි, 2020න් පස්සේ පහළ මැදි ආදායම් ලබන රටක් බවට අපි පත් වුණා. අපි ලෝකයේ නාමකරණයන්, ශ්‍රේණිගත කිරීම්වලින් පහළට ගියා. අපි ණය ගෙවා ගන්න බැරි රටක් බවට නම් කළා. එහෙම නම් කරලා තිබුණු රට අපි 2026 අවුරුද්ද වනවිට නැවත වතාවක් ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් කරලා තිබෙනවා.

2025, 2026 අය වැය ඉදිරිපත් කරලා මේ රට සංවර්ධනයේ දිශාවට යොමු කරපු නිසා තමයි, අපට ඒ දර්ශක ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ; ඒ ශ්‍රේණිගත කිරීම් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ වාගේම තමයි, 2026 Fitch ශ්‍රේණිගත කිරීම්වලින් අපේ ශ්‍රී ලංකාව CCC+ කියන තැන සිට දැන් B- කියන තැනට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි, Transparency International ආයතනය විසින් නිකුත් කරන ලද දූෂණ සංජානන දර්ශකය අනුව ස්ථාන 14කින් ඉදිරියට ඇවිල්ලා 107 වැනි ස්ථානයට පත්ව තිබෙනවා. ඒ වාගේම ගෝලීය සාම දර්ශකය අනුව අපි ස්ථාන 14කින් ඉදිරියට පැමිණ 67 වන ස්ථානයට පත් වුණා. ඒක නිසා මේ ආණ්ඩුව මේ අවුරුදු දෙක ඇතුළත ආර්ථික වශයෙන් සිදු කළ මේ වෙනස්කම් නිසා තමයි ලෝකයේ මෙවැනි තැනකට මේ රට ඔසවා තබන්න පුළුවන් වුණේ. ඒ සියලු දර්ශකත් එක්ක තමයි ජනාධිපතිතුමා 2027 අය වැය ඉදිරිපත් කළේ. විශේෂයෙන්ම රට පරිවර්තනීය යුගයකට අරගෙන යෑම අරමුණු කරගෙන තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එහිදී විශේෂයෙන්ම ආර්ථික ක්ෂේත්‍රය ගැන අවධානය යොමු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපේ රටේ ආර්ථිකය දැන් ස්ථාවර කර තිබෙන බව. අපි දන්නවා, ලෝකයෙන් එන කුඩා බාහිර බලපෑමකට වුණත් අපේ රට බිඳ වැටෙන තැනට පසුගිය දවස්වල පත් වෙලා තිබුණු බව. ඒ දවස්වල අපි කථාවට කිව්වා, ඇමෙරිකාවට හෙම්බිරිස්සාව හැදෙනකොට අපේ රටට නියුමෝනියාව හැදෙනවා කියලා. ලෝකයේ කොහේ හරි රටකට සිදුවන පොඩි බලපෑමක් - බාහිර කම්පනයක් - අපේ රටට දැනෙනවා. අපේ රටට ඒක තදින් දැනෙන තැනට පත් වෙලා තිබුණා. හැබැයි, මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක ඒ තත්ත්වය දැන් වෙනස් වෙලා තිබෙනවා. දැන් අපේ රටේ ඩොලර් බිලියන 7ක සංචිතයක් තිබෙනවා. ඒ මට්ටමට අපි ආර්ථිකය ස්ථාවර කර තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, ඇමෙරිකාව සහ ඉරානය අතර යුද්ධය නිසා මේ අවුරුද්ද තුළ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ශීඝ්‍රයෙන් ඉහළ ගිය බව. ඒ නිසා තෙල් ආනයනය කිරීම වෙනුවෙන් අතිවිශාල මුදලක් දරන්න සිද්ධ වුණා. 2025 මුළු වර්ෂය සඳහාම තෙල් ආනයනය වෙනුවෙන් ඩොලර් මිලියන 4,042ක් වැය කරනකොට මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසය වනවිට ඩොලර් මිලියන 4,487ක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ සඳහා අපට දැවැන්ත වියදමක් දරන්න සිද්ධ වෙලා තිබියදීත් ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා, ඩොලර් බිලියන 7ට වැඩි සංචිතයක් අපේ රට තුළ ගොඩ නහා ගන්න. ඒක නිසා තමයි කියන්නේ, ආර්ථිකය ස්ථාවර කරපු රටක් අපි දැන් ගොඩ නහා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළත්, ගිය අය වැය තුළදීත් අපි අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගැන කල්පනා කරලා තිබුණා. ඒ කර්මාන්තකරුවන්ට ඕනෑ කරන සහයෝගය අපි ලබා දෙමින් තිබුණා. මොකද, පසුගිය අර්බුද සමය තුළ අපේ රටේ සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර බිඳ වැටිලා තිබුණා. ඒ නිසා රැකියා අතිවිශාල ප්‍රමාණයක් අහිමි වෙලා තිබුණා. ඒකෙන් ආර්ථිකයට දැවැන්ත බලපෑමක් එල්ල වුණා. ඒ නිසා තමයි ගිය අය වැයේදී ජනාධිපතිතුමා තීන්දු කළේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගොඩ නහන්න ඕනෑ, මේ කර්මාන්තකරුවන් ගොඩ නහන්න ඕනෑ කියලා. ඒ නිසා ඒගොල්ලන්ට ඇප රහිත ණය ලබාදෙන වැඩ පිළිවෙළ, පොලී රහිත ණය ලබාදෙන වැඩ පිළිවෙළ, අඩු පොලියට ණය ලබාදෙන වැඩ පිළිවෙළ ආරම්භ කළා. ඒ අනුව 2026 අවුරුද්දේ විතරක් අපි පොලී සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 54,136ක් වෙන් කළා. ඒ වාගේම මේ අවුරුද්දේ රුපියල් මිලියන 97,100ක ණය ලබා දී තිබෙනවා. ඒ ව්‍යවසායකයන් ගොඩ නැඟීම වෙනුවෙන් ආණ්ඩුව දැවැන්ත කාර්යභාරයක් කළා. ඒකේ ඉදිරි පියවරක් හැටියට 2027 අවුරුද්දේ පොලී සහනාධාරය වෙනුවෙන් ද රුපියල් මිලියන 67,687ක් වෙන් කරද්දී ණය ලබා දීම වෙනුවෙන් රුපියල් බිලියන 174ක් වෙන් කර තිබෙනවා. ඒ කර්මාන්තකරුවන් ගොඩ නහා ගැනීම කෙරෙහි මේ ආණ්ඩුව අවධානය යොමු කර තිබෙනවා. ආර්ථිකයේ ඊළඟ පියවර තබනකොට ඒ ව්‍යවසායකයන් වෙනුවෙන් උදවු කරන්න ඕනෑ. ඒකට අදාළ වැඩ පිළිවෙළ මේ ආණ්ඩුව සකස් කරලා තිබෙනවා.

ඒ වාගේම ආයෝජකයන් සඳහා මේ අය වැයෙන් ඉඩ සලස්වා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, මෙතෙක් ඉතිහාසය තුළ වැඩිම ආයෝජකයන් ප්‍රමාණයක් ඇවිල්ලා තිබුණේ බස්නාහිර පළාත සහ බස්නාහිර පළාත ආසන්න පළාත්වලටයි කියලා. අපේ ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය ගත්තොත්, බස්නාහිර පළාත සියයට 42.4ක් දරනකොට වයඹ පළාත් සියයට 11.5ක් දරනවා. මධ්‍යම පළාත සියයට 10.7යි, දකුණු පළාත සියයට 9.3යි, සබරගමුව පළාත සියයට 7යි. ඉතුරු පළාත් ඔක්කෝගෙම සියයට 4.5ත්, 5ත් අතර දායකත්වයක් තිබුණේ. ඇත ගම්බද දිස්ත්‍රික්කවලට යනකොට, ඒ පළාත්වලට යනකොට ඒ පළාත්වල දුප්පත්කම වැඩිවෙන්න මෙන්න මේක බලපෑමක් වෙලා තිබෙනවා කියලා අපිට තේරෙනවා. ඒ කියන්නේ නිෂ්පාදන ආර්ථිකයකට ජනතාව දායක කර ගැනීමට නොහැකිවීම බලපා තිබෙනවා. ඒක නිසා ජනාධිපතිතුමා ඒක ගැන අවධානය යොමු කරලා මේ වසරේ කවුරු හරි අයෝජකයෙක් එහෙම දුර පළාත්වල ගිහිල්ලා ආයෝජනයක් කරනවා නම් අන්න ඒගොල්ලන්ට දෙන්න ඕනෑ සහන ගැන මේ අය වැයෙන් කථා කරලා තිබෙනවා. අපිට ඒක ඕනෑ. රටක් හැටියට රට ගොඩනඟද්දි, රටේ ජනතාවගේ ආර්ථිකය ගොඩනඟද්දි එවැනි වැඩසටහන් සකස් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

ඊළඟට ඩිජිටල්කරණය ගත්තොත්, අපේ දිස්ත්‍රික්කවල ඈත ගම්මානවලට ගියාම ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, phonesවලට සිග්නල් නැති එක. ඒක නිසා අපි ඩිජිටල් යුගයක් ගැන කථා කළාට වැඩක් නැහැ, ඒකට අදාළ වැඩ පිළිවෙළක් හදන්නේ නැතුව. ඒක නිසා ජනාධිපතිතුමා ඒ ගැන අවධානය යොමු කරලා මේ අවුරුද්දේ ඒකට රුපියල් මිලියන 9,000ක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, 2030 වෙනකොට ඒ හරහා සන්නිවේදන කුලුනු 700ත්, 800ත් අතර ප්‍රමාණයක් ඉදි කිරීමට සැලසුම් කර තිබෙනවා. ඒකට අනුව 2028 අවුරුද්දේ සන්නිවේදන කුලුනු 573ක් විතර ගොඩනඟන්න බලාපොරොත්තු වනවා. මෙන්න මේකෙදිත් අර වාගේම තමයි. නගරය ආශ්‍රිතව ජනගහනය වැඩියි. ඒ නිසා ඒ ප්‍රදේශයේ සන්නිවේදන කුලුනක් හදා ගත්තොත් ඒකෙන් වැඩි පාරිභෝගිකයන් ප්‍රමාණයකට ඒ සේවය සලසන්න පුළුවන්. ඒක නිසා ඒ ව්‍යාපාරිකයෝ ගම් මට්ටමට ගියේ නැහැ. තමන්ගේ සන්නිවේදන කුලුනු හදන ව්‍යාපාර වෙනුවෙන් ඒගොල්ලන් දුෂ්කර ප්‍රදේශවලට යන්නේ නැහැ. ඒක නිසා ජනාධිපතිතුමා මේ අය වැයෙන් තීන්දු කර තිබෙනවා, එහෙම දුෂ්කර ප්‍රදේශයකට ගිහිල්ලා ඒ සන්නිවේදන කුලුනු හදනවා නම් ඒගොල්ලන්ට යන වියදමෙන් සියයට 75ක්, එහෙම නැත්නම් රුපියල් මිලියන 35ක් දක්වා සහනාධාරයක් ලබා දෙන්න. ඒ ප්‍රදේශයට විදුලිය ලබා ගැනීම වෙනුවෙනුත් රුපියල් මිලියන 5ක් වෙන් කරන්න තීන්දු කර තිබෙනවා. ඒ නිසා අනාගතය ගැන හිතන අය වැයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. විපක්ෂය මේ අය වැයේ තිබෙන චූටි කොටස් අල්ලාගන්න උත්සාහ කළාට මේ අය වැය අලුත් පරිවර්තනයක් වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරපු, අන්න ඒ පරිවර්තනය වෙනුවෙන් දැක්මක් ඇතුව හදපු අය වැයක් කියන එක සිහි කරමින්, මේ අය වැයත් එක්ක එකතු වෙලා මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යමුයි කියලා අපේ රටේ සියලු ජනතාවගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.09]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැයේ වැරදිම දකිනවා, ඒකට බණිනවා කියලා කිව්වා. එහෙම එකක් නැහැ. අපි ඒකේ හොඳ පැත්තකුත් දැක්කා. ඒකේ හොඳ පැත්තට හොඳයි කිව්වා, වැරදි පැත්තට වැරදියි කිව්වා. අය වැය විවාදය ගැන කෙසේ වෙතත් අද විපක්ෂ නායකතුමාගේ කථාව ගැන තමයි වැඩිපුරම විවාදය තිබෙන්නේ. ඒක ටිකක් වැදිලා වැඩියි වාගේයි මට පෙනෙන්නේ.

මේ අය වැය හොඳයි. එහි හොඳ යෝජනා තිබෙනවා. වෛද්‍යවරුන්, නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරන අය, පොලිසියේ අය, ක්ෂේත්‍ර නිලධාරින්, බාහිර කථිකාචාර්යවරුන් කියන සියලුදෙනාට සොච්චම සොච්චම ඇවිල්ලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔව්. ඒගොල්ලන්ටත් ඇවිල්ලා තිබෙනවා. අපි ඒවා හොඳයි කියලා කියනවා. මේකෙන් කාට හරි දෙයක් ලැබෙනවා නම් ඒ ගැන අපිට සන්තෝෂයි. විපක්ෂයක් විධියට වාගේම දේශපාලනය කරන අපි ඒ සම්බන්ධයෙන් සන්තෝෂයි. මේක "හා", "හා" ප්‍රතිචාර ලක්ෂයක් වැටෙන ජාතියේ අය වැයක් නොවෙයි. මේක හොඳයි. එහෙම ප්‍රශ්නයක් නැහැ. හැබැයි සමහරු කිව්වා, ඊයේ අනුරාධපුරයේ matinee show එක පෙන්නුවේ මේකට "හා", "හා" වැටෙන එක නවත්වන්න කියලා. මම හිතන්නේ නැහැ, මේ ආණ්ඩුව එහෙම කරයි කියලා. නමුත් එහෙම කථාවකුත් ගියා. මේ අය වැය ඒ පැතිවලින් හොඳයි. ඉතින් හත්තිලව්වේ, ඒකේ නරක තිබෙනවා නම් ඒකත් අපි කියන්න ඕනෑ. ඒකත් අපේ වගකීමක්; විපක්ෂයේ වගකීමක්. ඒකට upset වෙන්න එපා. ඒකට තමයි අපි ඉන්නේ. ඒ නිසා ඒක ගැන කථා කරන්න අපිට අයිතියක් තිබෙනවා. ඒකටත් අවස්ථාව ලබාදෙන්න කියලා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

ආර්ථිකය ස්ථාවර වීමයි, වර්ධනය වීමයි කියන්නේ දෙකක්. ඒ දෙක තේරුම් ගත්තා නම් අපි කරන විවේචනය තේරෙනවා. ආර්ථිකය ස්ථාවර වීම ගැන අපි මොකුත් කිව්වේ නැහැ නේ. ස්ථාවරයි, ආර්ථිකය. ඒක හරි. ඒක අද නොවෙයි, 2024 ඉඳලා ස්ථාවර වුණා. එහෙම වුණේ නැතුව නොවෙයි. අපි ඒක දන්නවා. අපි ආර්ථික වර්ධනය ගැන කථා කළාම ඒක ගැන තරහ ගන්නට එපා කියන එක මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අය වැයක ප්‍රධානම ලක්ෂණය විය යුත්තේ මොකක්ද? අය වැය අතිරික්තය, අය වැය හිඟය, ප්‍රාථමික ගිණුම වැනි දේවල් ඇත්තටම ජනතාවට තේරෙන්නේ නැහැ. ජනතාවට තේරෙන්නේ මොකක්ද? තමන්ගේ කුස්සියට බඩු ටික ගෙනෙද්දි ඒකට යන වියදම ගැන තේරෙනවා. ගෘහ ආර්ථිකයට මේකෙන් සිද්ධ වුණු වාසිය මොකක්ද කියලා තේරුණොත් ඒක ජනතාවට තේරෙනවා. අය වැයෙන් ජනතාවට තමන්ගේ මිලදී ගැනීමේ ශක්තිය වැඩි කරගන්න යම්කිසි දෙයක් සිද්ධ වෙනවා නම් ඒක හරි. හැබැයි එහෙම වෙලා තිබෙනවාද කියන එකයි අපි අහන්නේ. බදු පනවලා සල්ලි ටික එකතු කරගෙන FD එකක් දාගෙන තියාගෙන ඉන්න එක හරියයිද, නැද්ද? ප්‍රාථමික ගිණුමේ ශේෂය හොඳයි කිය කියා කියනවා. මේ ගණන් හිලව් කිව්වාම වැඩක් තිබෙනවාද, ජනතාවට ඒවා තේරෙන්නේ නැත්නම්? ජනතාව මේක ආදරයෙන් වැලඳ ගන්නවා නම් විපක්ෂයක් විධියට අපිට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එහෙම වෙනවාද කියා මම අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණාව මෙයයි. අය වැයකින් මේ විධියට allocations කරන එක කාට වුණත් කරන්න පුළුවන්. මේ සභාවට ඇවිල්ලා කියවන්න නේ තිබෙන්නේ. ලියා දෙන එක පැය 5ක් නොවෙයි, පැය 10ක් හරි කියවන්න නේ තිබෙන්නේ. හැබැයි, මේ allocations කරන මුදල් ටික වියදම් කළාද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා නේ. ඒකෙන් නේ දළ දේශීය නිෂ්පාදිතයට මේ contribution එක ඇවිල්ලා මේ රට දියුණු වෙන්නේ. හැබැයි, ඒක සිද්ධ වෙනවාද කියලා අපි අහන්න කැමැතියි. නමුත්, ඇත්තටම එහෙම සිද්ධ වෙලා නැහැ. මේ අවුරුද්දේ අගෝස්තු වෙනකොට අපේ ප්‍රාග්ධන වියදම් ටික ඕනෑ නම් සියයට 30ක් විතර ඇති. මා හිතන විධියට එම ප්‍රමාණය සියයට 25ක, සියයට 26ක විතර මට්ටමේ තමයි තිබෙන්නේ. හැබැයි, මේ වසර අවසානයේදී ඒක සියයට සියයක් වෙනවා කියලා බලාපොරොත්තු වෙලා ඉන්නවා. එහෙම වෙන්න පුළුවන්ද, තව මාස දෙකකින්?

ඒ වාගේම, දැන් භාණ්ඩාගාරයේ cash plan එක - භාණ්ඩාගාරයෙන් නිකුත් වෙච්ච cash plan එක - අනුවම

[ගරු නීතිඥ විත්‍රාල් ප්‍රනාන්දු මහතා]

අගෝස්තු වෙද්දී තිබෙන්නේ සියයට 64යි. ඒක ඒ අයත් දන්නවා. මේ සියයට 64 කියන්නේ, එතැන ඉඳන් ඉතිරි සියයට 36 යනවා කියන එක නොවෙයි. ඒක ඒ කාලයට විතරක් නියම කරපු, plan කරපු එක. එහෙම නැතිව අගෝස්තු වෙද්දී ආයෙත් ඒක සියයට සියයක් වෙනවා නොවෙයි. රුපියල් බිලියන 774කින් තමයි මේ බිලියන 497ක් වියදම් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි මෙන්න මේක කියන්න කැමැතියි. එතුමා මෙතැන පැය 4ක්, 5ක් නොවෙයි, පැය 10ක් අය වැය ඉදිරිපත් කළත්, ඒක අහගෙන ඉන්න මිනිස්සු දන්නවා ද, මේ කියන ගණන්වලින් කීයක් මේ රට ඇතුළේ වියදම් වෙයිද කියලා? ඒක නේ ප්‍රශ්නය. එහෙම සිද්ධ වෙන්නේ නැහැ. පැය 4ක්, 5ක් නොවෙයි, පැය 6ක් කියෙව්වත් ආස මිනිස්සු ටික නම් අහගෙන ඉඳීවි. අපි අහගෙන හිටියා මිසක ඇත්තටම වෙන මොකෙක්වත් අහගෙන ඉන්නේ නැහැ. අපිත් අහගෙන හිටියේ අමාරුවෙන්. නමුත්, දැන් ඒ කියන වියදම් කිරීම සිද්ධ වෙන්නේ නැහැ. මේ දේවල් කරන්න ඇමතිවරුන්ට දැන් කාලය ඇති. මේ අය බලයට ඇවිල්ලා දැන් තුන්වැනි අවුරුද්ද යන්නේ. එහෙම නම් තීරණ ගන්න මේ කාලය දැන් හොඳටම ඇති. දැන් ඒ තීරණ ගන්න. ලේකම්වරු අත්සන ගහන්නේ නැහැ; තීරණයක් ගන්නේ නැහැ. Procurement committeesවල වැඩ කරන්නේ නැහැ. මිල දී ගැනීම් සිද්ධ වෙන්නේ නැහැ. මොකද, ලේකම්වරු බයයි හිරේ යන්න. මේ වෙන දේවල් එක්ක බැලුවාම ඒ මිනිස්සු කැමැති නැහැ මේ දේවල් කරලා හිරේ යන්න. ඒ අය risk එකක් ගන්නේ නැහැ. එතකොට මේ වැඩ නවතිනවා. වැඩ නැවතුණාම ප්‍රාග්ධන වියදම් ටික කර ගන්න බැරි වෙලා වැඩ නතර වෙනවා. මේ විධියට ගණන් ටික කියන්න නම් පුළුවන්. වැඩේ කරලා පෙන්වන්න කියන්නකෝ. මේ අවුරුද්දේ කරපු විධිය අපට පේනවා නේ. ඒ නිසා ආදායම වැඩි වුණා, වැඩි වුණා කියන්නේ නැතිව, මේ මුදල් වියදම් වෙන්නේ කොහොමද, මේ මුදල් අපේ රටේ ප්‍රගමනයට, අපේ රටේ සංවර්ධනයට දායක වෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපි පැහැදිලි කරගත යුතුයි.

මෙවර අය වැය කථාව කරපු පැය පහෙන්, පැය දෙකක් විතරම තිබුණේ පසුගිය අය වැයවල ඒවා නේද? ඒ ටික කපලා දැම්මා නම් ඊයේ අපට පැය දෙකකට කලින් යන්නත් තිබුණා. ඒ කියන්නේ, මෙවර අය වැයේ ගොඩක් තිබුණේ කලින් අය වැයවල සඳහන් වෙච්ච ඒවා. ඒ කියන්නේ, ඒවා කරලාත් නැහැ. මම නිකමට එකක් දෙකක් කියන්නම්. 2027 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැයේදීත් පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන ආර්ථිකයක් ගැන කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැයේදී කිව්වා, රාජ්‍ය පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිපත්ති කෙටුම්පත මේ වන විට සකසා අවසන් කර තිබෙනවා කියලා. 2026 වර්ෂය වෙනුවෙන්, 2025 අවුරුද්දේ නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කළ අය වැයේදී තමයි එහෙම කිව්වේ. එය 2026 වර්ෂය මුලදී ගේනවා කියලාත් කිව්වා. මෙය 2026 අවුරුද්ද වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැය පොතේ 17වැනි පිටුවේ සඳහන්ව තිබෙනවා. අවශ්‍ය කෙනෙකුට බලන්න පුළුවන්. ඊළඟට, 2027 අය වැය කථාවේ කියනවා, "ජාතික පර්යේෂණ හා සංවර්ධන පනත් කෙටුම්පත සකස් කර තිබෙනවා" කියලා. ඒක 2027 අය වැය පොතේ 23වැනි පිටුවේ සඳහන්ව තිබෙනවා. මේවා කිය කියා ඉන්නවා. මුදලක් වෙන් කරනවා; ඒක revise කරනවා. නමුත්, ඒක වියදම් කරන්නේ නැහැ. ආයෙත් මේ අවුරුද්දේ ඇවිල්ලා ඒක ගැනම කියනවා. 2028 අවුරුද්ද වෙනුවෙන් ලබන අවුරුද්දේ අය වැය කථාව කරාවි, පැය 7ක් විතර. මොකද, මේ ඉතුරු වෙච්ච ඔක්කෝම ටික නැවත නැවත කියවන්න ගියොත් ඒ තරම් කාලයක් යාවි.

ඊළඟට, කිව්වා ඩිජිටල් හැඳුනුම්පත ගැන. අද උදේ ගරු විපක්ෂ නායකතුමාත් මේ ගැන කිව්වා. 2026 අවුරුද්ද වෙනුවෙන්, 2025දී අය වැය ඉදිරිපත් කරමින් කිව්වා, "2026 වසරේ 3 වන කාර්තුවේදී පළමු ඩිජිටල් හැඳුනුම්පත නිකුත් කිරීමට කටයුතු කරනවා" කියලා. ඒක 2026 අය වැය පොතේ 15වැනි පිටුවේ සඳහන්ව තිබෙනවා. ඊළඟට මේ අවුරුද්දේදී කියනවා, "ඉදිරියේදී ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීමත් සමඟ සමස්ත රාජ්‍ය යන්ත්‍රණය පුරා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා" කියලා. ඊළඟ අවුරුද්දේ කියාවි, "අපි යන්න කලින් කොහොම හරි ඩිජිටල් හැඳුනුම්පත දෙනවා" කියලා. නමුත් ඒක දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම දැක්කා, බඩල්ගම මිල්කෝ කර්මාන්ත ශාලාවට 2026 අවුරුද්දේදීත් රුපියල් බිලියන 3ක් යොදවා තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2026 වාර්තාවේ තිබෙන්නේ, 2027 අවුරුද්දේ මුල එහි වැඩත් පටන් ගන්නවා කියලායි. හැබැයි, මේ පාර ඇවිල්ලා ආයෙත් රුපියල් බිලියන 3ක් දෙනවා. දැන් ඔක්කෝම රුපියල් බිලියන 6යි. මම දන්නේ නැහැ, කලින් වෙන් කරපු මුදල් වියදම් කළාද, නැද්ද කියලා. හැබැයි, රුපියල් බිලියන 18ක් වියදම් කරලා මේ කරපු විනාශය කියලා, අම්මෝ, ඒකටත් ඊයේ බැන්නා විනාඩි 10ක් විතර. කලින් ආණ්ඩුවලින් කරපු විනාශය කියලා බැන්නා. දැන් රුපියල් බිලියන 6ක් ආයෙත් දාලා තිබෙනවා. කෝ! දැන් මේවා කෙරෙන නිශ්චිත දවසක් නැද්ද? මේවා ගැන කියනවා; කෙරෙනවා ද කියන එක තමයි අපි අහන්නේ.

ඊළඟට, තනි ආයෝජන කවුළුව - Single Window එක - ගැනත් කිව්වා. මේකත් හැම අය වැයකදීම විකුණාගෙන කනවා. මේක සිද්ධ වෙන ප්‍රමාණයක් තිබෙනවා. නමුත්, ඒ කියපු ප්‍රමාණයට වෙන්නේ නැහැ. 2026දී රුපියල් මිලියන 2,500ක් දැම්මා. ඒක මෙතැනදී බොහොම ලොකුවට කිව්වා. ඊට පස්සේ ඒක revise කළා රුපියල් මිලියන 500ට. මොකද, ඒක වියදම් කර ගන්න බැරි බව තේරෙන්න ඇති. හැබැයි, මේ පාර ඇවිල්ලා ආයෙත් රුපියල් මිලියන 2,000ක් වෙන් කරනවා. ආයෙත් ඒ ගැන කියනවා. දැන් කොච්චර කල් මේක කිය කියා ඉන්නවාද දන්නේ නැහැ. හැබැයි, එක දෙයක් කියන්න ඕනෑ. දැන් තේ සහ පොල්වලට නොවැම්බර්වල ඉඳලා pilot project එක පටන් අරන් තිබෙනවා කියලාත් ආරංචියි. ඒ වාගේ හොඳ දේවලට අපි ස්තුතිවන්ත වෙනවා සහ ප්‍රශංසා කරනවා. ඒවා සම්බන්ධයෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ආයෙත් ඇවිල්ලා නම් මේ ගැන කියන්න එපා; මේක කරලා ඉවර කරන්න. දැන් මේ පාරත් රුපියල් මිලියන 2,000 වෙන් කර තිබෙනවා නේ. ඒ නිසා අපි යෝජනා කරන්නේ ඒ මුදල් වියදම් කරන්න කියලායි.

තඹුත්තේගම දුම්රිය ස්ථානය 2025දී විකුණාගෙන කෑවා. ඒක ගැන ගිය අවුරුද්දේ කථා කළේ නැහැ. මේ අවුරුද්දේ තඹුත්තේගම කියන්නේ නැතිව, සම්පූර්ණ දුම්රිය ස්ථාන හඳන්න රුපියල් මිලියන 2,000ක් වෙන් කරනවා කියලා සඳහන් කළා. තඹුත්තේගම දුම්රිය ස්ථානය සම්බන්ධයෙන් 2025දී කිව්වේ මොකක්ද? ඒ ආශ්‍රිතව ආර්ථික මධ්‍යස්ථානය තිබෙන නිසා එතැනින් බඩු ටික පටවලා, නිෂ්පාදන පටවලා කොළඹට එවන්න ඕනෑ කිව්වා. ඒ වෙනුවෙන් තඹුත්තේගම හදන එක ඉතාම ලේසියි කියලා කිව්වා. හැබැයි, දැන් පොඩ්ඩක් හදනවා. මිනිසුන්ට එහා මෙහා යන්න platform එකක් එහෙම හදනවා. දැන් 2027 අය වැයත් ඇවිල්ලා. දැන් තඹුත්තේගම විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ එළවලු ටික කොළඹට එන්නේ කෝච්චියෙන්ද දන්නේ නැහැ. මේක තමයි ඇත්ත කථාව. අපි බැන්නාට, මහින්ද රාජපක්ෂ මහත්මයා අඩුම ගණනේ හම්බන්තොටට හරි දෙයක් කළා; මෛත්‍රීපාල සිරිසේන මහත්මයා, පොළොන්නරුවට හරි දෙයක් කළා. මේ මනුස්සයා ගමත් රවට්ටනවා නේ. ගමත් රවට්ටන මිනිහාට රට කියන්නේ මොකක්ද? අග්ගලාවක් ගිල්ලා නම්,- මේවා, මිනිස්සු කියන කතන්දර. මම මිනිස්සුන්ටත් කියන්නේ මේකයි. මම නම් ආයෙත් පැය 7ක, 8ක කථා අහගෙන ඉන්නේ නැහැ. මේකේ ගොඩක් තිබෙන්නේ වැඩක් නැති ඒවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්මලාන ගුවන් තොටුපොළ ගැනත් කිව්වා නේ. අනේ, ඒවා කරන්න. ඒ ගැන කියලා අන්තිමට මොකක්ද කිව්වේ? අන්තිමට අපේ පැත්ත බලලා කිව්වා, ඒකට ඔයාලගේ, පාර්ලිමේන්තුවේ අවසරය ඕනෑ කියලා. මේ පාර්ලිමේන්තුවට උඩින් plane යන්න දෙන්නේ නැතිලු, no-fly zone එකක් තිබෙනවාලු. ඒ නිසා ඒකට අපෙන් අවසර ඉල්ලනවා. අපෙන් අහලා නේ, මේ අවුරුදු දෙකේ ඔක්කෝම කෝලම් කළේ. එහෙම එකක් නැහැ. අපි ඕනෑ නැහැ, ඒක කරන්න. කවුද, flight routes තීරණය කරන්නේ. සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් ඒක තීරණය කරනවා. ඒක කාගේ අතේද තිබෙන්නේ? ආරක්ෂක බාධාවක් තිබෙනවා නම් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒකට අවසර ගන්න පුළුවන්. ඒක අපෙන් අහ අහා ඉන්න ඕනෑ දෙයක් නොවෙයි නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
හැබැයි, එතුමා මේකේ ඇතුළේ කථා කරන වෙලාවට නම් flights යවන්න එපා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒක තමයි. කථා කර කර ඉන්න වෙලාවට ගියොත් නම් ඒවා ඔළුවට වැටෙයි, කියන බොරුවලට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 ජනවාරි 5වන දා - දැන් නොවෙයි - ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, "අපි මේ no-fly zone එක අඩු කරනවා, මේක ආරක්ෂාවට තර්ජනයක් නොවෙයි, මේ no-fly zone එක නැති කරන්න අපට අවශ්‍ය නැහැ, අපි ඒක අඩු - reduce - කරනවා" කියලා. "පාර්ලිමේන්තුවෙන් ඒකට කිසිම විරෝධයක් නැහැ" කියලාත් එතුමා කියලා තිබෙනවා. ඒක, පත්තරේ සඳහන්ව තිබෙනවා. "අකුරේගොඩ ගුවන් හමුදා මූලස්ථානය තිබෙන නිසා - මේ ළඟ නේ, එහා පැත්තේ නේ තිබෙන්නේ - ආරක්ෂාව සම්බන්ධයෙන් අපි මේක evaluate කරගෙන යනවා" කියන එක එතුමා ජනවාරි මාසයේ කියා තිබෙනවා. ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා - පාර්ලිමේන්තුව උඩින් flights යන එක විපක්ෂය නවත්වා ගෙන ඉන්නවා වාගේ - අපේ දිහා බලාගෙන අර විධියට කියනවා. ඒක පුදුම කථාවක්. තමන්ගේ අතේ ආණ්ඩුව තියාගෙන මේවා කිය කියා ඉන්නේ නැතිව කරන්න. මෙතැනට ඇවිල්ලා මේවා කියලා වැඩක් නැහැ. මොකද, අපි මේවා කරන්නේ නැහැ. අපට කමක් නැහැ, flights නොවෙයි මොනවා ගියත්. අපට ප්‍රශ්නයක් නැහැ නේ.

මෙතැන ඉන්නවා, උපාලි පන්නිලගේ මැතිතුමා. මම හිතන විධියට, එතුමා ඇමති කෙනෙක් වෙන්න ඇති. එතුමා අද ලස්සන වැඩක් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා ඇමති කෙනෙක්ද? මම දන්නේ නැහැ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
වෙන්න ඇති.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඔව්, ඇමතිවරයෙක්.

එතුමා ලෝක බැංකුවෙන්, IMF එකෙන්, ADB එකෙන් කියලා කොළ වගයක තිබුණු දේවල් කියෙව්වා. එතුමා, තමන්ට ඕනෑ ටික කියලා තමන්ට අවශ්‍ය තැනින් නවත්වලා, ලස්සනට පැනලා ගියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා ඉතාම ලස්සනට ඒක කළා. මම ඒක පෙන්වන්නම්කෝ. එතුමා කිව්වා, "Sri Lanka Poverty and Equity Brief" වාර්තාව ගැන. මේක, World Bank Group එකේ වාර්තාවක්. මම ඉස්සෙල්ලාම එතුමා කියවපු ටික කියන්නම්කෝ. එතුමා කිව්වා, I quote:

> "Sri Lanka's macroeconomic rebound has yet to translate into a recovery in household welfare."

අපිත් කියන්නේ ඒක තමයි. හැබැයි, එතුමාට "yet" කියන කෑල්ල තේරෙන්නේ නැහැ. ඒ නිසා "yet" කියන කෑල්ල දමලා එහෙමම ඇරලා දැම්මා. ඒක තවම වෙලා නැහැ කියන එකයි ඒකෙන් කියන්නේ. නමුත් එතුමා ඒක කිව්වා. නමුත් එතුමා අල්ලා ගත්තේ මෙන්න මේ කෑල්ල, I quote:

> "Poverty is projected to decline from 16.9 percent in 2025 to 15.8 percent in 2026..."

හරි, ඒකේ එහෙම කියලා තිබෙනවා. ඒ කෑල්ල කියවන්න ගිහිල්ලා තමයි එතුමා නා ගත්තේ. එතුමා එහෙම කියලා නැවැත්තුවා. ඒකේ ඉතුරු ටික මම කියන්නද? ඉතුරු ටික තමයි, I further quote:

> "....continuing the recovery that began in 2024, but to remain above its 2019 level of 11.5 percent until 2028. The recovery has also been unequal: poverty is two to three times higher outside the Western Province, where most economic activity is concentrated."

මේ තිබෙන්නේ, දැන් ඉහළ මැදි ආදායම් රටක් වුණේ කොහොමද කියලා. තමන්ගේ හොඳම හෙන්චයියන් ටිකට සල්ලි එකතු කර ගන්න දීලා - දුප්පතාට දුප්පත්කමටම ඉන්න දීලා - ඒ ඔක්කෝම එකතු කරලා ජනහගනයෙන් බෙදුවාම ඉහළ මැදි ආදායම් රටක් වෙලා. මේ තිබෙන්නේ කරපු විධිය. අපි නොවෙයි ඒක කියලා තිබෙන්නේ. එතුමා ඒක කිව්වේ නැහැ, තිබෙන තක්කඩිකමට. මේකේ ඔක්කෝම දේවල් ලියලා තිබෙනවා. මම මේකේ තිබෙන ඔක්කෝම කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, මේකේ ගොඩක් දේවල් තිබෙනවා. මේක තමයි ඉහළ මැදි ආදායම. ඉහළ මැදි ආදායමට ගියා කියන එක ජනාධිපතිතුමාට තේරෙන විධිය මම කියන්නම්. මේක හරිම සංවේදී කාරණයක්. එතුමා කිව්වා, අපි ඉහළ මැදි ආදායම් රටක් වුණු නිසා තමයි මරණ දඬුවම නියම වෙලා හිටපු අනෝජන් පවා නිදහස් කර ගන්න අපට පුළුවන් වුණේ කියලා. ඒක හරි. එය ඒ සඳහා දශමයක් හරි හේතු වුණා නම්, අපි ඒ සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. ඒක තමයි කළ යුතුව තිබුණේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Phone call එකෙන් ආවේ.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒ වාගේම අපේ ෆයිසර් මුස්තාපා මැතිතුමාටත්, උපුල් කුමරප්පෙරුම මැතිතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලාටත් බොහොම ස්තුතියි. ඔබතුමන්ලා ඒක කළා. ඒකේ credit එක ගන්නකෝ. ඒකට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේක ණය ගැනීම වෙනුවෙන් තිබෙන එකක්. නමුත් එතුමා ඒකත්

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

අල්ලලා එහෙම කිව්වා. කොහොම හරි ඒක සිද්ධ වුණා නේ. කමක් නැහැ. ඉහළ මැදි ආදායම් රටක් බවට පත් වුණේ ඔන්න ඔය විධියටයි කියන එක මතක් කරන්න කැමැතියි.

ඊළඟට උපාලි පන්නිලගේ මැතිතුමා, World Bank එක සම්බන්ධයෙන් කියපු එක මම එතුමාගේ වචනයෙන්ම කියන්නද? එතුමා ඒ ගැන කියාගෙන කියාගෙන කියා. මේක, හරිම විනෝදයි. මේ අහන්නකෝ. මේ කියන්නේ එතුමාගේම වචනයෙන්. "2026 වර්ෂයේ ආර්ථික වර්ධනය සියයට 4.4යි කියලා පුරෝකථනය කරලා තිබෙනවා. 2027 වසරේ ආර්ථික වර්ධනය ඒ වාගේම සියයට 4.2කට වර්ධනය වෙනවා කියලා පුරෝකථනය-" *[බාධා කිරීමක්]* 4.2ට කොහොමද වර්ධනය වෙන්නේ?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අඩු වෙනවා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒක නේ. වර්ධනය වෙන්නේ කොහොමද, දශම දෙකක් අඩු වුණාම? දැන් බලන්නකෝ, මේක. මේ එතුමාගේ වචන. මම කියන ඒවා නොවෙයි. "ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මොකක්ද කියන්නේ? 2025 ආර්ථික වර්ධනය සියයට 5යි. 2026 යම් පසුබෑමක් තිබුණත් සියයට 5.4යි." කොහොමද, 5.4 අඩු වෙන්නේ? 4යි දශම ගණනක් නේ. 5.4 නොවෙයි. ඒක වැරදියි. දැන දැන බොරු කියනවා. ඊළඟට එතුමා කියනවා, "ඒ වාගේම,....." ඒ වාගේම කියලා නැවැත්තුවා. මම හිතුවා, 2027 එකත් ඒ ගැම්මටම කියයි කියලා. ටක් ගාලා නැවැත්තුවා. ඇයි දන්නවාද නැවැත්තුවේ? 2027දී සියයට 3.7යි. බලන්න ඒ වීඩියෝ එක. හරිම කැතයි. දැන දැන බොරු කියන්න එහෙම පුළුවන්ද? ටක් ගාලා නැවැත්තුවා, වැරදිලා. ඉතින් ඊට පස්සේ- *[බාධා කිරීම්]* සියයට 3.7 නොවෙයි නම් කියන්නකෝ නැගිටලා. ඉතින්, ඒ කොළේ තිබ්බ එක කියෙව්වා නම් රෙදි ගැලවෙනවා.

ආසියානු සංවර්ධන බැංකුව ගැනත් එතුමා කිව්වා; ඔන්න බලන්න. එතුමාගේ වචන. මගේ වචන නොවෙයි. "ආසියානු සංවර්ධන බැංකුවෙන් මොකක්ද කියන්නේ? 2024 සහ 2025 දෙකේම ආර්ථික වර්ධනය සියයට 5යි." 2024 ඒවාත් අරගෙන, මේගොල්ලන්ට.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කලින් ආණ්ඩුවේ ඒවාත්.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඔව්. සියයට 5යිලු. ADB එක මොකද කියන්නේ? 2025දී සියයට 5යි. 2026දී සියයට 4යි. ඉතින් අඩු වේගෙන යන එක කියවනවා. *[බාධා කිරීමක්]* හරි. ඉන්න, ඉන්න. *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න. *[බාධා කිරීමක්]* ඉන්න. 2027දී සියයට 4.2යි. *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න. 5 ඉඳලා 4.2ට ආවාම කොහොමද ධන වෙන්නේ? මොකක්ද මේ කියන්නේ? ඒ නිසා මේ තමන්ගේ බැරිකම කියලා තිබෙන වාර්තා අරගෙන ඇවිල්ලා උජාරුවෙන් කියවලා,- ඒක කියවා ගන්නත් බැහැ. ඒක බොහොම අමාරුවෙන් කියෙව්වේ. ඉතින් ඒ නිසා- *[බාධා කිරීමක්]* ඉතින්, 5 ඉඳලා 4ට ධනද? මට තේරෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* සියයට 1ක් සෘණ. *[බාධා කිරීමක්]* ඒක තමයි මම කියන්නේ. මේ තනිකර බොරු.

මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොච්චර වෙලාව තිබෙනවාද දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි හතරක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
හොඳයි.

ඉතින් අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ කාරණයත්. ජනමාධ්‍ය වෙනුවෙන් අපි පෙනී ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාම සන්තෝෂයි, නලින්ද ඇමතිතුමාගේ විෂයය, ජනමාධ්‍ය වෙනුවෙන් මුදල් වෙන් කිරීම ගැන. ඒ සම්බන්ධයෙන් මේ රටේ ජනතාව වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙනවා. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රුපියල් මිලියන 400ක් වෙන් කරලා තිබෙනවා. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට රුපියල් මිලියන 489ක්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 384ක්, ඒ වාගේම සංගීත උළෙල සහ විනෝද චාරිකා වැඩසටහන් සඳහා MTV Channel (Pvt.) Limited එකට රුපියල් මිලියන 104ක් වශයෙන් ජනතාවගේ මුදල් වෙන් කරනවා කියලා- සමාවෙන්න, ඒක මේ අවුරුද්දේ එකක්. ලබන අවුරුද්දට කොච්චර වියදම් කරන්න ඉන්නවාද දන්නේ නැහැ. නමුත්, ජනමාධ්‍ය වෙනුවෙන් වෙන් කරන ඒවා සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, ජනතාවගේ මුදල්. ඒක බොහොම හොඳයි. ඒ සම්බන්ධයෙන් අපි ප්‍රශංසා කරන්නට කැමැතියි.

අවසාන වශයෙන් මම හිතන්නේ එතුමා බුදුහාමුදුරුවන්ටත් වඩා අපට බණ දේශනාවක් කරලා, ඉතාම ලස්සනට අපේ සිත් නිවලා ගියා. කාලාම සූත්‍රය ගැන එතුමා විශේෂයෙන් සඳහන් කළා. කෝසල ජනපදයේ කේසපුත්ත ගමට වැඩම කළ වෙලාවේ කාලාම කුමාරවරුන්ට උන්වහන්සේ ඒ සූත්‍රය දේශනා කළේ, යම් හේතුවකට. මොකක්ද හේතුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මම දන්නා විධියට මේ කියන්නේ. හේතුව මේකයි. නෙක නෙක ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඇවිල්ලා තමන් විතරයි හරි, තමන්ගේ දහම විතරයි හරි, වෙන එකෙක්වත් කියන එක හරි නැහැ කියලා හරි කියපු නිසා තමයි උන්වහන්සේට ඒ සූත්‍රය දේශනා කරන්න වුණේ. ඉතින් මේ ගොල්ලෝ මේ කියන්නේ මොකක්ද? "තමන් විතරයි හරි, තමන් ඇරෙන්න අනෙක් ඔක්කෝම හොරු, අනෙක් ඔක්කෝම මංකොල්ලකාරයෝ, අනෙක් සියලුදෙනා වැරදිකාරයෝ, දවසක් හරි ඇමතිකමක් කළා නම්, ඌ හොරා, ඒගොල්ලන් විතරයි කරන්න ඕනෑ" කියලා නේ. මේගොල්ලන්ට තමයි කාලාම සූත්‍රය කියන්න ඕනෑ. තමන් විතරක් හරි නොවෙයි. ඒ නිසා ජනතාවට අපි කියනවා, තමන්ගේ මනස වෙහෙසලා, තමන්ගේ මොළය කල්පනා කරලා බලන්න කියලා. මොකද, උන්වහන්සේ දේශනා කරපු වචනවලින්ම මේ කියන දේවල්වලත් ඇත්තක් තිබෙන්නත් පුළුවන්, නැත්තක් තිබෙන්නත් පුළුවන්. ඒ නිසා මේ කට උල් කරලා අත දික් කරලා මේ කියන ඒවායේත් ඇත්තක් තිබෙන්නත් පුළුවන්, නැත්තක් තිබෙන්නත් පුළුවන්. ඒ නිසා පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. ඉතින් එතුමා කාලාම සූත්‍රය ගැන කියපු නිසා මමත් එතුමාට මතක් කරන්න කැමැතියි, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය කියලා එකකුත් තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒකෙන් කියන්නේ මොකක්ද? පොඩි සාමණේරයන් වහන්සේලාට බොරු කීමේ ආදීනව උගන්වනවා. බොරු කියන්නේ, නිකම් බොරු නොවෙයි. දැන දැනම කියන බොරුවල ආදීනව උගන්වන්නේ, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන්. උන්වහන්සේ ඒකේ කියනවා ඉතාම ලස්සන උපහැරණයක් අරගෙන, හිස් වතුර භාජනයේ අන්තිම වතුර ටික බිම හෙළුවා වාගේ පුද්ගලයෙකුගේ ගුණ ධර්ම නැති වෙලා යනවාය කියලා, දැන දැන බොරු කිව්වොත්. ඒක තමයි ඇත්ත කථාව, උන්වහන්සේ දේශනා කරලා තිබෙන. ඉතින් ඒකෙන් ගන්නට තිබෙන්නේ මොකක්ද දන්නවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ සූත්‍රයේම අවසානයේ දේශනා කරනවා උන්වහන්සේ, "යමෙක් දැන දැන, ලජ්ජාවක් නැතුව බොරු කියනවා නම්, ඔහුට කළ නොහැකි පාපයක් නොමැත" කියලා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අය වැය විවාදය කියන්නේ ඉතාම වැදගත් විවාදයක් බව. දැන් මෙතුමන්ලා කියනවා නේ, අය වැය ඉදිරිපත් කරද්දී බොහොම අමාරුවෙන් අහගෙන හිටියා කියලා. අමාරුවෙන් හරි, කොහොම හරි අහගෙන ඉන්න ඕනෑ. මොකද, රටේ ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා වශයෙන් තමයි ඒ කථාව කළේ. එතුමා ඒ අය වැය කථාව කරනකොට අපි දැක්කා, මේගොල්ලන් හිනා වෙවී කථා කරනවා. හිනා වෙවී කථා කරනවා වාගේ පෙනුණත් අපි දන්නවා, ඒ එන්නේ හීන් කෙඳිරියක් කියලා. ගිය අවුරුද්දෙත් කිව්වා, සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළාට වැඩ කෙරිලා නැහැ, සියයට 40යි කෙරිලා තිබෙන්නේ කියලා. මම ඒ ගැන මුලින්ම කියන්නම්. මොකද, මෙතුමන්ලාට සංඛ්‍යාලේඛන කොහොමත් දිරවන්නේ නැති නිසා.

අය වැයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් 2025 අවුරුද්දේ සියයට 76ක් භාවිත කර තිබෙනවා. මම කියන්නම්, මෙතුමන්ලා උජාරුවෙන් කියන 2024 අවුරුද්දේ වියදම් කරපු ගණන ගැන. වියදම් කර තිබෙන්නේ, සියයට 54යි. 2023 අවුරුද්දේදී සියයට 64යි. ඒ නිසා අද කියන ඒවා ගැන ලබන අවුරුද්දේ අපි කියන්නම් සංඛ්‍යාලේඛනත් එක්ක. නිකම් කටට ආවාට අමාරුවට, හිතේ වේදනාවට දේවල් කියන්න එපා කියලා මම විපක්ෂයට කියනවා.

අනෙක් එක තමයි ඔබතුමන්ලාට අය වැය ඉදිරිපත් කරන්න බැහැ නේ, ඔබතුමන්ලා පැරදිලා නේ. පැරදිලා, කුල්ල කුජීත වෙලා තවදුරටත් කුජීත වෙන විධියට තමයි යන්නේ. ගිය පාර අය වැය විවාදයේදී මුලින්ම කථා කළා හර්ෂ ද සිල්වා මැතිතුමා. එතුමා කථා කරපු ගමන් කිව්වා, දැන් භාණ්ඩාගාරය පිරී ඉතිරිලා, සල්ලි උතුරන්න තිබෙනවාලු, අපට වැරදුණා කියලා. මෙවර ඊටත් වඩා අපි ආර්ථිකය ගොඩ දාලා තිබෙන නිසා එතුමාගෙන් ඒ වාගේ කථා කියැවෙයි කියලා හිතලා තමයි විපක්ෂ නායකතුමා අය වැය විවාදයේ මුලින්ම කථාව කළේ. ඒගොල්ලන්ම කියනවා ඒක හරබර කථාවක් කියලා. අපට නම් ඇහුණේ හැමදාම කරන ජරබර කථාව. ජරබර සද්දෙ තමයි අපට නම් ආවේ. 2021 අය වැය විවාදයේ මුලින්ම කථාව පටන් ගත්තේ හර්ෂද සිල්වා මන්ත්‍රීතුමා. 2022දීත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. 2023දීත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. 2024දී ඉරාන් වික්‍රමරත්න හිටපු මන්ත්‍රීතුමා. 2025දීත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. 2026දීත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. 2027 එකේදි අන්න වෙනස් වුණා. හරබර එක ජරබර වුණා. හැබැයි, ඉතින් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් වෙනදා කරන කථාව මෙවර නම් කරන්න වෙන්නේ නැහැ. අපි දන්නවා ඒකට වෙච්ච බලපෑම ගැන.

මේ වාගේ දුෂ්කර කාල වකවානුවක වුණත්, යුදමය තත්ත්වයත් එක්ක හෝමුස් වහලා තිබෙද්දීත් අපට අතිරේකව රුපියල් බිලියන 147ක් වෙන් කරන්න හැකියාව ලැබුණා. "දිට්වා" ව්‍යසනයෙන් පසු සහන සැලසීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් අපි රුපියල් බිලියන 500ක් වෙන් කරනු ලැබුවා. ඒ දේවල් වුණේ ආර්ථිකයේ ස්ථායීකරණය නිසා. ඉතින්, අර බොහොම අමාරුවෙන් අහගෙන හිටපු අයට අහන්න අමාරු වුණේ මෙන්න මේවා තමයි. ඉතිහාසයේ, අවුරුදු 67කට පස්සේ අඩුම අය වැය හිඟයක් වාර්තා කළා. වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් වසරක් තුළ ළඟා කර ගත්තා. වැඩිම අපනයන ආදායමක් ලැබුවා. වැඩිම සංචාරක පැමිණීම් ප්‍රමාණයක් තිබුණා. ණය ශ්‍රේණිගත කිරීම්වලදී අපි CCC+වල ඉඳන් B-වලට යනවා. ඉතින් ඕවා අහගෙන ඉන්න අමාරුයි තමයි. අමාරු වෙනවා. එතකොට අර චූටි චූටි හිනාවල් යනවා. ඒ අතර තව මන්ත්‍රීතුමෙක් කිව්වා, - එතුමා මෙතැන ඉන්නවා - අපි හොරු නොවෙයි, අපි කප්පම් ගන්නේ නැහැ නේ කියලා. අපට මතක් වෙනවා, චරිත් අබේසිංහ මහත්තයාව, වැලිගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමාව. ඒ වාගේ ගොඩක් අය මතක් වෙනවා. සාමාන්‍යයෙන් පුංචි කුඹියෙකුගේ කකුලක් විතර තරම් මොළයක් තිබෙනකොට මේවාත් චූටි වැඩ වාගේ පේනවා.

අපි දන්නවා, අපි ලබා තිබෙන්නේ සුවිශේෂ ජයග්‍රහණයක් කියලා. තව එක්කෙනෙක් කිව්වා නේ මාස 6ක් බලාගෙන ඉන්න කියලා. එතුමා මෙතැන ඉන්නවා. එතුමා කිව්වා, අප්‍රේල්වල විදුලිය කපනවා, තෙල් පෝලිම් ඇති වෙනවා කියලා. ඊට පස්සේ කියනවා, අනේ, විදුලිය කැපුවේ නැහැ, අපට හරි පුදුමයි, ඇයි ඒ කියලා. ඒ නිසා මාස 6ක් ගියාම එතුමාට ඔය දේම නැවත කියන්න වෙනවා. විශේෂයෙන්ම අපි දැක්කා, විදේශ ණය ගෙවා ගන්න බැරි වෙයි කියලා ජනතාව තුළ බියක් ඇති කර තිබෙන ආකාරය. හැබැයි, අපි ඒවා කරලා පෙන්නුවා. වැඩිපුරම ගෙවන්න තිබෙනවාය කියලා පෙන්වන 2028ටත් වඩා වැඩිපුර ගෙවලා තිබෙනවා. ඒ වාගේම තව විශේෂ කාරණා ටිකක් කියන්නම්.

බලශක්ති ක්ෂේත්‍රයේ ජාල පද්ධතිය ස්ථාවර කරන්න, ශක්තිමත් කරන්න රුපියල් බිලියන 26.5ක් අපි වෙන් කරලා තිබෙනවා. දැන් ඒගොල්ලන් හිතනවා නේ, අපි තමයි බලශක්තියට හොඳටම කළේ කියලා. සමහර අය එහෙම කියලා තිබුණා. ඒ හොඳටම කරපු අය rates හදලා තිබුණා, සූර්ය විදුලි ඒකකයක් සඳහා අවුරුදු 20ක් පුරා රුපියල් 30ට වඩා වැඩි ප්‍රමාණයක් ගෙවන්න. යම්කිසි දුරදර්ශී බුද්ධියක් තිබෙනවා නම් එහෙම දේවල් කරන්නේ නැහැ. කිව්වේ නම් කංචන තමයි හොඳටම කළේ කියලා. ඒ, කංචනලා කරපු දේවල් තමයි.

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ජනතාව මහා අගාධයක දාලා තිබුණා. සූර්ය විදුලි සංග්‍රාම කළා. හැබැයි, දවාලට නිපදවන සූර්ය විදුලිය රාත්‍රී කාලයේ භාවිතයට ගන්න විධිය ගැන සැලසුම් මොකුත් තිබුණේ නැහැ. හැබැයි, දැන් යථාර්ථයක් වෙලා තිබෙන BESS පද්ධතියේ මුළු ධාරිතාව මෙගාවොට් 160යි. 2027දී ඒක මෙගාවොට් 567ක් වෙනවා. 2029දී මෙගාවොට් 1,245ක් වෙනවා.

එතකොට තමයි අපට අර කියපු විධියට සියයට 30කින් විදුලි බිල අඩු කරනවා කියන තැන දක්වා යන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම අපි one gigawatt-hourවලට වඩා අඩු ඒවාට සම්පූර්ණයෙන්ම බදු සහන ලබා දීලා තිබුණා. මේ වතාවේ ජනාධිපතිතුමා කථාවේදී කිව්වා, rooftop solar panels තිබෙන අයට විශේෂ සහන දීලා තිබෙනවා කියලා. බැටරි ගබඩා ධාරිතාව one kilowatt සඳහා රුපියල් 25,000ක්, එතකොට 10 kilowatts සඳහා රුපියල් 250,000ක් වෙනවා. ඒ වාගේම මේ සඳහා වූ බැටරි ආනයනයේදී අය කරන වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද - PAL - ඉවත් කරලා තිබෙනවා. අන්න ඒ විධියට තමයි, පුනර්ජනනීය බලශක්තිය ශක්තිමත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම මේ පද්ධතිය අස්ථායී වෙනකොට මීට කලින් කවදාවත් විසඳුම් දීලා තිබුණේ නැහැ නේ, අස්ථායී වෙනවා, වෙනවා කියනවා මිසක්. නොරොච්චෝලේ බලාගාරය ගත්තාමත් මෙගාවොට් 900ක් නිපදවෙනකොට, එහි අභ්‍යන්තර මෙහෙයුම්වලට මෙගාවොට් 30 ඒවා තුනක් යනවා. අපි දන්නවා, ඒ පද්ධතිය බිඳ වැටුණාම ඒක හදන්න දවස් තුන හතරක කාලයක් ගත වෙනවා කියලා. එම නිසා ඒ සඳහාත් BESS එකක් හදුන්වා දීලා ඒකට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා 30-megawatt BESS එකක් ස්ථාපිත කිරීමට.

ඒ වාගේම අපි දන්නවා, සුළං බලයෙන් ජනනය වන විදුලියත් පද්ධතියට එකතු කරන්න ඕනෑ බව. ඒ සඳහා කිලිනොච්චියේ සිට නව හබරණ දක්වා 400kV line එක, ඒ වාගේම නොරොච්චෝලේ-හම්බන්තොට 220kV line එක කියන ඒ සියල්ල පද්ධතියට සම්බන්ධ කරලා තිබෙනවා. ඒ වාගේ තමයි, floating solar panels. විපක්ෂයේ සමහර අය කියලා තිබෙනවා මම දැක්කා, කෝ, ජල බැටරිය - pump storagesවලට නැහැ නේ කියලා. ඒ සම්බන්ධයෙන් අපට තිබෙන්නේ දීර්ඝ කාලීන ඉලක්ක. ඒකට අවුරුදු හතක්, අටක් වාගේ කාලයක් යනවා. මේවා කෙටි කාලීන ඒවා. මේ ජාලය ස්ථාවර කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ඔබතුමන්ලා කිසිම විධියකින් අරගෙන තිබුණේ නැහැ.

අනෙක් එක තමයි, smart meters. අපි දන්නවා, සූර්ය බලයෙන් ජනනය වන විදුලිය ප්‍රමාණය ඒ මොහොතේම පෙනෙන්නේ නැහැ කියලා. ඒකට විසඳුම වශයෙන් smart meters දීලා තිබෙනවා. Units 180ට වඩා වැඩියෙන් භාවිත කරන විදුලි පාරිභෝගිකයින් ලක්ෂ තුනකටත්, ඒ වාගේම LECO මඟින් සේවා සපයන විදුලි පාරිභෝගිකයින්ටත් ආරම්භයේදී මෙම සුහුරු මීටර් ලබා දෙනවා. ඒ තුළ අපට ඊළඟට හදුන්වා දෙන්න පුළුවන්, Time-of-Use tariff කියන එක. එතකොට ජනතාවට වැඩිපුර විදුලිය පාවිච්චි කරන වෙලාවන් තමන්ටම හදාගන්න පුළුවන්. මීට පෙර එවැනි විසඳුම් තිබුණේ නැහැ. ඒ වාගේම floating solar panels හරහා 500 megawatts එකතු කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ගත් අරගෙන තිබෙනවා. ඒ වාගේ සුවිශේෂී ක්‍රියාමාර්ග මෙවර අය වැයෙන් අපි අරගෙන තිබෙනවා. ඒවා අහගෙන ඉන්න අමාරුයි. ඒ ඇයි? මේ අය ඒවා එකක්වත් කළේ නැහැ නේ. Floating solar panels අපි කරන්න හිටියේ කිව්වා, කළේ නැහැ; smart meters කරන්න හිටියාලු, කළේ නැහැ; BESS එක ගේන්න හිටියාලු, ගෙනාවේ නැහැ. ඉතින් දැන් හරි අමාරුයි. පැය පහක් අහගෙන ඉන්නත් අමාරුයි.

අනාගතයේදී green hydrogenවලට වෙනම Master's Degree programmes ලංකාවේ විශ්වවිද්‍යාල තුළ ආරම්භ කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ගත් අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, අපි අනාගතයට capacities තිබෙන මිනිස්සු හදන්නත් ඕනෑ. අන්න ඒක තමයි අනෙක් ක්‍රියාමාර්ගය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි දැක්කා, අභ්‍යාස පොත්වලටත්, මුද්‍රිත පොත්වලටත් මෙතෙක් තිබුණු VAT එක සම්පූර්ණයෙන් ඉවත් කරනවා. ඒක සුවිශේෂී තීන්දුවක්. අපි එහෙම පොරොන්දු වෙච්ච ඒවා තිබෙනවා. ඒවා තමයි, අත්‍යවශ්‍ය ආහාරවල, බෙහෙත්වල මිල අඩු කරනවා කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
තව ඉතාම කුඩා කාරණයක් මේ වෙලාවේ කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මා ජීවත් වන බණ්ඩාරවෙල ප්‍රදේශය ගත්තාම, බණ්ඩාරවෙල, බදුල්ල, ඇල්ල ඇතුළුව නගර 16ක් සහ තවත් නගර 10ක සංවර්ධනය වෙනුවෙන් මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම හල්දුම්මුල්ල ප්‍රදේශයේ ජල ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන තුන්දහස් දෙසිය ගණනක් වෙන් කරලා තිබෙනවා. ඒක ඒගොල්ලන් කරන්න හිටියේ, විදේශ ණය අරගෙන, ලෝක බැංකු ණය අරගෙන. නමුත් පසුව ඒක අතහැර දාලා තිබුණා. දැන් භාණ්ඩාගාරයේ මුදල්වලින් ඒක කරන්න අපි තීරණය කරලා තිබෙනවා. ඒවා සුවිශේෂී කාරණා. ඒවා ගැන විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඒ වාගේම බෙරගල-වැල්ලවාය පාරටත් රුපියල් මිලියන 2,500ක වාගේ මුදලක් වෙන් කරලා තිබෙනවා. මම බලශක්ති ක්ෂේත්‍රය ගැන විතරයි කිව්වේ. මේකේ වචනයෙන් වචන, අකුරෙන් අකුර තිබෙන ඔය හැම්දේම ඔබතුමන්ලාට බොහොම වේදනාකාරීයි. ඔබතුමන්ලාගේ බලය කියන එක තව තව ඇතට, ඇතට ගිහිල්ලා ඒක හීනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒවා තමයි මේ ජරබර, හරබර කථාවල තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 4.36]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. இன்றைய தினம் நாங்கள் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் மூன்றாவது வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீடு மீதான விவாதத்தில் கலந்துகொண்டுள்ளோம். இந்த விவாதமானது, நாட்டை எந்த நிலைக்குக் கொண்டுசெல்லப்

போகின்றது, மக்களுடைய வாழ்வாதாரம் எப்படி அமையப் போகின்றது என்ற முக்கியமான கருப்பொருளைக் கொண்டுள்ளது. தேசிய மக்கள் சக்தி அரசாங்கம் மக்களுடன் பொருந்திக்கொண்ட பல விடயங்கள் உள்ளன. ஒரு வரவு செலவுத்திட்டத்தினூடாக நாடும் நாட்டு மக்களும் எதை எதிர்பார்க்கின்றார்கள்? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டம்தான் நாட்டின் எதிர்காலத்தைத் தீர்மானிக்கப் போகின்றது.

நாங்கள் கடந்த காலங்களில் பார்ப்போமேயானால், ஒரு வரவு செலவுத்திட்டத்தை முன்வைத்து தற்காலிக சந்தோஷத்தை மக்களுக்கு வழங்குவார்கள். இந்த நாட்டை வளர்ச்சியடையச் செய்ய வேண்டும், மக்களுக்கு அழகான வாழ்க்கையை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்ற தூரநோக்கு அவர்களிடம் காணப்படவில்லை. அவர்கள் வரவு செலவுத்திட்டத்தில் மத ரீதியாக நிதி ஒதுக்கீடு செய்தார்கள்; பிரதேச ரீதியாக நிதி ஒதுக்கீடு செய்தார்கள்; குடும்பங்களை இலக்கு வைத்து நிதி ஒதுக்கீடு செய்தார்கள். ஆனால், தேசிய மக்கள் சக்தியின் மூன்றாவது வரவு செலவுத்திட்டத்தில் எமது மிகப் பெரிய இலக்கான "வளமான நாடு-அழகான வாழ்க்கை"ஐ நோக்கிய வேலைத்திட்டங்கள் இருப்பதைக் காணலாம்.

கடந்த 10 வருடங்களில் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத் திட்டங்களைப் பார்ப்போமேயானால், 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் மூலதனச் செலவினமாக 650 பில்லியன் ரூபாயே ஒதுக்கப்பட்டு இருந்தது. அதற்குப் பின்னர், அது 700 பில்லியன் ரூபாயாக இருந்தது. ஒருபோதும் 1,000 பில்லியன் ரூபாயை - ஒரு டிரில்லியன் ரூபாயை - அது தாண்டவில்லை. தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டத்தில் - 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் - மூலதனச் செலவினமாக நாங்கள் 1,000 பில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்தோம். அதைத் தொடர்ந்து, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் மூலதனச் செலவினமாக 1,330 பில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்தோம். இன்று 2027ஆம் ஆண்டுக்கான Budgetஇல் மூலதனச் செலவினமாக கிட்டத்தட்ட 2,000 பில்லியன் ரூபாயை - 2 டிரில்லியன் ரூபாயை - ஒதுக்கீடு செய்திருக்கிறோம். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் 2027ஆம் ஆண்டில் GDP - மொத்தத் தேசிய உற்பத்தி - 39,000 பில்லியன் ரூபாய் - 39 டிரில்லியன் ரூபாய் - என எதிர்பார்க்கப்படுகின்றது. அந்த வகையில், இந்த Budgetஇல் தூரநோக்கு காணப்படுகின்றது. கடந்த கால அரசாங்கங்களால் வரவு செலவுத்திட்ட பற்றாக்குறையை 5 சதவீதத்துக்குக்கீழ் கொண்டுவர முடியாமல் இருந்தது. எனினும், எங்களுடைய அரசாங்கம் வரவு செலவுத்திட்ட பற்றாக்குறையை 2.3 சதவீதமாகக் குறைத்தது. 2027ஆம் ஆண்டில் வரவு செலவுத்திட்ட பற்றாக்குறையை 3.8 சதவீதமாக அதாவது, 5 சதவீதத்துக்கும் குறைவாகவே பேணவுள்ளோம்.

இந்த வரவு செலவுத்திட்டம் யாரை மையப்படுத்தி உருவாக்கப்பட்டுள்ளது? நாட்டின் இருப்பு, வளர்ச்சி, அபிவிருத்தி மற்றும் மக்களுடைய வாழ்வாதாரத்தை மையப்படுத்தியே வரவு செலவுத்திட்டம் உருவாக்கப்பட வேண்டும். எனவே, நாட்டுக்குத் தேவையான சட்டங்கள் உருவாக்கப்பட வேண்டும்; மறுசீரமைக்கப்பட வேண்டிய அரச நிறுவனங்கள் மறுசீரமைக்கப்பட வேண்டும்; அபிவிருத்தி செய்யப்பட வேண்டிய அரச நிறுவனங்களை அபிவிருத்தி செய்ய வேண்டும். மேலும், எமது நாட்டில் மாற்றத்தை ஏற்படுத்தக்கூடிய sectorsஐ நாம் அடையாளங்காணவும் வேண்டும். அது digital technology சார்ந்ததாக இருக்கலாம் அல்லது Science சார்ந்ததாக இருக்கலாம்!

கல்வியோடு தொடர்புடைய மாற்றத்தை உருவாக்கக் கூடிய, அடிப்படை வசதிகளை மேம்படுத்தக் கூடிய திட்டங்களை இந்த Budgetஇல் மிகப் பெரிய அளவில் காண முடியும். இவ்வாறு அதிகரிக்கப்படுகின்ற மொத்தத் தேசிய உற்பத்தி அல்லது பொருளாதார அபிவிருத்திமூலம் குறிப்பாக இந்த Budgetமூலம் நாட்டு மக்களை எவ்வாறு இந்த அரசாங்கம் பாதுகாக்கப் போகின்றது? அரசாங்கமானது நேரடியாக கல்வி அமைச்சு ஊடாகவும் ஏனைய அமைச்சுகள் ஊடாகவும் கிட்டத்தட்ட 74,900 கோடி ரூபாயை இந்த Budgetஇல் கல்விக்காக ஒதுக்கியுள்ளது. ஏனெனில், மாற்றத்தைக் கொண்டுவருவதற்கு நிச்சயமாக கல்விச் சமூகமொன்று வேண்டும். மேலும், சுகாதாரம் சம்பந்தமான விடயங்களுக்காக குறிப்பாக மக்களைப் பாதுகாக்கவும் அவர்களுக்குரிய வசதிகளைச் செய்துகொடுக்கவும் 71,000 கோடி ரூபாயை ஒதுக்கியுள்ளது. அதேபோன்று, அடிப்படை வசதிகளாக இருக்கலாம், பாதைகளாக இருக்கலாம், பாலங்களாக இருக்கலாம், கிராம மக்களின் பொருளாதாரத்தை மேம்படுத்து வதற்கும் இந்த Budgetஇல் நிதியொதுக்கீடு செய்யப் பட்டுள்ளது. கல்விக்காக ஒதுக்கியுள்ள தொகையை எமது நாட்டிலுள்ள கிராம சேவகர் பிரிவுகளின் எண்ணிக்கையால் பிரித்துப் பார்த்தால், 5 கோடி ரூபாய்க்கு மேற்பட்ட தொகை ஒவ்வொரு கிராம சேவகர் பிரிவுக்கும் கிடைக்கும். அதாவது, ஒவ்வொரு கிராம சேவகர் பிரிவுக்கும் கிட்டத்தட்ட 5 கோடி ரூபாய் நிதி ஒதுக்கப்பட்டுள்ளது. இது எமக்கு நேரடியாக விளங்காவிட்டாலும், கல்விக்காக ஒதுக்கப்பட்டுள்ள நிதி நிச்சயமாக ஒவ்வொரு பிள்ளையையும் அடைந்தே தீரும்.

மேலும், தொழில்முனைவோரைப் பாதுகாக்கவும் அவர்களை ஊக்குவிக்கவும் வரிச் சலுகை வழங்குவதற்காக இந்த Budgetஇல் 67 பில்லியன் ரூபாய் - 6,700 கோடி ரூபாய் - ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இதன்மூலம் கிட்டத்தட்ட 17,400 கோடி ரூபாய் கடன் பெறக்கூடிய வாய்ப்பை எமது தொழில்முனைவோர் - சிறிய மற்றும் நடுத்தர தொழில் முயற்சியாளர்கள் - பெறுகிறார்கள். அதனூடாக உருவாகக் கூடிய தொழில்வாய்ப்புகளால் மக்கள் கட்டாயம் பயன் பெறுவார்கள். இந்த 17,400 கோடி ரூபாயை கிராம சேவகர் பிரிவுகளின் எண்ணிக்கையால் பிரிப்போமானால், ஒரு கிராம சேவைகர் பிரிவுக்கு கிட்டத்தட்ட 12 கோடி ரூபாய் கிடைக்கும். இதன்மூலம் சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சியாளர்கள் வரிச் சலுகையுடன் கடன் பெற்று தங்களது தொழில் முயற்சிகளை மேம்படுத்தக் கூடியதாக இருக்கும்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොතැනකදී හරි අපේ විපක්ෂ නායකතුමා ජනාධිපතිතුමාට හෝ ආණ්ඩුවට ස්තුති කරයි කියලා මම හිතුවා. ඇයි, ඒ? 2015-2019 කාලය තුළ එතුමා රුපියල් 20,000, රුපියල් 40,000 ගාණේ ගෙවල්වලට ආධාර දුන්නා. ගෙවල්වලට ඒ ආධාර ගත්ත අය අද මහ පාරේ. විපක්ෂ නායකතුමා මහ පාරට ඇදලා දාපු පවුල් 10,000ක් බේරා ගන්න මේ අය වැයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. මම බලාගෙන හිටියා, තමන් කළ වැරැද්ද නිවැරදි කරන්න මේ ආණ්ඩුව උදව් කිරීම පිළිබඳව කොතැනකදී හරි විපක්ෂ නායකතුමා ආණ්ඩුවට ස්තුති කරයි කියලා. නමුත් එහෙම හිතක් එතුමාට නැති එක ගැන කනගාටුයි.

අපි සතුටු වෙන්නට ඕනෑ, මේ රට පරිවර්තන යුගය කරා යන එක ගැන. මේ සභාවේදී අදහස් දැක්වූ විපක්ෂයේ මන්ත්‍රීවරු කිසි කෙනෙක් පසුගිය අය වැය ඉතිහාසයට ගළපා, මෙතැන වැරදියි කියලා අවශ්‍යතාව පෙන්වලා දීලා, ඒ වැරැද්ද නිවැරදි කරන්නට මෙවර අය වැයෙන් එකතු වෙන්න ඕනෑ ප්‍රමාණය කීයද කියලා ඒවායෙන් වෙනස් විය යුතු තැන් පෙන්වා දීලා ඒ වෙනස කරන්න උත්සාහ කරන්නේ නැහැ.

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක පොඩි මිනිහාගේ අය වැයක් හැටියට අපි අර්ථ දක්වන්නේ ග්‍රාමීය පාරවල්වලට, දිළිඳුකම තුරන් කරන ප්‍රජා සංවර්ධන සභාවලට, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන්ට සහයෝගය දෙන්න සහ "ප්‍රජා ශක්ති" වැඩසටහන හරහා කරන ව්‍යාපෘතිවලට විශාල මුදලක් වෙන් කර තිබෙන නිසායි. අස්වැසුම සහ වෙනත් ප්‍රතිලාභ හරහා පොඩි මිනිහා ගැන හිතන මේ ආණ්ඩුවට ජනතාව දිළිඳුකමේ තියාගෙන ඒ දිළිඳුකම රකින්න වුවමනාවක් නැහැ. ඒ ජනතාව දිළිඳුකමින් මුදා ගෙන ඔවුන් හොඳ ජීවිතයක්, ලස්සන ජීවිතයක් කරා ගෙනියන්න බලාපොරොත්තුවෙන් තමයි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

எமது நாட்டின் சனாதிபதி அவர்களினதும் வெளி நாட்டலுவல்கள் அமைச்சினதும் எமது நாட்டின் பெரும் பாலான மக்களினதும் இணந்த போராட்டத்தின் விளைவாக அனோஜன் சிவராசாவை மீட்டெடுக்கக்கூடிய வாய்ப்புக் கிடைத்தது. இன்று அனோஜனின் விடுதலையானது, நாடு முழுவதும் சந்தோஷப்படக்கூடிய ஒரு செய்தியாக உள்ளது. ஆனாலும், இதையிட்டு எதிர்க்கட்சியினர் ஒருபோதும் சந்தோஷப்பட மாட்டார்கள். அவர்களுக்குத் தேவை, அனோஜனின் கழுத்தில் தொங்கிக் கொண்டாவது இந்த நாட்டில் அரசியல் செய்ய வேண்டும் என்பதுதான்.

அனோஜனின் விடுதலையையிட்டு யாராவது சந்தோசப் படுவர்களாக இருந்தால், அவர்களை நாங்கள் பாராட்டுகின்றோம். நாங்கள் இந்த நாட்டுக்கு நல்லதொரு செய்தியை வழங்கியிருக்கிறோம். அனோஜன் சிவராசாவின் பிரச்சினையை முஸ்லிம், தமிழ் மக்களுக்கு இடையிலான பிரச்சினையாக மாற்ற முயற்சித்தார்கள். இந்த விடயத்தை பாராளுமன்றத்திலும் நாட்டிலும் மிகப் பெரிய பிரச்சினையாகக் கொண்டு சென்றார்கள். நாங்கள் பொறுமையுடனும் நிதானத்துடனும் இராஜதந்திர ரீதியாகவும் செயற்பட்டு இந்த வெற்றியை அடைந்தோம். சில பாராளுமன்ற உறுப்பினர்கள் இந்த விடயத்தை தங்களது அரசியல் இருப்புக்குப் பயன் படுத்தியதை நாங்கள் கண்டோம். இந்த அரசாங்கத்தின் செயற்பாடு பற்றி மக்கள் மிகுந்த சந்தோஷத்துடன் உள்ளார்கள்.

இங்குள்ள எதிர்க்கட்சியினர் சில வைத்தியசாலைகளைத் தரமுயர்த்துவதற்கும் விருப்பமில்லை. ஏனென்றால், அவர்களுடைய அரசியல் இருப்புக்கு அதுவும் அச்சுறுத்தல்! சாணக்கியன் MP இங்கு உரையாற்றும்போது, Provincial Councilஇன் அதிகாரத்தைக் குறைப்பதற்காகத்தான் இந்த வைத்தியசாலைகளைத் தரமுயர்த்துவதாகக் குறிப்பிட்டார். உண்மையில் அவ்வாறில்லை! இந்த நாட்டிலுள்ள Provincial Councilஆக இருக்கலாம், line Ministryஆக இருக்கலாம், இந்த நாட்டுக்குள்தான் அவை இருக்கின்றன. குறித்த பகுதியிலுள்ள மக்களுக்குச் சேவைகளை வழங்கத் தேவையில்லையா? குறித்த வைத்தியசாலைகள் தரமுயர்த்தப்படுவதையிட்டு அப்பிரதேச மக்கள் சந்தோஷப்படுகிறர்கள். எனவே, இவ்வாறான மக்கள் பிரதிநிதிகள் இந்த நாட்டுக்குத் தேவையா என்பதை மக்கள் எதிர்வரும் காலங்களில் முடிவு செய்வார்கள் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.47]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2027 අය වැය විවාදයට එක් වන මේ මොහොතේදී මම කියන්න කැමතියි, විශේෂයෙන්ම COPE එකේ සාමාජිකයන් විධියට මේ රටේ මහජන මුදල් පිළිබඳව සහ ඒවාට වගවීම පිළිබඳව විශේෂ උනන්දුවකින් අපි කටයුතු කරනවාය කියන එක.

ඇත්තටම අපේ රට කියන්නේ වසර 4කට කලින් තෙල් ටික ගන්න බැරිව, බෙහෙත් ටික ගන්න බැරිව, ණය ගෙවා ගන්න බැරිව නිල වශයෙන්ම බංකොලොත් කියලා declare කළ, තමන්ම ප්‍රකාශ කර ගත්ත රටක්. ඒ තැනට මේ රට වැට්ටුවා. නමුත් 2025 අය වැය අපි කුමක් සඳහාද ඉලක්ක කළේ? 2025 අය වැය අපි ඉලක්ක කළේ රටේ ආර්ථික ස්ථායීතාවට සහ සමාජ යුක්තියට අත්තිවාරම දමන්න.

2026 අය වැය අපි මොකක් වෙනුවෙන්ද ඉලක්ක කළේ? නිෂ්පාදනය, ආයෝජනය සහ ඩිජිටල්කරණයේ දිශාවට යොමුවක් තමයි 2026 අය වැය. දැන් අපි රටේ සහ ආර්ථිකයේ ස්ථායීතාවක් හදාගෙන තිබෙනවා. 2027 අපේ අය වැයේ යොමුව තිබෙන්නේ අර හදපු ස්ථායීතාව පරිවර්තනයකට අරගෙන යන්න, පරිවර්තනීය යුගයකට අරගෙන යන්න සහ ආර්ථිකය වෙනත් තලයකට අරගෙන යන්නයි. ඒ අවශ්‍ය කරන පසුබිම හදන්න තමයි ජනාධිපතිතුමා මේ අය වැය ඉදිරිපත් කළේ.

මම ඉලක්කම් ටිකක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2025 වසරේ ආර්ථිකය සියයට 5කින් වර්ධනය වෙනවා. ඊට පසු "දිට්වා" එනවා. 2026 පළමු කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 5.1යි. දෙවන කාර්තුවේ දී මැදපෙරදිග යුද්ධය තිබිලාත්, ආර්ථික වර්ධන වේගය සියයට 4.2යි. දශක ගණනාවක් අපේ රටේ ප්‍රාථමික ශේෂය විශාල ප්‍රමාණයකින් සෘණ අගයක් වෙලා තිබුණේ. 2025දී අපි එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.4ක අතිරික්තයක් බවට පත් කළා; ඉතිහාසයේ ඉහළම අගය වාර්තා කළා. 2026 අය වැයට අනුව අපේක්ෂා කළ රුපියල් බිලියන 360ක ඉලක්කය පහු කරලා, රුපියල් බිලියන 1,844ක අගයක් වාර්තා කරන්න අපට පුළුවන් වෙනවා. 2025දී අය වැය හිඟය සියයට 2.3 දක්වා අරගෙන එන්නේ, අවුරුදු 68කට පසුවයි. 2022දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.2ක් වෙච්ච රජයේ ආදායම, 2025දී සියයට 16.6ක් දක්වා වැඩි කරන්න මුදල් අමාත්‍යවරයා විධියට ජනාධිපතිතුමාට පුළුවන් වුණා. ඒක, වසර 23කට පසුව වාර්තා වුණු ඉහළම අගය.

විදේශ අංශයේ කථාව මොකක්ද? විදේශ අංශයේ කථාව ගත්තාම, 2025දී ජංගම ගිණුම, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,719ක් ලෙස ඉතිහාසයේ ඉහළම අතිරික්තය වාර්තා කළා. 2025දී විදේශ ශ්‍රමිකයන්ගෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1ක් ආවා. මේ වසරේ ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 9ක් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. දැන් ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක සංචිතය ඉක්මවා තබාගන්න පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 වසර වෙනකොට රාජ්‍ය ව්‍යවසායන් 52ක් රුපියල් බිලියන 774.6ක් බදු පෙර අලාභ ලැබුවා. අපට පුළුවන් වුණා, 2025දී බදු පෙර ලාභය රුපියල් බිලියන 444.4ක් කරන්න. ඉස්සරවෙලා තිබුණේ අලාභය. හැබැයි, අපේ විපක්ෂයට පෙනෙන්නේ නැති වුණාට මේවා, ජාත්‍යන්තර සංවිධාන දැක්කා. Fitch Ratings ශ්‍රේණිගත කිරීම්වල අපිව CCC+ ඉඳලා B- වෙනකල් ඉහළට ගෙනෙනවා. අපේ රට ඉහළ මැදි

ආදායම් ලබන රටක් බවට පත් වෙනවා. ලෝක බැංකුව එතැනට rating වෙනස් කර ගන්නවා. අපේ ගරු චිත්‍රාල් මන්ත්‍රීතුමාට මේක පෙනුණේ නැහැ. එතුමා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, ආර්ථික වර්ධන වේගය අඩු වෙලාලු. මේ ජනාධිපතිතුමාගේ කථාව ගැන බොරු කියනවා. මේ අය වැය කථාව ලියලා, print කරලා, පොත දීලා තිබෙන්නේ. ඒක කියවලා නැහැ. මොකක්ද, මේ පටලැවිල්ල? ජනාධිපතිතුමාගේ කථාවේ තිබෙනවා, "දීර්ඝ කාලයක් පුරා වාර්තා කළ ඍණ ප්‍රාථමික ශේෂය, 2025 වසරේ දී සියයට 5.4ක ඉතිහාසයේ ඉහළතම ධන ශේෂය වාර්තා කළා" කියලා. ආර්ථික වර්ධන වේගය ගැන නොවෙයි කිව්වේ, ඍණ ප්‍රාථමික ශේෂය ගැන. ධන-ඍණත් පැටලිලා, ආර්ථික වර්ධන වේගයත් පැටලිලා, ප්‍රාථමික ශේෂයත් මාරු කරගෙන තිබෙනවා. මට තේරෙන්නේ නැහැ, චිත්‍රාල් මන්ත්‍රීතුමා වාගේ උගත් මන්ත්‍රීතුමෙකුට වැරදුණා ද, වැරැද්දුවා ද කියලා. කොහොමත් ඒගොල්ලන්ට බුදුරජාණන් වහන්සේගේ කාලාම සූත්‍රය ඇලර්ජීක් ඇති. හැබැයි, ඒගොල්ලන් වැඩියෙන් කැමැති කාලාම වැඩවලට තමයි. ඒගොල්ලන්ට කාලාම තමයි පුරුදු. නමුත්, ඒගොල්ලන්ට කාලාම සූත්‍රය ඇලර්ජීක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා භාණ්ඩාගාරයේ ණය 2022දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 114ක් වශයෙන් තිබුණේ. දැන් අපට පුළුවන් වෙලා තිබෙනවා ඒක සියයට 95 වෙනකල් ගෙනෙන්න. මේ අගයට ගෙනෙන්න නියමිතව තිබුණේ, 2032දී. නමුත්, දැන් ඒ අගයට ගෙනැල්ලා තිබෙනවා. දැන් IMF එක පුරෝකථනය කරන්නේ, 2032දී අපට එම අගය සියයට 87 දක්වා අඩු කරන්න පුළුවන් වෙයි කියලා. 2022දී අපේ රටේ රජයේ ආදායමෙන් සියයට 79.1ක් ණය පොලී ගෙව්වා. 2025දී අපට ඒක සියයට 45.9 දක්වා ගෙනෙන්න පුළුවන් වුණා. මේ වසරේ සැප්තැම්බර් වෙනකොට ඒක 39.6 දක්වා අඩු කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ණයකාරයින්ට ණය විධියට ගෙවපු මුළු රටේම ආර්ථිකයේ සල්ලි දැන් අපේ පාරවල්වලට, අපේ ඉස්කෝලවලට, අපේ රෝහල්වලට නැවත හරවන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ ගණනට ආර්ථිකය හදලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ උපාය මාර්ගික ගමනක් යන්නේ. මම කැමැතියි, මේක කරුණු 4කින් කෙටි කරන්න. අපි නීතියට බැඳිලා ඉන්නවා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතින් අපි බැඳිලා ඉන්නවා. ඔව්. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3කට ප්‍රාථමික අතිරික්තය තියා ගන්න, සියයට 5කට අඩු අය වැය හිඟයක් සහ සියයට 16කට නොඅඩු රජයේ ආදායමක් පවත්වා ගැනීමට අපි බැඳිලා ඉන්නවා. අපි ඒ වැඩේ කරනවා.

දෙවන කාරණය විධියට ණය සීමාව රුපියල් බිලියන 3,800ක තියාගන්න අපි බැඳිලා ඉන්නවා. අපි ඒ දේ කරනවා. ඒ චිත්‍රක් නොවෙයි. මේ වසරේ ජූනි 30වැනි දා වනකොට අපි පාවිච්චි කර තිබෙන්නේ සියයට 24.9යි. ඕනෑ නම් සියයට 25යි කියමු. ණය සීමාව එච්චර තිබුණාට අපි සියයට 25යි පාවිච්චි කරලා තිබෙන්නේ. ඒක උඩට උඩට අරගෙන ගිහිල්ලා නැහැ. හිතෙන හිතෙන වෙලාවට ණය අරගෙන නැහැ.

තුන්වන කාරණය විධියට අපට ඩොලර් මිලියන 2,986ක් ණය ගෙවන්න තිබෙනවා, 2027දී. කිසිදු හිඟයක් නැතිව අපි මේ ණය ගෙවනවා. ඒ නිසා බය වෙන්න දෙයක් නැහැ.

හතරවන කාරණය විධියට, ඊළඟට එන කුමන හෝ කම්පනයකට වුවත් මුහුණ දීමට අපි සූදානම් වෙන්න ඕනෑ. අපි ඒකට ලැහැස්තියි. ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් කමිටු පත් කරලා ලැහැස්ති කරලා තිබෙන්නේ, ඒකට අවශ්‍ය කරන උපකරණ මොනවාද, ඒකට මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් කටයුතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හුඟක් වෙලාවට කථා කළා, හැමෝම කථා කරනවා, අලි - මිනිස් ගැටුම පිළිබඳව. කාවන්තිස්ස ඇතා සම්බන්ධයෙන් වැලපෙනවා. කාවන්තිස්ස ඇතා විතරක් නොවෙයි - ඒක අපේ හදවතට වේදනා දැනෙන සිද්ධියක් තමයි - මේ රටේ අලි ඇතුන් 397ක් මැරුණා. ඒ විතරක් නොවෙයි, 2019 ඉඳන් අවුරුද්දට මිනිස්සු 138දෙනෙකු මැරෙනවා. එම නිසා මේකට උත්තර හොයන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට උත්තර හොයන්න ඕනෑ නිසා වනජීවී මුරකරුවන් 313දෙනෙකු, නඩත්තු සහායකයන් 3,451දෙනෙකු බඳවා ගන්න කටයුතු කර තිබෙනවා. ජූනි මාසයේ ඉඳන් අලි මංතීරු විවෘත කරලා තිබෙනවා. පොළොන්නරුවේ ඇත් අතුරු සෙවන අලුතින් පටන් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, පුළුවන් නම් මට තව විනාඩි කිහිපයක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලි පහර දීලා ගොවියෙක් මැරුණොත් වන්දි ගෙවන්න අවශ්‍ය කරන වාතාවරණය හදලා තිබෙනවා. ඒ වන්දි මුදල් වැඩි කරලා තිබෙනවා. තුවාල වුණොත් ගෙවන වන්දි මුදල් වැඩි කරලා තිබෙනවා. අපි හරි විධියට ගමනක් යනවා.

බලශක්ති ප්‍රතිසංස්කරණය අපේ ආර්ථිකයේ ඉතාම වැදගත් එකක්. ඒ වෙනුවෙන් රුපියල් මිලියන ගණන් වෙන් කරලා තිබෙනවා; පාරිභෝගිකයාට සහන දීලා තිබෙනවා. Battery storage promote කරලා තිබෙනවා. අපට කියනවා නේ, promote කරලා නැහැ කියලා. නැහැ, අපි promote කරලා තිබෙනවා. අපි අරමුණකට රට මෙහෙයවමින් ඉන්නවා. ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට රුපියල් මිලියන 100,000ක් විතර ග්‍රාමීය මාර්ගවලට වෙන් කරලා තිබෙනවා. තාක්ෂණය, මානව ප්‍රාග්ධනය හා ඵලදායීතාව හදන්න සල්ලි වෙන් කරලා තිබෙනවා. ආයෝජන, නිෂ්පාදන අපනයනය හරහා ආර්ථික වර්ධනය ගෙනෙන්නට සල්ලි වෙන් කරලා තිබෙනවා. ආර්ථික ස්ථායීතාව, ඔරොත්තු දීමේ හැකියාව වෙනුවෙන් සල්ලි වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති ස්ථායීතාව වෙනුවෙන් බැටරි ගබඩා පද්ධති ධාරිතාව මෙගාවොට් 560 දක්වා වැඩි කිරීම සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. දේශගුණික ආපදාවලට ඔරොත්තු දීම සඳහා අපි සල්ලි වෙන් කරලා තිබෙනවා. අපි නවීන රාජ්‍ය සේවයක් වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. නවීන රාජ්‍ය සේවයක් වෙනුවෙන් වාගේම ඩිජිටල් රාජ්‍යයක් හදන්නත් අපි රුපියල් මිලියන 4,090ක මුදල් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනට එන්න අපේ රටේ ජනතාව කොච්චර කැප කිරීම් කළාද කියලා අපි දන්නවා. මහජන රජයක් හදාගන්න අරගළ කළා, සටන් කළා. එම නිසා ඒ කැප කිරීම් තවදුරටත් ආරක්ෂා කරගන්න ඕනෑ කියන වගකීම අපට තිබෙනවා. ආර්ථිකයේ ස්ථායීතාව ආරක්ෂා කර ගන්න ඕනෑ කියන වගකීම අපට තිබෙනවා. අපි ඒවා ආරක්ෂා කරන ගමන්, බදු රහිත ආදායම රුපියල් 162,500 දක්වා ඉහළ නංවා තිබෙනවා. වකුගඩු රෝගීන්ට සහ ආබාධ සහිත තැනැත්තන්ට රුපියල් 12,500ක දීමනාවක් දීලා තිබෙනවා. මේ සියල්ල කරන්නේ ස්ථායීතාව ආරක්ෂා කර ගනිමින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි, අවසාන වශයෙන් තව එක කාරණයක් එකතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. දැන් අවසන් කරමු, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, අපේ උගත් මිත්‍රයා කිව්වා, අපි හැඳි ගෑරුප්පුවලින් කන්න පටන් අරගෙන තිබෙනවා, දැන් ධනවාදයට ගිහිල්ලා කියලා. එතුමන්ලාගේ ධනවාදය තිබිලා තිබෙන්නේ හැඳි ගෑරුප්පුවල. හරි නේ ඉතින්. එතුමාගේ කථාව හරි. එතුමන්ලා මහ බැංකුවට ගෑරුප්පුවෙන් ඇනලා, හැන්දෙන් කාලා, කෙහෙල් ගෙඩි බෙදලා, ඊට පස්සේ මොකක්ද කළේ? පොතකුත් ලියලා පොත හැංගුවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විපක්ෂයේ අයගේ මොළය තිබෙන්නේ හැන්දේ මිටේ තරමටයි කියන එකයි අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ .

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[பி.ப. 4.59]

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்று சனாதிபதி அவர்களின் வரவு செலவுத்திட்ட உரையைக் கேட்கும்போது, உண்மையிலே மிகுந்த வருத்தமாக இருந்தது. இதற்கு முன்னர் சமர்ப்பிக்கப்பட்ட இரண்டு வரவு செலவுத் திட்டங்களின்போதும் நான் எனது முழுமையான ஆதரவை எதிர்க்கட்சியில் இருந்துகொண்டு ஆளும் கட்சிக்கு வழங்கியிருந்தேன். மக்களின் ஆணையை மதித்து, சனாதிபதிமீது மக்கள் வைத்திருக்கின்ற நம்பிக்கையைப் பிரதிபலிக்கும் வகையில் முடிவெடுத்து அதற்கு ஆதரவாக வாக்களித்திருந்தேன்.

சனாதிபதி அவர்களின் இந்த வரவு செலவுத்திட்ட உரையைக் கேட்கும்போது, உண்மையாகவே வேதனையாக இருந்தது. அதற்கான காரணம் என்னவென்று நான் சொல்கிறேன். முக்கியமாக, இந்த வரவு செலவுத்திட்டத்தில் பெருந்தோட்ட மக்களிடம் கொண்டுசெல்லக்கூடியவாறு பெருந்தோட்டத்துறை சம்பந்தமான எந்த விடயமும் கிடையாது. இன்றைக்கு நீங்கள் சிந்தித்துப் பாருங்கள்! மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்கிறார், "நாங்கள் இந்தளவு நிதி ஒதுக்கீடு வழங்கியதே கிடையாது; இருப்பதிலே அதிகமான அளவு நிதி ஒதுக்கீடு மலையகப் பகுதிகளுக்கு வழங்கி இருக்கிறோம்" என்று. நான் ஒரு விடயத்தைத் தெளிவுபடுத்த விரும்புகிறேன். 2025இல் மலையக மக்களுடன் தொடர்புடைய அமைச்சின்கீழ் வருகின்ற நிதி ஒதுக்கீட்டில் 62 சதவீதம் இந்திய அரசாங்கத்திடமிருந்து கிடைக்கப்பெற்ற நன்கொடை ஆகும். இதை அன்றைக்கு நாங்கள் பாராளுமன்றத்தில் சொன்னோம். மாண்புமிகு சனாதிபதி அவர்களைத் தனிப்பட்ட ரீதியில் ஒரு பேரவையாகச் சந்திக்கும்போது நான் குறிப்பாக ஒரு விடயத்தைச் சொன்னேன். அதாவது, "பாதீட்டில் எங்களுடைய மக்களுக்கான நிதி ஒதுக்கீடு போதாது; அதை அதிகரித்தாக வேண்டும்" என்று சொன்னேன். அதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் 'சரி' என்று சொன்னார்.

என்ன நிதி ஒதுக்கீட்டை அதிகரித்து இருக்கிறார்கள் என்று நான் பார்த்தேன். இந்த வருடமும் முழுமையான நிதி ஒதுக்கீட்டில் கிட்டத்தட்ட 62 சதவீதம் இந்திய அரசாங்கத்தின் நன்கொடைதான் இருக்கிறது. குறிப்பாக, கடந்த வருடம் இந்திய அரசாங்கத்தால் 2,224 மில்லியன் ரூபாய் நன்கொடையாக வழங்கப்பட்டு இருக்கிறது; இந்த வருடம் 4,290 மில்லியன் ரூபாய் நன்கொடையாக வழங்கப்பட்டு இருக்கிறது. இதையும் சேர்த்துத்தான் சொல்கிறார்கள், "நாங்கள் மலையக மக்களுக்கு அதிகளவு நிதி ஒதுக்கீடு வழங்கி இருக்கிறோம்" என்று. ஆனால், சுவாரஸ்யமான விடயம் ஒன்று இருக்கிறது. கடந்த வருடம் இலங்கை அரசாங்கம் மூலமாக மலையக மக்களின் வீடமைப்பு மற்றும் உட்கட்டமைப்பு வசதிகளுக்காக வழங்கப்பட்ட நிதி ஒதுக்கீடு 500 மில்லியன் ரூபாய். இந்த வருடம் வெறுமனே 100 மில்லியன் ரூபாய்தான் அதற்காக ஒதுக்கப்பட்டு இருக்கிறது. இதை நான் உங்களுடைய கவனத்துக்குக் கொண்டு வருகின்றேன். சனாதிபதி அவர்களிடமிருந்து அறிவுரை பெற்றுத்தான் இந்த விடயத்தை நான் முன்வைக்கிறேன். அதாவது, "நீங்கள் ஓர் எதிர்க்கட்சியாக எங்கள்மீது இருக்கின்ற குற்றச்சாட்டுக்களையும் விமர்சனங்களையும் முன்வையுங்கள்! அவற்றை ஆரோக்கியமான மற்றும் நாகரிகமான முறையில் முன்வைத்தால், கட்டாயம் அதற்குப் பதில் சொல்வதற்குக் கடமைப்பட்டு இருக்கிறோம்" என்று நேற்று சனாதிபதி அவர்கள் தெளிவாகவே சொல்லியிருந்தார்.

எனக்குத் தெரிந்து, நான் கடந்த இரண்டு வருடங்களாக ஆரோக்கியமான முறையிலும் நாகரிகமான முறையிலும் விமர்சனங்களை முன்வைத்துக்கொண்டுதான் இருக்கிறேன். வீட்டுத் திட்டத்தைப் பற்றி கேட்டாலும் சரி, சம்பளத்தைப் பற்றி கேட்டாலும் சரி, அபிவிருத்தியைப் பற்றி கேட்டாலும் சரி, ஹற்றன் பிரகடனத்தைப் பற்றி கேட்டாலும் சரி, எனக்குக்

கிடைக்கின்ற பதில், "76 வருடமாக இந்த நாடு நாசமாகிவிட்டது; அப்படி இருக்கும்பொழுது, நீங்கள் கேள்விகள் கேட்கக்கூடாது" என்பதுதான். சரி! அப்படியே இருந்தாலும்கூட, இந்த நாடு நாசமாவதற்கு இன்றைக்கு ஆளுங்கட்சியில் இருக்கின்ற - கூட்டணியில் இருக்கின்ற - ஒரு பிரதான கட்சிதானே காரணம். அதுமட்டுமல்ல, அன்றிலிருந்து இன்றுவரை ஆட்சி செய்த சனாதிபதிகளுக்கு அதிகமான ஆதரவை தற்போதைய சனாதிபதி அவர்கள் வழங்கித்தானே ஆட்சிக்குக் கொண்டுவந்தார்கள். அதைப் பற்றியெல்லாம் நான் விமர்சனங்களை முன்வைக்க விரும்பவில்லை. நான் முழுமையாக பாதீட்டை பற்றி மட்டும்தான் பேச விரும்புகிறேன்.

2025ஆம் ஆண்டில் இந்திய வீடமைப்புத் திட்டத்துக்காக 2,224 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு இந்தியாவின் நன்கொடைமூலம் வழங்கப்பட்டு இருக்கிறது. அந்த நிதி ஒதுக்கீட்டில் எத்தனை வீடுகள் கட்டப்பட்டு இருக்கின்றன? இந்தக் கேள்வியை மக்கள் கட்டாயம் கேட்க வேண்டும். கடைசியாக நான் அமைச்சுப் பதவியில் இருக்கும்பொழுது, 1,300 வீடுகளை நிர்ணயித்தோம். அந்த 1,300 வீடுகளில், 2,224 மில்லியன் ரூபாய்மூலம் மலையக மக்களுக்கு எத்தனை வீடுகள் கட்டப்பட்டு இருக்கின்றன? பூணாகலையில் இராணுவம் மற்றும் GA மூலமாக 50 வீடுகளைக் கட்டி இருக்கிறீர்கள். அவற்றுக்குரிய உட்கட்டமைப்பு வசதிகளைச் செய்வது அமைச்சின் பொறுப்பு! என்ன செய்தார்கள்? அங்கு வீதிகள் கிடையாது; மின்சாரம் சரியான முறையில் வழங்கப்படவில்லை; நீர் வசதி சரியான முறையில் வழங்கப்படவில்லை. இராணுவம் செய்யக்கூடிய வேலையை ஏன் அமைச்சு பொறுப்பேற்று செய்ய முடியவில்லை? 1,300 வீடுகளில் வெறுமனே 45 வீடுகள் மட்டும்தான் work in progressஇல் இருக்கிறது. அதாவது, கடந்த இரண்டு வருடங்களில் 45 வீடுகளை மட்டும்தான் கட்டுவதற்கு ஆரம்பித்து இருக்கிறார்கள். இவ்வாறு நிலைமை இருக்கும் பொழுது, இதற்கு நிதி ஒதுக்கீடு செய்தால் என்ன, செய்யாவிட்டால் என்ன? நிதி இருந்து பிரயோசனம் இல்லை. அதைச் செலவு செய்வதற்குத் திறமை வேண்டும்.

பெருந்தோட்ட அமைச்சை எடுத்துக்கொண்டால், 50 சதவீதமான வேலைத்திட்டங்கள்தான் முடிந்திருக்கின்றன. மீதி 50 சதவீதமான வேலைத்திட்டங்களுக்கான நிதி மீண்டும் Treasuryக்குத்தான் போகும். இன்றைக்கு அந்த நிதி ஒதுக்கீடு வீணாய்ப் போய்விட்டது. இன்று தித்வா புயலால் ஏற்பட்ட பிரச்சினை மட்டுமல்ல, சர்வதேச ரீதியாகவும் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. குறிப்பாக, மத்திய கிழக்கில் போர் நடக்கிறது. அது எல்லோரையும்தான் பாதிக்கிறது. அதற்காக, எல்லா குறைபாடுகளும் இந்தப் போரால்தான் நடைபெறுகின்றன என்று சொன்னால், அதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. இது எல்லாம் நிருவாகம் சம்பந்தப்பட்ட விஷயம்!

இன்றைக்கு அரசாங்கம் முதலீட்டாளர்களுக்கு குறிப்பாக, வெளியாட்களுக்கு JEDB, SPC, எல்கடுவ பெருந்தோட்ட நிறுவனங்களுக்குச் சொந்தமான கிட்டத்தட்ட 3,000 ஏக்கரை - தெளிவாகச் சொல்வதென்றால், 1,714 ஹெக்டெயாரை - பிரித்துக் கொடுக்கிறது. அன்று கௌரவ அமைச்சர் அவர்கள் mediaக்குச் சொன்னார், "நாங்கள் இப்பொழுது முதலீட்டாளர் களுக்குப் பிரித்துக் கொடுகிறோம். பிறகு, இங்கு 200 வருடங்களாக பரம்பரை பரம்பரையாகக் கஷ்டப்பட்ட மக்களுக்கு அதைப் பிரித்துக் கொடுப்போம்" என்று. மாண்புமிகு சனாதிபதி அவர்கள் தேர்தலுக்கு முன்னர் ஹற்றனில் என்ன சொன்னார்? "தரிசு நிலங்கள் மலையக இளைஞர்களுக்கு வழங்கப்படும்" என்று சொன்னார். நானும் 2 வருடமாகச் சொல்லி வருகிறேன், "அதில் ஒரு சிக்கல் இருக்கிறது. பாராளுமன்றத்தில் ஆளும் கட்சியில் 159 உறுப்பினர்கள் இருக்கிறார்கள். சனாதிபதி அவர்கள் நினைத்தால், சட்டமூலமொன்றைக் கொண்டுவந்து இதனை நிறைவேற்ற முடியும்" என்று. தோட்டத் தொழிலாளர்களின் சம்பள அதிகரிப்புத் தொடர்பாகக்கூட உங்களால் ஒரு வர்த்தமானி அறிவித்தலை வெளியிட முடியவில்லை. அப்படியென்றால், கட்டாயம் ஒரு கேள்வியைக் கேட்டாக வேண்டும். மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர்கள் இந்தப் பிரச்சினைகளை சனாதிபதி அவர்களின் கவனத்துக்குக் கொண்டுசெல்கின்றார்களா, இல்லையா? என்று.

நேற்று சனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையில் மலையக மக்கள் சம்பந்தமாகப் பேசினாரோ இல்லையோ, பெருந்தோட்ட நிறுவனங்கள் சம்பந்தமாகப் பேசினார். இந்தப் பாதீட்டின் முதல் பக்கத்தில் குறிப்பிடப்பட்டு இருக்கின்றது, இது மக்களுக்கான பாதீடு என்பதாக. பெருந்தோட்டப் பகுதியைப் பொறுத்தமட்டில், இது மக்களுக்காக உருவாக்கப் பட்ட பாதீடா? இல்லாவிட்டால், இருக்கின்ற 20 பெருந் தோட்ட நிறுவனங்களுக்கும் சிறுதோட்ட உரிமையாளர் களுக்குமாக உருவாக்கப்பட்ட பாதீடா? என எனக்குப் புரியவில்லை. தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினையைப் பொறுத்தவரை, மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லியிருக்கிறார், "நாங்கள் 200 ரூபாயை அதிகரித்துக் கொடுக்கிறோம்" என்று. இதே 200 ரூபாயைத் தானே கடந்த வருடமும் சொன்னீர்கள்!

நான் இங்கு பேசுவதற்கு முன்னர் ஓர் உறுப்பினர் சொல்லியிருந்தார், “இங்கு எதிர்க்கட்சியிலுள்ள ஓர் உறுப்பினர் சொன்னார், முடிந்தால் 10 ரூபாயைக் கூட்டிக் கொடுங்கள்!" என்று. நான் உங்களிடம் வெளிப்படையாகவே கேட்கிறேன், நீங்கள் என்ன தைரியத்தில் என்னிடம் இப்படிக் கேட்கின்றீர்கள்? என்று. ஏனென்றால், நீங்கள் முதலில் சம்பளத்தைச் சரியான முறையில் கூட்டிக் கொடுக்கவில்லை. தனியார் தோட்டத்தில் வேலைசெய்கின்ற யாருக்குமே அதிகரிப்பட்ட சம்பளம் கிடைக்கவில்லை. குறிப்பாக, பல்வேறு பகுதிகளில் இந்த 200 ரூபாய் கிடைக்கவில்லை. இந்தப் பாதீட்டு காலப்பகுதியில், தொழில் அமைச்சு மீதான குழுநிலை விவாதத்தின்பொழுது, அதற்குரிய கணக்குவழக்கை கட்டாயம் சமர்ப்பித்தாக வேண்டும். அரசாங்கம் பெருந் தோட்ட நிறுவனங்களுக்கு வழங்கி இருக்கின்ற 200 ரூபாய் ஊக்குவிப்புக் கொடுப்பனவு எத்தனை தொழிலாளர்களுக்குக் கிடைத்திருக்கிறது? இது தொடர்பான விபரங்களை அரசாங்கம் கட்டாயம் சமர்ப்பித்தாக வேண்டும். ஏனென்றால், இன்றைக்குத் தனியார் நிறுவனங்களில் வேலை செய்வோருக்கு அது கிடைக்கவில்லை. ஒவ்வோர் இடத்திலும் நாங்களும் அரசாங்கத்துக்கு உதவி செய்தோம். சரி! தொழிலாளர்களின் பிரச்சினையை ஒரு முடிவுக்குக் கொண்டுவரலாம் என்று பார்த்தால் - சம்பந்தமில்லாமலே திருப்பிச் சொல்கிறார்கள், "அன்று நீங்கள் சவால் விட்டீர்கள்; நாங்கள் நிறைவேற்றிக் காட்டினோம்" என்று.

அரைகுறையாக நிறைவேற்றிவிட்டு, அப்புறம் என்ன பேச்சு? ஒரு விடயத்தை முழுமையாகவே முடிக்கத் தெரியவில்லை. நான் இங்கு இரண்டு வருடங்களாகச் சொல்லிக் கொண்டு இருக்கிறேன், நீங்கள் சம்பளத்தை கூட்டினாலும், அதற்கான வர்த்தமானியை - gazetteஐ - வெளியிடுங்கள் என்று. 1,000 ரூபாய் சம்பள உயர்வு தொடர்பில் 2020இல் நான் gazette வெளியிட்டு இருக்கிறேன்.

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

அதேமாதிரி, 1,350 ரூபாய் சம்பள உயர்வின்போதும் Gazette வெளியிட்டு இருக்கிறேன். இன்றைக்குப் பல்வேறு பகுதிகளில் நான் gazette பண்ணிய 1,350 ரூபாய்தான் கிடைக்கிறது. கடைசியில் பாதிக்கப்படுவது தொழிலாளர்கள்! மாண்புமிகு சனாதிபதி அவர்கள் தோட்டத் தொழிலாளர்களுக்கு கடந்த வருடம் கூட்டிய அதே 200 ரூபாவைத்தான் இந்த வருடமும் வழங்குவதாக கூறியிருக்கிறார். ஆனால், சிறுதோட்ட உரிமையாளர்களுக்கு மட்டும் மானியம்! அது எப்படி? நீங்கள் சிறுதோட்ட உரிமையாளர்களின் சுமையைக் குறைக்கிறீர்கள்! ஆனால், தோட்டத் தொழிலாளர்களுக்கு மட்டும் அதே 200 ரூபாய்! சிறுதோட்ட முதலாளிமாருக்கு அதிகரிக்கின்ற வாழ்வாதாரச் செலவு பெருந்தோட்டங்களில் வாழுகின்ற தொழிலாளர்களுக்கு அதிகரிக்காதா என்ன?

நான் இந்த இடத்தில் பல தடவை திரும்பத் திரும்ப சொன்ன விடயத்தை மீண்டும் சொல்கின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்களுக்குத் தெரிந்தாக வேண்டும், இன்றைக்குப் பெருந்தோட்டப் பகுதிகளில் வாழும் மக்களில் வெறுமனே 7-8 சதவீதம் மட்டும்தான் தோட்டத் தொழிலாளர்கள் என்பது. மிகுதி 92 - 93 சதவீதமானவர்கள் தோட்டத்தில் வேலை செய்யாத informal sectorஐச் சார்ந்தவர்கள். அவர்கள் பல்வேறு விஷயங்களை நோக்கி பயணித்துக்கொண்டு இருக்கிறார்கள். இன்றைக்கு மாண்புமிகு சனாதிபதி அவர்கள், குறிப்பாக இந்த 200 ரூபாவை வைத்துத்தான் பேசுகிறார். ஏன்? மலையகத்தில் சுகாதாரப் பிரச்சினை இல்லையா? நீர் வழங்கல் பிரச்சினை இல்லையா? இந்த மாதிரி பல்வேறு பிரச்சினைகள் அங்கு இருக்கின்றன. அவற்றையும் சனாதிபதி அவர்கள் கருத்திற் கொண்டு பேசுவாரென நான் எதிர்பார்த்தேன்.

உண்மையிலேயே நேற்று பெரும் எதிர்பார்ப்பு இருந்தது. ஆனால், ஏமாற்றம்தான் கிடைத்தது. நான் சனாதிபதி அவர்களிடம் எதிர்பார்த்தேன், காணி உரிமை சம்பந்தமாக ஏதாவது ஒரு கருத்தை தெரிவிப்பார் என்று. ஆனால், மாண்புமிகு சனாதிபதி அவர்கள் காணி உரிமை சம்பந்தமாக எந்த விடயத்தையும் பேசவில்லை. எனினும், அவர் ஒரு விஷயம் சொன்னார். அதை என்னால் இந்த இடத்தில் ஏற்றுக்கொள்ள முடியாது. ஆளும்கட்சியில் இருக்கின்ற மலையகப் பிரதிநிதிகள் யாராவது தயவுசெய்து எழுந்து சொல்லுங்கள், சனாதிபதி பெருந்தோட்ட நிறுவனங்களுடன் குத்தகை ஒப்பந்தத்தை நீடிப்பது சரியான முடிவு என்று. அது ஒரு தவறான முடிவு! நாங்கள் எதற்காகப் பெருந்தோட்ட நிறுவனங்களின் குத்தகை ஒப்பந்தத்தை நீடிப்பதற்கு இப்போது பேசிக்கொண்டு இருக்கின்றோம்? அது 2042இல்தானே முடிவடைகிறது.

இலங்கையின் அரசியலமைப்பின்படி, மாண்புமிகு சனாதிபதி அவர்கள் அடுத்த சனாதிபதித் தேர்தலில் ஜெயித்தால்கூட, இரண்டு தடவைதான் சனாதிபதியாக இருக்க முடியும். மிஞ்சி மிஞ்சிப் போனால் அதுகூட 2035இல்தானே முடிவடையும். அப்புறம் எதற்காக, அவருடைய ஆட்சிக் காலத்துக்குப் பிறகு இருக்கின்ற அதாவது, 2042இல் முடிவடைய வேண்டிய ஒப்பந்தம் பற்றி இப்போது பேச வேண்டும்? நான் இன்றைக்கு வெளிப்படையாகவே சொல்கிறேன், மலையகத்தில் பிரச்சினையாக இருப்பது, அங்கிருக்கின்ற அரசியல்வாதிகளோ, தொழிற்சங்கவாதிகளோ கிடையாது. மாறாக, பெருந்தோட்ட நிறுவனங்கள்தான்! It is corporate exploitation. அது நிறையப் பேருக்குப் புரிவதில்லை! இன்றைக்கு நீங்கள் என்ன செய்கிறீர்கள்? அந்த exploitationஐ வளர்த்துவிடுகிறீர்கள். "நீங்கள் மக்களைச் சீரழிக்கிறீர்களா, செய்யுங்கள்! குத்தகை காலத்தை இன்னும் கூட்டிக் கொடுக்கிறோம்" என்று சொல்வதைப்போன்று இருக்கின்றது. 2042இல் முடிவடைய வேண்டியதை கடைசியில் 2099இல்தான் முடிப்பீர்கள்! அதுவரைக்கும் மக்கள் என்ன செய்ய வேண்டும்?

சனாதிபதி அவர்கள் செய்கின்ற முதல் தப்பு, 2042இலும் மக்கள் தோட்டத்தில் வேலை செய்வார்கள் என்று நினைப்பதுதான். எங்களுடைய மக்கள் படித்து வெளியே வர முடியாதா என்ன? இன்றைக்கு இங்கு வந்து கேட்கிறார்கள், தொண்டமான் என்ன செய்திருக்கிறார் என்று. நாங்கள் ஸ்ரீ பாத கல்வியியற் கல்லூரியை உருவாக்கினோம். பெருந் தோட்டப் பகுதிகளில் வேலை செய்கின்ற தொழிலாளர் களுடைய பிள்ளைகளுக்கு அது பயனாக இருந்திருக்கிறது. இன்றைக்கு அரசாங்கம் நினைக்கிறது, அதைக் கல்வி அமைச்சின்கீழ் கொண்டுவர வேண்டும் என்று. எங்களிடம் இருப்பதையும் நீங்கள் எடுக்கப் பார்க்கிறீர்கள்! இது எந்தவிதத்தில் நியாயம்?இந்த விடயம் ஆளும்கட்சி, எதிர்கட்சி சார்ந்த விஷயமில்லை. இது ஒரு சமூகம் சார்ந்த விஷயம்! குறிப்பாக, அடையாளம் அற்ற ஒரு சமூகம் சார்ந்த விஷயம்! மாண்புமிகு சனாதிபதி அவர்களுடைய பிரதிநிதிகள், அவர் தும்மினாலும் கைதட்டுகிறார்கள்; இருமினாலும் கைதட்டு கிறார்கள்; பேசினாலும் கைதட்டுகிறார்கள்.

பெருந்தோட்டப் பகுதியைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற சில உறுப்பினர்கள் இங்கே சொல்லி இருக்கிறார்கள், "எங்களுக்குச் சமவுரிமை தேவை" என்று. நான் இன்றைக்கு வெளிப்படையாகவே சொல்கின்றேன், சமவுரிமை அல்ல, பொருந்தோட்டங்களில் வாழுகின்ற மக்கள்மீது அதிகளவான அக்கறை செலுத்தி, அவர்களுக்கு அதிகளவான உரிமைகளை வழங்கியாக வேண்டும் என்று. Equity is more important than equality. We do not require equality right now; we require equity. This word - நான் இப்பொழுது சொன்ன வார்த்தை - அன்று கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்கள் பேசும்போது சொன்னார், ஜீவன் தொண்டமான் சொல்வது சரியென்று. அப்படி இருக்கும்போது, நீங்கள் எப்படிச் சொல்ல முடியும் சமவுரிமை தேவை என்று.

என்னைப் பொறுத்தவரை, மாண்புமிகு சனாதிபதி அவர்கள் இன்னுமொரு விஷயத்தையும் புரிந்துகொள்ள வேண்டும். இன்றைக்கு நீங்கள் பெருந்தோட்ட மனித வள அபிவிருத்தி நிதியம் மூலமாக 45 வீட்டுத் திட்டங்களில் 35 வீட்டுத் திட்டங்களுக்குத்தான் மின்சாரம் மற்றும் தண்ணீர் வசதியை வழங்கி இருக்கிறீர்கள். வீதி வசதியை எந்த இடத்திலும் வழங்கவில்லை. அப்படி இருக்கும்போது, நீங்கள் ஒவ்வோர் இடத்திலும் மார்தட்டி சொல்கிறீர்கள், "நாங்கள் 6,000 வீடுகள் கட்டியிருக்கிறோம்; 10,000 வீடுகள் கட்டியிருக்கிறோம்" என்று. நான் வெளிப்படையாகவே இந்தச் சபையில் உங்களிடம் சொல்கிறேன். நீங்கள் ஜீவன் தொண்டமான் ஆரம்பித்த 1,300 வீடுகளில் 50 வீடுகளைத்தான் 2 வருடமாக கொஞ்சம் கொஞ்சமாக - செங்கல் செங்கலாக வைத்துக் - கட்டிக்கொண்டு இருக்கிறீர்கள். எனக்குத் தெரியும், அடுத்த வருட டிசம்பர் மாதத்திலும் நான் இதையேதான் சொல்லப் போகிறேன். எந்த வித்தியாசமும் இருக்காது. அதற்குள் ஒரு கேள்வி கேட்பார்கள், நீங்கள் என்ன செய்தீர்கள்? என்று. நான் வெளிப்படையாகவே சொல்கிறேன், எனக்கு அமைச்சரவையில் - Cabinetஇல் - இருப்பதற்கு ஒரேயொரு வருடம்தான் வாய்ப்புக் கிடைத்தது. அதாவது, நான் அமைச்சரவை அமைச்சராக ஒரேயொரு வருடம்தான் இருந்தேன். அப்போது, நாட்டின் சூழ்நிலை மட்டுமல்ல, சர்வதேசத்தின் சூழ்நிலையும் மோசமாகத்தான்

இருந்தது. இவர்களுக்குப் பிரச்சினை வந்தால் மட்டும் சொல்கின்றார்கள், ஈரான் யுத்தம், ஹோர்முஸ் பிரச்சினை என்று. எங்களுடைய காலத்தில் கொரோனா தொற்றே ஏற்பட்டது. அதுமட்டுமல்ல, உக்ரைன் - ரஷ்யா போர் இருந்தது. ஈரான் போர் அப்போதே ஆரம்பித்துவிட்டது. ஆனால், நாங்கள் காரணம் சொல்லவில்லை; வேலைகளைப் பார்த்தோம்.

குறிப்பாக நான் சொல்வதென்றால், நிதி ஒதுக்கீடு இல்லாத பட்சத்தில், பெருந்தோட்டத்துக்குப் பொறுப்பான அமைச்சராக இருந்தபோது, 1,000 ரூபாய் நாட் சம்பளத்தை gazette பண்ணினேன்; 1,350 ரூபாய் நாட் சம்பளத்தை gazette பண்ணினேன். நீண்ட நாட்களாக இழுத்தடிக்கப்பட்ட வீட்டுத்திட்டத்தை மீண்டும் ஆரம்பித்தேன். 950,000 ரூபாயாக இருந்த வீட்டின் பெறுமதியை 32 இலட்சம் ரூபாயாக அதிகரித்தேன். அதற்கே ஒன்றரை வருடம் போய்விட்டது. அதிகளவு காலம் ஏன் போனதென்றால், நாங்கள் டில்லியுடன் பேசி ஒரு விடயத்தில் அசையாமல் இருந்தோம். அதாவது, தோட்டத்தில் வேலைசெய்தால் மட்டும் வீடு இல்லை; தோட்டத்தில் பிறந்தால் வீடு என்று. ஆனால், இன்றைக்கு அதுவும் மாற்றப்பட்டு இருக்கிறது. அதாவது, மீண்டும் தோட்டத்தில் வேலை செய்தால் மட்டும்தான் வீடு! அந்தத் தோட்டத்தில் வளர்கின்ற குழந்தைகளுக்கு நீங்கள் என்ன காண்பிக்கிறீர்கள்? தோட்டத்தில் வேலைசெய்தால் உங்களுக்கு வீடு கிடைக்கும். படித்து teacherஆனால், doctorஆனால், வக்கீலானால் வீடு கிடைக்காது; கஷ்டத்தில் தான் இருக்க வேண்டும். இதில் என்ன அர்த்தம்?

இந்திய அரசாங்கத்தின் நிதியுதவியின்கீழ் 19 teachersஐ இங்கு அழைத்து வந்து, 2,000 ஆசிரியர்களுக்கு STEM education திட்டத்தின்கீழ் பயிற்சி வழங்கினோம். அந்த programmeஐத் தொடர்ச்சியாக முன்கொண்டு சென்றிருக்கலாம். ஆனால், நீங்கள் அதைச் செய்யவில்லை. இதுவரைக்கும் இந்திய அரசாங்கத்திடம் ஒரு கோரிக்கைகூட முன்வைக்கவில்லை. அதுமட்டுமல்லாமல், up-country இருக்கின்ற malnutritionஐக் குறைப்பதற்காக 1197 சிறுவர் பராமரிப்பு நிலையங்களில் உள்ள 26,000 சிறுவர்களுக்கு 6 மாதங்கள் காலை இலவச சத்துணவு வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்தினேன். இதை நினைத்து நான் பெருமைப்படுவேன். ஆனால், இன்று நீங்கள் என்ன செய்கின்றீர்கள்! இந்த programmeஐ continue பண்ணுமாறு கேட்டு ஒரு letterஐக்கூட இன்னும் அனுப்பவில்லை. மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் அவர்கள் மலையகத்தையும் பிரதிநிதித்துவப்படுத்தும் வகையில்தானே இருக்கின்றார். ஆனால், இதுவரை மலையகம் குறித்து அவர் என்ன சொல்லி இருக்கின்றார் என்பது எனக்குப் புரியவில்லை. இந்தப் programmeஐ continue பண்ணுங்கள் என்று ஒரு letterகூட உலக வங்கிக்கு அனுப்பப்படவில்லை. உங்களுடைய காசையா எங்களுடைய சிறுவர்களுக்குச் சாப்பாடு கொடுப்பதற்காக கேட்கின்றோம்?

எங்களைப் பொறுத்தவரை, அமைச்சராக இருக்கட்டும், அரசாங்கமாக இருக்கட்டும், அந்தப் பகுதியில் இருக்கின்ற மக்களின் கஷ்டம் என்ன என்பது தெரிந்திருக்க வேண்டும். அப்படித் தெரியாவிட்டால், நாங்கள் கட்டாயம் அது பற்றி பேசவேண்டி வரும். இதில்கூட, "ஜீவன் தொண்டமானுக்கு மட்டும் மக்களின் கஷ்டம் தெரியுமா?" என்று கேட்பீர்கள். ஆம்! கஷ்டத்தை அனுபவித்தால்தான் கஷ்டம் தெரியும் என்றில்லை. ஒரு சமூகத்துக்குத் தலைமைதாங்குவதென்றால், அந்தச் சமூகம் என்ன கஷ்டத்தை அனுபவிக்கின்றது என்பதைத் தெரிந்துகொண்டுதான் பேச வேண்டும். இன்று நீங்கள் சமூகத்தைப் பாதுகாக்கவோ, சமூகத்துக்குச் சேவை செய்யவோ வரவில்லை. நாங்கள் எதைக் கேட்டாலும், நீங்கள் "எங்கள் தேசிய மக்கள் சக்தி அரசாங்கம்தான், இதுவரை இருந்த அரசாங்கங்களிலேயே சிறந்த அரசாங்கம்" என்று சொல்கிறீர்கள். சரி, அது இருக்கட்டும்! அதை யார் வேண்டாம் என்றார்கள்? இன்று மலையகத்தின் பகுதிகளில் அபிவிருத்தி வேலைகள் நடைபெற்றிருக்கிறதோ இல்லையோ, வீதிகள் திறக்கப்பட்டு இருக்கிறதோ இல்லையோ, school கட்டப்பட்டு இருக்கிறதோ இல்லையோ, ஒவ்வொரு பகுதியிலும் உங்களுடைய தேசிய மக்கள் சக்தியின் காரியாலயங்களை மட்டும் திறந்து வைத்து இருக்கிறீர்கள். இது மக்களுக்கே தெரியும். நீங்கள் மனச்சாட்சிக்கு உண்மையாக இந்த இடத்தில் பேசியாக வேண்டும்.

எனக்கு மாண்புமிகு சனாதிபதிமீது கட்டாயம் மனவருத்தம் இருக்கிறது. அவர் lease ஒப்பந்தத்தைப் பற்றி பேசுவார் என்று நான் சத்தியமாக எதிர்பார்க்கவில்லை. நான் ஏன் JEDB, SPC, Elkaduwa Plantations ஆகியவற்றைப் பற்றி பேசுகின்றேன் என்றால், அவற்றின்கீழ் உள்ள காணிகளைத் தனியார் முதலீட்டாளர்களுக்குக் கொடுத்தால், நாளை அங்கு வாழும் மக்கள் பெரும் அவஸ்த்தைப்படுவார்கள். இதற்குச் சிறந்த உதாரணமாக ஹல்துமுல்ல சம்பவத்தைச் சொல்லலாம். ஹல்துமுல்ல பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பத்தகொடகொடவில் என்ன நடைபெற்றது? அந்தத் தனியார் நிறுவனம், சட்ட ரீதியாக eviction orderஐப் பெற்றிருந்தது என்பதை நான் ஏற்றுக்கொள்கின்றேன். என்னதான் eviction orderஐப் பெற்றிருந்தாலும், மனிதர்களை மதிக்க அவர்களுக்குத் தெரியவில்லை. அங்கிருந்த வீடுகளை உடைத்தெறிந்து மக்களை roadஇல் தூக்கி எறிந்தார்கள். அப்படியிருக்கும்போது, 3,000 ஏக்கர் காணிகளைத் தனியார் நிறுவனங்களுக்குக் கொடுக்க முயற்சிக்கின்றீர்கள். முதலில் ஒரு சட்டத்தை உருவாக்கி மக்களைப் பாதுகாக்குங்கள்! அதன் பின்னர், நீங்கள் தனியார் நிறுவனங்களுக்கோ அல்லது முதலீட்டார்களுக்கோ கொடுங்கள்! அது பற்றி எங்களுக்கு எந்தப் பிரச்சினையும் இல்லை.

நீங்கள் அவசரப்பட்டு lease காலத்தை அதிகரிக்கப் போகின்றோம் என்று சொல்கின்றீர்கள். அது தொடர்பாக எனக்குப் புரிகின்ற விஷயம் ஒன்றுதான். இது பொது அறிவு உள்ள அனைவருக்கும் புரியும். அப்படி என்றால், 200 ரூபாய் சம்பள அதிகரிப்பானது, பெருந்தோட்ட நிறுவனங்கள் மாண்புமிகு சனாதிபதியிடம் சொல்லி இருக்கின்றன, " நாங்கள் 200 ரூபாய் சம்பளத்தை அதிகரிக்கத் தயார்! அதே நேரத்தில், நீங்கள் குத்தகை ஒப்பந்த காலத்தை அதிகரிக்க வேண்டும்" என்று. அப்படியானால், அதற்குப் பெயர் இலஞ்சம்! இன்று நான் உங்களுக்கு வெளிப்படையாகச் சொல்கின்றேன். பெருந்தோட்ட நிறுவனங்களிடமிருந்து சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதாக இருக்கட்டும், வீட்டுத்திட்டமாக இருக்கட்டும், அபிவிருத்தியாக இருக்கட்டும், எல்லா விடயங்களிலும் அரசாங்கம் fail அடைந்துவிட்டது. இதுதான் உண்மை!

உங்களுக்குக் கொடி பிடிப்பதற்கென சில கூட்டத்தினர் இருக்கலாம்! நாட்டில் என்ன நடந்தாலும், "பார்த்தீர்களா! எங்களுடைய சனாதிபதி நாமல் ராஜபக்ஷவைச் சிறையில் அடைத்து விட்டார்; அவரைச் சிறையில் அடைத்துவிட்டார்; இவரைச் சிறையில் அடைத்துவிட்டார்" என்று அவர்கள் சொல்லிக் கொண்டிருப்பார்கள். மக்களைப் பொறுத்த வரைக்கும், அவர்களின் வாழ்க்கைச் செலவுக்கு என்ன செய்வது? அன்று வாழ்க்கைச் செலவு தொடர்பாக கௌரவ அமைச்சரிடம் கேட்டபோது, " மிக விரைவில் மலையகத்தில்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

இருக்கின்ற அரசியல்வாதிகளை investigate செய்வோமென்று அவர் சொன்னார். விசாரணை செய்யுங்கள்! யார் வேண்டாம் என்று சொன்னது? அதற்காக மக்கள்மீது வாழ்க்கைச் சுமையைச் சுமத்திக்கொண்டு, எல்லாமே சரியாக இருக்கின்றது போன்ற கண்கட்டி வித்தையைக் காண்பித்தால் எப்படி நம்புவது?

Just one last matter. ஓர் எதிர்க்கட்சியாக உங்களிடம் கேள்விகளையும் கோரிக்கைகளையும்தான் முன்வைக்க முடியும். நான் இங்கு பேசுகின்ற அனைத்துமே மலையக மக்களிடம் கலந்துரையாடிய பின்பு தெரிந்துகொண்ட விஷயங்கள் ஆகும். அது ஓர் எதிர்க்சி உறுப்பினராக எனக்கு மக்கள் வழங்கிய ஆணை! உங்களுக்கு மட்டும் மக்கள் ஆணை வழங்கவில்லை.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, give me just one more minute. I am almost done.

இறுதியாக நான் இந்த இடத்தில் ஒரேயொரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். பெருந்தோட்ட நிறுவனங்களுடனான lease agreementஐப் பொறுத்தவரை, இது மிகப்பெரிய தவறில் போய் முடியும். அந்தத் தவறை அரசாங்கம் செய்யாது என்று நான் நம்புகின்றேன். அப்படிச் செய்தால் கட்டாயம் மக்கள் வீதிக்கு இறங்குவார்கள். நான் இந்த இடத்தில் இன்னுமொரு விடயத்தையும் சொல்லிவிட்டு முடிக்கிறேன். இன்றைக்கு நீங்கள் ஆளும் தரப்பில் இருக்கிறீர்கள். நீங்கள் இந்த lease agreementஐ நீடித்தால், நான் என்றைக்காவது ஆளும் தரப்புக்கு வந்தால், அன்றைக்கு அந்த lease agreementஐ இந்தச் சபையிலே கிழித்து வீசுகிறேனா, இல்லையா என்று பாருங்கள்!

நுவரெலியா மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களின் கவனத்திற்கும் நான் ஒரு விஷயத்தைக் கொண்டுவர விரும்புகின்றேன். ஜனாதிபதி அவர்களின் வரவு செலவுத்திட்ட உரையில், மன்னார் போன்ற பகுதிகளிலுள்ள hospitalஐ Health Ministryக்குக்கீழ் நேரடியாகக் கொண்டுவருவதென்ற விடயத்தைச் சொல்லியிருந்தார். நுவரெலியா மாவட்டத்தில், District General Hospital, Nuwara Eliya மட்டும்தான் Health Ministryக்குக்கீழ் இருக்கின்றது. அங்கே கிளங்கன் hospital பிரதான வைத்தியசாலையாக இருக்கின்றது. மக்கள் அதனைத்தான் கூடுதலாகப் பாவிக்கின்றார்கள். அரசாங்க தரப்பில் இருக்கின்ற பிரதிநிதிகள் ஜனாதிபதி அவர்களுக்கு இதனை எடுத்துக்கூறி, உரிய நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். நன்றி.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.18]

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අපේ ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කළා, මුදල් විෂය භාර අමාත්‍යවරයා විධියට. එය පරිවර්තනීය අය වැයක්. මගේ කියවීම තමයි, එය ඉතාම යෝග්‍යයි; අවස්ථානුකූලයි; ඒ වාගේම අංග සම්පූර්ණයි; ඉලක්ක සහගතයි කියන එක. එම නිසා ඒක මෑත ඉතිහාසයේ ඉදිරිපත් කරපු යුගයට - මේ අවධියට - ගැළපෙන අය වැයක් විධියට තමයි අපි දකින්නේ. හැබැයි, මීට ටික වේලාවකට කලින් අපේ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම මෙතැන එකතු වෙලා කථා කර කර හිටියා. මම දැක්කා, නිකටේ අත තබාගෙන මොකක්දෝ දෙයක් වෙලා වාගේ ඒ අය ඉන්නවා. ඉතින් සමහර මන්ත්‍රීවරුන්ට කරුණු ඉදිරිපත් කරන්න ගිහිල්ලා ආර්ථික වර්ධනයයි, ආර්ථික වර්ධන වේගයයි දෙකත් පැටලිලා. එක්කෝ තේරෙන්නේ නැහැ, එක්කෝ පැටලිලා. ආර්ථික වර්ධනය ඍණ වෙලාලු, අඩු වෙලාලු. ආර්ථික වර්ධන වේගය සහ ආර්ථික වර්ධනය ගැන මෙලෝ අදහසක් නැතුව තමයි මේ අය කථා කරන්නේ.

මේ සඳහා විවිධ දර්ශක තිබෙනවා. ලෝක බැංකු වාර්තාවේ තිබෙන දර්ශකය අනුව 2026 වර්ෂයේ අපේ ආර්ථික වර්ධනය සියයට 4.4ක්; 2027 වර්ෂයේ එය සියයට 4.2ක් කියලා හිතනවා. ආසියානු සංවර්ධන බැංකුවේ - ADB එකේ - ඇගැයීම්වලට අනුව ගත්තොත්, 2026 වර්ෂයේ සියයට 4ක්; 2027 වර්ෂයේ සියයට 4.2ක් වනවා. එහෙම තමයි, මේ වර්ධන පුරෝකථනවල වෙනස්කම් තිබෙනවා. ඒවා පදනම් කරගෙන දේශපාලන සාකච්ඡාවක්, එහි ඉලක්කමක අගයක් පදනම් කරගෙන ආර්ථික වර්ධනය අඩු වෙලා හරි මොකක් හරි කියන එක හරිම අදේශපාලනික කාරණයක්. ඉතින් එතුමන්ලාට මම කොහොමද මේ දේවල් පැහැදිලි කරන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. ඒක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

කොහොම වුණත්, අද දවසේ විපක්ෂයේ කථා අතරමැදින් මතු වෙච්ච කථා, අරවා මේවා ඔක්කෝම ගත්තොත්, ඒවායේ තිබෙන්නේ අර Facebook එකේ දේශපාලනය. Facebook එක පදනම් කරගෙන තමයි ඔවුන් දේශපාලන සාකච්ඡාව මතු කර ගන්න උත්සාහ කරන්නේ. Facebook එකට ගිහිල්ලා බැලුවාම අපට පෙනෙන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුගයට සාධාරණ අය වැයක්, යුගයට සරිලන අය වැයක්, රටේ ඉලක්ක නිර්මාණය කරන අය වැයක් ඊයේ ඉදිරිපත් කළා. ඒ වාගේම අය වැය ඉදිරිපත් කරන්නටත් කලින් ප්‍රකාශ කරලා තිබුණා, මෙවර අය වැයෙනුත් රාජ්‍ය සේවයට සහ අනෙකුත් සේවාවන්ට යම් වැටුප් වැඩි කිරීමක්, දීමනා වැඩි කිරීමක් තිබෙනවා, නමුත් මේ අය වැයෙන් සියල්ලම කරන්න බැහැ කියන එක. නමුත්, යම් අත්‍යවශ්‍ය සේවාවලට දීමනා යම් ප්‍රමාණයක් වැඩි කරනවා කියන එක නිශ්චිත කරලා තමයි මේ යුගයට, මේ අවස්ථාවට ගැළපෙන විධියට මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

හැබැයි, දැන් Facebook එකට ගිහිල්ලා බැලුවා නම් පෙනෙනවා, අර සේවාව විනාශ කරලා තිබෙනවා; මේ සේවාවට ඇරියා කියන වාගේ වචනත් එක්ක තමයි සමහර වෙලාවට Facebook එක ඇතුළේ මේ අය වැය සම්බන්ධව තොරතුරු දාලා තිබෙන්නේ කියන එක. සමහර කණ්ඩායමක් උත්සාහ කරමින් ඉන්නවා, ඒ වාගේ පොඩි වෛරයක් ගොඩනැඟීම සඳහා වෙච්ච මාතෘකා හදන්න. හැබැයි, ඒ ඇත්ත සේවකයෝවත්, ඇත්ත නිලධාරීන්වත්, ඇත්ත මිනිස්සුවත් නොවෙයි, සමහර ඒවා fake. සමහරුන් එහෙම fake profile එකකින් වැඩ කරමින් ඉන්නවා.

ඉතින් මේ අපේ ආදරණීය විපක්ෂය සෑහෙනදුරට උත්සාහ කරනවා, අන්න ඒ කොටස පාර්ලිමේන්තුව ඇතුළේ highlight කරන්න. අජිත් මන්ත්‍රීතුමාත් ඒ වාගේ කථාවක් මතු කළේ ඒකයි. කොහොම වුණත්, අපි සැලකිල්ලට ගන්න ඕනෑ, විශේෂයෙන්ම මේ PAYE Tax එක සම්බන්ධ ප්‍රශ්නය පිළිබඳව. මම හිතනවා, ඒ සම්බන්ධව හරිම අදහසක් ජනතාවට යන්න ඕනෑ කියලා. 2023 ජනවාරි පළමුවෙනි දා ඉඳලා ක්‍රියාත්මක වන පරිදි රනිල් වික්‍රමසිංහ මහත්තයා ආ පසු IMF එකත් එක්ක එකතු වෙලා තමයි ඔය PAYE Tax එක මුලින් වැඩි කළේ. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා යම් ආකාරයකට, ඒ කියන්නේ විශාල වශයෙන් වෙනස් කරලා තිබ්බිව්ව එකක් තමයි ඔය PAYE Tax එක. ගෝඨාභයගේ මේ අඩු කිරීම නිසාම ආර්ථිකයට දැවැන්ත බලපෑමක් ඇති වුණා. මම හිතන්නේ රුපියල් බිලියන හය හත්සියයක් loss කර ගත්තා. ඒක තමයි ආර්ථික අර්බුදයක් ඇති වෙන්න ප්‍රධාන හේතුව වුණේ. ඒකට උඩින් රසායනික පොහොර තහනම් කරගෙන ඒ නටපු නාඩගමත් තිබුණා. ඒවාට උපදෙස් දීපු කණ්ඩායම් දීපු උපදෙස් මත පදනම් වෙලා කරපු ක්‍රියාකාරකම් නිසා රටේ ආර්ථිකය වැටුණා; දැවැන්ත ලෙස වැටුණා.

ඊට පසුව රනිල් වික්‍රමසිංහ මහත්තයා බලයට ආවාම තිබුණාටත් වඩා වැඩියෙන් බදු පනවන්න සිදු වුණා. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ තීන්දුව මත රාජ්‍ය නිලධාරීන් විධියට අපට ඒ අවස්ථාවේදී තිබුණු වැටුපටත් වඩා අඩු වැටුපක් ලබා ගැනීමට සිදු වුණා. PAYE Tax එක සංශෝධනයත් සමඟ මගේ වැටුප රුපියල් 27,000කින් පමණ අඩු වුණා. ඒ අනුව මට ලැබෙමින් තිබුණු වැටුප අඩු වුණා. වැටුපත් අඩු කරපු එහෙම ආණ්ඩු තිබුණු රටක්, මේක. එහෙම තමයි රාජ්‍ය සේවයට සලකා තිබුණේ. ඒ කාලයේ තිබුණේත් අඩු වැටුපක්. උද්ධමනය අදටත් වඩා වැඩියි. බඩු මිල අදටත් වඩා වැඩියි. ජීවන වියදම අදටත් වඩා වැඩියි. එවැනි තත්ත්වයක් තිබියදී රාජ්‍ය සේවයේ රුපියල් ලක්ෂයකට වඩා ශතයක හෝ වැඩි වැටුපක් ලබන පුද්ගලයන්ට බදු පැනවූවා. කිසිම ආකාරයක සහනයක් සැලසුවේ නැහැ. සමහර නිලධාරීන් රනිල් වික්‍රමසිංහ මහත්තයා හමු වෙලා වැටුපට සහනයක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටි විට කිව්වේ මොකක්ද? ගිහිල්ලා IMF එකෙන් ඉල්ලාගන්න කිව්වා. අඩු ගණනේ පුටුවක වාඩි කරවාවත් නොවෙයි, එහෙම කිව්වේ. හිටගෙන ඉන්න කොටම කිව්වා, ගිහිල්ලා IMF එකේ නිලධාරීන් හම්බ වෙන්න කියලා.

අද රට මේ තත්ත්වයට පත්ව තිබෙන්නේ යම් බාහිර කම්පන එක්කයි. මෙහිදී අපි තේරුම් ගත යුතු කාරණය වන්නේ මෙයයි. එම අවස්ථාවේදී රට ආර්ථික අර්බුදයට ඇද වැටුණේ තනි රටක් වශයෙන් මිසක්, ලෝක අර්බුදයක් නිසා හෝ ලෝකයේ ඇති වූ ගැටුමක් නිසා හෝ වෙනත් බාහිර කම්පනයක් නිසා හෝ නොවෙයි. එය තනි රටක ඇති වූ අර්බුදයක්. එම අර්බුදය create කරපු මහත්වරුන් තමයි මේ විපක්ෂයේ ඉන්නේ. ඒ මහත්වරුන් මැදිහත් වී නිර්මාණය කළ ආර්ථික අර්බුදය නිසාම මේ රටේ ව්‍යාපාරිකයන්ගේ වැටුප් කපා දැමූ යුගයක් අපට තිබුණා. ඉන් පසුව තමයි අපි බලයට පත් වුණේ. අපි බලයට පත් වීමෙන් පසුව මේ යුගයේ කළ හැකි උපරිම ප්‍රමාණයෙන් වැටුප් වැඩි කර තිබෙනවා. ඒ අනුව පසුගිය අවුරුදු දෙක තුළ -2025 මාර්තු මාසයේ සිට 2026 අවසානය වන විට, එසේ නැත්නම් 2027 ජනවාරි මාසය වන විට- වැටුප සියයට 70කින්, 80කින් වැඩි කිරීමට අපි මහන්සි වී තිබෙනවා. ඒක තමයි අපට ලබා දිය හැකි උපරිමය. මේ අවස්ථාවේදී අපට ලබා දිය හැකි උපරිම ප්‍රමාණය එයයි.

අපි රජයේ වෛද්‍යවරයෙකුගේ වැටුප ගැන බලමු. ඔය නායකයින් කියන කථාව නොවෙයි සාමාන්‍ය වෛද්‍යවරුන් කියන්නේ. ඔවුන් සමඟ පෞද්ගලිකව කථා කළාම බොහෝදෙනකු මේ කාරණය පිළිගන්නා බව අපි දන්නවා. රජයේ Grade 1 වෛද්‍යවරයකුගේ වැටුප දළ වශයෙන් රුපියල් ලක්ෂයක පමණ ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. තිබුණු වැටුපට වඩා තුනෙන් එකක ප්‍රමාණයකටත් වැඩියෙන් වැටුප් වැඩි වී තිබෙනවා. ඒක තමයි ඇත්ත. ඒක ඒ වෛද්‍යවරුන් දන්නවා. හැබැයි, වෛද්‍ය නායකයින් යැයි කියාගන්නා සමහර අය උත්සාහ කරමින් සිටිනවා, මේ ආණ්ඩුව වෛද්‍ය සේවය සමඟ දැඩි වෛරයකින් සිටිනවා, ආණ්ඩුවට අවුලක් තිබෙනවා, ඒ නිසා ඔවුන්ව නොසලකා හරිනවා කියන්න. ඔවුන්ගේ දීමනා වැඩි කරලා තිබියදීත් එවැනි කාරණා කියනවා. අනෙකුත් ව්‍යාපාරිකයින් අස්සේත් එහෙම අය ඉන්නවා. ඒ සියලුදෙනා තේරුම් ගත යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි අපට මේ රට තිබෙන ආකාරයටම ඉදිරියට ගෙන යන්න බැහැ කියන කාරණය. දැන් අපි රට ස්ථාවර කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වන විට ස්ථාවර කර තිබෙන රාජ්‍යය දැවැන්ත සංවර්ධනයක් අත්පත් කර ගත්තොත් තමයි එම සංවර්ධනයේ ප්‍රතිලාභ වශයෙන් නැවත වැටුප් සහ දීමනා වැඩි කිරීමට හැකි වන්නේ. රට සංවර්ධනය නොකර, දැනට භාණ්ඩාගාරයේ තිබෙන මුදල් බෙදාගැනීමට නොවෙයි මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටින්නේ. එම නිසා මුල් අවුරුදු දෙක අපට ගත කිරීමට සිදු වුණේ රට ස්ථාවර කිරීමටයි. හැබැයි, එම ස්ථාවර කිරීම මත දැන් රුපියල් ට්‍රිලියන දෙකකට වඩා වැඩි Capital Expenditure එකක් ඉදිරිපත් කරලා අපි උත්සාහ කරනවා, මේ රටේ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරමින්, ආයෝජන කැඳවා ගනිමින් ඉදිරි පිම්මක් පනින්න. අන්න ඒකයි මෙය පරිවර්තනීය අය වැයක් ලෙස නම් කර තිබෙන්නේ. සියලු රාජ්‍ය සේවකයින්ගෙන් සහ රටේ සියලු පුරවැසියන්ගෙන් අපි ඉල්ලීමක් කරනවා, මේ තත්ත්වය තේරුම් ගනිමින්, මේ පිළිබඳව අවබෝධ කර ගනිමින් ඔබ සියලුදෙනාම එකතු වෙන්න කියා, මේ පරිවර්තනීය අය වැයේ ප්‍රතිලාභ නැවත ජන සමාජයට ලැබෙන යුගයක් බිහි කර ගන්න.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.27]

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම නිදහසෙන් පසුව ඉදිරිපත් කරන 81වැනි අය වැය තමයි ගරු ජනාධිපතිතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කර, රටේ මූලික නීතියක් බවට පත් කිරීමට සූදානම් වී සිටින්නේ. විශේෂයෙන්ම අප සලකා බැලුවොත්, මේ අවුරුදු 81ක කාල සීමාව තුළ ඉදිරිපත් කළ අය වැයවලට වඩා ඉතා බරපතළ විධියේ ව්‍යුහාත්මක වෙනස්කම්

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

කිහිපයක් සහිතව තමයි මෙම අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. මොකද, ආර්ථික පීඩනයන් සහිතව සිටි ජනතාව සමාජ පරිවර්තනයක් ඉල්ලා හිටපු යුගයක් වුණු 2024 නොවැම්බර් මාසයේ තමයි අපි බලය ලබා ගත්තේ. විශේෂයෙන්ම 2025 සහ 2026 කියන අවුරුදු දෙක තුළ ශක්තිමත් ආර්ථික පදනමක් ගොඩනැඟීම වෙනුවෙන්, සමාජ වටපිටාවක් ගොඩනැඟීම වෙනුවෙන්, ආර්ථික, සංස්කෘතික, සමාජයීය සහ ජාත්‍යන්තර වටපිටාවක් ගොඩනැඟීම වෙනුවෙන් රටක් විධියට මහන්සි වෙලා වැඩ කරලා තමයි පරිවර්තනීය අය වැයක් 2027 වසරට ඉදිරිපත් කළේ.

ඔබතුමන්ලා දන්නවා, සෑම දර්ශකයක්ම ඉහළට ගනිමින් රට යම් ස්ථාවර තැනකට ගෙනෙන්න අපි සමත් වෙලා තිබෙනවාය කියන එක. එහිදී නොසිතූ පරිදි "දිටිවා" ව්‍යසනය, ඒත් එක්කම මැද පෙරදිග යුද්ධය වැනි කාරණා නිසා ආර්ථිකයේ යම්කිසි වලනයන් සිදු වුණත් අපි ඒවා දරා ගනිමින් රටක් විධියට ශක්තිමත්ව, ස්ථාවර තත්ත්වයක ඉඳගෙන තමයි මේ Budget එක ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය තුළ මීට පෙර ඉදිරිපත් කළ අය වැයවල තිබුණාට වඩා වෙනස්කම් ටිකක් තිබෙන බව අපි දකිනවා. ඒ වෙනස්කම් ටික ගත්තොත්, පරිවර්තනීය වෙනසක් මුල් කරගෙන තමයි අපි කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා මේ සාම්ප්‍රදායික විපක්ෂය පැත්තෙන් මේකට වටිනාකමක් ලබා දෙන්න අසමත් වුණාට සමාජයක් විධියට අපි මේක වැලඳ ගනිමින් ඉන්නවා. අනිවාර්යයෙන්ම අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදලා තිබෙන්නේ අනාගතයට ගැළපෙන මනුෂ්‍යයෙක් නිර්මාණය කිරීම වෙනුවෙනුයි. එතකොට මේ ප්‍රතිසංස්කරණ ගෙනෙන්නේ පරිවර්තනීය අවශ්‍යතාවක් වෙනුවෙනුයි. ඒ වාගේම මේ සාම්ප්‍රදායික විපක්ෂයට රට පාලනය කළ කාල සීමාව තුළදී කර ගන්න බැරි වුණු ගොඩාක් දේවල් තිබුණා.

විශේෂයෙන්ම රටේ ආර්ථික පදනම සකස් කරද්දි බදු ප්‍රතිපත්තිය වැදගත් වෙනවා. මහා භාණ්ඩාගාරය පුරවන්න ඕනෑ. විශේෂයෙන් බදු පදනම පුළුල් කිරීම පදනම් කරගෙන තමයි අපි කටයුතු කරමින් ඉන්නේ. ඒකෙදී බදු අනුකූලතාව ඉහළ නැංවීම, දූෂණය අවම කිරීම හා නවීන බදු විගණන රාමුවක් ඇති කරමින්, බදු ප්‍රතිපත්තිය සරල කරමින් කටයුතු කරන්න තමයි අපි සැලසුම් කරමින් ඉන්නේ. ඒ වාගේම මේ රට පරිවර්තනීය යුගයට යනවා නම් ඒකේ මූලික කොන්දේසියක් තමයි ඩිජිටල්කරණය. අපි ඉදිරියේදී ජාතික ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීමට බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම රාජ්‍ය සේවය ඩිජිටල්කරණය හරහා කාර්යක්ෂම සේවයක් බවට පත් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ අය වැය හරහා ඩිජිටල්කරණය දෙසට හැරෙන ව්‍යුහාත්මක වෙනස්කම් අපි කරමින් ඉන්නවා.

ඒත් එක්කම මේ රටේ ස්ථාවරත්වය පවත්වා ගෙන යෑමට නම් අපිට අනිවාර්යයෙන්ම පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් අදාළ වන පරිවර්තනීය වෙනසක් කරන්න ඕනෑ. ආණ්ඩුව පැත්තෙන් මේ අය වැය හරහා ඊට අදාළ කටයුතු සූදානම් කරමින් ඉන්නවා. විශේෂයෙන්ම ගබඩා ධාරිතාව පුළුල් කිරීම, තෙල් ටැංකි අලුතෙන් හැදීම, සෝලා සඳහා බැටරි පද්ධති සකස් කිරීම මේ පරිවර්තනීය ක්‍රියාවලියේ කොටස් විධියට තමයි අපි දකින්නේ. ඒ අනුව 2027 අය වැය මේ පරිවර්තනීය කටයුත්තට අදාළ මූලික පදනම අනුව තමයි සකස් කරලා තිබෙන්නේ.

ඒ අතරතුර අපි දකිනවා, මීට පෙර ඉදිරිපත් කළ අය වැයවල් තුළ වෙනස්කම් කිහිපයක් තිබුණු බව. මොකක්ද, ඒ අය වැයවල් තුළ තිබුණේ? පාරිභෝගිකයන්ට සහනාධාර දෙනවා වෙනුවට මැනිවරණ ඉලක්ක කරගෙන, කෙටි කාලීන සුබසාධන ක්‍රම හඳුන්වා දෙමින්, ඒ සඳහා කටයුතු කරමින් හිටියා. ඒ වෙනුවට ආර්ථික ස්ථාවරත්වය, නිෂ්පාදන ආර්ථිකය, අපනයන වර්ධනය වාගේම අනෙක් පැත්තෙන් ආයෝජන ප්‍රවර්ධනය ආදී ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් තමයි අපි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ.

අය වැය හිඟය පියවීම සම්බන්ධයෙන් ගත්තත්, මීට පෙර පැවති ආණ්ඩු කටයුතු කරමින් හිටියේ දේශීය සහ විදේශීය ණය කඳු ගොඩගහගෙනයි. ඒත් එක්කම බැංකු පද්ධතියෙන් සහ මුදල් අච්චු ගැසීම් වැනි අනෙකුත් ඉතාම සරල ක්‍රම හරහා උද්ධමනයක් ඇති වන විධියට තමයි කටයුතු කරමින් හිටියේ. ඒ වෙනුවට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අදාළව ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 12.9කට සීමා කර ගනිමින් ආර්ථික ක්‍රියාවලිය හසුරුවමින් තමයි මේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නේ.

ඒ නිසා මේ ආණ්ඩුව දැක්මක් සහිතව ඉතාම ක්‍රමානුකූල පරිවර්තනීය ගමනක් යාමට කටයුතු කරමින් ඉන්නවා. අසාමාන්‍ය විධියට භාණ්ඩ හා සේවා මත වක්‍ර බදු ගසමින් කටයුතු කරමින් හිටියා, පසුගිය කාලයේ හිටපු පාලකයන්. ඒ වෙනුවට අපි බදු පදනම පුළුල් කරමින්, බදු පරිපාලනය ඩිජිටල්කරණය කරමින් ඉතා විධිමත් තැනකට මේ රට ගනිමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මොහොතකට පෙර කථා කළ ජීවන් තොන්ඩමන් මැතිතුමා මලෙයහම් ජනතාවට, මධ්‍යම කඳුකරයට මේ අය වැය හරහා මොකුත් සිදු වෙලා නැහැ කියලා විවේචනයක් ඉදිරිපත් කළා. විශේෂයෙන් මම එතුමාට කියන්න කැමතියි, අපි මලෙයහම් ජනතාවට - වතු කම්කරු ජනතාවට - රුපියල් 200ක වැටුප් වැඩි කිරීමක් 2026 අය වැයෙන් සිදු කළ බව. ඒ හා සමානව 2027 අය වැයෙනුත් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා වතු කම්කරු ජනතාවගේ දෛනික වැටුප් වැඩි කිරීමට අදාළ පියවර අරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, එතුමාට අමතක වෙලා තිබෙනවා, "දිටිවා" ආපදාවෙන් වැඩිම විනාශයකට ලක් වුණු දිස්ත්‍රික්කය, නුවරඑළිය දිස්ත්‍රික්කය කියලා. "දිටිවා" ආපදාවෙන් විනාශ වෙච්ච නුවරඑළිය දිස්ත්‍රික්කය යළි ගොඩනැඟීම සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් මේ වෙනකොට යොදවා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ඉන්න දිසාපතිතුමිය ඇතුළු නිලධාරීන් සියලු දෙනාට කරගන්න බැරි තරම් වැඩ ගොඩක් ඇවිත් තිබෙනවා, මුදල් ඇවිල්ලා තිබෙනවා. අපි ඒ සියලු වැඩ කටයුතු කරන්නේ වතු ජනතාවගේ - මලෙයහම් ජනතාවගේ -, මධ්‍යම කඳුකරයේ සියලුම ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහායි.

තොන්ඩමන් මැතිතුමා තවත් කාරණයක් ඉදිරිපත් කළා. තොන්ඩමන් මැතිතුමන්ලාගේ කාලයේ වතු නිවාස හදලා තිබෙනවා, මේ ආණ්ඩුව ඒක කරන්න අසමත් වුණා කියලා එතුමා කිව්වා. අපි කියන්න කැමතියි, මේ වනකොට වතු නිවාස 1,194ක වැඩ කටයුතු සිද්ධ කරමින් තිබෙන බව. සොබා දහමේ ඇති වෙලා තිබෙන තත්ත්වයනුත්, ඉඩම් පිළිබඳ ගැටලුත් පදනම් කරගෙන අපට ඒ කටයුතු කිරීමේදී යම්කිසි කාල පමාවක් සිද්ධ වුණා. 2027 මුල් කාර්තුව වනකොට නිවාස 1,194ක් වතුකරයේ ජනතාවට ලබා දෙන්න මේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. මේ වෙනකොට එම නිවාස 500ක වැඩ කටයුතු නිමා වෙමින් තිබෙනවා. මෙම වසරේ දෙසැම්බර් මාසයේ 31වැනි දා වෙන්න කලින් අපි වතුකරයේ ජනතාවට ඒ අදාළ නිවාස ටික භාර දෙන්න සූදානමින් සිටිනවා.

ඒත් එක්කම එතුමා එම විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාල සීමාවේදී ආපදාවලින් විනාශ වෙලා තිබුණු

නිවාස ටික හදා ගන්න බැරිව හිටියේ. ඒවා බාගෙට හදලා තිබුණේ. අපි අන්න ඒ නිවාස 109 වැඩ කටයුතුත් මේ වෙනකොට අවසන් කරමින් ඉන්නවා. ඒ වාගේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති විශාල වශයෙන් සිද්ධ වෙමින් තිබෙනවා. මේ වනකොට හැටන් නගර සංවර්ධන කටයුතු සිදු වෙමින් තිබෙනවා. 2027 අය වැය තුළට නුවරඑළිය නගර සංවර්ධන සැලැස්මත් ඇතුළත් කරලා තිබෙනවා. එතුමා අහනවා, ජනාධිපතිතුමා නුවරඑළිය දිස්ත්‍රික්කයට මොනවාද කළේ කියලා. අපි ජාතික සැලැස්මක් අනුව විද්‍යාත්මක ක්‍රමයක් යටතේ තමයි සංවර්ධන කටයුතු සිද්ධ කරන්නේ. සොබා දහමේ අභියෝගවලට නිතරම ලක් වන, ජනතාව පීඩාවට පත් වන දිස්ත්‍රික්කයක් වෙච්ච නුවරඑළිය දිස්ත්‍රික්කයේ හිතුමතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ නිසා මෙවර අය වැය තුළ ජනාධිපතිතුමා මධ්‍ය කඳුකර ආරක්ෂණ අධිකාරි පනත ගැනත් සඳහන් කර තිබෙනවා. ඒකත් මේ Budget එකට දාලා තිබෙනවා. මේ ආණ්ඩුව පැහැදිලි දැක්මක් සහිතව, විද්‍යාත්මක ක්‍රමයකට සංවර්ධන කටයුතු මෙහෙයවන ආණ්ඩුවක් බව හිටපු ඇමති ජීවන් තොන්ඩමන් මැතිතුමාට අමතක වෙලා තිබෙනවා. ඔවුන් මුදල් ටිකක් අරගෙන ගිහින් කොහේ හරි තැන්වල අවිද්‍යාත්මකව කරපු දේවල් ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල මේ ආණ්ඩුවට භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙනවා; ජනතාවට භුක්ති විඳින්න වෙලා තිබෙනවා. ඒවා නිවැරදි කරන්න මේ ජනතා ආණ්ඩුවට කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. විවේචන ගොඩක් කරන්න පුළුවන්. ඒ විවේචනවලට විද්‍යාත්මක පදනමක් නැහැ. අපි ජනතාවට පොරොන්දුවක් දීලා තමයි මේ ආණ්ඩුව බලයේ පිහිටුවා තිබෙන්නේ. ඒ පොරොන්දු එකින් එක ඉෂ්ට කරලා, ජනතාවගේ පොරොන්දු ඉෂ්ට කරන ආණ්ඩුවක් බවට අපි මේ ආණ්ඩුව අනිවාර්යයෙන් පත් කරනවා.

විපක්ෂයේ නොයෙක්, නොයෙක් කෙදිරිලි තිබෙනවා. ඔවුන් මේ වෙලාවේදී අය වැය ලේඛනය අණ්වීක්ෂවලින් බලමින්, වැරදි හොයමින් ඉන්නවා, විවේචනය කරන්න මොනවාද තිබෙන්නේ කියලා. පුළුවන් තරම් විවේචන හොයා ගන්න. ධනාත්මක විවේචන කරන්න. ආණ්ඩුව ඉතාම ශක්තිමත් ගමනක් යනවා. ඉදිරියේදී ඔබට බලා ගන්න පුළුවන්, මේ ආණ්ඩුව තවදුරටත් ශක්තිමත් වෙනවාද, නැද්ද කියලා. විපක්ෂයේ විවේචනවල අපට සැලකිල්ලට ගන්න දෙයක් නැහැ. ඒවායේ ධනාත්මක බවක් නැහැ.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.38]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ජනාධිපතිතුමා 2027 අය වැය කථාව අවසන් කළ තැනින් මගේ කථාව පටන් ගන්නට මා කැමැතියි.

එතුමාගේ කථාව අවසානයේ එතුමා මෙසේ සඳහන් කර තිබෙනවා:

> "අද අපි මේ රටේ සියලු දේශපාලන පක්ෂවලටත්, සියලු පාර්ශ්වයන්ටත්, ලෝකයේ කොතැනක හෝ ජීවත් වන සෑම ශ්‍රී ලාංකිකයෙකුටමත් විවෘත හඳවතින් ආරාධනා කරනවා. එන්න, මේ රටේ අනාගතය ගොඩනැගීමේ කොටස්කරුවන් වෙමු! අපි හැමෝම එක විදිහට හිතන්න අවශ්‍ය නැහැ. එකම මතයක් දරන්න අවශ්‍යත් නැහැ. නමුත් අපේ වෙනස්කම්වලට වඩා අපේ රට විශාලයි. අපේ තනි තනි අරමුණුවලට වඩා අපේ දරුවන්ගේ අනාගතය වටිනවා. ඒ නිසා අපේ දැනුම, අපේ හැකියාවන්, අපේ ශක්තිය එකතු කරමු. අපට එකඟ විය හැකි තැනින් පටන් ගනිමු. එකිනෙකාට වඩා ඉදිරියෙන් යන්න නොවෙයි, අපේ මාතෘභූමිය අපි හැමෝටම වඩා ඉදිරියට ගෙන යන්න එකතු වෙමු!"

ජනාධිපතිතුමාගේ මේ කථාව අහලා එතුමාම ද මේක කිව්වේ කියලා මම ටිකක් වෙලා කල්පනා කළා. මේකම තමයි අපි කියන්නේත්. අපි දිගටම කියන්නේ මේක තමයි. මොකක්ද? අපි වෙන වෙනම දේශපාලනය කරමු, විරුද්ධ මත ඉවසමු, අපි අන් අයට කන් දෙමු, තවත් අදහස් තිබෙනවා නම් ඒවා අරගමු, එහෙම කරලා අපි මේ රට ගොඩ ගනිමු කියලා තමයි අපිත් කියන්නේ. ජනාධිපතිතුමා මේ කියපු ප්‍රකාශයත්, එතුමාගේ හැසිරීමත්, එතුමාගේ කණ්ඩායමේ හැසිරීමත්, එතුමා විසින් මෙහෙයවනු ලබන රාජ්‍ය නිලධාරීන්ගේ හැසිරීමත් අපි සැලකිල්ලට අරගත යුතුයි. හැබැයි, ධනාත්මකව. චෝදනාවක් හැටියට නොවෙයි. මොකද, එතුමාත් අපිත් එක්ක එකඟයි නේ.

ඒ ගැන කියන ගමන් මම තවත් කාරණයක් ගැන කියන්නට කැමැතියි. ගරු අනුර දිසානායක මැතිතුමා ජනාධිපති වෙලා දින දෙකක් ඇතුළත මේ කලාපයේ ප්‍රබල රටක රාජ්‍ය තාන්ත්‍රිකයෙක් මට හමු වුණා, පෞද්ගලිකව. මම එතුමාගෙන් ඇහුවා, මේ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය ගැන ඔබ මොකක්ද හිතන්නේ කියලා. එතුමා මට කිව්වා, "මට මේ කරුණු දෙක කියන්න පුළුවන්. එතුමා එතුමාගේ දේශපාලන වේදිකාවේ කියාගෙන ආපු දුෂණය කියන සටන් පාඨය එතුමාගේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලදී, එහෙම නැත්නම් ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කරද්දී එතුමාගේ ආණ්ඩුව ඒක ප්‍රධාන ආඛ්‍යානය කරගෙන ගියොත්, එතුමා විනාශ වෙනවා. හැබැයි, ඒ වෙනුවට එතුමා ඒක දේශපාලන වේදිකාවට සීමා කරලා, අතීතයට සීමා කරලා සංවර්ධනය කියන මාර්ගය තෝරා ගෙන ඵලදායීකාවය කියන වචනයත්, එමඟින් එතුමාට ඡන්දය නොදුන් ජනතාවත් එකතු කරගෙන ඔවුනුත් අභිප්‍රේරණය කරගෙන ගමනක් ආරම්භ කළොත්, එතුමාට මේ රට ජයග්‍රහණය කරා මෙහෙයවන්නට පුළුවන්" කියලා. මේ අපේ කලාපයේ ප්‍රබලම රාජ්‍යයක ප්‍රධානම රාජ්‍ය තාන්ත්‍රිකයෙක් මට කියපු කථාවක්. ඒක තමයි අපේ අල්ලපු රට වන ඉන්දියාව කර තිබෙන්නේත්.

දැන් මෙතුමා තෝරා ගෙන තිබෙන්නේ අර පළමුවැනි විකල්පය. මොකක්ද, ඒ විකල්පය? ඒ විකල්පය තමයි තවම එතුමා ජනාධිපතිවරණය දක්වා ගෙන ආ, ඡන්දය දිනා ගැනීම සඳහා ගෙන ආ සටන් පාඨය දිගටම ප්‍රධාන ආඛ්‍යානය කරගෙන තිබීම. ඇත්තටම ඊයේ එතුමාගේ කථාව දිහා ලෝකයා බලාගෙන සිටියා, මේ සභා ගර්භයේ ගැලරිය තුළ සිටි තානාපතිවරුන් ගොඩක් වෙලා එතුමාගේ කථාව අහගෙන ඉඳලා යන්න ගියා. නමුත් ජනාධිපතිතුමාට අමතක වෙනවා, එතුමා මේ පාර්ලිමේන්තුවට කථා කරනකොට, මුළු ලෝකයටම ආමන්ත්‍රණය කරනවා කියලා. මුළු ලෝකයටම ආමන්ත්‍රණය කරනකොට, අපට තිබෙන්න ඕනෑ අභිමානයක්. ඒ අභිමානයත් සමඟම ජනාධිපතිතුමා තුළ විශ්වාසයේ පණිවුඩය තිබෙන්නටත් ඕනෑ. ඒ විශ්වාසය තුළින් එතුමා ලෝකයටම ආමන්ත්‍රණය කරන්න ඕනෑ, වසරකට වරක් ලැබෙන මේ අවස්ථාවේදී අපේ උපායමාර්ගික වැඩ පිළිවෙළ සහ ඒ තුළින් මේ රට ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියලා. මොකද, උපායමාර්ගික වැඩ පිළිවෙළකින් තොරව මේ රට ඉස්සරහට ගෙනයන්නට බැරි බව එතුමා නොදැන සිටියත්, ලෝකය එවැනි වැඩ පිළිවෙළක් අපේක්ෂා කරනවා. එසේ තිබියදී අපි ගමේ කොටන් හතරක් උඩ කථා කරන ආකාරයට, නැත්නම් ගමේ වේදිකාවක කථා කරන ආකාරයට, පරණ දේශපාලනයේ සිදුවුණු යම් යම් දුෂණ තිබුණා නම් ඒවා පිළිබඳව කථා කරමින් ඒවාත් මේ අය වැය තුළට ඇතුළත් කරගෙන කථා කරනකොට ඒක ලස්සන නැහැ, ඒක රටට හොඳ නැහැ. ඒ වාගේම, අපේ අභිමානයටත් හොඳ නැහැ.

[ගරු දිලිත් ජයවීර මහතා]

මේ රටේ ඉන්නේ ඉතාම දක්ෂ මිනිස්සු. මේ රට තුළ ඉතාම දීප්තිමත් පෞද්ගලික අංශයක් තිබෙනවා. මේ රටේ ධනයෙන් සියයට 75කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර දෙන දීප්තිමත් ව්‍යවසායකයන් සහ පෞද්ගලික අංශයක් තිබෙනවා. අන් සියල්ලටම වඩා ඔවුන් අහන්න කැමති වචනයක් තමයි "උපායමාර්ගික" කියන වචනය. ඒ වාගේම ලෝකය තුළ අපි අපේක්ෂා කරන සෘජු විදේශ ආයෝජන කියන අංශයෙන් අපේ රට ඉදිරියට ගෙන යනවා කියන විශ්වාසය ඇති කරන්නට නම්, අපි කථා කළ යුතු වචන සහ වාක්‍යය තිබෙනවා. හුදු වචන හරඹයක් හරහා ගමේ දේශපාලනය කරලා තවදුරටත් අපට ගොඩ එන්නට බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබත්, අපත් ඊළඟ ජනාධිපතිවරණයට මුහුණ දෙනකොට Gen Z පරම්පරාව සහ Gen Alpha පරම්පරාව අපෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ, මෙවැනි සරල, විද්‍යාත්මක පදනමක් නැති -අවිද්‍යාත්මක - සහ නූතනත්වයට නොගැළපෙන කථා. ඔවුන් අපෙන් අහනවා, මේ රට ගොඩනඟනවා නම් එය කරන්නේ කෙසේද කියා. ඒකයි මම කිව්වේ, මේක වැය ඉදිරිපත් කිරීමක් විතරක් නොවෙයි, අය සහ වැය දෙකම ඉදිරිපත් කිරීමක් කියා. අය එන්නේ කොහෙන්ද? මේ අය වැය තුළ අය -ආදායම- එන්නේ කොහෙන්ද? අපටම බදු ගහලා, රටේ සිටින දුප්පත්ම දුප්පත් මිනිසාටත් බදු ගහලා, හැම භාණ්ඩයකටම බදු ගහලා, ඒ බදු ගැන කථා කරන්න ඕනෑම කෙනෙකුට පුළුවන්. නමුත්, රටක නිර්මාණශීලී නායකත්වයකට, දූරදර්ශී නායකත්වයකට තිබිය යුතුයි, ආදායම් නිර්මාණය කර ගැනීමේ උපායමාර්ගයක්, ධනය නිර්මාණය කර ගැනීමේ උපායමාර්ගයක්. මේ අය වැයේ මොන පිටුවේද කථා කළේ, මේ රටේ අපනයන දියුණු කිරීම සඳහා එවැනි තියුණු උපායමාර්ගයක් ක්‍රියාත්මක කරන බව? "මෙවැනි තියුණු - razor-sharp - උපායමාර්ග අපි කලාපීය සහ ගෝලීය තත්ත්වයන්ටත් වඩා ඉදිරියෙන් සිටිමින් ගන්නවා. අපේ විදුලිබල සැපයුම, ඒ කියන්නේ බලශක්ති සැපයුම පැත්තෙන්, අපනයනකරුවන්ට ඉඩම් ලබාදීම, බදු සහන ලබාදීම වැනි පියවර තුළින් ලබන අවුරුද්දේ අපේ ආදායම මෙතරම් ප්‍රමාණයකින් වැඩි කරනවා" කියලා කථා කළාද? "අපි අපේ බදු ප්‍රතිපත්තිය වෙනස් කරලා, මේ රටේ සිටින දිදුලන ව්‍යවසායකත්වයට අත දෙනවා, ඩොලර් උපයා ගන්න මෙන්න මේ ආකාරයටයි කටයුතු කරන්නේ" කියලා කිව්වාද? මේ අය වැය කථාවේ කොහේ හෝ තැනක එහෙම කිව්වාද?

මේ රටේ වෘත්තිකයන්ට කිව්වාද, "මේ රට අතහැර යන්න එපා. ඔබ රඳවා ගැනීම සඳහා අපි මෙවැනි උපායමාර්ග ක්‍රියාත්මක කරනවා. ඔබේ අනාගතය සහ ඔබේ දරුවන්ගේ අනාගතය මෙන්න මේ විධියට සුරක්ෂිත කරනවා. ඔවුන්ට වෙනත් රටකට යාමට හේතු නොවන කාරණා අපි ඉදිරිපත් කරනවා" කියලා? එහෙම කළාද? නැහැ. ඒ වෙනුවට කිව්වේ, අපි විදේශ ප්‍රේෂණ තවදුරටත් වැඩි කරගෙන තිබෙනවා කියලායි. දැන් අපේ ප්‍රධාන ආදායම් මාර්ගය මොකක්ද? විදේශ ප්‍රේෂණ. අපේ රටේ විදේශ ප්‍රේෂණ වැඩි වෙනවා කියලා අපි සතුටු වෙන්න ඕනෑද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? නැහැ, අපි දුක් වෙන්නට ඕනෑ. ඒ ඇයි? මේ රටේ සංවර්ධනයට අත දෙන්නට පුළුවන් හැම කෙනෙක්ම රට දාලා යනවා. අපේ හෝටල් ක්ෂේත්‍රයේ සේවය කළ සූපවේදීන් ඇතුළුව අපේ රටේ ඉංජිනේරුවරු, ගණකාධිකාරිවරු සහ අනෙකුත් සියලුම වෘත්තිකයන් රට දාලා ගියාම මේ රට සංවර්ධනය වෙන්නේ කොහොමද? වෙනත් රටවල් ඔවුන්ගේ ශ්‍රමය ලාභයට ලබාගෙන අපේ රටේ සංවර්ධනය අඩාළ වන තත්ත්වයට ගෙන ආවාට පස්සේ මේ රට ඉස්සරහට යන්නේ කොහොමද? මේ මව්බිමට ආදරය කරන මිනිසුන් කොහොමද මේ රටේ ඉන්නේ? ඔවුන් මේ රට තුළ රඳවා ගැනීම සඳහා සුවිශේෂී වැඩ පිළිවෙළක් මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබුණා නම්, මම මේ අය වැයට ඒ ප්‍රමාණයට ගරු කරනවා. නමුත්, ඒක එහෙම වුණේ නැහැ. මේ අය වැයත් හාල්මැස්සන් ගැන කථා කරපු, මිරිස් ගැන කථා කරපු, උම්බලකඩ ගැන කථා කරපු අය වැයක් බවට පත්වුණා. ඒකයි ඇත්ත තත්ත්වය.

අපේ වෘත්තිකයන් ඉල්ලා සිටි, තමන්ගේ වැටුපට ගහන අසාධාරණ බද්ද අයින් කරන්න කිව්වාම මොකක්ද කළේ? මාසයකට රුපියල් 750ක් අඩු කරලා දුන්නා. මේක අපහාසයක් නොවෙයිද? මේ රටේ වැඩ කරන මිනිස්සු, මේ රටේ මහන්සි වෙන මිනිස්සු, මේ රටට සල්ලි හම්බ කරලා දෙන අර පාරේ ඉන්න ක්ෂුද්‍ර ව්‍යවසායකයාගේ ඉඳලා මේ රටේ මහා පරිමාණ කර්මාන්තකරුවා දක්වා වන අයට කරන ලද අපහාසයක් නොවෙයිද? ඔවුන්ට බලාපොරොත්තුවක් නොදී සිටීම හරිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න ඕනෑ දෙවැනි කාරණය මේකයි. අද මේ රට වෙනදාට වඩා බරපතළ ලෙස ජීවන මට්ටම පහළ වැටීමකට මුහුණ දෙමින් පවතිනවා. මේ ජීවන වියදම කියන කාරණය ලෙහෙසි පහසු දෙයක් හැටියට සලකන්න එපා. අපි දැක්කා, පසුගිය දා අමෙරිකාවේ තිබුණු midterm electionsවල exit pollsවල මොකක්ද කිව්වේ කියලා. ඒ exit pollsවල ඔවුන් පිළිතුරු දුන්නේ, දරාගත නොහැකිභාවය කියන කාරණය ගැනයි. අද මේ රටේත් ජීවන වියදම ඉතාම බරපතළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. දැන් ඔබ සංඛ්‍යාලේඛන, ගණන් හිලව් ලෝක බැංකුවෙන් ගන්නවා; IMF එකෙන් ගන්නවා. ඇයි ඔබ ඒවා ඔබේ cadresලාගෙන් ගන්නේ නැත්තේ? හවසට පෝස්ටරයක් යැව්වාම, එළිවෙන කොට ඒක ගමේ ගහන්න පුළුවන් කණ්ඩායමක් ඔබතුමන්ලාට ඉන්නවා නේ; ගමට එක්කෙනා ගාණේ ඉන්නවා නේ. ඔවුන්ගෙන් අහන්නකෝ, ගමේ තත්ත්වය මොකක්ද කියලා. නිකමට අහන්න කියන්නකෝ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය කළේ ඉලක්කම් හරඹයක් නේ. එහෙම එකක් නම්, accountant කෙනෙකුගෙන් අහගෙන bookkeeper කෙනෙකු දාලා මෙතැන Budget එක කියෙව්වා නම් හොඳයි. එහෙම කරන එකක් නොවෙයි නේ මේක. මේ bookkeeper කෙනෙක් නොවෙයි නේ. මේ අය වැයේ තිබිය යුතුව තිබුණේ, සැබෑ දත්ත. ජනාධිපතිතුමාගේ මුවඟින් පිටවේවි යැයි අප බලාපොරොත්තු වුණේ, "මම දන්නවා, මේ රටේ මිනිස්සු මගේ රජය යටතේ අත්ත දුක්ඛිත තත්ත්වයට පත් වෙලා ඉන්න බව. ඒකෙන් ජනතාව බේරා ගන්න මම කටයුතු කරනවා" කියලායි. එහෙම කිව්වා නම් ඔන්න අපට බලාපොරොත්තුවක් ඇති කර ගන්න තිබුණා. එහෙම කරන්නේ නැතිව, එකකට එකක් නොගැළපෙන ඉලක්කම් කියනවා; එහෙන් අරගෙන ඉලක්කම් කියනවා, මෙහෙන් අරගෙන ඉලක්කම් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිකමට හිතලා බලන්න, PAYE Tax එක නිසා රුපියල් 750ක් ඉතිරි වුණා නේ. Perera & Sons එකෙන් මාළු පාන් එකක් කාලා, රෝල් එකකුත් කාලා, කිරි කෝපි එකකුත් බිව්වොත් එතුමා මාසයේම ඉතිරි කර ගත්තු එක ඉවරයි. ඔහු ආස නැද්ද එහෙම මාළු පාන් එකක් කන්න? හැමදාම රොටී කාලා ඉන්න පුළුවන්ද? බැහැ නේ. ඉතින්, මාළු පාන් එකක් කෑවොත් අර රුපියල් 750 එක දවසින් ඉවරයි. මාසයටම ඉතිරි කර ගත්තු ඒ සල්ලිවලින් පෙට්‍රල් ලීටර් 2ක්වත් ගහන්න බැහැ. ඉතින්, ඇයි මෙහෙම අපහාස කරන්නේ? අපේ රටේ ඉපදිලා නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන, ඔබත් අපත් විශ්වාස කරන, මේ රට ගැන විශ්වාසය තියලා ඉන්න මිනිසුන්ට මෙහෙම කරන්නේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කනගාටුදායක තත්ත්වය ගැන මම නැවත වතාවක් සාරාංශයක් හැටියට කියන්න ඕනෑ. මට පෙනෙන විධියට, මේ දියුණු වන ලෝකයේ; Gen Z එක විසින් අද අතට අරගෙන තිබෙන ලෝකයේ මේක ඉතාම සාම්ප්‍රදායික ලියවිල්ලක්. ගිය අවුරුද්දේ සහ ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ අය වැයවල තිබුණු ගණන්ම, එහෙට මෙහෙට දාලා ඒ පොතම edit කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම බැලුවාම ඒ සමහර ඒවා මේකේත් එහෙමම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවුරුදු දෙකේම ආයාචනයක් කළා. ශ්‍රී ලාංකිකයන් වන අපි නිර්මාණශීලී මිනිස්සු, ලෝකයත් එක්ක හැප්පෙන්න පුළුවන් මිනිස්සු, කලාපයක් එක්ක හැප්පෙන්න පුළුවන් දක්ෂ මිනිස්සු. අප මෙවැනි අය වැය නොවෙයි ඉදිරිපත් කරන්නට ඕනෑ. අප ඉදිරිපත් කරන්න ඕනෑ, අපේ මව්බිම ගැන විශ්වාසයක් ඇති වන අය වැයක්, අපේ තාරුණ්‍යයට මේ රට ගැන ආදරයක් හිතෙන අය වැයක්. නිෂ්පාදන ආර්ථිකයක්, ඒ තුළින් ඩොලර් නිර්මාණය වන ආර්ථිකයක්, පිටරට ගිය අපේ දරුවන්ට සහ තාරුණ්‍යයට ආපහු මේ රටට එන්න හිතෙන, දේශපාලන විශ්වාසයක්, දර්ශනයක් සහිත ආර්ථිකයක් හදන යෝජනා තමයි අපි අය වැයෙන් බලාපොරොත්තු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. ජනාධිපතිතුමා අවංකව කිව්වත්, එසේ නොකිව්වත්, එතුමාගේ වචනවල තිබුණු ආකාරයටම මේ ලැබුණු අවස්ථාවේ අපි එකතු වෙන්නට ඕනෑමයි. අපි දිගින් දිගටම ඒ යෝජනාව කරනවා. එසේ එකතු වෙන්න ඕනෑ එකට දේශපාලනය කරන්න නොවෙයි. ඔබතුමන්ලාත් එක්ක කොහෙත්ම එහෙම කරන්න බැහැ නේ. මා කියන්නේ, අපි ජාතියක් හැටියට එකතු වෙන්නට ඕනෑ කියලායි. මොකටද? මෙන්න මේ ප්‍රධාන කාරණය හඳුනා ගන්නයි. මොකක්ද මේ කාරණය? අපට ඉතිහාසය පුරා අවස්ථා මහ හැරී ගියා; දිගින් දිගටම මහ හැරී ගියා. මොකක් සඳහාද? මේ රටට අවශ්‍ය වූයේ ජාතික උපාය මාර්ගයක් - national strategy එකක් - නිර්මාණය කර ගැනීමයි. ඒ තුළ අපේ තිබෙන සම්පත් උපරිම ලෙස භාවිත කරමින්, අපේ මානව සම්පත උපරිම ලෙස කාර්යක්ෂමව භාවිත කරමින් ධනය නිර්මාණය සඳහා අපි මේ රට ඉස්සරහට ගෙන යන්න ඕනෑ. ඒකයි වැදගත් වෙන්නේ. ඒකයි සාකච්ඡා විය යුත්තේ. මට මෙහි ශීර්ෂ අරගෙන සාකච්ඡා කරමින් දිගින් දිගටම පෙන්වන්න පුළුවන්, මෙය කොතරම් සාම්ප්‍රදායික අය වැයක්ද කියන එක. මේ අය වැය තුළ නැත්තේම අවංකභාවයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමා දන්නවා, අප කථා කරන ප්‍රාථමික ශේෂය ගැන. ඒ කියන්නේ, භාණ්ඩාගාරයේ උතුරා ගියා කියන මුදල. ඇත්තම කථාව, එහෙම මුදල් උතුරා ගිහිල්ලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගිය සැරේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදල්වලින් මාස 9ක් වනකොටත් - මේ වන කොටත් - වියදම් කරලා තිබෙන්නේ සියයට 30.1යි. ඒ වියදම් නොකළත් දැන් තිබෙන්නේ මේ මාස 9ට රුපියල් බිලියන 22යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබට හිතා ගන්න පුළුවන් නේද රුපියල් බිලියන 22 කොච්චර පොඩි ප්‍රමාණයක්ද කියලා? ඒකයි ඇත්ත තත්ත්වය. මොකද, අපි මේ headline එක ගැන නේ කියන්නේ. Primary surplus හෙවත් ප්‍රාථමික ශේෂය ගැන අප කථා කළේ ණය සේවාකරණය අමතක කරලායි. ඉතින් ඔබතුමන්ලාට සාධාරණයක් වෙන්න ඒ ගැන කියන්න ඕනෑ. මොකද, භාණ්ඩාගාරය උතුරලා යනවා කියමින් මිනිස්සු ඔබතුමන්ලාට බැණ බැණ ඉන්නවා; අපිත් ඔබතුමන්ලාට බණිනවා. ඒ නිසා ඔබතුමන්ලා ඔය කියන ඉලක්කම හරියට විග්‍රහ කරලා දෙන්න ඕනෑ. ඇත්තටම දැන් සල්ලි නැහැ - රුපියල් නැහැ, ඩොලර් නැහැ - ඔබතුමන්ලාට. හේතුව, අපේ ඩොලර් ශේෂයත් ඍණ අගයක තිබෙන්නේ. අපට රුපියල් නැහැ, ඩොලර් නැහැ. ඩොලර් හොයන විධියත් මේ අය වැයේ නැහැ, රුපියල් හොයන විධියත් මේ අය වැයේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුතින් ඩොලර් එන විධියක් මේකේ කොහේ හරි තිබෙනවාද? මෙහි නව ඩොලර් උත්පාදනය කිරීමේ උපාය මාර්ගය තිබෙන පිටුව මට කියන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කොතැනින්ද ඩොලර් එන්නේ කියන්න? ඔබතුමන්ලා පුරෝකථනය කරන බදු ගිය වතාවේ ගත්තේ වාහන ආනයනය කිරීම තුළින්. දැන් ඔබතුමන්ලා උපකල්පනය කරලා තිබෙනවා, ඒ බදු ප්‍රමාණයට වඩා වැඩියෙන් බදු ලැබෙයි කියලා. එහෙම බදු වැඩියෙන් ලැබෙනවා නම් ඒකත් මට පෙන්වන්න, කොහොමද ඒක වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මම ඉකිමනින් කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම එක කාරණයක් කියන්න ඕනෑ. මේක මගේ මිත්‍රයෙක් අද උදේ කියපු කථාවක්. ඒක කියලා මම කථාව නතර කරන්නම්. මගේ ඒ මිත්‍රයා ලංකාවේ ප්‍රධාන සමාගමක ඉන්න ප්‍රධාන විධායක නිලධාරියෙක්. එතුමා බිරිඳත් සමඟ සුපර්මාර්කට් එකට ගිය වෙලාවේ එතුමාගේ basket එකට වැරදිලා වැටුණු පාර්සලයක් තිබිලා. ගෙදර ගිහිල්ලා බලන කොට තමයි දැකලා තිබෙන්නේ. ඒක, බඩු ගෙන යන්න ඒ සුපර්මාර්කට් එකටම ආපු තවත් පුද්ගලයෙකුගේ එකක්. ඒ බඩු පාර්සලයේ තිබිලා තියෙනවා, හැඩැල්ලෝ හතරදෙනෙකුයි, පොඩි අල ගෙඩියකුයි, පොඩි කැරට් අලයකුයි, හාල් ග්‍රෑම් 500කුයි. ඒක, කොළඹ තදාසන්න ප්‍රදේශයක ප්‍රධාන සුපර්මාර්කට් එකකට ආපු කෙනෙකුගේ පාර්සලයක්. එහෙම නම් ඔබ අප එක්ව එකිනෙකාට බොරු කර ගැනීමෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ. මේ රටේ ජනතාව අන්ත දුගී බවට පත් වී තිබෙනවා. ඔවුන් එයින් මුදා ගැනීම සඳහාත්, රට ඉදිරියට ගෙන යෑම සඳහාත් නිශ්චිත වැඩ පිළිවෙළක් සහිත අය වැයක් අඩු ගණනේ ලබන වසරේ හෝ ඉදිරිපත් කිරීමට ඔබට ශක්තිය, ධෛර්යය ලැබේවා!

අපේ ජනාධිපතිතුමාගේ අය වැය කථාව සූත්‍රගත දේශනාවලින්ද කරුණු අරගෙන කියපු එකක් වන නිසා මම එතුමාට සම්මා සම්බුදු සරණම වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින සභාවේ වැඩකටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.58]

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ විවාදය ආරම්භ කරද්දී විපක්ෂ නායකතුමා ඔසවා පෙන්වූවා, අපේ පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය. එතුමා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය හොඳට ලැම්නේට් කරලා තියාගෙන ඉන්නවා. ඒක බොහොම හොඳයි. ඒ වාගේම මම කියන්න ඕනෑ, තවත් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තිබෙන බව. ඒ, අපේ ජාතික තරුණ ප්‍රතිපත්ති ප්‍රකාශනය. ඒකත් ලැම්නේට් කරලා තියාගන්න. අපි ඒවායේ තිබෙන දේවල් එකින් එක ඉෂ්ට කරනවා. පක්ෂයකට ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තිබෙනවා, කාලානුරූපව වෙනස්කම් කරමින් ඒ වාගේම කාලයක් තිස්සේ කරගෙන යන්න තිබෙන දැවැන්ත වැඩ ගොඩක් තිබෙන. අය වැය කියන්නේ මොකක්ද? ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන සියල්ල එක අය වැයෙන් ඉවර වෙනවාද? අය වැයක් කියන්නේ අන්න ඒ ප්‍රතිපත්තිය ඔස්සේ කටයුතු කරද්දී ඒ වර්ෂයට අදාළව ඒ රට යන ගමන් මාර්ගය පැහැදිලි කරන ලේඛනය.

ඊයේ දවසේ අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා මුදල් ඇමතිවරයා විධියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉදිරිපත් කළේ ලබන අවුරුද්දට - 2027ට - අදාළ එහි අය වැය කථාව. ඒක අය වැය නොවෙයි, අය වැය කථාව. අපේ තුන්වැනි අය වැය තමයි අපේ ආණ්ඩුවෙන් මේ ඉදිරිපත් කරන්නේ. අපි පළමුවැනි අය වැය ඉදිරිපත් කළාම ඒ පළමුවැනි අය වැයේ විශේෂ කාරණා කිහිපයක් අපි දකිනවා. ඉන් එකක් තමයි, විශාල වශයෙන් බදු බර අඩු කරපු එක. ඒ වාගේම එම අය වැයෙන් ලංකා ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩි කිරීම සිද්ධ කරනවා. ඒ වාගේම, දීමනා වැඩි කරනවා, ආධාර ලබා දීම වැඩි කරනවා. ඒ වාගේම, ආර්ථිකය ස්ථාවර කරන්න ඕනෑ පදනම ඒ පළමුවැනි අය වැයෙන් ඉදිරිපත් කරනවා.

අපේ ගරු නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා වාගේ බදු බර අඩු කර ගන්න 2023 වාගේ කාලයේ වෘත්තිකයන් යනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයාව හම්බ වෙන්න. ඒ වෙලාවේ එතුමා කියන්නේ, ගිහිල්ලා මේ ගැන IMF එකත් එක්ක කථා කර ගන්න කියලා. හැබැයි අපි වෘත්තිකයන්ට එහෙම නිගා කරන්නේ නැහැ. අපි එහෙම නිගා කරන්නේ නැතුව වැඩකටයුතු කරගෙන යනවා. එතුමා අපේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ නායකයා විධියට කටයුතු කළා නේ. එහෙම නේද? සජිත් ප්‍රේමදාස නොවෙයි, රනිල් වික්‍රමසිංහ නායකයා කියලා හිතාගෙන තමයි සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අදහස් ටික ඉදිරිපත් කරගෙන ගියේ. බොහොම හොඳයි, ඒක.

2025 දෙසැම්බර් මාසයේ අපේ දෙවැනි අය වැය ගෙනෙද්දී ආරම්භක කථාව කරනවා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. එතුමා එදා කිව්වා, අපි හරියටම වැඩේ කළා කියලා. අපි සාර්ව ආර්ථිකය කළමනාකරණය කිරීම, ස්ථාවර කිරීම හරියටම කළා කියලා එතුමා කිව්වා. එතුමා එහෙම කියපු හින්දාද දන්නේ නැහැ, අද කථික ලැයිස්තුවෙන් එතුමාගේ නම කපලා තිබෙන්නේ. අද කොතැනකවත් නැහැ, එතුමාගේ නම. එතුමා ඉදිරි දිනයක කථා කරයි.

අපි ආණ්ඩුවක් විධියට මේ දෙවැනි අය වැය තුළිනුත් දැවැන්ත වැටුප් වැඩි කිරීමක්, ඉතිරි අදියරේ වැටුප් වැඩි කිරීමක්, ඒ වාගේම ආධාර සහ දීමනා වැඩි කිරීම යන සියල්ල කරමින් ඉන්දෙද්දි ඒ අතරමැද අපිට යම් බාධකයක් ආවා. අපි සියලුදෙනාම දන්නවා, අපේ රටට "දිට්වා" ආපදා තත්ත්වයට මුහුණ දෙන්න සිදු වුණා කියන කාරණය. ලංකා ඉතිහාසයේ බලපෑ දැවැන්තම ස්වාභාවික ආපදාවට අපේ රට මුහුණ දුන්නා. අපේ ආණ්ඩුවත් ඒකට මුහුණ දුන්නා. ඒ, "දිට්වා" ආපදාව ආපු වෙලාවේ විපක්ෂ නායකතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ කළේ මොකක්ද? එතුමා කිව්වා, "දැන් මේ 'දිට්වා' ඇවිල්ලා තිබෙන්නේ. ඒක දැවැන්ත හානියක්. ඒ හානිය මෙහෙම තියෙද්දි මේ අය වැය ක්‍රියාත්මක කරන්න බැහැ, අලුත් අය වැයක් හදන්න ඕනෑ" කියලා. එතුමා බලයේ හිටියා නම් කරන්න හදන්නේ ඒක. එතකොට අනුර දිසානායක සහෝදරයා මොකක්ද තීරණය කළේ; ජනාධිපතිතුමා මොකක්ද තීරණය කළේ, ආණ්ඩුව මොකක්ද තීරණය කළේ? "දිට්වා" ආපදාවෙන් වුණු හානිය ප්‍රතිෂ්ඨාපනය කරන්න පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනෙන්නත්, ඒ වාගේම 2026 වර්ෂයේ අපිට ඉදිරියට අරන් යන්න තිබෙන අදියර ඒ ආකාරයෙන්ම, plan කළ විධියටම, ඉදිරියට අරගෙන යන්නත් ආණ්ඩුව තීරණය කළා. අපේ දේශපාලන නායකත්වය කණ්ඩායමක් විධියට ඒ තීන්දුව ගත්තා. අන්න ඒ දේශපාලන නායකත්වය ජනාධිපතිතුමාගෙන් අපිට හම්බ වුණා. මම හිතනවා, අන්න එහෙමයි ආණ්ඩු කරන්නේ, එහෙමයි රටවල් කරන්නේ කියලා.

"දිට්වා" ආපදාව ඇති වෙලා මාස කිහිපයයි ගියේ. ඊළඟට මැද පෙරදිග යුද්ධය පටන් ගත්තා. මම හිතනවා, ඒ සියල්ල තියෙද්දි ඉතාම ධනාත්මක ප්‍රවේශයකින් මේ ආර්ථිකය ස්ථාවර කරගෙන යන ගමන්, 2026 වර්ෂයත් ධනාත්මක ප්‍රවේශයකින් අවසන් කරගෙන යන්න අපිට හැකි වුණා කියලා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය ගලේ කෙටූ අකුරු වාගේ අනිවාර්යයක්ම ද කියලා ඇහුවොත් අපි දෙන උත්තරය තමයි, "නැහැ, එහෙම නැහැ" කියන එක. විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරද්දී සැරින් සැරේ කිව්වා, ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන ඒවා නොවෙයි ක්‍රියාත්මක කරන්නේ කියලා. සමහර ඒවා ගත්තොත්, අපිට පුළුවන් නම් ප්‍රතිපත්ති ප්‍රකාශයට වඩා දෙයක් දෙන්න, අපි ඒක දෙනවා. අපි එහෙම දීලා තිබෙනවා. ඒ මොනවාද දීලා තිබෙන්නේ? අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර තිබෙනවා, නිදන්ගත රෝග තිබෙන අය වෙනුවෙන් මාසයකට රුපියල් 10,000ක දීමනාවක් දෙනවා කියලා. හැබැයි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? අපි බලයට එද්දි තිබුණු මුදල පළමුවැනි අය වැයෙන්ම අපි වැඩි කළා. අපි ඉදිරිපත් කරපු දෙවැනි අය වැයෙන් එම මුදල තවත් වැඩි කළා. මේ අවුරුද්දේ අය වැයෙන් ඒක තවත් රුපියල් 2,500කින් වැඩි කරලා, එම මුදල රුපියල් 12,500ක් දක්වා වැඩි කර තිබෙනවා. මෙතැනදී පොඩි ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, වකුගඩු රෝග සඳහා තමයි ඒ ආධාරය හම්බ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තවත් රෝග කිහිපයක් තිබෙනවා. ඒකට අදාළව මුදල් ලබා දෙන්නේ පළාත් සභාවෙන්. දැන් රාජමාණික්කම් මන්ත්‍රීතුමා පළාත් සභා සම්බන්ධයෙන් කථා කරද්දී කිව්වා, "මධ්‍යම රජයයි, පළාත් සභා ටිකයි රෝග ටිකත් බෙදාගෙන තිබෙන්නේ." කියලා. සමහර රෝගවලට මධ්‍යම රජය හරහා මුදල් ලබා දෙන්න හැකියාවක් නැහැ. එවැනි ප්‍රශ්නයකුත් තිබෙනවා.

ඒ වාගේම, "ප්‍රජා ශක්ති" වැඩසටහන ගැනත් කථා කළා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, දරිද්‍රතාවට අදාළව ඒ කටයුතු සිදු කරන්න "ප්‍රජා ශක්ති" වැඩසටහන ගේනවා කියලා. නමුත්, අපි ආණ්ඩුව භාර ගත්තාට පස්සේ මොකක්ද සිදු කළේ? අපි ආණ්ඩුව ගත්තාට පස්සේ "ප්‍රජා ශක්ති" වැඩසටහන වෙනම කමිටු ස්ථාපිත කරලා වඩාත් ශක්තිමත්ව, වෙනම වක්‍රලේඛ නිකුත් කරලා, දුප්පත්කම තුරන් කරන්න ඕනෑ කියන පදනම යටතේ ජාතික මෙහෙයුමක් බවට පත් කළා. ඒ සඳහා පසුගිය අවුරුද්දේ රුපියල් මිලියන 25,000ක්

වෙන් කළා. මේ අවුරුද්දේත් රුපියල් මිලියන 25,000ක් වෙන් කර තිබෙනවා. දේශපාලන අධිකාරිය විධියට අපට සමාජ වගකීමක් පැවරිලා තිබෙනවා. අපි ඒ සමාජ වගකීම ඉෂ්ට කරගෙන යද්දී, අපිට තිබෙන ප්‍රධානම කාරණය තමයි මේ රට සංවර්ධනය කරන එක. මේ රටේ භෞතික සම්පත් සංවර්ධනය කරන්න, මේ රටේ මානව සම්පත් සංවර්ධනය කරන්න, ඒ වාගේම මේ රටේ සමාජ සංවර්ධනය වෙනුවෙන් පොරබදන එක අපි සිදු කරමින් තිබෙනවා. අපි ආණ්ඩුවක් විධියටත්, පෞද්ගලිකවත්, අපි කණ්ඩායමක් විධියටත් නිදිවර්ජිතව කැප කිරීම් කරලා ඒ කටයුත්ත කරගෙන යන්නේ මේ රට ගොඩනඟන්නයි. අන්න ඒ ආදර්ශය, ඒ කැප කිරීම අනුර දිසානායක සහෝදරයාගේ ඉඳන්, අපේ ගම්වල පහළම ඉන්න සියලු සහෝදර සහෝදරියන් මේ වෙද්දී දෙමින් තිබෙනවා. ලාංකිකයන් විධියට, පුරවැසියන් විධියට, තරුණ තරුණියන් විධියට, වෘත්තිකයන් විධියට, රාජ්‍ය සේවකයන් විධියට, ගොවීන් විධියට, ධීවරයන් විධියට අපි සියලුදෙනා මෙන්න මේ පොරබැදීම වෙනුවෙන් එකතු වෙන්න ඕනෑ. අන්න එහෙම තමයි මේ රට ගොඩනඟන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(මාණ්පුමිකු ලසිත් පාෂ්ණ කමකේ)
(The Hon. Lasith Bhashana Gamage)
මම ඉක්මනින්ම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ විද්‍යාත්මකව අය වැයක් ඉදිරිපත් කළා නම්, ඒ ආකාරයට විද්‍යාත්මක අය වැයක් ඉදිරිපත් කළේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකින් විතරයි. මේ ඉදිරිපත් කළේ අපේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන තුන්වැනි අය වැය. මම මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, මේ අය වැය ලේඛන තුන පිළිබඳව විශ්ලේෂණය කර බලන්න; අධ්‍යයනය කර බලන්න කියලා. අපි එකින් එකට මේ පියවර තැබුවේ කොහොමද, මේක අපි අරන් යන්නේ මොන දිශාවකටද, අපි මේ වර්ෂය අවසන් කරන්නේ කුමන විධියට ද කියලා හොඳින් අධ්‍යයනය කර බලන්න කියා මම මේ රටේ ජනතාවට ආරාධනා කරනවා. ඒ වාගේම, අපි 2028 වර්ෂය වෙනුවෙනුත් 2027 වර්ෂය අවසානයේදී අය වැය ඉදිරිපත් කරනවා. එම නිසා මම විපක්ෂයට ආරාධනා කරනවා, කථිකයාව දැන්ම ලෑස්ති කරලා තියාගන්න කියලා. ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා වාගේ, 2028 වර්ෂයට අදාළ අය වැයේදී හොඳ කථිකයෙක් දැන්ම ලෑස්ති කරලා තියාගන්න. අපිට ඕනෑ වෙන්නේ අය වැය විවාදයකදී වෙන වැල් බයිලා නොවෙයි. ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
විවාදය කල් තැබීම, ගරු අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) උපාලි පන්නිලකේ - කිරාමිය අපිවිරුත්ති, චමූකප් පාතුකාප්පු මර්රුම් චමූක වලුවූට්ටුකෛ අමෛච්චර්)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
එකැන් සිට විවාදය 2026 නොවැම්බර් 14වන සෙනසුරාදා පවත්වනු ලැබේ.

අතන්පඩි, විවාතම් ඔත්තිවෛක්කප්පට්ටදු.
විවාතම්, 2026 නවම්පර් 14, චනික්කිළමෛ මීළත් තොටංකුම්.

The Debate stood adjourned accordingly.
Debate to be resumed on Saturday, 14th November, 2026.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
සභාව කල් තැබීම.

කල්තැබීම
ඔත්තිවෛප්පු
ADJOURNMENT

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(මාණ්පුමිකු (කලානිති) උපාලි පන්නිලකේ)
(The Hon. (Dr.) Upali Pannilage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එටුත්තියම්පප්පෙට්රදු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා.

තද වැසි කාලවලදී කොළඹ නගරය ජලයෙන් යටවීම සඳහා ස්ථිර විසඳුමක්
கனமழை பெய்யும்போது கொழும்பு நகரில் ஏற்படும் வெள்ளப்பெருக்குக்கான நிரந்தரத் தீர்வு
PERMANENT SOLUTION FOR INUNDATION OF COLOMBO CITY DURING HEAVY RAINFALL

[අ.භා. 6.08]

ගරු අමිල ප්‍රසාද් මහතා
(මාණ්පුමිකු අමිල පිරසාත්)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අධික වර්ෂාපතනය හේතුවෙන් කොළඹ නගරය සහ තදාසන්න ප්‍රදේශ නැවත නැවතත් වැසි ජලයෙන් යටවීම බරපතළ මහජන ගැටලුවක් බවට පත්ව ඇත. මෙය හුදෙක් ස්වාභාවික විපතක් නොව, නිසි පරිදි කානු පද්ධති නඩත්තු නොකිරීම, අනවසර ඉදිකිරීම් පාලනය කිරීමට අපොහොසත් වීම, කසළ බැහැර කිරීමේ දුර්වලතා සහ කොළඹ මහ නගර සභාවේ අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් උග්‍ර වූ තත්වයකි.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

විපතට පත් ජනතාවගේ නිවාස, දේපළ, ව්‍යාපාර සහ ජීවනෝපායයන් විනාශ වී ඇති අතර, කොළඹ නගරයේ ආර්ථිකයට හා සංචාරක ව්‍යාපාරයට ද දැඩි බලපෑම් එල්ල වී ඇත. එවැනි පසුබිමක බලධාරීන්ගේ විසඳුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය ජනතා පීඩාව තවදුරටත් වැඩි කර ඇත.

එබැවින්, රජය වහාම වගකිවයුතු ආයතන සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ජලය බැස යාමේ ස්ථිර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර විපතට පත් වූ සියලු ජනතාවට සාධාරණ හා කඩිනම් වන්දි ලබා දීමට පියවර ගත යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි."

ඇත්තටම මේක පසුගිය දවස්වල ඇති වෙච්ච ප්‍රශ්නයත් එක්ක නිර්මාණය වුණු යෝජනාවක්. ඊයේ අය වැය ඉදිරිපත් කරපු අවස්ථාවේත් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු වෙයි කියලා හිතුවා. නමුත් මම දැක්කේ නැහැ, එහෙම විශේෂ අවධානයක් යොමු වෙලා තිබුණු බව. කවුරුත් පිළිගන්නා දෙයක් තමයි, කොළඹ නගරය තෙත් කලාපයේ තිබෙන නගරයක් කියන එක. මම සොයා බැලීමක් කළා, පසුගිය ආණ්ඩු පැවති කාල සීමාවලදී කොළඹ නගරය ආශ්‍රිතව ජලය බැස යෑම උදෙසා ක්‍රියාත්මක කරපු උපායශීලී නව ක්‍රියාමාර්ග මොනවාද කියලා. ඒ කාලය අතරතුර බොහෝ සාර්ථක ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මම මේ යෝජනාව ඉදිරිපත් කරද්දිම අහන ප්‍රශ්නය තමයි, මේ ආණ්ඩුව අවුරුදු දෙකක කාලය තුළ ඒ වෙනුවෙන් ඉදිරිපත් කරපු අලුත් ව්‍යාපෘති මොනවාද කියන එක.

පසුගිය කාලවල පැවති ආණ්ඩු ඒ වෙනුවෙන් කරපු දේවල් මතක් කළොත්, පාඨලී චම්පික රණවක හිටපු ඇමතිවරයා යටතේ පැවති මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ වැඩ පිළිවෙළ කිහිපයක් ක්‍රියාත්මක වුණා. ඒවා, ඉතා හොඳ වැඩ පිළිවෙළවල්. වෙරළ ගඟ වැසි ජලය අපවහනය හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ගෝඨාභය රාජපක්ෂගේ කාල සීමාවේදී අවසන් වුණාට පස්සේ, - ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ලෙස - නව මුතුවැල්ල සහ ටොරින්ටන් ප්‍රදේශ ආශ්‍රිතව පොළව යටින් මුහුදට යන නළ මාර්ග පද්ධතියක් හදලා තිබෙනවා. Norris Canal එක ප්‍රතිසංස්කරණය කර තිබෙනවා. ඊට අමතරව, ඒකේ කෙළවරෙන් නැවත වතාවක් පොළොව යටින් tunnel එකක් හරහා මුහුදට වතුර යවලා තිබෙනවා.

ඇළවල් ප්‍රතිසංස්කරණය කිරීම වාගේම කොළඹ යටවීම කියන කාරණාව කරුණු දෙකක් නිසා සිද්ධ වෙන්න පුළුවන්. එකක් තමයි, කැලණි ගඟේ වතුර ඇළවල් දිගේ ආපස්සට ඇවිල්ලා යටවෙන එක. මොකද, කොළඹ නගරයේ සැලකිය යුතු ප්‍රදේශ ගණනාවක්ම තිබෙන්නේ කැලණි ගඟට වඩා පහළින්. ඒ නිසා ඉහළ ප්‍රදේශවලට වැස්සොත් කැලණි ගඟේ වතුර වැඩිවෙනවා. ඒ සමඟ ම ඇළවල් දිගේ, කානු දිගේ වතුර ආපස්සට ඇවිල්ලා යට වෙන්න පුළුවන්.

අනෙක් එක තමයි, වැසි ජලයෙන් යට වීම. ආපස්සට වතුර එන එක වළක්වා ගන්න නම් කළ යුතුව තිබෙන්නේ ඒකට අදාළව pumping stations හදන එක. ඒ කාල සීමාව තුළ 8ක් හදන්න plan කරලා තිබුණත්, 4ක් තමයි හදලා තිබෙන්නේ. මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, ඒ සැලසුම්වල තිබෙන විධියට ඉතිරි 4 හදන්නේ නැද්ද කියලා. අඹතලේ, Manning Market එක අසල, ගල් පල්ලිය, පිටකොටුව කියන ප්‍රදේශවල මේ pumping stations හදලා, ආපස්සට එන වතුර පාලනය කර ගන්න සැලසුම් නිර්මාණය කර තිබෙන බව දැනගන්න ලැබී තිබෙනවා.

ඒ වාගේම මෙවර ඇති වෙච්ච ප්‍රශ්නය දිහා හොඳට බැලුවොත්, විශේෂයෙන් දෙයක් පෙනෙන්න තිබෙනවා. ඒ, ඇළ මාර්ග උතුරා ගියේ නැති එක. මම මේ ප්‍රශ්නය මතු කරන්න හේතුව වුණේත් ඒකමයි. ඇළ මාර්ග උතුරා ගංවතුර ආවා නම් අපට තේරුම් ගන්න පුළුවන්, මෙය අධික වර්ෂාපතනයක් නිසා ඇළවල් දිගේ ඒ වතුර යන්න බැරි වුණු නිසා ඇති වෙච්ච තත්ත්වයක් කියලා. නමුත් මෙතැන සිද්ධ වුණේ, කානුවලින් ඇළ මාර්ගවලට වතුර නොයෑමයි. ඒකට ප්‍රධාන හේතුව තමයි, නගර සභාව සහ තවත් ආයතන ගණනාවක්ම කළමනාකරණයකින් තොරව කටයුතු කිරීම. ඒ වෙලාවේදී ආණ්ඩුවේ වගකිවයුතු ඇමතිවරයෙක්, නගරාධිපතිනියගේ පැත්තට අවධානය යොමු කරලා එතුමියගෙන් අහන්න කියලා කිව්වාට, කොළඹ වාගේ විශාල නගරයක - විශේෂයෙන්ම ලංකාවේ වාණිජ අගනගරයේ - ජලය පාලනය කිරීම නගර සභාවට විතරක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ වෙලාවේදී සමහරුන් වගකීම් විරහිතව කථා කරපු ආකාරයත් අපට දකින්න ලැබුණා. ඒ මොනවා වුණත්, වතුරෙන් යටවීම නිසා අවසානයේදී බොහෝ ව්‍යාපාරික ස්ථානවලට විශාල හානියක් සිද්ධ වුණා. ඒ වාගේම හානි සිදු වූ ඒ ව්‍යාපාරිකයින්ට වන්දි ලබා දීමේ වැඩ පිළිවෙළක් පිළිබඳව ඔවුන් තවම දැනුවත් වෙලා නැහැ. ඒ නිසා සංචාරක ආකර්ෂණය තිබෙන ලංකාවේ ප්‍රධානම නගරය මේ වාගේ සුළු වර්ෂාපතනයකින් පවා යටවෙනවා කියන්නේ අතිශය නොසැලකිලිමත්භාවය නිසා සිදුවන දෙයක්.

මම එහෙම කියන්නේ ඇයි? හැමෝම මා මේ කියන එක දකින්න ඇති. ගංවතුරෙන් - ගංවතුරකුත් නොවෙයි ඒක - යට වුණු දවසට පහුවදා සියලු කානු සුද්ධ කරමින් විශාල ව්‍යාපෘතියක් කළා. අග්‍රාමාත්‍යවරිය මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා කියද්දිත් මේ ආණ්ඩුවේ ඉතිරි කණ්ඩායම් ටික - නගර සභාව සහ අනෙකුත් ආයතන සියල්ල - ඒ පිළිබඳව අවධානය යොමු නොකිරීම තමයි ඒකට ප්‍රධාන හේතුව. කොළඹ නගරයේ තිබෙන ජලය බැස නොයෑමේ ප්‍රශ්නය දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. හැබැයි ඒ ඒ ආණ්ඩු දිගටම උත්සාහ කළා, මේ ප්‍රශ්නය විසඳන්න. ගරු ඇමතිතුමනි, නමුත් ඒ වෙනුවෙන් මේ ආණ්ඩුව යටතේ මොනවාද කළේ කියන එක පැහැදිලි කිරීම විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාගේ වගකීමක් වනවා.

ඒ වාගේම මම හොයා බලනකොට දැනගන්න ලැබුණා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදීත්, විශේෂයෙන්ම 2014ට පෙර කාල සීමාවේදීත් ලෝක බැංකු ආධාර සහිතව ඩොලර් මිලියන 223ක් විතර වියදම් කරලා ජල ව්‍යාපෘතියක් නිර්මාණය කර තිබෙන බව. ඒ, ඇළ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම, රොන් මඩ ඉවත් කිරීම යනාදිය සඳහා. ඒ වාගේම කොළඹ ජල ද්‍රෝණියේ ගංවතුර අවදානම අඩු කිරීම සඳහා වූ බොහෝ අරමුණු ඒ කාල සීමාවේදී සාර්ථක කර ගත්තා කියලාත් මේ වාර්තාවල සඳහන් වනවා. මේ, ලෝක බැංකු නිරීක්ෂණ; දේශපාලන වර්ණනා නොවෙයි. දැන් අවුරුදු 11ක් විතර වෙනවා, මම මේ කියන සිද්ධි ටිකට. ඊට පස්සේ මහානගර හා බස්නාහිර සංවර්ධන ඇමතිවරයා විධියට පාඨලී චම්පික ඇමතිවරයා හිටපු කාල සීමාවේදීත් මේ ටික සිද්ධ වෙලා තිබෙනවා. නමුත් වර්තමානයේ ඒ වාගේ විශේෂ ව්‍යාපෘති කිසිවක් අපි දැක්කේ නැහැ, කොළඹ නගරයේ ගංවතුර පාලනය සඳහා ආණ්ඩුව පැත්තෙන් ක්‍රියාත්මක වනවා. ඒ නිසා ආණ්ඩුවෙන් අපි ඉල්ලීමක් කරනවා, කුමක්ද ඔබ මේ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ග ටික කියලා මේ සභාවට පැහැදිලි කරන්න කියලා. ඒ වාගේම මේකෙන් විපතට පත් වූ ජනතාවට ඔබ ලබා දෙන්න බලාපොරොත්තු වන සහන පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලාත් ඉල්ලා සිටිමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.14]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අමීල ප්‍රසාද් මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා.

අපි දන්නවා, වැස්සාම කොළඹ නගරයේ පාරවල් කිහිපයක් සාමාන්‍යයෙන් හැමදාම යට වීම කොළඹ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් කියලා. කොළඹ ඉපදිලා, කොළඹ හැදිලා, කොළඹම ජීවත් වන කෙනෙක් හැටියට මට ඒ පිළිබඳව බොහෝ අත්දැකීම් තිබෙනවා. නමුත් කොළඹ නගරයේ පසුගිය දා ඇති වෙච්ච තත්ත්වය දිහා බැලුවාම පෙනෙනවා, එය අසාමාන්‍ය තත්ත්වයක් බව. එහෙම නැතුව වැස්සාම කවදාවත් කොළඹ යට නොවී තිබිලා නැහැ. පාරවල් කිහිපයක් තිබෙනවා, යට වෙන. නමුත් වැස්ස නැවතිච්ච ගමන් විනාඩි 10න්, 15න් ඒ වතුර බැහැලා යනවා. නමුත් මේ වතාවේ වුණේ, කවදාවත් යට නොවන ප්‍රදේශ වන වැල්ලවත්ත, බම්බලපිටිය, හයිලෙවල් පාර වාගේ ප්‍රදේශවල, ඒ වාගේම ගුණසිංහපුර, පීපල්ස් පාර්ක් පැත්ත, ආමර් වීදිය වාගේ ප්‍රදේශවල, මරදාන, දේවානම්පියතිස්ස මාවත යන ප්‍රදේශවල ඉතාම අසාමාන්‍ය ලෙස වතුර දැමීමක් සිදුවීම. වෙනදාටත් මම ඒ කියපු සමහර ප්‍රදේශවල යම් ප්‍රමාණයකට වතුර එකතු වෙනවා. නමුත් වැස්ස වැහැලා විනාඩි 10න්, 15න් ඒ වතුර ටික බහිනවා. නමුත් මෙවර මෙහෙම වුණේ ඇයි? ප්‍රධානම දේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ කොළඹ නගර සභාවට සම්බන්ධ වෙලා වැඩ කරන රාජ්‍ය ආයතන ටිකක් තිබෙනවා. මොකද, කොළඹ නගරයට දවසකට ලක්ෂ 10කට ආසන්න පිරිසක් ඇවිල්ලා යනවා. ඉස්කෝලවලට එනවා; රජයේ ආයතනවලට එනවා; රැකියාවලට එනවා; නොයෙක් වැඩ කර ගන්න එනවා. ඒ නිසා ලක්ෂ 10කට ආසන්න පිරිසක් දවසකට කොළඹට එනවා. ඒ වාගේම කොළඹ නගරය ඇතුළේ ලක්ෂ 6කට ආසන්න පිරිසක් ජීවත් වනවා. පොඩි භූමි ප්‍රමාණයක් ඇතුළේ අධික පිරිසක් සැරිසරනවා. ඒ නිසා කොළඹ නගර සභාවට විතරක් කොළඹ නගරයේ තිබෙන අඩුපාඩු සකස් කරන්න, යටිතල පහසුකම් පාලනය කරන්න බැහැ. ඒක තමයි ඉතිහාසය පුරාම අපි දැකපු යථාර්ථය. ඒ නිසා කොළඹ නගර සභාවට සහයෝගය දෙන ආයතන කිහිපයක් තිබෙනවා.

එකක් තමයි, නාගරික සංවර්ධන අධිකාරිය. ඊළඟට තිබෙනවා, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව. ඊළඟට තිබෙනවා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව. එතකොට ඒ ආයතන තමයි කොළඹ නගර සභාවේ යටිතල පහසුකම් ටික හරියාකාරව පවත්වාගෙන යන්නේ; ඇළ දොළ ටික සුද්ද කරන්නේ; කානු පද්ධතිය සුද්ද කරන්නේ; ගලි ටික සුද්ද කරන්නේ; stormwater drainage system එක සුද්ද කරන්නේ. මේවා තමයි පසුගිය කාලය පුරාම නගර සභාවත් එක්ක ඒකාබද්ධ වෙලා වැඩ කළ රාජ්‍ය ආයතන. නමුත් කියන්න කනගාටුයි, තමුන්නාන්සේලාගේ නගරාධිපතිතුමිය බලයට ආවාට පස්සේ ඒ කිසිදු ආයතනයක සහයෝගයක් ගත්තේ නැහැ. එදිනෙදා කරන වැඩ ටිකක් තිබෙනවා. ඒ එදිනෙදා කරන වැඩ ටික තමයි කානු පද්ධතිය සුද්ද කරන එක. එදිනෙදා කරන ඒ routine වැඩ ටික සිද්ධ වුණේ නැහැ. ඒවා වුණේ නැති නිසා තමයි වැස්සත් නැවතිලා, අනෙක් දවසේ කානු පද්ධතිය ඔක්කෝම සුද්ද කරනකොට ටොන් ගණන් කුණු එළියට ආවේ; ටොන් ගණන් පස් එළියට ආවේ. ඒ ඇයි? අවුරුදු එකහමාරක් තිස්සේ මේවා සුද්ද කළේ නැහැ. ඒකයි ඒ අසාමාන්‍ය ගංවතුරක් ආවේ. ඉතින් ඒක සම්පූර්ණයෙන්ම එතුමියගේ අකාර්යක්ෂමතාව. ඒක තමයි ප්‍රශ්නය. අනෙක් එක එතුමිය මේ වැඩ කටයුතු සඳහා අනෙකුත් රාජ්‍ය ආයතනවල සහයෝගය ගත්තේ නැහැ. මම කිව්වා වාගේ කොළඹ නගරය කියන්නේ, ජන ඝනත්වය ඉතාම වැඩි නගරයක්, භූමි ප්‍රමාණය අඩු වුණාට. ඉතින් කොළඹ නගර සභාවට විතරක් ඒක දරාගන්න බැහැ. ඒකට තමයි නාගරික සංවර්ධන අධිකාරිය තිබෙන්නේ; ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව තිබෙන්නේ; සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තිබෙන්නේ. ඒ ඔක්කෝම එකතු වෙලා තමයි මේ නගරය ඉස්සරහට ගෙන යන්නේ. නමුත් පසුගිය කාලය පුරාම ඒක වුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟ කාරණය මෙයයි. ලෝක බැංකු ආධාර යටතේ ගංවතුර, විශේෂයෙන්ම වැසි වතුර පාලනය කිරීමේ project එකක් තිබෙනවා. ඒ, මරදානේ තිබෙන Norris Canal ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘතිය 2019-2020න් පසුව ක්‍රියාත්මක වුණේ නැහැ. වර්තමාන පාලනය බලයට ඇවිල්ලාත් අවුරුදු එකහමාරක් වෙනවා. නමුත්, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැති නිසා තමයි පිටකොටුව, ගුණසිංහපුර, මරදාන, දේවානම්පියතිස්ස මාවත වතුරෙන් යට වුණේ. ලෝක බැංකු ආධාර යටතේ සිදු කරන ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන ගියේ නැහැ. ඒ ව්‍යාපෘතිය එහෙමම අඩපණ වුණා; ඒක නැවතුණා.

ඊළඟට, විශේෂ කාරණය මේකයි. වැස්ස නිසා වැල්ලවත්ත, බම්බලපිටිය, හයිලෙවල් පාරත් ජලයෙන් යට වුණා. වැල්ලවත්ත රොක්සි ගාර්ඩන් එකේ තිබෙනවා, පොම්පාගාර තුනක්. ඒ පොම්පාගාර තුනෙන් පොම්පාගාර දෙකක් මාස ගණනාවක් තිස්සේ වැඩ කළේ නැහැ. අඩුම ගණනේ ඒවා repair කළේවත් නැහැ. ඒ පොම්පාගාර තුනෙන්, පොම්පාගාර දෙකක් වැඩ කරන්නේ නැත්නම් වතුර ටික අදින්නේ කොහොමද? මාස ගණනාවක් තිස්සේ ඒවා වැඩ කළේ නැහැ, ගරු ඇමතිතුමනි. වැල්ලවත්ත, බම්බලපිටිය, හයිලෙවල් පාර එහෙම ජලයෙන් යට වෙන ප්‍රදේශ නොවෙයි. මේක ගංවතුරක් නොවෙයි, ඇත්තටම වැහි වතුර. එහෙම නැතුව ගහ උතුරලා වතුර එළියට ආවේ නැහැ. වැස්ස නිසා නගරයට වැටුණු වතුර ටික ගලාගෙන යන system එක අවහිර වෙලා තිබුණා. ඒ system එක හරියට සුද්ද කරලා තිබුණා නම් මෙහෙම වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අමීල ප්‍රසාද් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව ගෙනාවාට. ඒ වාගේම මේ සභාවේ සිටින අපේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේවාට මැදිහත් වෙන්න කියලා. කොළඹ නගරයට වැස්සාම ඒ වැහි වතුර පිරෙන එක නවත්වා ගන්න පුළුවන් ව්‍යාපෘති කිහිපයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ ව්‍යාපෘති ටික එදිනෙදා කරන්න ඕනෑ. ඒ routine වැඩ ටික කළා නම් මේ වැහි වතුර ටික පාලනය කරගන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.20]

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන, ගරු විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශක වන අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා විසින් අධික වැසි තත්ත්වය මත කොළඹ CMC පාලන බලප්‍රදේශය තුළ පසුගිය 06වැනි දා සවස මතු වෙච්ච මාර්ග අවහිරතාව සහ ජල ගැල්ම පිළිබඳව කල්තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාව සම්බන්ධයෙන් එතුමා කරුණු කිහිපයක් මතු කළා. අකාර්යක්ෂම පාලනය, අනවසර ඉදිකිරීම් ඇතුළු කාරණා කිහිපයක් සම්බන්ධයෙන් ඒ යෝජනාවට බර තබමින් එතුමා කරුණු දැක්වුවා. ඒ යෝජනාව ස්ථිර කරමින් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් කරුණු දැක්වීමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාව කියන්නේ දකුණු ආසියාවේ තිබෙන නගර සභා අතරින් ඉතාම පැරණි නගර සභාවක්. එය වසර 160ක් පමණ පැරණි බව එහි ඉතිහාසය දෙස ආපස්සට හැරී බලද්දී පෙනෙනවා. 1954දී වාමාංශික නායකයෙක් විධියට එන්.එම්. පෙරේරා මහතා කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස කටයුතු කර තිබෙනවා. 2025 වර්ෂයේ පැවතුණු පළාත් පාලන මැතිවරණයේදී - 2025 ජූනි මාසයේ 02වැනි දායින් පසුව - තමයි කොළඹ මහ නගර සභාව තුළ ජාතික ජන බලවේගයේ පාලනයක් ඇති වෙන්නේ. එදා මෙදා තුර - වසර එකසිය ගණනක ඉතිහාසයක් තුළ - කොළඹ මහ නගර සභාව එක්සත් ජාතික පක්ෂයේ කොළ පැහැති පාලනයක් එක්ක තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ඔය සමස්ත ක්‍රියාවලියෙන් වසරක කාලයකදී තමයි ජාතික ජන බලවේගය ඊට නායකත්වය දෙමින් තිබෙන්නේ.

කොළඹ නගරයේ කානු පද්ධතිය වසර 120කට වඩා පැරණියි. ඒ කාල වකවානුවේදී නිර්මාණය වෙච්ච කානු පද්ධති තමයි ගොඩක් තිබෙන්නේ. විශේෂයෙන්ම මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් මතු කළා, මේක සාමාන්‍යයෙන් සිදු වන තත්ත්වයක් නොවෙයි කියලා. අපි දැක්කා, 2010දීත් මිලිමීටර් 400 ගණනක වාගේ අධික වර්ෂාපතනයක් ලැබිලා මෙවැනි තත්ත්වයක් ඇති වුණාට පස්සේ එදාත් ඒ කානු පද්ධතිය නවීකරණය කරන්න - සාමාන්‍යයෙන් දෙනිකව වැඩි ධාරිතාවකට ඔරොත්තු දෙන විධියට සකස් කරන්න - යම් යෝජනා සකස් වෙලා තිබුණු බව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ වැඩ පිළිවෙළ අනුව කිලෝමීටර 7කට ආසන්න ප්‍රමාණයක් තමයි ඒ වකවානුවේදී සංවර්ධනය වෙලා තිබුණේ. ඉන්පසුව එහි සංවර්ධනයක් සිද්ධ වුණු බවක් පෙනෙන්න නැහැ. කෙසේ වෙතත්, මේ යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමාට අපි ඉතාම පැහැදිලිව කියනවා, වැස්ස නිසා එම ප්‍රදේශ ජලයෙන් යට වීම සහ එය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වග කියන්න ඕනෑ ඒ පක්ෂයද, මේ පක්ෂයද කියලා සංවාදයක් අවශ්‍ය නැහැ කියන එක. නමුත්, යෝජනාව තුළ මතු කරන කාරණාව අනුව විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාවේ අකාර්යක්ෂමතාව නිසායි ඒක එහෙම වුණේ කියලා අපි මදකට හිතමු. තව පැත්තකින් ගත්තොත්, නොවැම්බර් මාසයේම 07වැනි දා රාත්‍රියේ වැහැපු වැස්සෙන් මම නියෝජනය කරන අවිස්සාවේල්ල ආසනයේ, සීතාවකපුර නගර සභා බලප්‍රදේශයට අයත් ප්‍රදේශ රාශියක්ම මුළුමනින්ම ජලයෙන් යට වෙලා මේ විධියටම ජරමරයක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවිස්සාවේල්ල නගර සභාවේත් එකම වතාවක් - 2018දී - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ රණවීර මන්ත්‍රීතුමා සභාපතිවරයා ලෙස කටයුතු කළා. ඒ හැරුණුකොට ඒ සභාවත් පටන් ගත්ත දවසේ ඉඳලා අද දක්වාම පාලනය කරන්නේ ගරු විපක්ෂ නායකතුමාගේ සහ එතුමාගේ මාධ්‍ය ප්‍රකාශකතුමාගේ පක්ෂය නියෝජනය කරන සභාපතිවරු කියන එක මතක් කළ යුතුව තිබෙනවා. හැබැයි, අවිස්සාවේල්ල නගර සභා බලප්‍රදේශයත් ඒ විධියටම ජලයෙන් යට වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම ඒ ප්‍රදේශය ජලයෙන් යට වෙන්න හේතු මොනවාද කියා මම අවිස්සාවේල්ල ප්‍රදේශයේ කෙනෙකු හැටියට දන්නවා. කොළඹ මහ නගර සභාව පිළිබඳවත් මට යම් අදහසක් තිබෙනවා. විශේෂයෙන්ම මේවාට බලපාන හේතු තිබෙනවා. දැන් මේ ජල බැස්මට තිබෙන විශේෂ බාධා ගත්තොත්, අනවසර ඉදිකිරීම් විශාල ප්‍රමාණයක් ඒ සඳහා බලපා තිබෙන බව අපි දන්නවා.

මම නියෝජනය කරන අවිස්සාවේල්ල නගරය ගත්තොත්, සාමාන්‍යයෙන් වැසි තත්ත්වයකදී අවිස්සාවේල්ල ටවුන් එකට බිසෝ ඇළෙන් වතුර ටික ගලා ගෙන එනවා. ඒ ප්‍රදේශයේ කානු පද්ධති කිහිපයක් තිබෙනවා. ඊට පස්සේ ඒ වතුර ටික ආපහු කිරිමැටි ඇළ ඔස්සේ පහත් බිමට ගලා ගෙන යනවා. පසුගිය පාලන කාලයේදී කානු පද්ධති උඩ, ඇළ මාර්ග උඩ ඒ අනවසර නිවාස, වාණිජ ස්ථාන, කඩ කාමර සියල්ල හදන්න ඉඩකඩ දීලා තිබෙනවා. තමන්ගේ පක්ෂයේ දේශපාලන හිතවාදීන් සහ තමන්ගේ කණ්ඩායම් ඒවාට අනුග්‍රහ දීලා, අවසර දීලා, වරිපනම් අංක දීලා, බලපත්‍ර දීලා - ඒ සියල්ල ඒ ආකාරයෙන් සකස් කරලා - ඒ සියල්ල අවහිරතාවට පත් කරලා, අද කිඹුල් කඳුළු හෙළීම පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ නිසා මේ යෝජනාව හොඳයි. හැබැයි, මේක පක්ෂයක් විධියට හෝ ඒ ආයතනය අපේ, අර ආයතනය ඒගොල්ලන්ගේ කියන කාරණය නොවෙයි වැදගත් වෙන්නේ. මේකෙන් පීඩාවට පත් වෙන්නේ ඒ ප්‍රදේශවල ජනතාව. ඒ නිසා අපට ඉතා පැහැදිලිව වගකීමක් තිබෙනවා, මේවා කළමනාකරණය කරලා අවශ්‍ය කටයුතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්ව කාරණයට මම එකඟ වෙන්නේ නැහැ. පසුගිය අගහරුවාදා තිබුණු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී SLLDC එකේ සභාපතිතුමා - Chairman - කරුණු පැහැදිලි කරලා කිව්වා, මීට මාස තුනකට කලිනුත් මේ ඇළ මාර්ග පද්ධති තමන්ගේ යන්ත්‍රසූත්‍ර දාලා ඉවත් කිරීම් කළාය කියලා. එක ඇළක නමක් කියලා කිව්වා, ඒ වෙනකොට fridgeවල දොරවල්, ඇඳන්, මෙට්ට ආදී විශාල ප්‍රමාණයක් ටිපර් 18ක් යොදා ඉවත් කළා කියලා. එතකොට මේ අවුරුද්දේ මොනවත්ම වෙලා නැහැ කියලා මතයක් හදන්න හදන එක නිවැරැදි නැහැ. ඒ කටයුතු ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

නමුත්, අද වනවිට අපි දේශගුණික විපර්යාසයකට මුහුණ දීලා තිබෙනවා. විශේෂයෙන්ම එල් නිනෝ තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. අපි දන්නවා, මේ හදිසි තත්ත්වයේදීත් එදා -06වැනි දා - තිඹිරිගස්යාය ඇතුළු ප්‍රදේශ කිහිපයකට මිලිමීටර් 149, 129 වැනි අධික ධාරිතාවයකින් යුතු වර්ෂාපතනයක් පතිත වුණු බව. කෙටි කාලයක් ඇතුළත ඇති වෙච්ච මේ වැසි තත්ත්වයන් එක්ක ඒ ප්‍රදේශයේ ජනතාව බරපතළ තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා.

මේ යෝජනාව ගෙනාපු විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශකතුමාට සිහිපත් කරන්න කැමැතියි, අවිස්සාවේල්ල නගර සභා සීමාවේ, කොළඹ මහ නගර සභා සීමාවේ විතරක් නොවෙයි, මතුගම නගරයත් ඊයේ පෙරේදා ක්ෂණිකව ජලයෙන් යට වුණු බව. මම හිතන විධියට, මතුගම නගර සභාව අයිතිව තිබෙන්නේත් විපක්ෂ නායකතුමාගේ සහ මාධ්‍ය ප්‍රකාශකතුමාගේ පක්ෂයේ කණ්ඩායමට. ඒ නිසා මේවා පිළිබඳව ඒ line එකෙන් අරගෙන කථා කරලා වැඩක් නැහැ. අපි දන්නවා, දශක ගණනාවක් මේ පළාත් පාලන ආයතනවල පාලනය හෙබවූයේ ඔබතුමන්ලාගේ කණ්ඩායම් බව. අනවසර ඉදිකිරීම්, කානු පද්ධති අවහිර කිරීම්, ඇළ මාර්ගවල මෙවැනි කටයුතු නිසා ස්වාභාවික ජල බැස්මට බාධා වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, අද වනකොට ස්වභාව ධර්මයේ ආශීර්වාදයත් ලැබිලා තිබෙනවා. ඒ නිසා අඩුපාඩු නිවැරැදි කරලා කාර්යක්ෂමව මේ ආයතන පවත්වා ගෙන යන්න. එදා ඒ අකාර්යක්ෂම පාලනය විසින් ඇති කරපු ප්‍රතිවිපාකවලට තමයි අද වනකොට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ ඇති

වී තිබෙන දේශගුණික විපර්යාස නිසා ජනතාව තවතවත් විවිධ අපහසුතාවලට පත් වෙන්න පුළුවන්. අද ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ පළාත් පාලන අමාත්‍යාංශත්, ඒ යටතේ ඇති සියලු ආයතනත් ඒකාබද්ධ වෙලා ජනතාව තවදුරටත් පීඩාවට පත් වන එක වළක්වාලීම සඳහා කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම පොලීසියේ, ත්‍රිවිධ හමුදාවේ හා විවිධ ආයතනවල සහාය ඇතිව, රටේ සියලු පළාත් පාලන ආයතනවල සහායෙන් මෙම කටයුතු කාර්යක්ෂම කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා කියන එකත් මම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.28]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ අපේ අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා එක්කයි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා එක්කයි මම එකඟ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් වැස්ස වහිනවා නම් වතුර එකතු වෙනවා නේ.

"ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි, ඒක විපක්ෂයේ ප්‍රශ්නයක්. එකතු වෙන වතුර බහින්නේ නැත්නම් ඒක ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි, ඒක විපක්ෂයේ ප්‍රශ්නයක්. *[බාධා කිරීමක්]*

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

වෙන්න එපා අහන්න.

ඒ වතුර ටික යන කානු අරවා මේවා ශුද්ධ කරලා නැත්නම් ඒක ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි, ඒක විපක්ෂයේ ප්‍රශ්නයක්. විපක්ෂයට ඒවා හරියට ශුද්ධ කරන්න තිබුණා. බල්තසාර් මැඩම් වැඩ කළේ නැත්නම් ඒකට සම්පූර්ණ වගකීම ගන්න ඕනෑ විපක්ෂය.

අවුරුදු 76ක් මේගොල්ලන් ඉඳලාත් කානු ටික හදලා තිබෙන්නේ පොඩියට. ඒ නිසා මේ අය වැයෙන් අපි වෙන් කරලා තිබෙනවා, කෝටි 10,000ක්. ශුද්ධ කරන්න කෝටි 20,000යි, හෝදන්න කෝටි 30,000යි. එහෙම අපේ රජය වෙන් කරලා තිබෙන්නේ. එම නිසා මම මේ සභාවට කියන්නේ, ඒ වතුර ගලපු එකට සම්පූර්ණයෙන් වගකීම ගන්න ඕනෑ විපක්ෂයේ කට්ටියයි. කානුවලට වතුර යන්නේ නැත්නම් ආණ්ඩුව කොහොමද වගකීම ගන්නේ? ආණ්ඩුව වගකීම ගන්නේ නැහැ. කලින් හිටපු මේගොල්ලන් තමයි ඔක්කෝම ටික පස් දාලා පුරවලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඇවිල්ලා අවුරුදු දෙකයි. තව අවුරුදු 30ක්, 40කින් බලන්නකෝ අපි මේ හුණ්ඩුව පොඩ්ඩක් ලොකු කරලා පෙන්වන්නම්. අන්න අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඉන්නවා. ඒ ඔක්කෝම එකතු වෙලා අපි රට හදමු; "පොහොසත් රටක් -ලස්සන ජීවිතයක්" කරමු.

අපි ඇවිල්ලා තවම අවුරුදු දෙකයි. මේකට කෝටි 10,000ක් වෙන් කරලා තිබෙනවා. අපි වැව හදනවා, ඒකට 1,000යි. ඊට පස්සේ වැව ගැන study කරන්න campus හදනවා, ඒකට 20යි. ඊට පස්සේ campus එකේ research කරන්න ආයතන හදනවා, ඒකට 40යි. ඒවා ඔක්කෝටම මේ අය වැයෙන් සල්ලි වෙන් කරලා තිබෙනවා. ඒ නිසා අපට ගහන්න එපා නිකම් වතුර චුට්ටක් ආවාට. ඕනෑ රටකට වහිනවා නම් කොහොමත් වතුර එකතු වෙනවා. අපි නිකම් try කරලා බැලුවා, කොළඹ කොටුවට වතුර එකතු වෙනවාද, නැත්නම් වැල්ලවත්තට එකතු වෙනවාද, කොතැනටද එකතු වෙන්නේ කියලා. අපි plan කරලා කරපු ඒක අපේ අනුර කුමාර ජනාධිපතිතුමා එකතු වෙලා කළ මාර ලොකු වැඩක්, project එකක්. ඒකට නිකම් මෙහෙම ඇවිල්ලා අපට ආතල් දෙන්න එපා. අපි ඇවිල්ලා තාම අවුරුදු දෙකයි නේ. හැම අවුරුදු පහේම අපට මතක් කරන්න ඕනෑ නැහැ ශුද්ධ කරන්න කියලා. අපි 2055 වෙනකම් ඉන්නවා" කියලා හිතාගෙන ඉන්නවා මේ බබ්බු ටික. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔන්න ඔය මම කියපු විධියට තමයි ඒගොල්ලන් හිතාගෙන ඉන්නේ.

අඩුම ගාණේ වතුර ටික අයින් කර ගන්න බැරි මිනිස්සු ගෙදර ගිහිල්ලා පිටිපස්ස කොහොම හෝදනවාද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා කියන්න කලින් ගිහින් කානු ටික ශුද්ධ කරන්න කියලා ජෙප්පොන්ට.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව, ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.31]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් මම පිළිතුරු ලබා දෙන්නම්.

2026 නොවැම්බර් 06 දින ඇති වූ ගංවතුර තත්ත්වය නිසි පරිදි ඇගයීමේදී එය හුදෙක් කානු හා ඇළ මාර්ග නිසි පරිදි පිරිසිදු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස පමණක් සැලකීම තාක්ෂණික වශයෙන් නිවැරදි නොවේ. එම තත්ත්වය සඳහා බලපෑ අධික කෙටි කාලීන වර්ෂා තීව්‍රතාව, නාගරීකරණය හේතුවෙන් වැඩි වූ මතුපිට ජල ගලායාම, පවතින ජලවහන පද්ධතියේ සැලසුම් ධාරිතාව, භූගෝලීය පිහිටීම සහ ගංගා ජල මට්ටම්වල බලපෑම ඇතුළු සාධක කිහිපයක් විද්‍යාත්මක හා ඉංජනේරුමය පදනමකින් සලකා බැලිය යුතුව ඇත.

කොළඹ නගරය යට වුණාම ඒක නගර සභාවේ ප්‍රශ්නයක් හෝ වෙනත් ආයතනවල ප්‍රශ්නයක් කියලා කියනවාට වැඩිය විද්‍යාත්මක පදනමකින් බලන්න ඕනෑ කාරණයක් හැටියට තමයි අපි දකින්නේ.

කොළඹ නගරයේ පැරණි ඇළ මාර්ග හා වැසි ජලවහන පද්ධති බොහොමයක් එවකට පැවති වර්ෂාපතන දත්ත සහ

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

තාක්ෂණික ප්‍රමිතීන් මත පදනම්ව, ආසන්න වශයෙන් පැයකට මිලිමීටර් 30ක වර්ෂාපතන තීව්‍රතාවක් සැලකිල්ලට ගනිමින් සැලසුම් කර ඉදි කර ඇති බව කොළඹ මහ නගර සභාව වෙතින් ලද වාර්තාව අනුව දක්වා ඇත.

මේක කොළඹ මහ නගර සභාව කියන්නේ නිකම්ම නොවෙයි. මේ පිළිබඳව පර්යේෂණයක් කළ ඉංජිනේරු පර්යේෂකයන් පිරිසක් තමයි මේ කාරණය පැහැදිලි කරලා තිබෙන්නේ. ඒ තත්ත්වය සැලකිල්ලට ගත්තාම තමයි අපට මේ කාරණය දකින්න පුළුවන් වෙන්නේ. ඒ කියන්නේ පැයකට මිලිමීටර් 30ක වර්ෂාපතනයක් සඳහා තමයි කානු පද්ධති සැලසුම් කරලා තිබෙන්නේ. ඒක කාගේවත් වැරැද්දක් නොවෙයි එවකට තිබුණු දත්ත සැලකිල්ලට ගනිමින් කළ දෙයක්.

කෙසේ වෙතත්, කාලගුණික රටාවන්හි සිදුවන වෙනස්වීම් හා කෙටි කාලීන අධික වර්ෂාපතනයන්හි වැඩිවීම සැලකිල්ලට ගනිමින් නව ජලවහන ව්‍යාපෘති සැලසුම් කිරීමේදී ඉහළ වර්ෂාපතන තීව්‍රතාවයන් සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාව පවතිනවා. විශේෂයෙන්ම අපි දන්නවා, මේ වෙනකොට ගෝලීය දේශගුණික, කාලගුණික විපර්යාස විශාල වශයෙන් සිදු වෙමින් පවතිනවා. ඒ නිසාම කෙටි කාලීනව අධික වර්ෂාපතනයක් ලැබෙන්න පුළුවන්. 2010 කොළඹ නගරයට මිලිමීටර් 350කට අධික වර්ෂාපතනයක් පැය 24ක කාලයක් තුළ ලැබී තිබුණා. නමුත්, මේ අවස්ථාවේදී පැයකට ආසන්න කාලයකදී මිලිමීටර් 129ක වර්ෂාපතනයක් ලැබී තිබුණා. ඒ තත්ත්වයනුත් අපි සැලකිල්ලට ගන්නවා.

මහජනතාවගේ ජීවිත, දේපළ හා දෛනික කටයුතුවලට මෙවැනි ගංවතුර තත්ත්වයන්ගෙන් සිදුවන බලපෑම පිළිබඳව අපි රජයක් හැටියට කනගාටුව පළ කරනවා. ඒ වාගේම, කොළඹ නගරයේ ගංවතුර අවදානම අවම කිරීම සඳහා පවතින ජලවහන පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අපි මූලික කටයුතු මේ වන විටත් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම තමයි, මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම ඉදිරිපත් කරපු අදහස්වල මීට කලින් කොළඹ නගරයේ වැසි ජලය බැහැර කිරීම සඳහා විධිමත් වැඩසටහන් ආරම්භ කර තිබුණු බව කියවුණා. නමුත් අපි දකිනවා, ඒවා තිරසර වැඩසටහන් නොවන බව. ඇත්තටම ඒ අවස්ථාවල නම් දෙකකුත් සඳහන් වුණා. එතුමන්ලාගේ කාලයේ දී ඒ වැසි ජලය බැහැර කිරීමේ වැඩසටහන තිරසර විධියට ඇති කර තිබුණා නම්, මම හිතන්නේ ආයෙත් අපට අවුරුදු 10ක් ඇතුළත මේ ප්‍රශ්නය කථා කරන්න වෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ වන විට, මේ වෙනුවෙන් තිරසර වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම සඳහා පියවර ගනිමින් ඉන්නවා.

ඒ අනුව, පහත ක්‍රියාමාර්ග අපි මේ වනකොටත් හඳුනාගෙන අවශ්‍ය මූලික පියවර අරගෙන තිබෙනවා.

ඇළ මාර්ග, කානු පද්ධති සහ ජලවහන මාර්ගවලට ඝන අපද්‍රව්‍ය බැහැර කරන පුද්ගලයන්ට එරෙහිව පවතින නීති හා අතුරු ව්‍යවස්ථා, - ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා කිව්වා, සමහර තැන්වල fridgeවල කැඩුණු දොරවල් ගිහිල්ලා කානුවල දාලා තිබුණා, foam මෙට්ට දාලා තිබුණා කියලා. ඒ වාගේ තත්ත්වයන් තිබෙනවා. ඒ නිසා, මෙන්න මේවාට එරෙහිව නීති හා අතුරු ව්‍යවස්ථා දැඩිව ක්‍රියාත්මක කිරීම වාගේම, අවශ්‍ය අවස්ථාවලදී ප්‍රමාණවත් දඩ මුදල් පැනවිය හැකි නීතිමය විධිවිධාන හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම.

ඒ වාගේම, ප්‍රජා සහභාගිත්වය ඇති කිරීම තුළින් ඇළ මාර්ග ආශ්‍රිත ප්‍රදේශවල පදිංචිකරුවන්, ප්‍රජා සංවිධාන, පරිසර සංවිධාන සහ ප්‍රාදේශීය නියෝජිතයන් සම්බන්ධ කර ගනිමින් ඇළ මාර්ග ආරක්ෂා කිරීමේ හා පිරිසිදුව පවත්වාගෙන යාමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. විශේෂයෙන් Clean Sri Lanka වැඩසටහන මඟින්, ඒ වාගේම "අත්තම" වැඩසටහන මඟින් ප්‍රජාව සම්බන්ධ කරගෙන මේවා පිරිසිදු කිරීම පිළිබඳ වගකීම අපි ප්‍රජාවටත් පවරමින් කොළඹ මහ නගර සභාව සහ රජය මැදිහත් වී මේ කටයුතු කරන්න පියවර ගනිමින් ඉන්නවා.

ඒ වාගේම, නිවාස මට්ටමින් කසළ එකතු කිරීමේ සේවාව නිසි පරිදි භාවිත කිරීම, කසළ වෙන් කිරීම සහ අවිධිමත් ලෙස කසළ බැහැර කිරීමෙන් ඇති වන ගංවතුර හා පාරිසරික බලපෑම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

ඒ වාගේම, නිතර කසළ බැහැර කරන ස්ථාන හඳුනාගෙන ඒවා නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම, අවශ්‍ය ස්ථානවල නිරීක්ෂණ කැමරා සවි කිරීම සහ නීති උල්ලංඝනය කරන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.

ඒ වාගේම, කොළඹ මහ නගර සභාව, පහත් බිම් සංවර්ධන අධිකාරිය - ඔබතුමා කිව්වා, වෙනත් ආයතන සම්බන්ධ කරගන්න ඕනෑ කියලා. ඒක නිවැරදියි - සහ අනෙකුත් අදාළ ආයතන ඒකාබද්ධව ඇළ මාර්ග පිරිසිදු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ මහජන සහභාගිත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ කොළඹ නගරයේ කැළි කසළ අවිධිමත්ව බැහැර කිරීමේ ප්‍රශ්නය මේ කොළඹ නගරය වැසි වතුරට යටවීම ඇතුළේ තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කරනවා.

කානු හා ඇළ මාර්ගවලින් ඉවත් කරනු ලබන රොන් මඩ, වැලි හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථිර ස්ථාන වෙන් කිරීම.

දෛනිකව කොළඹ නගරය වෙත රැකියා හා විවිධ රාජකාරි අවශ්‍යතා සඳහා පැමිණෙන පිරිස් විසින් කසළ බැහැර කිරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

ඒ වාගේම, නවීන ජලවහන ව්‍යාපෘති සැලසුම් කිරීම, තාක්ෂණික අධ්‍යයන සිදු කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය කිරීම සහ පවතින ජලවහන පද්ධතියේ නිරන්තර නඩත්තු කටයුතු පවත්වාගෙන යාම, තාක්ෂණික නිපුණත්වයක් සහිත ඉංජිනේරු හා තාක්ෂණික නිලධාරීන් යොදා ගැනීම. ඒ පිළිබඳව මූලික කටයුතු අපි මේ වෙනකොට සකස් කර තිබෙනවා.

ඒ වාගේම, මෙම කරුණ සම්බන්ධව ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ගරු ආණ්ඩුකාරතුමාගේ සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් කොළඹ හා තදාසන්න ප්‍රදේශවල සියලුම ඇළ මාර්ග ඉහළ ප්‍රමිතියකින් නඩත්තු කර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලද අතර, එහි දී ඇළ මාර්ගවලට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම සම්බන්ධව ප්‍රජා සහභාගිත්වය සහිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව දැඩිව අවධාරණය කර තිබෙනවා.

ඒ වාගේම ගංවතුර අවම කිරීමේ දිගු කාලීන පහත සඳහන් විසඳුම් කොළඹ මහනගර සභාව හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව,

* ගංවතුර පොම්පාගාර: ගුරුත්ව බලයෙන් ජලය බැහැර කළ නොහැකි පහත් බිම් ප්‍රදේශවල රැස්වන ජලය කෘත්‍රිමව ප්‍රධාන ජලවහන මාර්ග හෝ සුදුසු ජල බැහැර කිරීමේ ස්ථාන වෙත යොමු කිරීම.
* භූගත ජල ප්‍රවාහන උමං මාර්ග: නගරයේ පවතින සීමිත ඉඩකඩ තුළ විශාල ජල පරිමාවක් කාර්යක්ෂමව ප්‍රවාහනය කිරීම සඳහා භූගත උමං මාර්ග පද්ධති ස්ථාපනය කිරීම.
* ජල රඳවා ගැනීමේ ටැංකි හා ජලාශ: අධික වර්ෂාපතන අවස්ථාවලදී ක්ෂණිකව ඇති වන අතිරික්ත ජල පරිමාව තාවකාලිකව රඳවාගෙන, පසුව පාලිත ආකාරයෙන් ජලවහන පද්ධතියට මුදා හැරීම.

* ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක්: ප්‍රධාන ඇළ මාර්ග, අනු ජලවහන මාර්ග, පොම්පාගාර, ජල රඳවා ගැනීමේ ප්‍රදේශ හා භූගත ජල ප්‍රවාහන පද්ධති ඒකාබද්ධව ක්‍රියාත්මක වන පරිදි සැලසුම් කිරීම.

උක්ත අධ්‍යයන හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සැලකිය යුතු, දිගු කාලීන මූල්‍ය ආයෝජන අවශ්‍යව ඇති අතර ඒ සඳහා අවශ්‍ය යෝජනා මහ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු කරලා තිබෙනවා.

අපි දන්නවා, ඇති වන හදිසි වර්ෂාවලදී; විශාල වර්ෂාපතනයක් එක මොහොතක, සුළු මොහොතකදී ලැබෙනකොට කොළඹ නගරය තුළ මේ ප්‍රශ්නය ඇති වන බව. ඒ වාගේම කොළඹ නගරය පිහිටා තිබෙන්නේ භූගෝලීය වශයෙන් කැලණි ගං මෝදර ආසන්නයේ. අවුරුදු මිලියන ගණනක් තිස්සේ කැලණි ගඟ ගලාගෙන ගිය පහත්ම භූමිය එතැන නිසා ස්වාභාවිකවම කොළඹ නගරය ඉතා පහසුවෙන් ගංවතුර, වැහි වතුර අවදානමකට ලක් වීමේ ඉඩකඩ තිබෙනවා. ඒ තත්ත්වයත් තේරුම් අරගෙන ජනතාවට සිදුවන අපහසුතා මහහැරවීම සඳහා කටයුතු කිරීමට අපි පියවර ගන්නවා. බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.40ට, 2026 ඔක්තෝබර් 23වන දින සභා සම්මතිය අනුව, 2026 නොවැම්බර් 14වන සෙනසුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழුது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.40க்கு, பாராளுமன்றம் அதனது 2026 ஒக்ரோபர் 23ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2026 நவம்பர் 14, சனிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.40 p.m. until 9.30 a.m. on Saturday, 14th November, 2026, pursuant to the Resolution of Parliament of 23rd October, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය: සංරක්ෂණය කිරීම
சுதேச பாரம்பரிய மருத்துவ முறைமை: பாதுகாத்தல்
SYSTEM OF INDIGENOUS MEDICINE: PRESERVATION

2341/2026

1. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ 'දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය' පවත්වාගෙන යාමට දේශීය පාරම්පරික වෛද්‍යවරුන් දායක වී ඇති බවත්;

(ii) එම වෛද්‍ය ක්‍රම ගුරු-ගෝල පදනම මත පාරම්පරිකව පැවත ආ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) පසු කාලීනව 'වෛද්‍ය තක්සලාව' (ගුරුකුල) ක්‍රමය මඟින් එම වෛද්‍ය ක්‍රමය පෝෂණය වී ව්‍යාප්ත වූ බවත්;

(ii) විවිධ රෝග සඳහා විශේෂිත ප්‍රවීණ වෛද්‍ය පරම්පරා රට පුරා පැවැති බවත්;

(iii) අඛණ්ඩව පැවත ආ එම වෛද්‍ය ක්‍රමය වර්තමානයේ 'ජාතික උරුමයක්' ලෙස සැලකිය යුතු බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානය සහ යුනෙස්කෝ සංවිධානය මඟින් ස්වදේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කළ යුතු බව ප්‍රකාශ කර තිබේද;

(ii) එම ප්‍රතිපත්තිවලට අනුකූලව එම වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය හා පවත්වාගෙන යාම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(iii) පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සකස් කර ඇති නව නීති කෙටුම්පත මඟින් එම ජාත්‍යන්තර ප්‍රතිපත්ති ආරක්ෂා වන බව තහවුරු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் 'சுதேச பாரம்பரிய மருத்துவ முறைமையை' தொடர்ந்தும் பேணிவருவதற்கு சுதேச பாரம்பரிய வைத்தியர்கள் பங்களிப்புச் செய்துள்ளார்கள் என்பதையும்;

(ii) மேற்படி வைத்திய முறைகள் குரு-சீடர் அடிப்படையில் பாரம்பரியமாகத் தொடர்ச்சியாக வந்துள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பிற்காலத்தில் 'வைத்திய தக்சலாவ' (குருகுல) முறைமைமூலம் மேற்படி வைத்திய முறை பேணிவளர்க்கப்பட்டு விரிவுபடுத்தப்பட்டுள்ளது என்பதையும்;

(ii) பல்வேறு நோய்களுக்காக விசேட நிபுணத்துவம் பெற்ற வைத்தியப் பரம்பரைகள் நாடு முழுவதும் இருந்துள்ளன என்பதையும்;

(iii) தொடர்ச்சியாக நிலவிவந்த மேற்படி வைத்திய முறையானது தற்காலத்தில் 'தேசிய மரபுரிமையாகக்' கருதப்பட வேண்டும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) உலக சுகாதார அமைப்பு மற்றும் யுனெஸ்கோ அமைப்பு ஆகியவற்றால் சுதேச மருத்துவ முறைகள் பாதுகாக்கப்பட வேண்டுமென தெரிவிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கொள்கைகளுக்கு இணங்க, அவ்வைத்திய முறையைப் பாதுகாப்பதற்கும் பேணிவருவதற்கும் அரசாங்கம் எடுத்துள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) பாரம்பரிய வைத்தியர்களைப் பதிவு செய்வதற்காக தயாரிக்கப்பட்டுள்ள புதிய

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

சட்டமூலம் ஊடாக மேற்படி சர்வதேச கொள்கைகள் பாதுகாக்கப்படுவது உறுதிப் படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) indigenous traditional medical practitioners have contributed toward sustaining the system of indigenous medicine in Sri Lanka; and

(ii) the said system of medicine has traditionally been transmitted through a lineage of teacher-disciple relationships?

(b) Will he accept that -

(i) the said system of medicine was subsequently nurtured and expanded through the Vaidya Thaksalawa - Gurukula - system;

(ii) specialized and expert medical lineages renowned for treating various diseases existed throughout the country; and

(iii) the said system of medicine, which has been continuously preserved to date, ought to be declared a national heritage?

(c) Will he inform this House -

(i) whether the World Health Organization and UNESCO have declared that indigenous systems of medicine should be preserved;

(ii) the measures taken by the Government to preserve and sustain the said system of medicine in conformity with those policies; and

(iii) whether it has been ensured that the new Bill drafted for the registration of traditional medical practitioners upholds those international policies?

(d) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය ක්‍රම (දේශීය චිකිත්සාව හෝ හෙළ වෙදකම) නීත්‍යානුකූලව සහ නිල වශයෙන් ජාතික සෞඛ්‍ය පද්ධතියේ ප්‍රධාන කොටසක් ලෙස පිළිගෙන ඇත. ශ්‍රී ලංකා රජය විසින් පාරම්පරික වෛද්‍ය ක්‍රම ආයුර්වේද, සිද්ධ සහ යුනානි ක්‍රම සඳහා සමාන මට්ටමේ පිළිගැනීමක් ලබා දී ඇති අතර, එය සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා පවතින යන්ත්‍රණයන් වඩාත් විධිමත්ව සකස් කිරීම සඳහා සමාලෝචනය කරමින් පවතී.

(ඇ) (i) ඔව්.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ සාම්ප්‍රදායික වෛද්‍ය උපායමාර්ගය -WHO Medicine Strategy- සහ යුනෙස්කෝහි අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් සුරැකීමේ සම්මුතිය - Convention for the Safeguarding of Intangible Cultural Heritage - මඟින් ස්වදේශීය සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම සුරක්ෂිත කිරීම, නියාමනය කිරීම සහ පෝෂණය කිරීම පිළිබඳව නිර්දේශ කර ඇත.

(ii) 1. නීතිමය සහ පාලන ව්‍යුහය පෝෂණය කිරීම

1961 අංක 31 දරන ආයුර්වේද පනත සහ 2023 අංක 19 දරන සංශෝධිත ආයුර්වේද පනත මඟින් දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රම සහ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හිමිකම් හා නියාමනයන් නීත්‍යානුකූලව තහවුරු කර තිබීම.

2. ව්‍යවස්ථාපිත පිළිගැනීම

1961 අංක 31 දරන ආයුර්වේද පනත මඟින් (සහ එහි නවතම සංශෝධනය වන 2023 අංක 19 දරන සංශෝධිත පනත මඟින්) 'ආයුර්වේදය' යන්නට පාරම්පරික දේශීය චිකිත්සාව ද ඇතුළත් කර නීතිමය පිළිගැනීම ලබා දීම.

3. රාජ්‍ය පරිපාලන ව්‍යුහය

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ දේශීය වෛද්‍ය අංශය - Indegenous Medicine Section, ආයුර්වේද දෙපාර්තමේන්තුව, ආයුර්වේද වෛද්‍ය සභාව සහ පර්යේෂණ හා අධ්‍යාපන ආයතන පිහිටුවා ඒ මඟින් ස්වදේශීය වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාමට සහ ඒවායේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

4. ජාතික ප්‍රතිපත්ති මඟින් නියාමනය

ලංකාවේ පාරම්පරික වෛද්‍ය ක්‍රම සුරක්ෂිත කිරීම උදෙසා වසර 10ක කාල සීමාවක් ආවරණය වන පරිදි විශේෂ 'ජාතික පාරම්පරික වෛද්‍ය ප්‍රතිපත්තියක්' - National Traditional Medicine Policy එකක් - සකස් කිරීම.

5. වෛද්‍යවරුන් ලියාපදිංචිය හා සංරක්ෂණය

ආයුර්වේද වෛද්‍ය සභාව - Ayurveda Medical Council - මඟින් පාරම්පරික/ ගුරුකුල ක්‍රමවේද හරහා පැමිණෙන පාරම්පරික වෛද්‍යවරුන් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) වගන්තිය අනුව පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සිදු කරයි. පනතේ විධිවිධාන ප්‍රකාරව

ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සකස් කරන ලද රෙගුලාසි අනුව කාර්යක්ෂම ලෙස ආයුර්වේද වෛද්‍ය කර්මයේ යෙදීමට සුදුසු දැනුමක්, පළපුරුද්දක් හා හැකියාවන් අදාළ අයදුම්කරුවන්ට ඇති බවට සභාව සෑහීමකට පත්වීම නිර්ණය කිරීම සඳහා ලිඛිත හා වාචික පරීක්ෂණ පවත්වා, ඉන් සමත් වන අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමට හැකි ක්‍රමවේදයක් පවත්වා ගෙන යාම.

6. පාරම්පරික ඥානය හා වට්ටෝරු සංරක්ෂණය

පාරම්පරික ඥානය හා වට්ටෝරු, පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

7. ඖෂධ පැළෑටි හා ද්‍රව්‍ය සංරක්ෂණය

ඖෂධ පැළෑටි හා ද්‍රව්‍ය සංරක්ෂණය සඳහා ඔසු උයන් පවත්වාගෙන යාම සහ ප්‍රජා මට්ටමින් දේශීය වෛද්‍ය සායන පැවැත්වීම.

8. වෛද්‍ය සේවා පවත්වාගෙන යාම

රජයේ ආයුර්වේද රෝහල්, පර්යේෂණ රෝහල්, ශික්ෂණ රෝහල් සහ බාහිර රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් මහජනතාවට ස්වදේශීය වෛද්‍ය සේවා ලබා දීම.

(iii) ඔව්.

ආයුර්වේද පනත සංශෝධනය කිරීමේදී සහ ඊට අදාළව සකස් කෙරෙන නව නියාමන රීති/විධාන මඟින්

1. පාරම්පරික වෛද්‍යවරුන්ගේ සාම්ප්‍රදායික දැනුම හා ගුරු-ගෝල පරම්පරාගත හිමිකම් ආරක්ෂා කිරීම.
2. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රෝගීන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි විනිවිදභාවයෙන් යුත් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම.
3. පාරම්පරික දැනුම අයථා ලෙස භාවිත කිරීම - bio-piracy - වැළැක්වීම සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම.

ඉහත සඳහන් කරුණු වඩාත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින 1961 අංක 31 දරන ආයුර්වේද පනත සහ 2023 අංක 19 දරන සංශෝධිත ආයුර්වේද පනත සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

(அ) (i) ஆம்.

(ii) ஆம்.

(ஆ) (i) ஆம்.

(ii) ஆம்.

(iii) ஆம்.

இலங்கையின் பாரம்பரிய மருத்துவ முறை (சுதேச சிகிச்சை அல்லது நாட்டு வைத்தியம்) சட்டபூர்வமாகவும் அதிகாரபூர்வமாகவும் சுதேச சுகாதார அமைப்பின் பிரதான அங்கமாக ஏற்றுக்கொள்ளப்பட்டுள்ளது. இலங்கை அரசாங்கத்தால் பாரம்பரிய மருத்துவ முறைமைக்கு ஆயுர்வேத, சித்த மற்றும் யுனானி மருத்துவ முறைகளுக்கு இணையான மட்டத்தி லான அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதுடன், அதனைப் பாதுகாப்பதற்கும் மேம்படுத்துவதற்கு மான பொறிமுறைகளை மேலும் முறைப்படுத்து வதற்காக மீளாய்வுகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

(இ) (i) ஆம்.

உலக சுகாதார நிறுவனத்தின் பாரம்பரிய மருத்துவ உத்தி -WHO Traditional Medicine Strategy- மற்றும் யுனெஸ்கோவின் அருவமான கலாசார பாரம்பரியத்தைப் பாதுகாப்பதற்கான உடன்படிக்கை - Convention for the Safeguarding of Intangible Cultural Heritage - ஆகியவற்றின்மூலம் சுதேச மற்றும் பாரம்பரிய மருத்துவ முறைகளைப் பாதுகாத்தல், ஒழுங்குபடுத்துதல் மற்றும் போஷித்தல் தொடர்பாகப் பரிந்துரைக்கப்பட்டுள்ளன.

(ii) 1. சட்ட மற்றும் நிருவாகக் கட்டமைப்பை வலுப்படுத்துதல்

1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேதச் சட்டம் மற்றும் 2023இன் 19ஆம் இலக்க திருத்தப்பட்ட ஆயுர்வேதச் சட்டத்தின் மூலம் உள்நாட்டு பாரம்பரிய மருத்துவ முறைகள் மற்றும் ஆயுர்வேத மருத்துவர்களின் உரிமைகள் மற்றும் ஒழுங்குமுறைகள் சட்டபூர்வமாக உறுதிப் படுத்தப்பட்டுள்ளன.

2. அரசியலமைப்பு மற்றும் சட்டபூர்வ அங்கீகாரம்

1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேதச் சட்டத்தின்மூலம் (மற்றும் அதன் மைய திருத்தமான 2023ஆம் ஆண்டின் 19ஆம் இலக்க, திருத்தப்பட்ட சட்டத்தின்மூலம்) 'ஆயுர்வேதம்' என்பதில் பாரம்பரிய உள்நாட்டு சிகிச்சையையும் உள்ளடக்கி சட்டபூர்வ அங்கீகாரம் வழங்கப்பட்டுள்ளது.

3. அரச நிருவாகக் கட்டமைப்பு

சுதேச மருத்துவத் துறைக்காகவே சுகாதார அமைச்சின்கீழ் உள்நாட்டு மருத்துவப் பிரிவு - Indigenous Medicine Section, ஆயுர்வேதத் திணைக்களம், ஆயுர்வேத மருத்துவ சபை மற்றும் ஆராய்ச்சி மற்றும் கல்வி நிறுவனங்களை நிறுவி, அவற்றின் மூலம் சுதேச மருத்துவ சேவைகளைப் பேணிச் செல்வதற்கும் அவற்றின் தரத்தைப் பாதுகாப்பதற்கும் நடவடிக்கை எடுத்தல்.

4. உள்நாட்டுக் கொள்கைகள் மூலம் ஒழுங்கு படுத்துதல்

இலங்கையின் பாரம்பரிய மருத்துவ முறைகளைப் பாதுகாப்பதற்காக 10 வருட காலப்பகுதியை உள்ளடக்கும் வகையில் விசேட "உள்நாட்டு பாரம்பரிய மருத்துவக் கொள்கை" - National Traditional Medicine Policy - ஒன்றைத் தயாரித்தல்.

[ගරු (වෛද්‍ය) හලින්ද ජයතිස්ස මහතා]

5. මරුත්துவர்கள் பதிவு மற்றும் பாதுகாப்பு
ஆயுர்வேத மருத்துவ சபை - Ayurveda Medical Council - மூலம் பாரம்பரிய/குருகுல முறைமைகள் வழிவரும் பாரம்பரிய மருத்துவர்களை 1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேதச் சட்டத்தின் 55(1)ஆம் பிரிவின்கீழ் பதிவு செய்தல் மேற்கொள்ளப் படுகிறது. சட்டத்தின் விதிகளுக்கமைய ஆயுர்வேத மருத்துவ சபையால் தயாரிக்கப் பட்ட ஒழுங்கு முறைகளின்படி செயற்றிறனாக ஆயுர்வேத மருத்துவத்தை மேற்கொள்வதற்குப் பொருத்தமான அறிவு, அனுபவம் மற்றும் திறன்கள் விண்ணப்பதாரர்களுக்கு உள்ளனவா என்பதை சபை திருப்திப்படுத்திக் கொள்வதற்காக எழுத்துமூல மற்றும் வாய்மொழிப் பரீட்சைகளை நடாத்தி, அதில் சித்தியடையும் விண்ணப்பதாரர்களைப் பதிவு செய்வதற்கான ஒரு பொறிமுறை யைப் பேணி வருதல்.

6. பாரம்பரிய ஞானம் மற்றும் பதிவு பாதுகாப்பு
பாரம்பரிய ஞானம் மற்றும் பதிவுகள், ஓலைச்சுவடி புத்தகங்களைப் பாதுகாப்பதற்காக விசேட செயற்றிட்டங்களை நடைமுறைப்படுத்தல்.

7. மருந்து மூலிகைகள் மற்றும் திரவியங்கள் பாதுகாப்பு
மருந்து மூலிகைகள் மற்றும் திரவியங்களை பாதுகாப்பதற்காக மூலிகைத் தோட்டங் களைப் - மருத்துவத் தோட்டங்களைப் - பேணி வருவதும் சமூக மட்டத்தில் உள்நாட்டு மருத்துவச் சிகிச்சைகளை நடாத்துவதும்.

8. மருத்துவ சேவைகளைப் பேணிச்செல்லல்
அரச ஆயுர்வேத வைத்தியசாலைகள், ஆராய்ச்சி வைத்தியசாலைகள், போதனா வைத்தியசாலைகள் மற்றும் வெளி நோயாளர் சிகிச்சை நிலையங்கள் ஊடாக பொது மக்களுக்கு சுதேச மருத்துவ சேவைகளை வழங்குதல்.

(iii) ஆம்.

ஆயுர்வேதச் சட்டத்தை திருத்துவதிலும் அதனுடன் தொடர்புடையதாக தயாரிக்கப்படும் புதிய ஒழுங்குமுறை விதிகள்/கட்டளைகள்மூலம்

1. பாரம்பரிய மருத்துவர்களின் பாரம்பரிய அறிவு மற்றும் குரு - சீடர் பரம்பரை உரிமைகளைப் பாதுகாத்தல்.
2. சர்வதேச தரங்களுக்கு இணங்க நோயாளி களின் பாதுகாப்பை உறுதிப்படுத்தும் வகையில் வெளிப்படைத்தன்மையுடன் கூடிய பதிவு செய்யும் முறைகளைத் தயாரித்தல்.
3. பாரம்பரிய அறிவை முறையற்ற விதத்தில் பயன்படுத்துவதை -bio-piracy- தடுத்தல் மற்றும் புலமைச் சொத்து உரிமைகளைப் பாதுகாப்பதற்கான நடவடிக்கைகளை எடுத்தல்.

மேலே குறிப்பிடப்பட்ட விடயங்களை மிகவும் நடைமுறை ரீதியாகச் செயற்படுத்துவதற்காக தற்போதுள்ள 1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேதச் சட்டம் மற்றும் 2023ஆம் ஆண்டின் 19ஆம் இலக்க, திருத்தப்பட்ட ஆயுர்வேதச் சட்டம் என்பவற்றைத் திருத்துவ தற்கு நடவடிக்கை எடுக்கப்படுகின்றது.

(ஈ) எழவில்லை.

(a) (i) Yes.
(ii) Yes.

(b) (i) Yes.
(ii) Yes.
(iii) Yes.

Traditional systems of Medicine in Sri Lanka - Deshiya Chikitsa or indigenous medicine - have been legally recognized as an integral component of the national healthcare system. The Government of Sri Lanka has granted recognition to traditional medical systems, including Ayurveda, Siddha and Unani medicine and is reviewing and strengthening the mechanisms required for their protection and promotion.

(c) (i) Yes.

The WHO Medicine Strategy of the World Health Organization and the Convention for the Safeguarding of Intangible Cultural Heritage of UNESCO have made recommendations on protecting, regulating and sustaining indigenous and traditional medical systems.

(ii) 1. Strengthening the Legal and Regulatory Framework.

The rights and regulatory provisions relating to indigenous traditional medical systems and Ayurveda practitioners have been legally guaranteed under the Ayurveda Act, No. 31 of 1961, and the Ayurveda (Amendment) Act, No. 19 of 2023.

2. Statutory Recognition.

Under the Ayurveda Act, No. 31 of 1961 (with the Amendment made by the Ayurveda (Amendment) Act, No. 19 of 2023), has provided legal recognition to the term “Ayurveda” by incorporating traditional indigenous medicine - Deshiya Chikitsa - within its scope.

3. Public Administrative Structure.

The Indigenous Medicine Section under the Ministry of Health, the Department of Ayurveda, the Ayurveda Medical Council and research and educational institutions have been established

specifically to serve the indigenous medical sector, and action is being taken through these institutions to maintain indigenous medical services and ensure the preservation of their quality.

4. Regulation through National Policy.

   Formulation of a specific National Traditional Medicine Policy, covering a period of ten years, with the objective of preserving traditional medical systems in Sri Lanka.

5. Registration and Preservation of Physicians.

   The Ayurveda Medical Council registers traditional practitioners who have come through traditional/Gurukula systems of training, in accordance with Section 55(1) of the Ayurveda Act, No. 31 of 1961. In accordance with the Regulations formulated by the Ayurveda Medical Council under the provisions of the Act, a mechanism is maintained to conduct written and oral examinations to determine whether the relevant applicants have acquired knowledge, experience and skills required to practise Ayurveda medicine efficiently to the satisfaction of the Council and to register such applicants who pass the examinations.

6. Preservation of Traditional Knowledge, Formulations.

   Implementation of special projects for the preservation of traditional knowledge, formulations and palm-leaf manuscripts.

7. Conservation of Herbal Plants and Materials.

   Maintenance of herbal gardens and conducting indigenous medical clinics at community level for the conservation of herbal plants and materials.

8. Provision of Medical Services.

   Provision of indigenous medical services to the public through government Ayurveda hospitals, research hospitals, teaching hospitals and outpatient treatment centres.

(iii) Yes.

In amending the Ayurveda Act and through the new regulatory rules/provisions formulated in this regard,

1. Safeguarding the traditional knowledge of traditional practitioners and their hereditary rights passed down through *guru-shishya* - teacher-disciple - lineages.

2. Formulation of transparent registration procedures to ensure patient safety in accordance with international standards.

3. Taking action to prevent the improper use of traditional knowledge - bio-piracy - and to protect intellectual property rights.

Action is being taken to amend the existing Ayurveda Act, No. 31 of 1961, through the Ayurveda (Amendment) Act, No. 19 of 2023, in order to implement the above-mentioned measures more practically.

(d) Does not arise.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.